258 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 258 - இல. 7
Volume 258 - No. 7

2018 පෙබරවාරි 21වන බදාදා
2018 பெப்ருவரி 21, புதன்கிழமை
Wednesday, 21st February, 2018

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**ජාතික ආණ්ඩුව :**
ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය

**වරප්‍රසාද:**
ගරු සිවශක්ති ආනන්දන් මන්ත්‍රීතුමා සිදු කළ හානිකර ප්‍රකාශය

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
වෛද්‍ය එස්.එස්. ගුණවර්ධන දේශීය ආයුර්වේද සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) -[ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා] – පළමුවන වර කියවන ලදි.

පොතුවටවන මහා විහාරය පදනම (සංස්ථාගත කිරීමේ) - [ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා] – පළමුවන වර කියවන ලදි.

**මෝටර් වාහන පනත :**
නියෝගය

**කල් තැබීමේ යෝජනාව:**
රජයේ පාසල් වර්ග කිරීම

# பிரதான உள்ளடக்கம்

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தேசிய அரசாங்கம்:**
மாண்புமிகு பிரதம அமைச்சரினது கூற்று

**சிறப்புரிமை:**
மாண்புமிகு சிவசக்தி ஆனந்தனின் பாதகமான கூற்று

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
டாக்டர் எஸ்.எஸ். குணவர்தன சுதேச ஆயுர்வேத அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன] - முதன்முறை மதிப்பிடப்பட்டது

பொத்துவடவன மகா விகாரை மன்றம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு நலின் பண்டார ஜயமஹ] -முதன்முறை மதிப்பிடப்பட்டது

**மோட்டார் வாகனச் சட்டம்:**
ஒழுங்குவிதி

**ஒத்திவைப்புப் பிரேரணை:**
அரச பாடசாலைகளைத் தரம் பிரித்தல்

# PRINCIPAL CONTENTS

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

NATIONAL GOVERNMENT:
Statement by Hon. Prime Minister

PRIVILEGE:
Adverse Statement made by Hon. Sivasakthi Ananthan

PRIVATE MEMBERS' BILLS:
Dr. S.S. Gunawardana Indigenous Ayurveda Development Foundation (Incorporation) – [The Hon. Anura Sidney Jayarathne] – Read the First time

Pothuwatawana Maha Viharaya Foundation (Incorporation) – [The Hon. Nalin Bandara Jayamaha] – Read the First time

MOTOR TRAFFIC ACT:
Regulation

ADJOURNMENT MOTION:
Classification of Government Schools

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2018 පෙබරවාරි 21වන බදාදා***
*2018 பெப்ருவரி 21, புதன்கிழமை*
*Wednesday, 21st February, 2018*

**අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப.1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 පෙබරවාරි 21වන බදාදා, එනම් අද දින අපර භාග 3.00ට පැවැත්වීමට නියමිතව තිබූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම අද දින අපර භාග 2.00ට මාගේ නිල කාමරයේදී පැවැත්වෙන බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස සභික මන්ත්‍රීන් සියලු දෙනාට දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2015 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(ii) 2015 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂය සඳහා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදේශ රැකියා අමාත්‍යතුමිය සහ අධිකරණ අමාත්‍යතුමිය වෙනුවෙන් 2013 සහ 2014 වර්ෂ සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තා මම ඉදිරිපත් කරමි.

එම වාර්තා නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත යටතේ නියෝගය; සහ

(ii) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනත යටතේ නියෝග

සම්බන්ධයෙන් වූ වාර්තාව එකී ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை அமைச்சர்)
(The Hon. Sajith Premadasa - Minister of Housing and Construction)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කටුවන, ගඟුලන්දෙනිය, උඩ අළුපොත්දෙනිය, ලක්මිනි ස්ටෝර්ස් යන ලිපිනයෙහි පදිංචි ඊ.එම්. සුනිල් රංජිත් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) තිස්සමහාරාම, මහා අකුරුගොඩ, අංක 23/1 දරන ස්ථානයෙහි පදිංචි එස්.එච්. අජන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු වසන්ත අලුවිහාරේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, නුවරඑළිය තුරඟ තරග පිටිය, ස්ථානභාර නිලධාරි ලෙස සේවය කරන ඒ.ජී. පියසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, පාදුක්ක, මලගල, අංක 182/7 දරන ස්ථානයෙහි පදිංචි ඩී.පී. ප්‍රේමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1-885/'16-(1), ගරු බුද්ධික පතිරණ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2-1250/'16-(1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3-1428/'16-(1), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4-1660/'17-(1), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5-2002/'17-(1), ගරු බිමල් රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6-2010/'17-(1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7-2114/'17-(1), ගරු ඩග්ලස් දේවානන්ද මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## 2015 වසරේ උසස් පෙළ විභාගයෙන් වෛද්‍ය පීඨවලට සුදුසුකම් ලැබූ සිසුන් : බස්නාහිර පළාත
## 2015 உயர்தரப் பரீட்சை மூலம் மருத்துவ பீடத்திற்குத் தகைமை பெற்ற மாணவர்கள்: மேல் மாகாணம்
## STUDENTS QUALIFIED FOR MEDICAL FACULTIES AT 2015 ADVANCED LEVEL EXAMINATION: WESTERN PROVINCE

2132/'17

**8. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ අ. පො. ස. (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් කළුතර, කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) එම සංඛ්‍යාවෙන් වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනීම ලැබූ පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டில் க.பொ.த. (உயர் தர) பரீட்சைக்கு உயிரியல் பாடத்துறையில் களுத்துறை, கொழும்பு மற்றும் கம்பஹா மாவட்டங்களிலிருந்து தோற்றியுள்ள மாணவர் களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி எண்ணிக்கையில், பல்கலைக்கழக அனுமதிக்கான தகைமையைப் பெற்றுள்ள மாணவர்களின் எண்ணிக்கையும் சதவீதமும் எவ்வளவென்பதையும்;

(iii) மருத்துவ பீடத்திற்கான தகைமையைப் பெற்றுள்ள மாணவர்களின் எண்ணிக்கையும் சதவீதமும் எவ்வளவென்பதையும்;

(iv) மருத்துவ பீடத்திற்கான தகைமையைப் பெற்றுள்ள மாணவன் அல்லது மாணவியின் ஆகக்குறைந்த பெறுபேறு, Z பெறுமதி, கல்வி கற்ற பாடசாலை மற்றும் தெரிவுசெய்யப்பட்ட மருத்துவ பீடம் யாதென்பதையும்;

ஒவ்வொரு மாவட்டத்தின்படி தனித்தனியாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House in respect of each district separately-

(i) the number of students who sat for the GCE (A/L) Examination in the biology stream in 2015 from the Kalutara, Colombo and Gampaha Districts;

(ii) the number and the percentage of the students who were qualified for university entrance;

(iii) the number and the percentage of the students qualified for medical faculties; and

(iv) the minimum result of the students who were qualified for the medical faculty, Z-score, the school in which each student studied and the medical faculty to which they got selected?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ජෛව විද්‍යා විෂය ධාරාවෙන් 2015 වර්ෂයේ පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව

| | | |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කය | - | 4941 |
| ගම්පහ දිස්ත්‍රික්කය | - | 3690 |
| කළුතර දිස්ත්‍රික්කය | - | 2790 |

(ii) විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ පිරිස හා ප්‍රතිශතය

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

කොළඹ දිස්ත්‍රික්කය - 3128 63.31%

ගම්පහ දිස්ත්‍රික්කය - 2170 58.80%

කළුතර දිස්ත්‍රික්කය - 1486 53.26%

(iii) වෛද්‍ය පීඨ සඳහා තෝරාගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව හා ප්‍රතිශතය.

කොළඹ දිස්ත්‍රික්කය - 203 - 4.11%

ගම්පහ දිස්ත්‍රික්කය - 118 - 3.20%

කළුතර දිස්ත්‍රික්කය - 70 - 2.51%

(iv) ඇමුණුම 1 යටතේ දක්වා ඇත.

ඇමුණුම 1

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෛද්‍ය පීඨ සඳහා අවම සුදුසුකම් ලත් සිසුන්ගේ තොරතුරු

| විභාග අංකය | නම | දිස්ත්‍රික් කය | පාසල | විෂය හා සාමාර්ථය | | Z අගය | තෝරාගනු ලැබූ වෛද්‍ය පීඨය |
|---|---|---|---|---|---|---|---|
| 4130855 | එච්.ඩී.පී. එම්. දයානන්ද | කොළඹ | කො/ විශාකා බාලිකා | භෞතික විද්‍යාව | A | 2.0235 | කැලණිය වෛද්‍ය පීඨය |
| | | | | රසායන විද්‍යාව | A | | |
| | | | | ජීව විද්‍යාව | B | | |
| 4436148 | එස්.එම්. ඒ.ජී.එම්. සෙව්වන් | ගම්පහ | * | භෞතික විද්‍යාව | B | 1.8776 | රජරට වෛද්‍ය පීඨය |
| | | | | රසායන විද්‍යාව | B | | |
| | | | | ජීව විද්‍යාව | A | | |
| 4648390 | කේ.ඩබ්. ඩී.එස්.පී. පෙරේරා | කළුතර | * | භෞතික විද්‍යාව | A | 1.8636 | රජරට වෛද්‍ය පීඨය |
| | | | | රසායන විද්‍යාව | A | | |
| | | | | ජීව විද්‍යාව | B | | |

(ආ) පැන නොනඟී.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා මෙම ප්‍රශ්නයේ (iv)වැනි කොටසට ලබාදුන් උත්තරය අනුව මෙම දිස්ත්‍රික්ක තුනෙන් වෛද්‍ය පීඨයට ඇතුළත් වුණු ශිෂ්‍යය හෝ ශිෂ්‍යාවන්ගේ අවම සුදුසුකම බවට පත්වෙලා තිබෙන්නේ, එක දිස්ත්‍රික්කයක -මම හිතන විධියට කොළඹ දිස්ත්‍රික්කය වෙන්න ඇති- A සාමාර්ථ 3ක් ලබා ගැනීම.

ගම්පහ දිස්ත්‍රික්කයේ "A"1 සහ "B"2 යි. වෛද්‍ය පීඨවලට බඳවා ගන්නා 1,100 දෙනා අතරින් - [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ඔබතුමා අකුරුවලින් කිව්වා. එකක් "A" වලින් කිව්වා. අනෙක් එක "A"1 යි, "B"2 යි කියලා කිව්වා. Z-score එක වෙනම කිව්වා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

It may be a very high "A" or a very low "A". Ultimately, it depends on the Z-score.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

කොහොම වුණත් "A" එකට range එකක් තිබෙනවා නේ. එහෙම තිබියදී දැන් වෛද්‍ය පීඨවලට බඳවා ගන්නා අවම සුදුසුකම පිළිබඳ සාකච්ඡාවක් යනවා. ඒකෙදී "S"3 යෝජනා කර තිබෙනවා. මේ වාගේ ඉතාම පහළ අගයක් ගන්න එක අසාධාරණයි නේද? ඒකේ කිසි පදනමක් නැහැ නේද? තමුන්නාන්සේලා SAITM වැනි ආයතන පිහිටුවනකොට කියන්නේ, - [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, අපේ රටේ සුදුසුකම් සහිත දරුවන් ඕනෑ තරම් ඉන්නවා. වෛද්‍ය පීඨයකට බඳවා ගැනීමේ අවම ප්‍රමිතිය ලෙස අඩුම තරමින් ඔබතුමන්ලා "B"3 කියලා යෝජනා කරනවා නම්, ඒක සලකා බලන්න පුළුවන්. නමුත් ඊටත් වඩා පහළ අගයකට ගියාම වෛද්‍ය අධ්‍යාපනයේ සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමිතිය තමයි බිඳ වැටෙන්නේ. ඒ නිසා මේ සංඛ්‍යා ලේඛන අනුව කිසි පදනමක් නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

පසුගිය කාලයේ "S"3 ලබා ගත් වෛද්‍ය ශිෂ්‍යයන් හොඳ වෛද්‍යවරු වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට GMOA එකේ නිලධාරි මණ්ඩලය ගත්තොත්, බොහෝ නිලධාරීන් උසස් පෙළ විභාගයේ "S"3 තිබෙන අයයි. සම්මුඛ සාකච්ඡාවකදී ඒ අයගේ උසස් පෙළ ප්‍රතිඵල ඇහුවාම ඔවුන් කියන්න මැළි වුණා. ලොකුවට කථා කරපු එක්කෙනෙක් හිටියා, එතුමාට "S"3 යි තිබුණේ. ගරු කථානායකතුමනි, සම්මුඛ සාකච්ඡාවකදී එතුමාගේ උසස් පෙළ ප්‍රතිඵල පිළිබඳව ඇහුවාම කිව්වේ නැහැ. නමුත්, "S"3 ලබා ගත් අය හොඳ වෛද්‍යවරු වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමා මතු කරන තර්කයේ පදනමක් තිබෙනවා. අපි ඒ ගැන සාකච්ඡා කරමු.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමනි, යුද්ධය පැවති කාලයේ කිලිනොච්චි දිස්ත්‍රික්කයෙන් වෛද්‍ය පීඨයට ඇතුළත් වුණු දරුවකුගේ සුදුසුකම අරගෙන තමයි මේ "S" සාමාර්ථ තුන කියන එක අරගෙන තිබෙන්නේ. නමුත් කොළඹ හෝ ගම්පහ හෝ වෙන තැනක හෝ පහසුකම් තිබෙන අයටත් ඒ දරුවාගේ පදනම ආදේශ කළාට පසුව තවත් ඊට වඩා සුදුසුකම් තිබෙන අයට මොකද කරන්නේ? දැන් තමුන්නාන්සේලා ඔය මුදල් ප්‍රශ්නය සාකච්ඡාවට ගන්නේ. එහෙම ගන්න බැරි ගොඩක් තැන් තිබෙනවා. ඒ නිසා, මෙහෙම කළොත් ඊට වඩා හොඳයි නේද, ගරු ඇමතිතුමනි? තමුන්නාන්සේලා අවම සුදුසුකම විධියට අඩු තරමේ "B" සාමාර්ථ තුනක්වත් ගන්නවා නම්, අඩු ගණනේ ශිෂ්‍යයන් 2,500ක් පමණ වෛද්‍ය පීඨවලට ඇතුළත් කර ගන්න අවස්ථාවක් හදන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමා ඒ ගැන යෝජනාවක් ඉදිරිපත් කරන්න. අපි ඒ ගැන සලකා බලන්නම්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

අපි කොයි තරම් යෝජනා ඉදිරිපත් කළාත්, ඒ ගැන කනටවත් ගන්නේ නැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමනි, "S" සාමර්ථ තුනෙන් ගන්න එපා, "B" සාමර්ථ තුනෙන් ගන්න කියා ඔබතුමා කියනවා නම්, ඒ ගැන යෝජනාවක් ඉදිරිපත් කරන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, සයිටම් ආයතනය සම්බන්ධයෙන් රටේ මහත් ආන්දෝලනයක් ඇති වෙලා, ඊට පසුව එම සටන යම් කිසි ආකාරයකට පසුගිය කාලයේ යටපත් වෙලා තිබෙනවා. නමුත් ඒ පොරොන්දු වුණු ආකාරයට, විශේෂයෙන්ම හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමා ගිහින් පොරොන්දු වූ ආකාරයේ විසඳුමක් තවමත් ලැබී නැහැ. ඊයේත් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය, රජයේ වෛද්‍ය පීඨවල සිටින ශිෂ්‍යයන්ගේ දෙමව්පියන්, සයිටම් එකේ ශිෂ්‍යයන්ගේ දෙමව්පියන් එකතු වෙලා සාකච්ඡා කළා. ඒ පොරොන්දු වුණු ආකාරයට තමුන්නාන්සේලා විසඳුම ක්‍රියාත්මක කරන්න සූදානම්ද? දැන් දින වකවානු පහු වෙලා තියෙද්දිත් ඒකට ඇලිමැලි ගතියක් පෙන්නුම් කරන්නේ ඇයිද කියලායි මම අහන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා දන්නවා, එහි තිබෙන ප්‍රශ්නය මොකක්ද කියලා. එතැන ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරගෙන යනවා.

Hon. Member, you know what the problem is. I do not have to tell you. Why must you tell the whole world what the problem is. You know what the problem is.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සඳහා තව දින කීපයක් කල් දෙන්න, ගරු මන්ත්‍රීතුමනි.
ප්‍රශ්න අංක 9 -2151/17- (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 10 -2179/'17- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11 -2202/'17- 1 ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 12 -2214/'17-(1), ගරු එස්.එම්. මරික්කාර් මහතා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 13 - 2285/'17 - (1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා -*[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 14 - 2300/'17 - (1), ගරු ඩී.වී. චානක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
දෙවන වටය.
ප්‍රශ්න අංක 1 - 885/'16-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පානීය ජල සැපයුම : වවුනියාව දිස්ත්‍රික්කය
குடிநீர் விநியோகம் : வவுனியா மாவட்டம்
SUPPLY OF DRINKING WATER: VAVUNIYA DISTRICT

1250/'16

**2. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு பந்துல குணவர்தன - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය: (1):

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

(අ) (i) 1983 වර්ෂය වනවිට වවුනියාව දිස්ත්‍රික්කය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් පිරිසිදු පානීය ජලය සපයා තිබූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට පිරිසිදු පානීය ජලය සපයනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) 1983 වර්ෂයෙන් පසුව යුදමය තත්ත්වය නිමවන තෙක් පානීය ජලය ලබාදීම වෙනුවෙන් එක් එක් වර්ෂය සඳහා රජය විසින් වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

(iv) යුදමය තත්ත්වය නිම වීමෙන් පසු, 2015 වර්ෂය වනතෙක් පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘති වෙනුවෙන් රජය වෙන් කරන ලද මුළු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1983ஆம் ஆண்டளவில் வவுனியா மாவட்டத்தில் தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையினால் சுத்திகரிக்கப்பட்ட குடிநீர் வழங்கப் பட்டிருந்த வீடுகளின் எண்ணிக்கை யாது;

(ii) இன்றளவில் சுத்திகரிக்கப்பட்ட குடிநீர் வழங்கப் படுகின்ற வீடுகளின் எண்ணிக்கை யாது;

(iii) 1983ஆம் ஆண்டின் பின்னர் யுத்த நிலைமை முடிவடையும் வரை குடிநீர் வழங்குவதற்காக ஒவ்வோர் ஆண்டிற்கும் அரசாங்கம் ஒதுக்கிய மொத்தப் பணத்தொகை யாது;

(iv) யுத்த நிலைமை முடிவடைந்த பின்னர், 2015ஆம் ஆண்டுவரை குடிநீர் வழங்கல் கருத்திட்டங் களுக்காக அரசாங்கம் ஒதுக்கிய மொத்தப் பணத்தொகை ஆண்டு வாரியாக தனித்தனியாக எவ்வளவு;

(v) மேற்படி அனைத்தினதும் முன்னேற்ற அறிக்கை யைச் சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning and Water Supply :

(a) Will he inform this House -

(i) how many households within the Vavuniya District had been connected to the supply of cleaned drinking water by the National Water Supply and Drainage Board by 1983;

(ii) how many households are provided with cleaned drinking water at present;

(iii) what amount was allocated by the Government in each year for providing drinking water until the end of the war situation after 1983;

(iv) what amounts had been allocated by the Government for projects implemented for the supply of drinking water, separately in respect of each of the years following the war situation until the year 2015; and

(v) whether he will table a progress report on all above?

(b) If not, why?

**ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவுப் ஹக்கீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පිරිසිදු පානීය ජලය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව : 146

(ii) 2017 අවසානය දක්වා පිරිසිදු පානීය ජලය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව : 2025

(iii) 1983 සිට 2009 දක්වා වෙන් කරන ලද මුදල: මිලියන 29.25 (පවතින තොරතුරු අනුව)

(iv)

| අංකය | වර්ෂය | වෙන් කරන ලද මුදල |
|---|---|---|
| 1 | 2009 | රුපියල් මිලියන 8.58 |
| 2 | 2010 | රුපියල් මිලියන 76.8 |
| 3 | 2011 | රුපියල් මිලියන 130.8 |
| 4 | 2012 | රුපියල් මිලියන 247.8 |
| 5 | 2013 | රුපියල් මිලියන 565.8 |
| 6 | 2014 | රුපියල් මිලියන 960.0 |
| 7 | 2015 | රුපියල් මිලියන 1020.0 |
| සම්පූර්ණ එකතුව | | රුපියල් මිලියන 3009.78 |

2009 සිට 2015 දක්වා වෙන් කරන ලද මුදල: රු.මි.3009.78

(v) ඔව්

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල | මූල්‍ය ආධාර | ව්‍යාපෘති කාලසීමාව | ලබා දී ඇති/ අපේක්ෂිත සම්බන්ධන ගණන හා ප්‍රතිලාභීන් |
|---|---|---|---|---|---|
| | GTZ | රු.මිලියන 29.25 | GTZ (ජර්මන්) | 1989-1991 | ජල සම්බන්ධන ආසන්න වශයෙන් 1,500 |
| | ADB 5th | රු. මිලියන 3009.78 | ADB (ආසියානු සංවර්ධන බැංකු) | 2010 - 2015 | ජල සම්බන්ධන ආසන්න වශයෙන් 525 2035 වසරේදී ADB 5th ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතියේ මුළු ප්‍රතිලාභීන් 94,000 |

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 - 1660/'17 - (1), ගරු චමින්ද විජේසිරි මහතා

**ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha )
Sir, I ask for two weeks' time to answer that Question.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයාගේ කාර්යාල: විස්තර
## கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரின் அலுவலகங்கள்: விபரம்
## OFFICES OF MINISTER OF FISHERIES AND AQUATIC RESOURCES DEVELOPMENT: DETAILS

2002/'17

**5. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (ගරු බිමල් රත්නායක මහතා වෙනුවට)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ - மாண்புமிகு பிமல் ரத்நாயக்க சார்பாக)
(The Hon. (Dr.) Nalinda Jayathissa on behalf of the Hon. Bimal Rathnayake )
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයාගේ අමාත්‍ය කාර්යාලවල ලිපිනයන් කවරේද;
(ii) එම කාර්යාල වෙනුවෙන් කුලී හෝ බදු ගෙවන්නේ නම්, එම මාසික කුලී/බදු මුදල කොපමණද;
(iii) 2015 සිට 2017 වර්ෂයේ මේ දක්වා ගෙවා ඇති මුළු කුලී/බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සංඛ්‍යාව;
(ii) එම පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;
(iii) අමාත්‍යවරයා සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரின் அமைச்சு அலுவலகங்களின் முகவரிகள் யாவை என்பதையும்;
(ii) அந்த அலுவலகங்களுக்காக வாடகை அல்லது குத்தகை செலுத்தப்படின் அந்த மாதாந்த வாடகை/ குத்தகை தொகை எவ்வள வென்பதையும்;
(iii) 2015 - 2017 ஆம் ஆண்டின் இதுவரை செலுத்தப்பட்டுள்ள மொத்த வாடகை/ குத்தகைத் தொகை எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அமைச்சரின் பிரத்தியேக பதவியணியின் உத்தியோகத்தர்களின் எண்ணிக்கை யாதென் பதையும்;
(ii) அந்த பிரத்தியேகப் பதவியணிக்கு ஒதுக்கப்பட்ட வாகனங்களின் எண்ணிக்கை யாதென்பதையும்;
(iii) அமைச்சருக்காக ஒதுக்கப்பட்டுள்ள வாகனங் களின் எண்ணிக்கை யாதென்பதையும்;

ஒவ்வொரு அமைச்சுக்கு ஏற்ப வெவ்வேறாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development :

(a) Will he inform this House -
(i) the addresses of ministerial offices of the Minister of Fisheries and Aquatic Resources Development;
(ii) if rent or lease is paid for the said offices, the monthly rental/lease; and
(iii) the total rent/lease paid from the year 2015 up to now in 2017?

(b) Will he also inform this House, separately in respect of each Ministry-
(i) the number of officials in the personal staff of the Minister;
(ii) the number of vehicles allocated for the said personal staff; and
(iii) the number of vehicles allocated to the Minister?

(c) If not, why?

**ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development and State Minister of Mahaweli Development)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

[ගරු මහින්ද අමරවීර මහතා]

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය,
පස්වන මහල,
නව මහ ලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10.
(ii) අදාළ නොවේ.
(iii) අදාළ නොවේ.

(ආ)

| ප්‍රශ්න අංකය | තොරතුර | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය |
|---|---|---|---|
| (i) | පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරින් සංඛ්‍යාව | 19 | 17 |
| (ii) | පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා වෙන් කර ඇති වාහන සංඛ්‍යාව | 05 | 05 |
| (iii) | අමාත්‍යවරයා සඳහා වෙන් කර ඇති වාහන සංඛ්‍යාව | 03 | - |

(ඇ) පැන නොනඟී.

## වන අලි තර්ජන: ඔඩ්ඩුසුඩ්ඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
## ஒட்டுசுட்டான் பிரதேச செயலாளர் பிரிவு: காட்டு யானை அச்சுறுத்தல்
WILD ELEPHANT THREATS: ODDUSUDDAN DS DIVISION

2114/'17

**7. ගරු කුමාර වෙල්ගම මහතා (ගරු ඩග්ලස් දේවානන්ද මහතා වෙනුවට)**
(மாண்புமிகு குமார வெல்கம - மாண்புமிகு டக்ளஸ் தேவானந்தா சார்பாக)
(The Hon. Kumara Welgama on behalf of the Hon. Douglas Devananda)

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, ඔඩ්ඩුසුඩ්ඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඕලුමඩු, මන්නාකණ්ඩල් හා කරිප්පට්ටමුරිප්පු යන ගම්මානයන්හි නැවත පදිංචි කරන ලද ජනතාව ජීවත්වන බවත්;

(ii) එම ප්‍රදේශයන්හි පවතින වන අලි තර්ජන හේතුවෙන් යළි පදිංචි වූ විශාල පිරිසකගේ ජීවිත තර්ජනයට ලක්වී ඇති බැවින් ඔවුන්ගේ ජීවනෝපාය වූ ගොවිතැන් කටයුතු විනාශ වෙමින් හා හානිවෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වන අලි තර්ජනවලින් එම ජනතාව ආරක්ෂා කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முல்லைத்தீவு மாவட்டத்தின் ஒட்டுசுட்டான் பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள ஓலுமடு, மன்னாக்கண்டல் மற்றும் கறிப்பட்ட முறிப்பு ஆகிய கிராமங்களில் மீள குடியமர்த்தப் பட்ட மக்கள் வசிக்கின்றார்கள் என்பதையும்;

(ii) அம்மக்கள் மீள குடியமர்த்தப்பட்ட காலம் தொடக்கம் அப்பிரதேசங்களில் நிலவும் காட்டு யானை அச்சுறுத்தல் காரணமாக பெரும் தொகையானோர் உயிர் அச்சுறுத்தலை எதிர் கொண்டுள்ளதால் இவர்களின் வாழ்வாதாரமான விவசாய நடவடிக்கைகள் அழிந்தும் சேத மடைந்தும் வருகின்றதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) காட்டு யானைகளின் அச்சுறுத்தல்களிலிருந்து அம்மக்களை பாதுகாப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், அத் திகதி யாதென்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Sustainable Development and Wildlife :

(a) Is he aware that -

(i) the villages of Olumadu, Mannakandal and Karipattamurippu of the Oddusuddan Divisional Secretary's Division belonging to the Mullaitivu District are populated by people who were resettled in the said villages; and

(ii) from the time that these people were resettled in the above area, they have been facing the threat of wild elephants putting the lives of a large number of people at risk and causing the destruction of cultivations which are their livelihoods?

(b) Will he inform this House -

(i) whether steps will be taken to protect these people from the threat of wild elephants; and

(ii) if so, of the date on which it will be done?

(c) If not, why?

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சரும் புத்தசாசன அமைச்சரும்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife and Minister of Buddhasasana)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්

(ii) ඔව්

මුලතිව් දිස්ත්‍රික්කයේ වනජීවීන් සඳහා හිතකර ඉතා ඉහළ ජෛව විවිධත්වයක් ඇති පරිසර පද්ධතියක් තිබීම හේතුවෙන් වන අලින් බහුලව වාසය කරනු ලබන අතර, මෙම බොහෝ කැලෑ ප්‍රදේශ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව පවතින බවද, ඔඩ්ඩුසුඩ්ඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති ප්‍රධාන මාර්ගයන් ආශ්‍රිතව දෙපස වන අලින් ගැවසෙන ප්‍රදේශ බණ්ඩනය වන ආකාරයට මෙම ගම්මාන හා කෘෂි ඉඩම් පිහිටා තිබීම මෙම ප්‍රශ්නයට හේතුව ලෙස පෙන්වා දිය හැකිය. තවද වර්ෂා කාලය උපයෝගී කර ගෙන වගා කටයුතු ඇරඹීමත් සමඟ වන අලි මිනිස් ගැටුම උග්‍ර වී වියලි කාලයක් එළඹීමෙන් අනතුරුව මෙම තත්ත්වය අවම වී යයි.

(ආ) (i) ඔව්

(ii) මේ වන විටත් පියවර ගෙන ඇත.

(ඇ) අදාළ නොවේ.

## බඩඉරිඟු නිෂ්පාදනය : විස්තර
### சோள உற்பத்தி: விபரம்
### MAIZE PRODUCTION: DETAILS

2151/'17

**9. ගරු හේෂාන් විතානගේ මහතා (ගරු අශෝක ප්‍රියන්ත මහතා වෙනුවට)**
(மாண்புமிகு ஹேசான் விதானகே - மாண்புமிகு அசோக்க பிரியந்த சார்பாக)
(The Hon. Heshan Withanage - The Hon. Ashoka Priyantha)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 වර්ෂයේ සිට අද දක්වා දේශීය බඩඉරිඟු නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2010 වර්ෂයේ සිට මේ දක්වා දේශීය බඩඉරිඟු අවශ්‍යතාවය කොපමණද;

(iii) එම කාලසීමාව, තුළ මෙරටට බඩඉරිඟු ආනයනය කිරීමට කටයුතු කළේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iv) බඩඉරිඟු මිල ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016 ஆம் ஆண்டு தொடக்கம் இன்றுவரை உள்நாட்டு சோள உற்பத்தி ஒவ்வொரு வருடத்துக்கு இணங்க வெவ்வேறாக எவ்வளவு;

(ii) 2010 ஆம் ஆண்டு தொடக்கம் இன்றுவரை உள்நாட்டு சோளத்தின் தேவைப்பாடு எவ்வளவு;

(iii) மேற்படி காலகட்டத்தினுள் இலங்கைக்கு சோளத்தை இறக்குமதி செய்ய நடவடிக்கை எடுத்திருப்பின், அது தொடர்பான விபரங்கள் யாவை;

(iv) சோளத்தின் விலையை நிலையான மட்டத்தில் வைத்திருப்பதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture :

(a) Will he inform this House -

(i) the production of maize in Sri Lanka from 2016 up to date in relation to each year, separately;

(ii) the local maize need from 2010 up to date;

(iii) if maize was imported to this country during that period, details of such imports; and

(iv) the steps the Ministry intends to take to maintain the price of maize at a stable level?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| බඩ ඉරිඟු | 2016 | | 2017 | |
|---|---|---|---|---|
| | 2015/16 මහ | 2016 යල | 2016/17 මහ | 2017 යල |
| නිෂ්පාදනය (මෙ.ටො.) | 207,075 | 36,885 | 163,733 | 26,535 |

මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2017* - නිෂ්පාදන දත්ත - 2017 යල - භෝග පුරෝකථන අවසන් වාර්තාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

(ii)

| වර්ෂය | අවශ්‍යතාවය/සුලභතාවය (මෙට්‍රික් ටොන්) |
|---|---|
| 2010 | 171,264 |
| 2011 | 144,808 |
| 2012 | 203,319 |
| 2013 | 208,803 |
| 2014 | 327,412 |
| 2-15 | 328,352 |
| 2016 | 285,876 |
| 2017* | 264,397* |

මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2017* - නිෂ්පාදන දත්ත - 2017 යල - භෝග පුරෝකථන අවසන් වාර්තාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iii)

| වර්ෂය | ආනයනය (මෙට්‍රික් ටොන්) |
|---|---|
| 2010 | 9,570 |
| 2011 | 7,011 |
| 2012 | 1,004 |
| 2013 | 528 |
| 2014 | 86,824 |
| 2015 | 67,237 |
| 2016 | 41,916 |
| 2017 | 74,129 |

* 2017 අනයනය ( ජන-සැප්.)

මූලාශ්‍රය ආනයන සත්ත - ශ්‍රී ලංකා රේගුව 2017 සැප්තැම්බර් දක්වා පමණි.

(iv) ඔව්.

බඩ ඉරිඟු මිල රට තුළ ස්ථාවරව පවත්වා ගැනීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය සෘජුවම මැදිහත් වන අතර දේශීය බඩ ඉරිඟු අස්වැන්න වෙළෙඳපොළට නිකුත් වන කාලයේදී බඩ ඉරිඟු ආනයනය කිරීමට සීමා පනවන අතර බඩ ඉරිඟු අවශ්‍යතාව රට තුළින්ම සපුරා ගැනීම සඳහා ඵලදායිතාව ඉහළ නැංවීම හා වගා කරන භූමි ප්‍රමාණය වැඩි කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට අමාත්‍යාංශය මඟින් කටයුතු කර ඇත.

(ආ) අදාළ නොවේ.

## ගම්පොල - දොළොස්බාගේ මාර්ගය : කාපට් ඇතිරීමේ ව්‍යාපෘතිය
## கம்பளை - தொலொஸ்பாகே வீதி: 'காபட்' இடும் கருத்திட்டம்
## GAMPOLA-DOLOSBAGE ROAD: CARPET LAYING PROJECT

2202/'17

**11. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා වෙනුවට)**

(மாண்புமிகு பந்துல குணவர்தன - மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே சார்பாக )

(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Mahindananda Aluthgamage)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මහනුවර, ගම්පොල - දොළොස්බාගේ මාර්ගය පුළුල් කර කාපට් ඇතිරීමේ ව්‍යාපෘතිය 2013 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ බව දන්නේද;

(ii) එහි පළමු අදියර ලෙස කුරුඳුවත්ත සිට ගම්පොළ දක්වා වැඩ ආරම්භ කරන ලද අතර, 2014 වර්ෂය අවසන් වනවිට කිලෝමීටර් 8ක වැඩ අවසන් වූ බව දන්නේද;

(iii) ගම්පොල සිට ඉතිරි කිලෝමීටර් 4ක වැඩ 2015 වර්ෂයේ ජනවාරි සිට නැවතී ඇති බව පිළිගන්නේද;

(iv) මෙම මාර්ගය විශාල ජනතාවක් විසින් භාවිතා කරන අත්‍යාවශ්‍ය මාර්ගයක් වන බැවින්, මාර්ගයේ ඉතිරි කිලෝමීටර් 4හි වැඩ ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வீதி அபிவிருத்தி அதிகாரசபைக்கு சொந்தமான கண்டி, கம்பளை - தொலொஸ்பாகே வீதியை விஸ்தரித்து காபட் இடும் கருத்திட்டம் 2013 ஆம் ஆண்டு முதல் நடைமுறைப்படுத்தப்பட்ட தென்பதை அறிவாரா என்பதையும்;

(ii) அதன் முதல் கட்டமாக குருந்துவத்த முதல் கம்பளை வரையிலான வேலைகள் ஆரம்பிக்கப் பட்டதுடன், 2014 ஆம் ஆண்டு நிறைவடையும் போது 8 கிலோமீற்றர்களுக்கான வேலைகள் நிறைவுபெற்றதென்பதை அறிவாரா என்பதையும்;

(iii) கம்பளையிலிருந்து எஞ்சியுள்ள 4 கிலோமீற்றர் தூரத்தின் வேலைகள் 2015 ஆம் ஆண்டு சனவரி முதல் தடைப்பட்டுள்ளதென்பதை ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(iv) இவ்வீதி பெருமளவு மக்களினால் பயன்படுத்தப் படுகின்ற அத்தியாவசியமானதொரு வீதி என்பதால், வீதியின் எஞ்சிய 4 கிலோமீற்றரின் வேலைகளை ஆரம்பிப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House -

(i) whether he is aware of the fact that the project to expand and carpet the Kandy, Gampola-Dolosbage road belonging to the Road Development Authority was implemented from 2013;

(ii) whether he is aware of the fact that work was started from Kurunduwatta to Gampola as its first stage and 8 kilometres were completed by the end of 2014;

(iii) whether he admits that work of the remaining 4 kilometres from Gampola has stalled from January 2015; and

(iv) whether steps will be taken to start work of the remaining 4 kilometres of this road as this is an essential road used by a large number of people?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)

(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) මෙම මාර්ගය පුළුල් කර කාපට් ඇතිරීම සඳහා විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නැත.

එසේ වුවද මාර්ග සංවර්ධන අධිකාරියට මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදනවලින් කොටසක් භාවිතා කර 2013 වර්ෂයේදී මෙම මාර්ගයේ 4 කිලෝමීටර් සිට 8.9 කිලෝමීටර් දක්වා කොටස කාපට් ඇතිරීම ආරම්භ කර ඇත.

(ii) 2014 වර්ෂයේදී ද මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා ලැබුණ ප්‍රතිපාදන යොදා ගනිමින් මෙම මාර්ගයේ කොටසක් කාපට් ඇතිරීම සිදු කරන ලදී. ඒ අනුව 4 කිලෝමීටර් සිට 8.9 කිලෝමීටර් දක්වා වූ කිලෝමීටර් 4.9ක දුර ප්‍රමාණය කාපට් අතුරා සකස් කිරීම අවසන් කර ඇත.

(iii) නැත.

2015 වර්ෂයේ සිට මාර්ග පුළුල් කිරීම වැඩි දියුණු කිරීමේ වැය ශීර්ෂයට ලැබෙන ප්‍රතිපාදන භාවිතා කර මෙම මාර්ගයේ 0 කිලෝමීටර් සිට 4 කිලෝමීටර් දක්වා වූ කොටස තුළ පහත සඳහන් වැඩ කොටස් නිම කර ඇත.

මීටර් 360ක් කාපට් අතුරා සකස් කිරීම

මීටර් 100 දුරට කොන්ක්‍රීට් කාණුව ඉදි කිරීම

රුදවුම් බැම් දෙකක් ඉදිකිරීම.

(iv) ඉදිරි කාලයේදී මාර්ග පුළුල් කොට වැඩිදියුණු කිරීමේ වැය ශීර්ෂයේ ප්‍රතිපාදන යොදා ගෙන මෙම මාර්ගයේ ඉතිරි කොටස කාපට් අතුරා සංවර්ධනය කිරීමට කටයුතු කරනු ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 13-2285/'17 -(1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 14 -2300/'17- (1), ගරු ඩී.වී. චානක මහතා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, ගරු ඩී.වී. චානක මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, අමාත්‍යාංශ නිවේදන, ගරු අග්‍රාමාත්‍යතුමා. අද දින ජාතික ආණ්ඩුවේ සංයුතිය පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න අපි එකඟ වුණා.

## ජාතික ආණ්ඩුව : ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය
## தேசிய அரசாங்கம்: மாண்புமிகு பிரதம அமைச்சரினது கூற்று
## NATIONAL GOVERNMENT: STATEMENT BY HON. PRIME MINISTER

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

මේ ආණ්ඩුව පවත්වා ගෙන යන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මෙම සභාවෙන් ගත්ත තීරණයක් අනුවයි. එම යෝජනාව තවමත් වලංගුයි. ඒක අවලංගු කරලාත් නැහැ; අහෝසි කරලාත් නැහැ; we have not rescinded it. ඒ අනුවයි ක්‍රියාත්මක කරන්නේ. දැනට ඒක අවලංගු කරන්න වුවමනා තත්ත්වයක් මතු වෙලා තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ගරු මහින්ද අමරවීර මැතිතුමා, ඒ ගැන ඔබතුමාගේ මතය පැහැදිලි කරන්න. [බාධා කිරීම්] ඒ සඳහා අවස්ථාව දෙන්න. Let him explain. එතුමාට අවස්ථාව දෙන්න එපායැ.

**ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development and State Minister of Mahaweli Development)

ගරු කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂයත්, අපත් අතර ගිවිසුමක් අත්සන් කරලා තිබෙනවා. ඒ වාගේම පාර්ලිමේන්තුවේ ඒ කරුණු ඉදිරිපත් කරලා සම්මත වෙලා තිබෙනවා. අපි තවම ඒ ගිවිසුමේ බැඳී සිටිනවා; දිගටම කටයුතු කරගෙන යනවා. අපි තවම ඒකෙන් ඉවත් වෙලා නැහැ. [ඝෝෂා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! ගරු අනුර දිසානායක මහතා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු අමාත්‍යතුමනි, "අපි" කියලා කියන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානය වෙනුවෙන් ඔබතුමා -

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
එක්සත් ජනතා නිදහස් සන්ධානයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් කියන දෙකම බැඳිලා තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
[බාධා කිරීමක්] හරි, හරි. පොඩ්ඩක් ඉන්න.

ගරු කථානායකතුමනි, එක්සත් ජනතා නිදහස් සන්ධානයත්, එක්සත් ජාතික පක්ෂයත් -එක්සත් ජාතික පක්ෂය හැටියට වෙන්න ඇති අගමැතිතුමා ප්‍රකාශ කරන්න ඇත්තේ- අතර මෙම ගිවිසුම තවදුරටත් බලාත්මකයි කියන එක එතුමා දැන් දැනුම් දුන්නා. හැබැයි, ගරු කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති, මෙම ජාතික ආණ්ඩුව ගොඩනැඟීම පිළිබඳව 2015 සැප්තැම්බර් මාසයේ 03 වැනි දා මේ පාර්ලිමේන්තුවට ඔබතුමන්ලා දැනුම් දුන්නා, මේක අවුරුදු 2කට තමයි ගොඩනැඟෙන්නේ කියලා. එම අවුරුදු දෙක මත පදනම්ව තමයි - [බාධා කිරීමක්] නැහැ, නැහැ. [බාධා කිරීමක්] තිබෙනවා. අවුරුදු දෙකක් සඳහා ජාතික ආණ්ඩුවක් හදන බව Agreement එකේ තිබෙනවා, අගමැතිතුමාගේ කථාවේ තිබෙනවා. එම අවුරුදු දෙකෙන් පසුව මෙය ඉදිරියට ගෙන යනවාද, නැද්ද කියා කථා කරනවා කියලා සමාලෝචනය ඇතුළත් හැන්සාඩ් වාර්තාව මා ළඟ තිබෙනවා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. කලබල වෙන්න එපා.

ගරු කථානායකතුමනි, 2017 සැප්තැම්බර් මාසයේ 03 වැනිදායින් පසුව එම ගිවිසුම අවලංගු වෙනවා. අපි අහන්නේ ඒකයි. සැප්තැම්බර් මාසයේ 03 වැනි දා වෙන කොට, ඔබතුමාට අලුත් ගිවිසුමක් ඉදිරිපත් කළ යුතුව තිබුණා. හැබැයි, පසුගිය සැප්තැම්බර් මාසයේ 03 වැනි දා සිට මාස 4කට අධික කාලයක් දැන් වනවිට ගත වෙලා තිබෙනවා. අද තමුන්නාන්සේලා ඒ ගැන කියනවා. එසේ කියනවා වාගේම අද තමුන්නාන්සේලා එම ගිවිසුම ගරු කථානායකතුමාට භාර දෙයි කියලා මා හිතනවා. අද වනවිට මාස 4කට අධික කාලයක් ගත වෙලා තිබෙනවා.

අපිට දැන ගන්න ඕනෑකම තිබෙන්නේ මෙයයි. මේ මාස 4ක කාල පරිච්ඡේදය තුළ ඔය ගොල්ලන් එකට හිටියා තමයි. එකට කැබිනට් මණ්ඩලයේ හිටියා; එක පැත්තේ වාඩිවෙලා හිටියා. හැබැයි, නීත්‍යානුකූල ලෙස අවුරුදු දෙකේ ගිවිසුම අවසන් වුණාට පසුව දැන් වනවිට මාස 4ක කාලයක් ගත වෙලා තිබෙනවා. එම මාස 4ක කාල පරිච්ඡේදයේ අර අමාත්‍යවරුන් 48 දෙනෙක් කටයුතු කිරීම ව්‍යවස්ථාවට පටහැනියි, ගරු කථානායකතුමනි. මොකද, මෙම ගිවිසුම දීර්ඝ කිරීමකට ලක් කරනවා කියලා ගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ 03 වැනිදාම තමයි ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුවට කියන්න තිබුණේ. මාස 4ක් කිසිදු එකඟතාවකින්, ගිවිසුමකින් තොරව තමයි මේ ජාතික ආණ්ඩුව පැවතී තිබෙන්නේ.

එම නිසා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වෙලාවේදී අවුරුදු දෙකකට ජාතික ආණ්ඩුවක් ගොඩ නඟන බවත්, ඒ අවුරුදු දෙකේ ජාතික ආණ්ඩුව ගොඩ නැඟෙන නිසා අමාත්‍යවරු සංඛ්‍යාව තිහේ සිට හතළිස් අට දක්වාත්, නියෝජ්‍ය රාජ්‍ය අමාත්‍යවරු සංඛ්‍යාව හතළිහේ සිට හතළිස්පහ දක්වාත් වැඩි කරන්න මේ පාර්ලිමේන්තුවේ අනුමතිය ගත්තා. අවුරුදු දෙකකටයි ගත්තේ. [බාධා කිරීමක්] නැහැ. නැහැ. මා ළඟ හැන්සාඩ් වාර්තාව තිබෙනවා. "නැහැ." කියන්න එපා. මම ඔක්කොම බලලා තමයි තිබෙන්නේ. [බාධා කිරීමක්] ඒ මාස හතර කාලපරිච්ඡේදයට මොකද වෙන්නේ? [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ගරු අගමැතිතුමාට අවස්ථාව දෙමු. ගරු අගමැතිතුමා පැහැදිලි කරන්න. ඊට පසුව ගරු ෆයිසර් මුස්තාපා අමාත්‍යතුමාටත්, ඊයේ කාරණය ගැන පැහැදිලි කරන්න පුළුවන්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, හොඳම දෙය තමයි, අපේ මහ ලේකම්තුමාට පුළුවන් නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 වන ව්‍යවස්ථාවේ (4)(1) වන අනු ව්‍යවස්ථාව යටතේ අපි සම්මත කර තිබෙන යෝජනාව කියවන එක. අපට දැන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 වන ව්‍යවස්ථාවේ (4) (1) වන අනු ව්‍යවස්ථාව යටතේ ක්‍රියා කරන්නට පුළුවන් කියා එක්සත් ජාතික පක්ෂය දැනුම් දුන්නා. ඒ දැනුම් දීම අනුව දැන් තිබෙන අමාත්‍යාංශ සංඛ්‍යාව 48යි. 48ට වැඩි කර තිබෙනවා. 46 වන ව්‍යවස්ථාවේ (4) (1) වන අනු ව්‍යවස්ථාව යටතේ මේක අහෝසි කළාම, ඕනෑම වෙලාවක- ඇත්ත වශයෙන්ම ආණ්ඩුව පවතින වෙලාවක හෝ අහෝසි කරන්න පුළුවන්. ආණ්ඩුව කැඩුණාමත් අහෝසි කරන්න පුළුවන්. ඒක අහෝසි කළොත් අපි යනවා. දැන් තිබෙන කරුණු අනුව, මේ විධියට අපට ආණ්ඩුව ගෙනියන්නට පුළුවන්. අපි ආණ්ඩුව කර ගෙන යන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 වන ව්‍යවස්ථාවේ (4) (1) වන අනු ව්‍යවස්ථාව යටතේ. ඒ යටතේ තමයි ක්‍රියාත්මක කරන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 වන ව්‍යවස්ථාවේ (4) (1) වන අනු ව්‍යවස්ථාව යටතේ තමයි බලය දී තිබෙන්නේ. ඒ අනුව තමයි ක්‍රියාත්මක කරන්නේ. ඇත්ත වශයෙන්ම මේ ගරු සභාව නොමඟ යවන්නට වැඩක් නැහැ. ඒ කාරණා අනුව, -වෙනත් කාරණා තිබෙනවා නම් ඔබතුමාව දැනුවත් කරන්න පුළුවන්.- ගරු කථානායකතුමනි, ඔබතුමාට පුළුවන් සභාව දැනුවත් කරන්න. දැනට එවැනි වාර්තාවක් නම් මම දැක්කේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 වන ව්‍යවස්ථාවේ (4) (1) වන අනු ව්‍යවස්ථාව යටතේ සම්මත කළ යෝජනාවන් අනුව අපට ක්‍රියා කරන්නට පුළුවන්.

එතැනදී වෙනත් කරුණු මොකුත් ඉල්ලා නැහැ. මෙහිදී කළ ප්‍රකාශය අනුව එය ක්‍රියාත්මක වෙනවා. ඊට පසුව හැම කෙනාම කතා කරලා තිබුණා. ගිවිසුමකුත් තිබුණා. ඒ වාගේම, ක්‍රියා කරන එක -මොකක්ද අප කරන්නේ කියන එක- එතැනට අදාළ නැහැ. මම ඔබතුමාට ඊයේත් කිව්වා. ඒ කරුණු වෙනස් වෙලා නැහැ. I do not think there is a set of circumstances in which we have to come and meet you yet. There is no need. If that is so, we will come and meet you, but I do not think that there is any such circumstance. So, in such a situation there is nothing for the House to determine.

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ෆයිසර් මුස්තාපා අමාත්‍යතුමාත් පැහැදිලි කිරීමක් කරන්න අවස්ථාව ඉල්ලුවා. එතුමාගේ පැහැදිලි කිරීමෙන් පසුව මම ඔබතුමාට අවස්ථාවක් දෙන්නම්. I will give you time, Hon. Ajith P. Perera. Do not worry.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils and Local Government)

Hon. Speaker, we are dealing with a constitutional process in terms of Article 46 (4). The mandatory requirement in terms of that process is to pass a Resolution to the effect that there is a National Government and that position has been rescinded. Even in a statement if it was referred to the fact that there were two years or six months or whatever the period, the pith and substance is the Resolution. So, in terms of the Resolution, both parties have said that their Agreement is in existence and there is no mandatory requirement for any Agreement to be tabled before the Hon. Speaker. So, the Agreement has not been tabled. Both parties who are privy to the Agreement, have expressed their desire to continue as a National Government and that *per se* is sufficient in terms of Article 46 (4) of the Constitution. Therefore, we cannot go into extra matters which do not constitute under Article 46 (4).

A Resolution was tabled in Parliament saying that the composition of the Cabinet should be increased based on the National Government and Parliament approved it. Consequent to it being approved, neither was any agreement tabled, because there is no mandatory requirement. So, Hon. Speaker, you are dealing with a constitutional process and all other statements made even in the Hansard are irrelevant because the parties to the Agreement have expressly informed the Hon. Speaker the desire to continue in terms of that Agreement and that is what is required in terms of the Article 46 (4).

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. මම දැන් මහ ලේකම්තුමාට අවස්ථාව ලබා දෙනවා අග්‍රාමාත්‍යතුමා විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව කියවන්න. ඊට පසුව ගරු තාරක බාලසූරිය මැතිතුමා අවස්ථාව ඉල්ලුවා. ඊටපසුව, අපේ අජිත් පී. පෙරේරා මැතිතුමා ඉල්ලුවා. ඊට පසුව ඔබතුමා ඉල්ලුවා. ඉල්ලන විධියට අපි අවස්ථාව ලබා දෙමු. අපි ස්ථාවර නියෝග අනුව කටයුතු කරමු. මහ ලේකම්තුමා, එම යෝජනාව කියවන්න.

**පාර්ලිමේන්තුවේ මහ ලේකම්**
(பாராளுமன்றச் செயலாளர் நாயகம்)
(Secretary-General of Parliament)

ගරු කථානායකතුමනි, "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය: ජාතික ආණ්ඩුවේ අමාත්‍යවරු සංඛ්‍යාව" සම්බන්ධයෙන් අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව මෙසේයි:

"පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාවක් ලබා ඇති එක්සත් ජාතික පක්ෂය විසින් ජාතික ආණ්ඩුවක් පිහිටුවා ඇති බැවින්, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරු සංඛ්‍යාව 48ක් නොඉක්මවිය යුතු බවත් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍ය වරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව 45ක් නොඉක්මවිය යුතු බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(4) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබයි."

ගරු කථානායකතුමනි, 2015 සැප්තැම්බර් මස 03වන බ්‍රහස්පතින්දා පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස්වෙලා තිබෙන්නේ. එදින අවසානයේදී ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව ස්ථාවර නියෝග 43 යටතේ පක්ෂව 143ක්ද, විරුද්ධව 16ක්ද යනුවෙන් බෙදී එය සභා සම්මත විය.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමාගේ ඉල්ලීම පරිදි පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට යෝජනාව කියවීමට ඔබතුමා අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිවන්ත වනවා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, යෝජනාවක් ඉදිරිපත් කොට, එය ඉදිරිපත් කරන ගරු අග්‍රාමාත්‍යතුමා කළ ප්‍රකාශය. ඒ මත තමයි පාර්ලිමේන්තුවක් කටයුතු කරන්නේ. ව්‍යවස්ථාව කියන්නේ, විහිළුවක් නොවෙයි. එය අපි පිළිගන්නවා. නමුත්, මේ, ව්‍යවස්ථාවක් එක්ක විහිළු කිරීමට කාලයත් නොවෙයි, මේ රටට උදා වී තිබෙන්නේ. එදා පාර්ලිමේන්තු විවාදයේදී මතු කරපු කරුණු ගැන අපි අවධානය යොමු කරනවා නම්, ඒ කරුණුවල මෙහි මතු වන ගැටලු පිළිබඳ කරුණු අපි ඉතා පැහැදිලිව ඉදිරිපත් කරලා තිබෙන බව කියන්න ඕනෑ. මම ඒවා වාක්‍යයෙන් වාක්‍ය කියවන්න අවශ්‍ය නැහැ. ඔබතුමා අද තීන්දුවක් ප්‍රකාශ කරන බවයි, ඊයේ සඳහන් කළේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මම කිව්වේ, පැහැදිලි කිරීමක්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 ව්‍යවස්ථාව හා ජාතික ආණ්ඩුවක් පිහිටුවීම පිළිබඳ අපේ උගත් ගරු ෆයිසර් මුස්තාපා අමාත්‍යතුමා

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

කියපු කාරණාව ගැනත් සඳහන් කරමිනුයි මා මේ කියන්නේ. පාර්ලිමේන්තුව ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීමේදී යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන බවත් සත්‍යයි. යෝජනාවට අදාළ ලියකියවිලි තිබෙන බව ගරු කථානායකතුමා විසින් ප්‍රකාශයට පත් කළා. ඒ කියන්නේ, මේ පක්ෂ දෙක හෝ තුන අතර ගිවිසුමක් තිබෙන බවත්, එම ගිවිසුම පාර්ලිමේන්තුවට එවා තිබෙන බවත්. එම නිසා ඒ ලියවිල්ල අදාළ නැහැ කියලා අද තර්ක කරන්න බැහැ.

ඒ ලියවිල්ල මත තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරු -එක්සත් ජාතික පක්ෂය ගැන අපි කථා කරන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂයට හවුල් වුණු හෝ යටත් වුණු අනෙක් මන්ත්‍රීවරු- සියලුදෙනාම කටයුතු කිරීමට එකඟ වී තිබෙන්නේ. දැන් තිබෙන ප්‍රශ්නය මෙයයි. ඒ එකඟ වී තිබීම ගැන මත භේදයක්, මත වාදයක්, මත ගැටුමක් තිබුණා. ඒ මත ගැටුම මතු වූ අවස්ථාවල අග්‍රාමාත්‍යතුමාටත් වඩා සභානායකතුමා පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කර තිබෙනවා, එය අවසන් වූ වහාම අවශ්‍ය නම් යළිත් පාර්ලිමේන්තුවේ අනුමැතියක් ගත හැකියි කියලා. මම ඊයෙත් මේ කාරණය මතු කළා. අනුර කුමාර දිසානායක මැතිතුමාත්, මමත්, 2017 සැප්තැම්බර් මාසයේ, මේ වගන්තිය යටතේ අවසන් වන ගිවිසුම පිළිබඳව ප්‍රශ්න කළ අවස්ථාවේදී සභානායකතුමා එසේ ප්‍රකාශ කළා. සභානායකතුමා පිළිගන්නවා, එම ගිවිසුම දීර්ඝ කර නැත්නම් සභාවේ අනුමැතියක් අවශ්‍යයි කියලා. දැන් තිබෙන ප්‍රශ්නය: මුළු රටකට කරන ප්‍රකාශය ආණ්ඩුවේ ප්‍රධානීන් විසින්, අමාත්‍යවරු විසින් ප්‍රකාශ කර තිබෙනවා, දෙසැම්බර් මාසයේ 31 වනදා දක්වා මේ ගිවිසුම ඉදිරියට ගෙන යනවා කියලා. ජනමාධ්‍යවලින් මුළු රටම එය දැන ගත්තා. ඒක කියන්න අගමැතිතුමාට බැහැ, අගමැතිතුමාගේ පාර්ශ්වයෙන් නොවෙයි, අනෙක් පාර්ශ්වයෙන් කිව්වා. ඒක මුළු රටම දන්නා දෙයක්. ඒක පුවත්පත්වල සිරස්තල විධියට පමණක් නොවෙයි, ජාත්‍යන්තරවත් පළ වුණා. මේ සම්බන්ධ තොරතුරු ජාත්‍යන්තරයටත් ගියාම අනිවාර්යයෙන් රටේ අවිනිශ්චිත තත්ත්වයක් මතුවනවා. දෙසැම්බර් 31ට පස්සේ මේ අවිනිශ්චිත-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සැප්තැම්බර්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සැප්තැම්බර් තමයි. නමුත් මම මේ කථා කරන්නේ දෙසැම්බර් 31 වෙනිදායින් පස්සේ මේ ගිවිසුම අවසන් කියලා, මේ ආණ්ඩුවේ ඇමතිවරු ප්‍රකාශයක් කළා, "අපි ඉවසීමෙන් ඉන්නවා" කියලා. දැන් ප්‍රශ්නය මෙයයි. සැප්තැම්බර් වෙනකොට මේ ගිවිසුම අවසන්. නමුත්, මේ ගිවිසුම මොකක්ද කියලා අපට පෙන්වන්නේ නැහැයි කියලා කථානායකතුමාට කියන්න බැහැ. This is a document of Parliament. ඒ නිසා කරුණාකරලා,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙම අවශ්‍ය නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, නැහැ. එහෙම අවශ්‍ය නැහැයි කියලා කියන්න බැහැ. This is a document of Parliament. මේ ලියවිල්ල අත්සන් තබපු එක් තැනැත්තෙකු දැන් ජීවතුන් අතර නැහැ. අප අතර විවිධ මත තිබුණත්, මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාට මගේ ගෞරවය හිමිවනවා. එතුමා මේ ගිවිසුමේ අත්සන්කරුවෙක්. නමුත්, දැන් එතුමා ජීවතුන් අතර නැහැ. වෙනත් අත්සන්කරුවන් කවුරු හෝ ඉන්නවා නම්, ඉදිරිපත් වෙයි. නමුත්, ඒ මහාචාර්යතුමා ඒ ගිවිසුමේ යම් යම් මන්ත්‍රීවරු ඉවත් කර දැනුම් දී තිබෙන බවත් කථානායකතුමා විසින් මේ සභාවට මීට පෙර ප්‍රකාශ කර තිබෙනවා. ඒක හැන්සාඩ් වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා. ඒ අනුව, එලෙස ඉවත් කර තිබෙන මන්ත්‍රී කණ්ඩායම මේකට අන්තර්ගත නැති බවත් පිළිගන්න සිද්ධ වනවා. අපි ඉතා ඕනෑකමින් කියනවා, ඕනෑම කසාදයක් කර ගැනීමට හෝ දික්කසාද වීමට අයිතියක් ඕනෑම කෙනෙකුට තිබෙන බව. නමුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව ඉල්ලා සිටින්නේ; අගමැතිතුමාටත් අපි කියන්නේ; ඔබතුමාට බහුතරයක් තිබෙනවා නම්, යූඑන්පී ආණ්ඩුවක් තබා ගන්න කියලායි. නමුත්, අපේ ප්‍රශ්නය ඒක නොවෙයි. පාර්ලිමේන්තුවට මේ ලියවිල්ල ඉදිරිපත් කර එහි කාලය අවසන් වීමත් සභානායකතුමා පිළිගෙන තිබෙනවා. මම මේ ප්‍රශ්නය ජනවාරි මාසයේ ඇහුවාමත්, සැප්තැම්බර් මාසයේ ඇහුවාමත් "අවශ්‍ය නම්, යළිත් අනුමැතියකට අපි එනවා," කියලා එතුමා කිව්වා. එය හැන්සාඩ් වාර්තාවේත් සඳහන්ව තිබෙනවා. ඒකයි මම නඟන ප්‍රශ්නය.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා. ගරු සභානායකතුමාගෙන් පසුව ඔබතුමාට අවස්ථාව ගන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි,-[බාධා කිරීමක්] ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණාව පැහැදිලි කරන්නට ඕනෑ. [බාධා කිරීමක්] ඔබතුමා දැන් කථා කළානේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. ඔක්කොටම එකයි. On behalf of the Government, I take that point.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
හැම තිස්සේම කථා කරන්නට බැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ කාරණය තවම ඉවර නැහැ, ඒකයි පැහැදිලි කරන්නේ. ඒ අවස්ථාව මට දෙන්න. සියලු දෙනාටම එක විධියට තමයි සලකන්නේ. [බාධා කිරීමක්] ඔව්, සභානායකවරයාට අවස්ථාව තිබෙනවා එය පැහැදිලි කරන්නට. ගරු අනුර දිසානායක

මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙයට සහයෝගය දෙන්න. හැම වෙලාවේම මම ඔබතුමාලාටත් අවස්ථාව දෙනවා. [බාධා කිරීමක්] ඔව්. කියන්න, මම දෙන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳට බලාගෙන ඉන්නම් අවස්ථාව දෙන-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ජාතික ආණ්ඩුව කියන්නේ මොකක්ද කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 (5) (4) ව්‍යවස්ථාවේ මෙසේ පැහැදිලි කරලා තිබෙනවා:

> "...ජාතික ආණ්ඩුවක් යනු, පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාව ලබාගන්නා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම සහ පාර්ලිමේන්තුවේ අනෙකුත් පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් එකතුව පිහිටුවනු ලබන ආණ්ඩුවක් වන්නේ ය."

මේ Agreements පාර්ලිමේන්තුවට ගේන්නට ඕනෑ කියලා එකක් නැහැ. දැන් ගරු අගමැතිතුමා කිව්වා, ජාතික ආණ්ඩුව තිබෙනවා කියලා. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්වරයා කිව්වා, ජාතික ආණ්ඩුව තිබෙනවා කියලා. තව වෙන මොනවාද? මේක විහිළුවක්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera )
ගරු කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා ජාතික ආණ්ඩුව පිළිබඳ පාර්ලිමේන්තුව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 (4) ව්‍යවස්ථාව ප්‍රකාරව සම්මත කරන ලද සත්‍ය යෝජනාව මහ ලේකම්වරයා මඟින්ම ඉදිරිපත් කිරීම ගැන. ගරු කථානායකතුමනි, ඒ යෝජනාව ඉතා වැදගත්. එහි සඳහන් වෙන්නේ මෙහෙමයි: "පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාවක් ලබා ඇති එක්සත් ජාතික පක්ෂය විසින් ජාතික ආණ්ඩුවක් පිහිටුවා ඇති බැවින් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් සංඛ්‍යාව 48ක් නොඉක්මවිය යුතු බවත්, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරුන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව 45ක් නොඉක්මවිය යුතු බවත් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 (4) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබයි."

මෙම යෝජනාවේ ඇති සංයුතිය පිළිබඳව අනුර දිසානායක මන්ත්‍රීතුමා ඒ අවස්ථාවේදී විරෝධතාවක් ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේදී දීර්ඝ වාද විවාදවලින් පසුව ගරු කථානායකතුමා ඒ පිළිබඳව විස්තරාත්මක නියෝගයක් දුන්නා. ඒ අනුව ඔබතුමා පිළිගෙන තිබෙනවා, මෙම යෝජනාව නීත්‍යානුකූලයි, මේ යෝජනාව ඉදිරිපත් කළ හැකියි කියලා. ඒ අනුව දැන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 (4) ව්‍යවස්ථාව නැවත අර්ථ නිරූපණය කිරීමේ ප්‍රශ්නය මතු වන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, වැදගත්ම දේ තමයි, වසර දෙකක කාලයක් සඳහා ජාතික ආණ්ඩුවක් පිහිටුවන බව මෙම යෝජනාවේ කිසිම තැනක සඳහන් කරලා නැති එක. "වසර දෙකක කාල සීමාවක්" කියන එක සඳහන් වෙලා නැහැ. පාර්ලිමේන්තුවේ ගරු මැති ඇමතිවරු වසර දෙකක කාලයකින් පසුව නැවත සලකා බැලීමට ඇති ඉඩකඩ පිළිබඳව සාකච්ඡා කළා. ඒක අපි පිළිගන්නවා. එහෙම කථාවක් තිබුණා. නමුත්, "වසර දෙක ඉකුත් වූ වහාම මෙම ගිවිසුම අවසන් වේ, ජාතික ආණ්ඩුව අවසන් වේ" කියලා කියන්න පුළුවන් කිසිම වචනයක් හෝ කොන්දේසියක් මෙම යෝජනාවේ සඳහන් වන්නේ නැහැ. කොටින්ම කිව්වොත්, "ජාතික ආණ්ඩුව වසර දෙකකට පමණයි" කියලා, මේ පාර්ලිමේන්තුවේ සම්මත වුණු යෝජනාවේ කිසිම තැනක සඳහන් වන්නේ නැහැ. එහෙම නම්, "වසර දෙකකින් පසු ජාතික ආණ්ඩුව අහෝසි වී ඇත. එතැන් පටන් සියලු පනත්, සියලු නීති රීති, පාර්ලිමේන්තුවේ අමාත්‍ය මණ්ඩලය විසින් කරපු සියලු කටයුතු අහෝසි වේ" කියන තර්කය යෝජනා සම්මතයට පටහැනියි; නීතියට පටහැනියි. එම නිසා ගරු කථානායකතුමනි, බොහොම පැහැදිලිව පෙනෙනවා, පසුගිය දවස් කිහිපය තුළම අපි මිථ්‍යාවක් මතයි වාද විවාද කළේ කියලා. මොකක්ද, මිථ්‍යාව? පාර්ලිමේන්තුව ඉදිරියේ තිබෙන සභා සම්මතිය තිබෙන්නේ වසර දෙකකටය කියන මිථ්‍යාවයි. අපි ඔබතුමාට ස්තුතිවන්ත වනවා, අපි සම්මත කළේ කුමක්ද කියලා ඉතාම නිවැරදිව පෙන්වා දීම ගැන. ඒ අනුව මේ සාකච්ඡාව ඉදිරියට ගෙන යෑමේ තේරුමක් නැහැ. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්තුමා පාර්ලිමේන්තුවේ සඳහන් කළා, "අපි දේශපාලනිකව ඉදිරියට යනවා"යි කියලා.

ඒ අනුව සැක සංකාවක් තිබෙන්න බැහැ. ඒ වාගේම ලිඛිත ගිවිසුමක පැවැත්ම ජාතික ආණ්ඩුවක අත්‍යවශ්‍ය අංගයක් විධියට මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46වන ව්‍යවස්ථාවේ කිසිම තැනක සඳහන් කරලා නැහැ, ගරු කථානායකතුමනි. ලිඛිත ගිවිසුමක් තිබෙනවා නම් හොඳයි. හැබැයි, ලිඛිත ගිවිසුමක අවශ්‍යතාවක් නැහැ. සමහර වෙලාවට අපි පුළුල් ජාතික ආණ්ඩුවක් හදන විට ඒ සියලු දෙනාම එක ලේඛනයකට එකඟ නොවෙන්නත් පුළුවන්. එකඟ නම් හොඳයි. එහෙම එක ලේඛනයකට එකඟ නොවී පොදු කාරණා, මූලධර්මවලට එකඟ වෙමින් ජාතික ආණ්ඩුවක් ගෙන යාමටත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(4) ව්‍යවස්ථාව අනුව ඉඩකඩ තිබෙනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, ලිඛිත ගිවිසුමක් අත්‍යවශ්‍ය නැත. වසර දෙකක් පිළිබඳ කරුණක් යෝජනාවේ - සම්මුතියේ- නැත. එසේ නම් වසර දෙකකින් පසු ජාතික ආණ්ඩුවක් නැතැයි කියන තර්කයට නීතිමය පදනමක් නැහැ කියලා ඉතාම ගෞරවයෙන් ඔබතුමාට මා කියා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, දැන් අජිත් පී. පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා කියපු කාරණයත් එක්ක මා එකඟ වෙනවා. යෝජනාවේ නැහැ, ජාතික ආණ්ඩුව අවුරුදු දෙකකට සීමා වනවා කියලා. ඒක හරි. එහෙම දෙයක් යෝජනාවේ නැහැ. මොකද, යෝජනාවට එහෙම අවශ්‍යතාවක් එන්නේත් නැහැ. යෝජනාව ගෙනෙන්නේ අමාත්‍යවරු සංඛ්‍යාව 40 සිට 48 දක්වා වැඩි කර ගන්නත්, නියෝජ්‍ය, රාජ්‍ය අමාත්‍යවරු සංඛ්‍යාව 40 සිට 45 දක්වා වැඩි කර ගන්නත්. හැබැයි, ඒ යෝජනාව නිකම් ගෙනෙන්න බැහැ. එහෙම යෝජනාවක් නිකම් ගෙනෙන්න බැහැ, ජාතික සම්මුතියක් පක්ෂ අතරේ එන්නේ නැතිව. යෝජනාව ගෙන ඒමට පෙර එකඟතාවකට ආ යුතුව තිබෙනවා. [බාධා කිරීමක්] ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, පොඩ්ඩක් ඉන්න කෝ. ඔබතුමා පනින්න එපා. හරිද? ඒ දැන් නේ කියන්නේ. දැන් තිබෙන ප්‍රශ්නය

[ගරු අනුර දිසානායක මහතා]

ගැන නොවෙයි මා අහන්නේ. යෝජනාව ගෙනෙන්න පුළුවන්කම ලැබෙන්නේ එවැනි ජාතික ආණ්ඩුවක් ගොඩ නැඟුවාට පසුවයි. හරිද? ඔබතුමන්ලා එදා මේ පාර්ලිමේන්තුවට දැනුම් දුන්නා, එවැනි ජාතික ආණ්ඩුවක් ගොඩ නැඟී තිබෙන බව.

ඒ අනුව තමයි -එහි පරස්පරතා, විවිධ ප්‍රශ්න තිබුණත්- ඔබතුමන්ලා මේ යෝජනාව ගෙනාවේ. මේ යෝජනාව ගෙන ඒමේදී පූර්වයෙන් සම්පූර්ණ කළ යුතු කරුණ තමයි ජාතික ආණ්ඩුවක් ගොඩ නැඟීම. මොකද, ජාතික ආණ්ඩුවක් ගොඩ නැඟීමකින් තොරව මේ යෝජනාව ගෙනෙන්න බැරි නිසා. ඒ නිසා අනිවාර්යයෙන්ම මේ යෝජනාව රඳා පවතිනවා, ජාතික ආණ්ඩුවේ කාල සීමාවත් එක්ක. ඒක හරි වැදගත්නේ. මොකද, ජාතික ආණ්ඩුවේ කාලසීමාව ඉක්මවා යනකොට මේ යෝජනාවේ කාලසීමාවත් නිකම්ම ඉක්මවා යනවා නේ. මෙම යෝජනාව ගෙන ඒමට හැකි වන්නේ ජාතික ආණ්ඩුවක් ගොඩ නැඟීම කියන පූර්ව එකඟතාවට යටත්වයි. එතකොට, එදා ජාතික ආණ්ඩුව පිළිබඳව තිබූ පූර්ව එකඟතාව මොකක්ද? ඒකයි මම අහන්නේ. ඒ යෝජනාව ගැන නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. 'ජාතික ආණ්ඩුව' කියන පූර්ව කොන්දේසිය මත තමයි මේ යෝජනාව ගෙනාවේ. එහෙනම් ජාතික ආණ්ඩුව ගොඩ නැඟීම පිළිබඳව තිබුණු පූර්ව එකඟතාව මොකක්ද? ගරු කථානායකතුමනි, මා ඔබතුමාගෙන් මේ ඉල්ලීම කරනවා. දැන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා ඒ යෝජනාව කියෙව්වා වාගේම, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ හිටපු මහලේකම් මහාචාර්ය විශ්වා වර්ණපාල මහතා ඔබතුමාට ඉදිරිපත් කරපු ලිපියත් කියවන්න කියලා. එහි තිබෙනවා මේ යෝජනාවට අඩංගු වන කොටස.

ඒ විතරක් නොවෙයි. 2015 සැප්තැම්බර් මස 01 වැනි දා මෙම පාර්ලිමේන්තුව අමතා අතිගරු ජනාධිපතිතුමා කළ ප්‍රකාශයේදී මෙසේ කියා තිබෙනවා:

> "..මෙම පාර්ලිමේන්තුව දෙවසරක් සඳහා සම්මුති-සන්ධාන රජයක් ගොඩ නඟන්නේ එම ජාතික අවශ්‍යතාව ඉටු කිරීම සඳහා යි..."

එතකොට මේ යෝජනාව ගෙනාවේ 2015 සැප්තැම්බර් මස 03වැනි දා. මෙම යෝජනාව ගෙන ඒමට පෙර, 01වැනි දා මේ පාර්ලිමේන්තුව අමතා ජනාධිපතිතුමා කියා තිබෙනවා, "මෙම පාර්ලිමේන්තුව දෙවසරක් සඳහා සම්මුති- සන්ධාන රජයක් ගොඩ නඟන්නේ එම ජාතික අවශ්‍යතාව ඉටු කිරීම සඳහා යි" කියලා. එතකොට, ජනාධිපතිතුමාත් මෙම යෝජනාව ගෙන ඒමට පෙර කියනවා, මෙම සම්මුති ආණ්ඩුව ගොඩ නඟන්නේ අවුරුදු දෙකක් සඳහායි කියලා.

ගරු කථානායකතුමනි, ඊට පස්සේ මෙම යෝජනාව ඉදිරිපත් කරමින් ගරු අග්‍රාමාත්‍යතුමා කියා තිබෙන්නේ මොකක්ද? එතුමා මෙසේ කියා තිබෙනවා:

> "..අපේ පළමුවැනි උත්සාහය වන්නේ, මෙම ක්‍රමය සාර්ථක වෙනවාද නැද්ද කියලා බලන්න අවුරුදු දෙකකට සීමා කර කටයුතු කිරීමයි...."

මේ කියලා තිබෙන්නේ ඒකයි. එතුමා නිශ්චිත ලෙස කියනවා, "අපේ පළමුවැනි උත්සාහය වන්නේ, මෙම ක්‍රමය සාර්ථක වෙනවාද නැද්ද කියලා බලන්න අවුරුදු දෙකකට සීමා කර කටයුතු කිරීමයි." කියලා. එතකොට, මෙම යෝජනාවට අදාළ පූර්ව අවස්ථා තුනක් තිබෙනවා. එකක්, ජනාධිපතිතුමා කියා තිබෙනවා, මෙය අවුරුදු දෙකක් සඳහා කරන ව්‍යායාමයක් කියලා. ඊළඟට, ගරු අග්‍රාමාත්‍යතුමා පාර්ලිමේන්තුවට කියා තිබෙනවා, අවුරුදු දෙකකට සීමා කොට කටයුතු කරනවාය කියලා. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ හිටපු මහලේකම්වරයා වූ මහාචාර්ය විශ්වා වර්ණපාල මහත්මයා කියා තිබෙනවා, අවුරුදු දෙකකට මේ ජාතික ආණ්ඩුව ගොඩ නඟනවාය කියලා. මේ සාධක තුනම අවශ්‍ය නැහැ, මෙයින් එකක් තිබුණත් ප්‍රමාණවත් ඒ යෝජනාව ගෙනෙන්න. මා වැඩිමනත් වශයෙන් තමයි ඒ කරුණු කිව්වේ. මේ සාධක තුන මත තමයි මේ ජාතික ආණ්ඩුව ගොඩ නැඟීම පිළිබඳ යෝජනාව එන්නේ. එහෙම නැත්නම් එවැනි යෝජනාවක් ගෙනෙන්න බැහැ. මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමාගේ ලිපිය තිබුණේ නැත්නම්, ජනාධිපතිවරයා ජාතික ආණ්ඩුවක් හදන බව කිව්වේ නැත්නම්, අගමැතිවරයා ජාතික ආණ්ඩුවක් හදන බව කිව්වේ නැත්නම් ඒ යෝජනාව ගෙනෙන්න බැහැ. ඒ යෝජනාව ගෙනෙන්න පුළුවන්කම තිබුණේ පූර්ව කොන්දේසි සම්පූර්ණ නිසායි. හැබැයි, පූර්ව කොන්දේසිවලට තමුන්නාන්සේලා සීමාවක් දාලා තිබෙනවා.

මොකක්ද ඒ? ඒ තමයි, "අවුරුදු දෙකයි" කියන කාරණය. එහෙමනම්, සම්මත කරන ලද, අමාත්‍යවරු වැඩි කර ගැනීමේ යෝජනාව නෛසර්ගිකව, අනිවාර්යයෙන් අවුරුදු දෙකකට ගැට ගැහිලා තිබෙනවා. මේකයි සිද්ධ වෙලා තිබෙන්නේ. මේ කාල සීමාව අවුරුදු දෙකක් ඉක්මවා යනවා නම්, ඒ ඉක්මවා යෑමට පෙර ඔබතුමන්ලාට පුළුවන්කම තිබුණා, අවශ්‍ය නම් 2017 සැප්තැම්බර් මාසයේ 2වැනි දාට පෙර යළි ඒ ගිවිසුම දීර්ඝ කර ගන්න. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් රික්තකයක් තිබෙනවා. සැප්තැම්බර් මාසයේ 2වැනි දා සිට, අද පාර්ලිමේන්තුවේ මේ ප්‍රකාශය කරන තෙක් රික්තකයක් තිබෙනවා. ඒ රික්තකයට අදාළ කාල පරිච්ඡේදය තුළ ජාතික ආණ්ඩුවක් නැහැ. ඒ නිසා ඒ රික්තකය continue කරන්න බැහැ. සැප්තැම්බර් මාසයේ 2වැනි දා සිට තමුන්නාන්සේලාට මේ කාලය දීර්ඝ කරන්න තිබුණා. හැබැයි, එහෙම දීර්ඝ කළේ නැහැ. ඒ නිසා දැන් රික්තකයක් තිබෙනවා. ඒ රික්තකය තිබෙන නිසා අද තමුන්නාන්සේලාට කියන්න බැහැ, " අපි මේ යෝජනාව අපි දීර්ඝ කරනවා" කියලා. ඒ මොකද, රික්තකය ඇති වෙන කොට මේ යෝජනාව අහෝසි වෙලා ඉවර නිසා. ඒ නිසා තමුන්නාන්සේලා යළි ජාතික ආණ්ඩුවක් පිළිබඳව ගිවිසුම කථානායකතුමාට භාර දෙන්න ඕනෑ. ඒ වාගේම, තමුන්නාන්සේලාගේ යෝජනාව අවුරුදු දෙකකට ගැට ගැසී තිබෙන බැවින්, මේ පාර්ලිමේන්තුවේ අමාත්‍ය ධුර වැඩි කර ගැනීම සඳහා යළිත් අනුමැතිය ගන්න ඕනෑ. ඒ නිසා මේ කාරණය බරපතළයි, ගරු කථානායකතුමනි. තවදුරටත් තමුන්නාන්සේලා ඇමතිවරුන් හැටියට කටයුතු කරනවා නම්, මේ අමාත්‍ය මණ්ඩලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි -

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Hon. Speaker -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I want to reply him. So, please -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Faiszer Musthapha will clarify it. Then, I will give you time.

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

Hon. Speaker, the Hon. Anura Kumara Dissanayake referred to the fact that there was an Agreement which referred to two years. If it was a prerequisite that the Agreement be tabled, it would have been done at the time when this Resolution was brought in. An agreement could be either orally or in writing. His Excellency the President said "two years". According what the Hon. Anura Kumara Dissanayake said, the Hon. Prime Minister also said so. But, if parties to the Agreement say that they want to continue the Agreement, then the Agreement is operational. It is only the contracting parties who can come before the Hon. Speaker and say that the Agreement is not in existence. It is not for third parties to interpret the Agreement before this House. Hon. Speaker, no third party can say that this Agreement is operational or not. Here, both contracting parties to the Agreement have come before this House and say that the Agreement is operational. Therefore, third party statements have no consequence and also the fact that this Agreement was not tabled at the time when this Resolution was passed does not make it a mandatory prerequisite that the Agreement be tabled.

In terms of contracting law there are two contracting parties, or maybe three, and if those parties come before the House and say that that Agreement is yet operational, no third party can come before the House and say, "This agreement is not in existence." It is all for the General Secretary of the UPFA or the UPFA and the United National Party to come before the House and say that this Agreement is operational. So, that is what they have stated.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මේක පාර්ලිමේන්තුවක්. මේක කච්චේරියක් නොවෙයි. අද පාර්ලිමේන්තුවේදී ගරු අගමැතිතුමා නැඟිටලා ප්‍රකාශයක් කළා, "මේ ජාතික ආණ්ඩුව තිබෙනවා" කියලා. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම් නැඟිටලා ප්‍රකාශයක් කළා, "මේ ජාතික ආණ්ඩුව තිබෙනවා" කියලා. එච්චරයි. එතැනින් ඒක අවසන්. මේක කච්චේරියක් නොවෙයි. මේක දිසාපති කාර්යාලයක් නොවෙයි. පාර්ලිමේන්තුවේ තීරණය තමයි වටින්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, කාන්තාවක් සහ පුරුෂයෙක් අතර විවාහයක් සිදු වුණා නම්, ඒක ඔවුන්ගේ ප්‍රශ්නයක්. ඒක අපට ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැන්, මේ ප්‍රශ්නය ගැන කියන්න කෝ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

දැන් තුන්වැනි පාර්ශ්වයක් ගැන කථා කරන නිසායි මෙහෙම කියන්නේ.

ඔවුන්ට එකට ඉන්නත් පුළුවන්; වෙන් වෙන්නත් පුළුවන්; දරුවෝ බෙදා ගන්නත් පුළුවන්. ඒක ඔවුන්ගේ ප්‍රශ්නයක්. හැබැයි, මෙතැන තිබෙන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානය කියන භාර්යාවත්, එක්සත් ජාතික පක්ෂය කියන ස්වාමිපුරුෂයාත් අතර විවාහක ප්‍රශ්නයක් නොවෙයි. මෙතැන තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ ප්‍රශ්නයක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කියලා තිබෙනවා, ජාතික ආණ්ඩුවක් ගොඩනඟනවා නම් පමණයි අමාත්‍ය ධුර වැඩි කළ හැකි වන්නේ කියලා. ජාතික ආණ්ඩුව ගොඩනැඟීම සඳහා නිශ්චිත කාල පරිච්ඡේදයක් තිබෙන බව ඔබතුමන්ලා කියලා තිබෙනවා. අපි මැදිහත් වෙන්නේ තුන්වැනි පාර්ශ්වයක් ලෙස නොවෙයි. මෙය ඔබතුමන්ලා දෙගොල්ලෝ අතර විවාහයක් නම් අපට ප්‍රශ්නයක් නැහැ. "පාටි" දමනවාද, බොනවාද, රට නිදාගන්නවාද කියන ඒවා අපට අදාළ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Point එකට එන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

අපි මේ අහන්නේ මොකක්ද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව තවදුරටත්, විශේෂයෙන්ම සැප්තැම්බර් මාසයේ 03වැනි දා සිට අද දක්වා, අඩුම තරමින් මේ කාල පරිච්ඡේදය දක්වා- මේ අමාත්‍ය මණ්ඩලය වලංගු නැහැ. ඒක තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කියන්නේ. පූර්ව කොන්දේසිය අනුව අවුරුදු දෙකකට ජාතික ආණ්ඩුව හදනවා කියලා, ඒ මත පදනම්ව තමයි අමාත්‍ය ධුර සංඛ්‍යාව වැඩි කර ගත්තේ. ඒ පූර්ව කොන්දේසි අවලංගු වී තිබියදී, ඊට පහළින් තිබෙන කොන්දේසි විතරක් රැකෙන්නේ කොහොමද?

ගරු කථානායකතුමනි, ඒ නිසා මේ අමාත්‍ය මණ්ඩලය කරන්න ඕනෑ මෙයයි. අද ඉඳලා නැවත එවැනි එකඟතාවකට එනවා නම්, අමාත්‍ය ධුර වැඩි කර ගන්න ඕනෑ කියලා අද ප්‍රකාශයක් කරලා, හෙට නැවත පාර්ලිමේන්තුවේදී ඒවැනි යෝජනාවක් සම්මත කර ගන්න. ඒක වෙනම දෙයක්. හැබැයි, තමුන්නාන්සේලාට අයිතියක් නැහැ සැප්තැම්බර් මාසයේ 02වැනි දා අවලංගු වූ එකකට, රික්තයක කාලයකුත් තියලා, 'අද ඉඳන් continue වෙනවා' කියලා කියන්න. ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මෙතැන තුන්වැනි පාර්ශ්වයක් ගැන නොවෙයි, ව්‍යවස්ථාමය ප්‍රශ්නයක් තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. බොහොම ස්තුතියි. මම පාර්ශ්ව දෙකම කියපු කරුණු පිළිබඳව අවධානය යොමු කළා. ගරු අග්‍රාමාත්‍යතුමනි, පැහැදිලි කිරීමක් අවශ්‍යද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඔව්. ගරු කථානායකතුමනි, මේ විවාදය පැවැත්වූ අවස්ථාවේ දී එක ලියවිල්ලයි මේ සභාවේ තිබුණේ. ඒ මම ඉදිරිපත් කරපු යෝජනාව. එය එක්සත් ජාතික පක්ෂය ගත යුතු පියවර පිළිබඳව ඉදිරිපත් කරපු යෝජනාව. වෙන කිසිම ලියවිල්ලක් මෙහි තිබුණේ නැහැ. ඒක මම කියන්නට ඕනෑ. මෙතැනට කිසිම ලියවිල්ලක් ඉදිරිපත් කළේ නැහැ; කිසිම ගිවිසුමක් ඉදිරිපත් කළේ නැහැ. කථාවල කියන්න ඇති ගිවිසුම් ගැන. එම ගිවිසුම ඉදිරිපත් කරන්න කියලා කිව්වාම මම කිව්වා, "ඉදිරිපත් කරන්න වුවමනාවක් නැහැ.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ඔබතුමාට වුවමනා නම් ඒක පෙන්වන්නම්" කියලා. ඒ ගිවිසුම ලංකාවේ පළමුවැනි වතාවට සිදුවුණු දෙයක් නිසා ආරම්භයේ අපි කොහොමද වැඩ කටයුතු කරන්නේ කියන එක ගැන කතිකාවක් තිබුණා. මෙතැන පක්ෂ තුනක් තිබුණා. ආණ්ඩුව ඇති කළාට පස්සේ තුන්වැනි පක්ෂය එක්ක ඇති කර ගත්තු ගිවිසුමක් නැහැ. මෙතැන තිබෙන්නේ එකම එක යෝජනාවක් විතරයි. [බාධා කිරීමක්] මම ඒ වෙලාවේ කිව්වා. මොකද, මේ ආණ්ඩුව අවුරුද්දක් එකහමාරක් ගෙන යන්න බැහැ නේ. තවදුරට ගෙන යන්න බැහැ. ඉතින් ඉස්සෙල්ලාම - [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමන්ලා එතුමාට කථා කරන්න දෙන්න. ඔබතුමන්ලාට අවශ්‍ය නම් මම අවස්ථාව පසුව දෙන්නම්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, ජාතික ආණ්ඩුවක් විධියට හරි මෙහෙම පක්ෂ එකතු වෙන අවස්ථාවලදී සම්ප්‍රදායයක් තිබෙනවා. ඒවා, කිසි විටෙක ලිඛිතව ඇති වුණේ නැහැ. ඔබතුමා මම මේ කියන දේ ගැන පොඩ්ඩක් බලන්න. 1916 එංගලන්තයේ පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ ඩේවිඩ් ලොයිඩ් ජෝජ් අගමැති වෙලා ඇති කරපු ජාතික ආණ්ඩුව ගැන කිසිම ලියවිල්ලක් නැහැ. [බාධා කිරීමක්] ඒකත් අවසන් කළාම මේ වාගේමයි කළේ. ඒක ව්‍යවස්ථාවේ එකක් නොවෙයි. 1931 - [බාධා කිරීම්] දන්නේ නැත්නම් වාඩි වෙන්න. 1931 රැම්සේ මැක්ඩොනල්ඩ් යටතේ තිබුණු ආණ්ඩුවේත් එහෙමයි. [බාධා කිරීම්] මෙතුමන්ලාට ඕනෑ නම්, එහි කොපියක් අරගෙන දෙන්න. 1940 බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ වින්ස්ටන් චර්චිල් යටතේ ඇති වුණු සභාග ආණ්ඩුවට ඔක්කෝම පක්ෂ එකතු වුණා. මොකක්ද තිබුණේ කියලා බලන්න. මොන ලියවිල්ලක්වත් නැහැ. අපි අතර ගිවිසුමක් තිබුණා, ඒක අපි මේ සභාවට ඉදිරිපත් කළේ නැහැ. මොකද, ඒක පදනම් කරගෙන යන්නේ නැති නිසා. එච්චරයි අපි කිව්වේ. මේ සභාව තීරණය කළා, ඒ අනුවම යමු කියලා. ඉතිහාසය අනුවත් මෙවැනි ගිවිසුමක් ලිඛිතව තිබිලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමා. [ඝෝෂා කිරීම්]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, මහ ලේකම්තුමා විසින් ඉදිරිපත් කරන ලද අගමැතිතුමා මේ ගරු සභාවට ඉදිරිපත් කරපු යෝජනාවේ 'එක්සත් ජාතික පක්ෂය ජාතික ආණ්ඩුවක් පිහිටුවා ඇත' කියලා තිබෙනවා මිසක් 'ජාතික ආණ්ඩුවක් පිහිටුවූයේ කුමන පක්ෂයක් සමඟද' කියලා සඳහන් වෙන්නේ නැහැ. [බාධා කිරීම්] ඒක නිසා - [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, අපි ඇත්ත කථා කරනකොට කට්ටිය හයද? [බාධා කිරීම්] ඔබතුමා සභාව නිහඬ කරලා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එතුමාට කථා කරන්න ඉඩ දෙන්න. ඉක්මනින් මෙය අවසන් කරන්න ඕනෑ. [බාධා කිරීම්] Order, please!

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, ඒ නිසා අදාළ ගිවිසුම මෙතැනදී ඉදිරිපත් නොකළොත් අනාගතයේ දී සිද්ධ වෙන්නේ මොකක්ද? දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පස්සේ කැබිනට් අමාත්‍යධුර සංඛ්‍යාව 30කට සීමා කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. එම කරුණු ඉදිරිපත් කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන්න තිබෙනවා. ඒ නිසා ඉක්මනින් අවසන් කරන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

එංගලන්තයේ එහෙම සීමාවක් නැහැ. ඒ නිසා එංගලන්තයේ ආදර්ශය මෙතැනට ගැළපෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මෙතැනදී ගිවිසුම ඉදිරිපත් කරන්නේ නැත්නම් අනාගත අගමැතිවරුත් මේක වැරදි පූර්වාදර්ශයක් කර ගන්නට ඉඩ තිබෙනවා. ජාතික ආණ්ඩුවක් තිබෙනවා කියා හුදු ප්‍රකාශයක් පමණක් කරලා, ඇමතිවරු 30දෙනෙක් වෙනුවට තමන්ට පාර්ලිමේන්තුව තුළ සාමාන්‍ය බහුතරය තිබෙන නිසා ඕනෑම ඇමතිවරුන් ගණනක් පත් කර ගැනීමට දැන් ලබාදෙන වැරදි අවස්ථාව පූර්වාදර්ශයක් කර ගැනීමේ අවදානමක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

මම කිව්වේ වෙන එකක්. එංගලන්තය ගැන කියලා කිව්වේ, ආදර්ශයක් හැටියට ලිඛිතව ක්‍රියා කරන්න වුවමනා නැහැ කියායි. ඒ කාලයේ අමාත්‍යධුර එකසිය ගණනක් තිබුණා. මම ඒවා ගැන කථා කරන්නේ නැහැ. නමුත්, මෙවැනි ආණ්ඩුවක් ඇති කරන්න ලිඛිතව දැනුම් දෙන්න වුවමනා නැහැ. ඒ සම්ප්‍රදාය තමයි මෙතැනත් තිබෙන්නේ කියන එකයි ඉස්සෙල්ලා මම කිව්වේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, අපි දැන් මේක අවසන් කරන්න ඕනෑ. ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා මුල ඉඳලාම ඉල්ලපු නිසා අවස්ථාව ලබාදෙනවා. ඊට පස්සේ අපි ප්‍රධාන කටයුතුවලට යන්න ඕනෑ. මේ කරුණ ගැනමද ඔබතුමා කථා කරන්නේ?

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

ඔව්, ගරු කථානායකතුමනි. අපි අගමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා, එංගලන්තයේ සම්ප්‍රදාය ගැන අපට කියාදීම පිළිබඳව. නමුත්, මෙතැන ගැටලුව විධියට තිබෙන්නේ මෙයයි. ගරු කථානායකතුමනි, මෙතැන ව්‍යාකූල තත්ත්වයක් තිබෙන නිසා තමයි අපි මේ ගැන අද තව දුරටත් සාකච්ඡා කරන්නේ. අවුරුදු 2ක් මේ ආණ්ඩුව පවත්වාගෙන යනවා කියලා තමයි කිව්වේ. "හය නැති අගමැති" නේ. ඒ නිසා ඔය ගිවිසුම නැවත අත්සන් කරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. මොකද, අපට ඒ සම්ප්‍රදාය කඩන්න ඕනෑ නැහැ, ගරු කථානායකතුමනි. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! මෙම කාරණය පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලාව දැනුවත් කරන්න කැමැතියි. මම ඊයේ පොරොන්දු වුණා, මේ සම්බන්ධයෙන් කරුණු සොයා බලා අදාළ විධියට පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කරනවා කියලා. ඒ අනුව මම ගරු අග්‍රාමාත්‍යතුමාටත්, ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානයටත් කථා කළා. අද කරුණු පැහැදිලි කරන්න එතුමන්ලා එකඟ වුණා. මේ Agreement එක තව දුරටත් තිබෙනවා කියලා අදාළ පාර්ශ්වකරුවන් අද මේ සභාවේදී පැහැදිලි කළා. මේ පිළිබඳව තව ගැටලු තිබෙනවා නම් මට ඒවා ගැන සොයා බලන්න පුළුවන්. දැනට අදාළ පාර්ශ්ව තුනේම එකඟත්වයක් තිබෙනවා නම්, මට එතැනින් එහාට යන්න බැහැ. නමුත් මම සොයා බලන්නම්. ඔබතුමන්ලා කියපු කරුණු පිළිබඳවත් නීත්‍යනුකූලව මට යම් තීරණයක් ගන්න පුළුවන්ද කියලා මම සොයා බලන්නම්. බොහොම ස්තූතියි.

ඊළඟට, වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය, ගරු ඊ. සරවනපවන් මන්ත්‍රීතුමා.

## වරප්‍රසාද: ගරු සිවශක්ති ආනන්දන් මන්ත්‍රීතුමා සිදුකළ හානිකර ප්‍රකාශය
## சிறப்புரிமை: மாண்புமிகு சிவசக்தி ஆனந்தனின் பாதகமான கூற்று
## PRIVILEGE: ADVERSE STATEMENT MADE BY HON. SIVASAKTHI ANANTHAN

**ගරු ඊ. සරවනපවන් මහතා**
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

Hon. Speaker, during the Local Government Elections, the Hon. Sivasakthi Ananthan, Member of Parliament, made a statement that the TNA Members of Parliament have accepted a bribe of Rs. 20 million each from the Government in order to support the Budget of 2018. This was highlighted in all Tamil newspapers, electronic media, social media et cetera and all the parties made use of this statement for their election campaign, which resulted in adverse results substantially. So, since this is a Question of Privilege and further tarnishing the image of elected Members of Parliament, I kindly request you to take proper action against him. Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සිවශක්ති ආනන්දන් මන්ත්‍රීතුමා, what is your point of Order?

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Sir, that was a Privilege matter that the Hon.Saravanapavan raised. - [*Interruption.*] Sir, that was a Privilege matter.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Okay.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

We will leave it at that. I cannot give you time. Under Standing Orders, he raised it. So, you cannot reply now.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Please sit down. I asked you to sit down. Otherwise, I will get the mike disconnected.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Please sit down! Otherwise, I will send you out.

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Either you have to sit down or I will have to send you out of the Chamber. [*Interruption.*]

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Will you sit down? I am warning you for the third time. - [*Interruption.*] This is the third time I am telling you. Will you sit down or will you go out of the Chamber? [*Interruption.*] I am telling you, please sit down!

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is your point of Order?

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
The Hon. Member raised a Question of Privilege. In that Question of Privilege, he made a complaint against another Member. Merely because he made a complaint, that Member cannot say that his name has been mentioned and start speaking. I am moving that whatever Hon. Sivasakthi Ananthan said in response to the Question of Privilege that was raised be expunged from Hansard.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay, I will look into that.

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### වෛද්‍ය එස්.එස්. ගුණවර්ධන දේශීය ආයුර්වේද සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### டாக்டர் எஸ்.எஸ். குணவர்தன சுதேச ஆயுர்வேத அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### DR. S.S. GUNAWARDANA INDIGENOUS AYURVEDA DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"වෛද්‍ය එස්.එස්. ගුණවර්ධන දේශීය ආයුර්වේද සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ගරු කේ.කේ. පියදාස මහතා
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙත පවරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Health, Nutrition and Indigenous Medicine for report.*

### පොතුවටවන මහා විහාරය පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### பொத்துவடவன மகா விகாரை மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### POTHUWATAWANA MAHA VIHARAYA FOUNDATION (INCORPORATION) BILL

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"පොතුවටවන මහා විහාරය පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා වෙත පවරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சரும் புத்தசாசன அமைச்சருமானவருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப் பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Sustainable Development and Wildlife and Minister of Buddhasasana for report.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මම අද උදේ ඔබතුමාගේ නිල කාමරයේ දීත් දැනුම් දුන් පරිදි, ඊයේ මේ සභාවේ විවාදයට ගැනීමට නියමිතව තිබුණේ මහ බැංකු බැඳුම්කර ගනුදෙනුව පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව සහ බරපතළ වංචා, දූෂණ විමර්ශන ජනාධිපති කොමිෂන් සභා වාර්තාව පිළිබඳවයි. මේ වාර්තා දෙක ඊයේ විවාදයට ගැනීමේ දී ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් කථාව ආරම්භ කිරීමට නියමිතව සිටියේ මමයි. එම අවස්ථාවේ දී ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා නැඟිටලා විරෝධය දක්වමින් කියා සිටියා, "බරපතළ වංචා, දූෂණ විමර්ශන ජනාධිපති කොමිෂන් සභා වාර්තාව දෙමළ බසට පරිවර්තනය කරලා නැහැ, සිංහල භාෂාවෙන් පමණයි තිබෙන්නේ" කියලා. එම විරෝධය සම්බන්ධයෙන් අනුකූලතාව දක්වමින් මමත් කිව්වා, එතුමා ඉල්ලා සිටින පරිදි විවාදය කල් තැබීම සුසුදුයි කියලා. නමුත්, මා ඊට පසුව මේ ගැන කරුණු සොයා බැලුවා. 2018 පෙබරවාරි මස 6වැනි දිනත් මේ වාර්තා දෙක ගැන විවාදය පැවතුණා. නමුත් ඒ අවස්ථාවේදී දෙමළ ජාතික සන්ධානයෙන් මේ භාෂා පරිවර්තන ප්‍රශ්නය මතු කළේ නැහැ.

දෙවැනි කාරණය තමයි, ඔබතුමා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව රැස් කළා. එම කාරක සභාවේ දීත් මේ ප්‍රශ්නය මතු කළේ නැහැ. එසේ නොකර ඉඳලා අන්තිම මොහොතේ එම කරුණ මතු කළේ ඇයි? ආණ්ඩු පක්ෂයට චූවමනාවක් තිබුණා, එදින බැඳුම්කර විවාදයේ දී අපි මේ සභාවේ කරුණු දැක්වීම වළක්වන්න. මොකද, මේ දින කිහිපය අගමැතිතුමා ටිකක් අපහසු තත්ත්වයෙන් ගත කරන නිසා.

එම නිසා ඒ දෙපාර්ශ්වය එකතුවෙලා යෙදූ කූට උපායක් හැටියට මේ විවාදය කල්තැබීමට කටයුතු යෙදුවාය කියන එක මම ඔබතුමාට පැමිණිලි කරනවා.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Sir, the Hon. Member should not ascribe motives for the issues that I have raised. That is prohibited by the Standing Orders of Parliament. As I said yesterday, having been in this Parliament for the longest time, from 1970, more than anybody else, he should know not to do that.

This Debate started on the 06th of February. It was adjourned for two more days. Before the Debate started itself, at the Party Leaders' Meeting, I clearly stated that if it was to be on the 06th of February, we had no objection - we wanted the Debate to take place early - but, if it was to be on the 06th of February, the TNA Members, none of us, would be able to participate. That was noted.

As the Hon. Dinesh Gunawardena correctly said yesterday, it was also noted that if the Report is in English, we will not seek the translations before the Debate. We agreed to that. The only objection I took yesterday was not in terms of the Bond Report. That was in English and we had agreed at the Party Leaders' Meeting that we will not ask for translations of that. The only objection I took was that the PRECIFAC Report was not in English. It was only in Sinhala and we had said very clearly that we will not participate on the 06th of February. But, after the 06th of February, if it had been adjourned for some date and after several weeks, still if it was only in Sinhala, I am unable to participate in a Debate that included the PRECIFAC Report.

The Hon. Vasudeva Nanayakkara says I should debate the Bond Report. I want to speak on the Bond Report as well. But I also want to speak on the PRECIFAC Report. You cannot restrict my speech only to the Bond Report. So, that was unfair. I was going by the agreement at the Party Leaders' Meeting and I am really surprised that he of all people is still persisting in this objection to my raising this matter of concern and ascribing motives on top of that.

I take strong objection to the Hon. Member ascribing motives for a very valid and legitimate concern that I raised in this House yesterday.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay. Thank you very much.

මේ කාරණයට පිළිතුරක් දීමට මට අවස්ථාව දෙන්න. මම පළමුවෙන්ම සඳහන් කරන්නට කැමැතියි, මේ කරුණ සම්බන්ධයෙන් ඊයේ තීරණය ගත්තේ ගරු සභාවෙන්. මොකද, ගරු එම්.ඒ. සුමන්තිරන් මහතාට ඒ ප්‍රශ්නය නඟන්නට නීත්‍යානුකූල අයිතියක් තිබෙනවා. සිංහල භාෂාව කියවන්නට බැරි නම් පිටු 8000ක Report එකක් ගැන කථා කිරීමට නොහැකි

[ගරු කථානායකතුමා]

තත්ත්වයක් ඇති වෙනවා. මම ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාටත් ඒ අවස්ථාවේ සඳහන් කළාම එතුමා ඒකට එකඟ වුණා. මුලින් අපි අදහස් කළේ මේ ඔක්කොම වාර්තා පරිවර්තනය කර ලැබෙයි කියා. නමුත් යම් හේතුවක් මත ඒ පරිවර්තනය ලැබීම ප්‍රමාද වුණා. ගරු ජනාධිපතිතුමාගේ කාර්යාලයෙන් මේ පරිවර්තනය ලබා ගන්න ඊයේත් අපි කථා කළා. අඩු ගණනේ මූලික වාර්තාව හෝ පරිවර්තනය කර ඉක්මනින් ලබා දෙන්න එකඟ වුණා. එම නිසා අපි මෙතැනදී වාද විවාද කරන්නට අවශ්‍ය වෙන්නේ නැහැ. එතුමාට නීත්‍යනුකූල අයිතියක් තිබෙනවා, නොදන්නා භාෂාවෙන් තිබෙන වාර්තාවක් ගැන කථා නොකර සිටීමට.

ඒ වාගේම, මම නොවෙයි ඒ තීරණය ගත්තේ. මුළු සභාවම ඒකමතිකවයි ඒ තීරණය ගත්තේ. මේ විවාදය කල් දමන්නය කියා අණ්ඩු පක්ෂයෙන් මට කිසිම අවස්ථාවක බලපෑමක් කළේ නැත කියන එක මම වගකීමෙන් යුතුව මේ අවස්ථාවේදී කියන්නට කැමැතියි.

මීළඟට, ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී හදිසියේ කෙටි කාරණාවක් මතු කරන්නට කැමැතියි.

මේ වනවිට යාපනයේ සිට බණ්ඩාරවෙලට ගමන් කළ මගීන්ද ඇතුළුව, බණ්ඩාරවෙල සිට දියතලාවට ගමන් කළ බස් රථයක අභ්‍යන්තරයේ ඇති වුණු පිපිරීමක් නිසා එහි ගමන් ගත් සිංහල, මුස්ලිම්, දෙමළ ඇතුළු හැම ජන කොට්ඨාසයකටම අයත් මගීන් විශාල අනතුරකට භාජනය වී තිබෙනවා. යුද හමුදාවේත්, ගුවන් හමුදාවේත් අය එහි සිටි බව වාර්තා කරනවා. ප්‍රවෘත්ති රට පුරා ගමන් කරන නිසා, මේ බරපතළ තත්ත්වය ඇති වුණේ කොහොමද, කුමක් නිසාද කියන එක ගැන පැහැදිලි කරමින් රජය වහාම ප්‍රකාශයක් කරන ලෙස ඉල්ලා සිටිනවා. රට තුළ වැරදි ප්‍රචාරයක් ඇති වීම බලාගෙන ඉන්න එපා. එම නිසා දැනට මේ පිළිබඳව තිබෙන නිවැරදි තොරතුරු පාර්ලිමේන්තුවට ප්‍රකාශ කරන්නය කියා මම ගරු සභානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු අග්‍රාමාත්‍යතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට ඇහුම්කන් දීලායි මම මෙතැනට පැමිණියේ.

මේ සිද්ධියෙන් පස්සේ මම පළමුවෙන්ම නීතිය හා සාමය පිළිබඳ ගරු ඇමතිතුමාගෙන් ඇහුවේ. කහගොල්ල අසළදී එම බස්රථයේ පිපිරීමක් ඇති වෙලා තිබුණා. ඒ අවස්ථාවේ සෝදිසි කර බලන විට සම්පූර්ණ පරීක්ෂණ අවසන් කර තිබුණේ නැහැ. ගරු ඇමතිතුමා මේ සභාවට ඇවිත් ඉන්නවා. යුද්ධ හමුදාවෙන් තමයි මූලික පරීක්ෂණ කර ගෙන ගියේත්. අන්තිමට වාර්තා වුණේ "ග්‍රෙනේඩ්" එකක් පුපුරා ඇති බවයි.

පසුව මම යුද හමුදාපති මහේෂ් සේනානායක මහත්මයාට කථා කළා. එතුමාත් කිව්වා, "ග්‍රෙනේඩ් එකක් කියලා තමයි හිතන්නේ, ඒ අනුව පරීක්ෂණ කටයුතු කරගෙන යනවා, යාපනයේ සිට පැමිණි කෙනෙකුගේ ගමන් මල්ලක තියෙන්න ඇති" කියලා. ඒ ගැන තවදුරටත් විභාග කරගෙන යනවා. ගරු නීතිය හා සාමය පිළිබඳ ඇමතිතුමාත් ඒ ගැන දැන් ඔබතුමන්ලා දැනුවත් කරාවි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සාගල රත්නායක ඇමතිතුමා.

**ගරු සාගල රත්නායක මහතා**
(மாண்புமிகு சாகல ரத்நாயக்க )
(The Hon. Sagala Ratnayaka)
ගරු කථානායකතුමනි, "ග්‍රෙනේඩ්" එකක් පිපිරිලා කියා තමයි ඒ සිදුවීම පිළිබඳ කළ මූලික පරීක්ෂණවලදී හෙළි වී තිබෙන්නේ. ඒ ගැන තවදුරටත් පරීක්ෂණ කරගෙන යනවා. රජයේ රස පරීක්ෂක ඒ කටයුතු ආරම්භ කර තිබෙනවා. එයින් පසුව ඊට වඩා අපිට ඒ ගැන ප්‍රතිඵල කියන්න පුළුවන් වෙයි. ඒ බස් එකේ ගමන් කළ මගියකුගේ ගමන් මල්ලක තිබුණු "ග්‍රෙනේඩ්" එකක් පිපිරිලා තමයි එහෙම දෙයක් වෙලා තිබෙන්නේ කියන එකයි දැනට විශ්වාස කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ප්‍රධාන කටයුතු යටතේ මෝටර් වාහන පනත යටතේ නියෝගය අනුමත කිරීම.

## මෝටර් වාහන පනත : නියෝගය
## மோட்டார் வாகனச் சட்டம் : ஒழுங்குவிதி
## MOTOR TRAFFIC ACT: REGULATION

[2.02 pm]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Speaker, on behalf of the Minister of Transport and Civil Aviation, I move,

"That the Regulation made by the Minister of Transport and Civil Aviation under Section 237 of the Motor Traffic Act (Chapter 203) read with Sections 21, 22, 23, 24 and 24A of the aforesaid Act and published in the Gazette Extraordinary No. 2032/36 of 18th August 2017, which was presented on 06.12.2017, be approved."

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අශෝක් අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා.

ඊට ප්‍රථම, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* **නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා]** *මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Ashok Abeysinghe, you may commence your speech.

[අ.භා. 2.03]

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහ ජනතාවට හා වාහන හිමියන්ට අවශ්‍ය සේවය ලබාදීම සඳහා ප්‍රකාශයට පත් කර ඇති 2017 අගෝස්තු 18 දිනැති අංක 2032/36 දරන නියෝගයට මෙම උත්තරීතර පාර්ලිමේන්තුවේ අනුමැතිය අපි බලාපොරොත්තු කරනවා. මෙයින් අපි බලාපොරොත්තු වන්නේ විශේෂයෙන්ම අපේ රටේ තිබෙන මෝටර් රථවාහන සඳහා තිබෙන අංක තහඩු සඳහා යම් නියාමනයක් ඇති කරලා, ඒ තුළින් මහ ජනතාවට අවශ්‍ය සේවය ලබාදීමයි. ලංකාවේ දැනට ලියා පදිංචි වාහන හැත්තෑඑක්ලක්ෂයක් පමණ තිබෙනවා. සාමාන්‍යයෙන් මෙම වාහන සඳහා දිනපතා අංක තහඩු විශාල ප්‍රමාණයක් නිකුත් කරනවා. 2017 වසරේ පමණක් මෙම අංක තහඩු 12,16,805ක් නිකුත් වී තිබෙනවා. සාමාන්‍යයෙන් මසකට අංක තහඩු ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් නිකුත් වෙනවා. මෙම අංක තහඩුවල යම්කිසි ප්‍රමිතියක් තිබෙනවා. 2013 ඔක්තෝබර් 24වැනි දින නිකුත් කරන ලද අංක 1833/27 දරන ගැසට් පත්‍රය මඟින් විශේෂයෙන්ම 280 mm x 180 mm හා 280 mm x 200 mm ප්‍රමාණයේ කහ පැහැති ප්‍රතිපුනරාවර්තන අංක තහඩු සඳහා යම්කිසි මිලක් නියම කර තිබුණා. නමුත්, සුදු පැහැති ඉදිරිපස අංක තහඩු සඳහා මිලක් නියම වෙලා තිබුණේ නැහැ. ඉදිරියෙන් එන වාහන පිළිබඳ දත්ත වාහනය තුළට ලබා ගැනීමට නවීන වාහනවල ඉදිරිපස සන්නිවේදක උපකරණ -sensors- තිබෙනවා. දැනට ඉදිරිපස සුදු පැහැති අංක තහඩුව මිලිමීටර 520 x 110 ප්‍රමාණයෙන් තමයි තිබෙන්නේ. එම අංක තහඩුව සවි කළාම නවීන වාහනවල සන්නිවේදක උපකරණය වැහෙනවා. එවිට අවශ්‍ය දත්ත වාහනය තුළට ලබා ගැනීමට හැකියාව ලැබෙන්නේ නැහැ. එම නිසා නවීන වාහනවල මිලිමීටර 280 x180 සහ මිලිමීටර 280 x 200 වැනි සුදු පැහැති ඉදිරිපස අංක තහඩු නිකුත් කරන ලෙස ඉල්ලීමක් තිබුණා. එසේ කිරීමෙන් එම වාහන හිමියන්ගේ අවශ්‍යතාව ඉටු වෙන බව සඳහන් කරලා තිබුණා. එම නිසා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව එවැනි අංක තහඩු නිකුත් කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා තමයි අපි අද පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගන්නේ. සාමාන්‍යයෙන් එවැනි අංක තහඩුවක් රුපියල් 1,500 බැගින් මිල නියම කරලා තිබෙනවා. ඒ සඳහා මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ අනුමැතිය බලාපොරොත්තු වෙනවා.

2013 වසරේ පිටු පස මිලිමීටර 280 x 180 ප්‍රමාණයේ සහ මිලිමීටර 280 x 200 ප්‍රමාණයේ අංක තහඩුවලට මිලක් නියම කරලා තිබුණත්, ඉදිරිපස අංක තහඩු සඳහා මිලක් නියම වෙලා තිබුණේ නැහැ. අපි අද මෝටර් වාහන පනත යටතේ නියෝගය අනුමත කිරීමෙන් බලාපොරොත්තු වන්නේ ඉදිරිපස අංක තහඩු සඳහා වන ගැසට් පත්‍රය පාර්ලිමේන්තුවේ අනුමත කිරීමයි. කෙසේ වෙතත්, අපි -මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව- මේ වන විට වැඩ කටයුතු රාශියක් කරගෙන යනවා. මෙම දෙපාර්තමේන්තුව සාමාන්‍යයෙන් වසරකට රුපියල් බිලියන 5ක වාගේ මුදලක් රජයේ භාණ්ඩාගාරයට ලබා දෙනවා. නව රජය බලයට පත් වුණාට පසුව, අපි 2016 වසරේදී "e-Motoring" ව්‍යාපෘතිය හරහා මෙම ආයතනයේ වැඩ කටයුතු යම් කිසි ක්‍රමානුකූලභාවයකට පත් කිරීමට ක්‍රියා කරලා තිබෙනවා. "e-Motoring" ව්‍යාපෘතිය තුළින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තිබෙන විශාල ලිපිගොනු ප්‍රමාණය අඩු කරලා, ඒ සියල්ල පරිගණකගත කරලා, පරිගණක තුළින් වාහන හිමියන්ට, පාරිභෝගිකයන්ට අවශ්‍ය සහන සලසන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ සඳහා රුපියල් මිලියන 500කට වැඩි මුදලක් අපි ඇස්තමේන්තු කරලා තිබෙනවා.

2018 වසරේ මෙම "e-Motoring" ව්‍යාපෘතිය ආරම්භ කරලා, හැකි ඉක්මනින් එම කටයුතු අවසන් කරලා ඒ තුළින් ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ සඳහා අපි 2017 වසරේ ටෙන්ඩර් කැඳවීමක් කළා. ඒ වාගේම මේ මස අවසානයේ හෝ ලබන මාසයේ මුල් සතියේදී 2018 වසරේ දෙවැනි අදියරට ටෙන්ඩර් කැඳවන්න අපි බලාපොරොත්තු වෙනවා. එයින් අපි බලාපොරොත්තු වන්නේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සතුව තිබෙන සියලුම දත්ත පරිගණකගත කරලා, මේ රටේ ජනතාවට ප්‍රමාදයකින් තොරව තමන්ගේ අවශ්‍යතා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළින් ඉෂ්ට සිද්ධ කර දීමයි. ඒ වාගේම රියැදුරු බලපත්‍ර නවීකරණය කර නිකුත් කිරීමට අවශ්‍ය වෙලා තිබෙනවා. මම හිතන විධියට පැරණි රියැදුරු බලපත්‍රයේ කාලය 2017-2018 වන විට අවසන් වෙනවා. එය නැවත අලුත් කිරීම අවශ්‍ය වෙනවා. වෙනත් දියුණු රටවල තිබෙන පරිදි රියැදුරු බලපත්‍රයට අදාළව ලකුණු ක්‍රමයක් දීලා යම් කිසි වැරැද්දක් කළාම, එම ලකුණු අඩුවීමෙන් යන ක්‍රමයක් සකස් කරන්න අපි මෙවර බලාපොරොත්තු වෙනවා. එසේ නව රියැදුරු බලපත්‍රය හඳුන්වා දීමේ ක්‍රමවේදය ඉදිරියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අනුමැතිය ලබා ගන්න අප බලාපොරොත්තු වෙනවා.

අද දින මෝටර් වාහන පනත යටතේ මෙම නියෝගය ඉදිරිපත් කිරීම තුළින් අපි බලාපොරොත්තු වන්නේ විශේෂයෙන්ම වාහන හිමියන්ගේ වාහනවල නොම්මර තහඩුවලට අවශ්‍ය ප්‍රමිතිය ලබා දීමයි. කෙසේ වෙතත්, අපේ රටේ සිටින හුඟාක් ජනතාවගේ අදහසක් තිබෙනවා, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ විශාල අක්‍රමිකතා සිදු වෙනවා කියලා. මෙම අක්‍රමිකතා නැවැත්වීම සඳහා තමයි අපි "e-Motoring" ව්‍යාපෘතිය ආරම්භ කරන්න බලාපොරොත්තු වෙන්නේ. ඒ වාගේම හැකි ඉක්මනින් එම කටයුතු අවසන් කරලා ජනතාවට අවශ්‍ය සේවය ලබා දීමට තමයි අප බලාපොරොත්තු වෙන්නේ.

අපේ රටේ දැනට සිටින සමස්ත පවුල් ප්‍රමාණය පනස්දෙලක්ෂයක් වෙනවා. නමුත් වාහන හැත්තෑඑක්ලක්ෂයක් ලියා පදිංචි කරලා තිබෙනවා. පවුල් පනස්දෙලක්ෂයක් සිටින මේ රටේ වාහන හැත්තෑඑක්ලක්ෂයක් ලියා පදිංචි කරලා තිබෙනවා. මෙයින් මෝටර්සයිකල් තිස්නවලක්ෂයක් තිබෙනවා. ත්‍රි-රෝද රථ එකොළොස්ලක්ෂ පනස්දහසක් තිබෙනවා. කුඩා මෝටර් රථ, සාමාන්‍ය මෝටර් රථ හත්ලක්ෂ පනස්දහසක් පමණ තිබෙනවා. ඒ වාගේම ද්විත්ව කාර්ය වාහන හාරලක්ෂයක් තිබෙනවා. ට්‍රැක්ටර්, ලොරි හාරලක්ෂයක් බැගින් තිබෙනවා. ඒ වාගේම ඩීසල් මෝටර් රථ දහතුන් ලක්ෂයක් තිබෙනවා. මේ විධියට තමයි අපේ රටේ තිබෙන වාහන හැත්තෑඑක්ලක්ෂයක ප්‍රමාණය සෑදී තිබෙන්නේ. ඒ නිසා මෝටර්සයිකල්වලට වෙනම අංක තහඩුත්, මෝටර් රථවලට වෙනම අංක තහඩුත් -යම් යම් මිලිමීටර ප්‍රමාණය අනුව- සකස් කළ යුතුව තිබෙනවා. ඒ නිසා මම බලාපොරොත්තු වනවා,

[ගරු අශෝක් අබේසිංහ මහතා]

මෝටර් රථ හිමියන්ට අවශ්‍ය ඒ සහනය සැලසීම සඳහා අප විසින් අද ඉදිරිපත් කරන ලද මෙම නියෝගය මේ උත්තරීතර පාර්ලිමේන්තුව අද දින අනුමත කරාවි කියා.

විශේෂයෙන්ම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී අප රටේ මහ ජනතාවට සලසනු ලබන සේවය පහසු කිරීම සඳහා අප ආරම්භ කරන e-Motoring ව්‍යාපෘතිය හැකි ඉක්මනින් අවසන් කරලා මේ රටේ ජනතාවට ඒ පහසුකමත් ලබා දෙන්න අපි බලාපොරොත්තු වනවා. මා මුලින් කිව්වා වාගේ රියදුරු බලපත්‍රය නවීකරණය කරලා, එය ලකුණු ලබා දීමේ ක්‍රමයට ඇතුළත් කරලා, ලෝකයේ දියුණු රටවල තිබෙන රියදුරු බලපත්‍රවලට සමාන රියදුරු බලපත්‍රයක් හඳුන්වා දීමත් මේ වසර තුළ කරන්න අප බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරමින්, අද මෙම නියෝගය සඳහා මෙම උත්තරීතර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.12]

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් සඳහන් කරන ලද නියෝගයේ කරුණුවලට අමතරව වර්තමාන ප්‍රවාහන ක්ෂේත්‍රය පිළිබඳව කථා කරන්න මා කැමැතියි. ගරු ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කතාවේදීත් සඳහන් කළා, වර්තමානයේ ලංකාවේ මෝටර් රථ, මෝටර්සයිකල් ඇතුළුව වාහන 71,00,000ක් ලියා පදිංචි වෙලා තිබෙන බව. සෑම අතින්ම ගත්තාම ඉතාම විශාල වාහන ප්‍රමාණයක් මේ රටේ වාර්ෂිකව ලියා පදිංචි වෙනවා. කෝටි දෙකක ජන ගහනය අත අද වාහන 71,00,000ක් තිබෙන මට්ටමට මේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ යම් පමණක සාධනීය වර්ධනයක් සිදු වෙලා තිබෙනවා. ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇති වන දියුණුවත් එක්ක කොළඹ වාගේම, තදාසන්න ප්‍රදේශවල වාගේම අනෙක් ප්‍රදේශවලත් නාගරීකරණය හරහා ඇති වන වාහන තදබදය පිළිබඳ ගැටලු ප්‍රමාණය උග්‍ර වෙමින් පවතින බව අප සෑම කෙනෙකුටම බොහොම පැහැදිලිව පෙනෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා, මේ ඇති වන වාහන තදබදය වළක්වා ලන්නට කටයුතු කිරීමට සෑම ආණ්ඩුවකටම වගකීමක් තිබෙනවා කියා. ඒ වාගේම මේ රටේ අධික වාහන සංඛ්‍යාවක් ලියා පදිංචි වීම හරහා අධික වාහන සංඛ්‍යාවක් මෙරටට ආනයනය කිරීම හරහා ඇති වන මාර්ග අනතුරු වළක්වා ගෙන වඩාත් සාධනීය ප්‍රවාහන සේවයක් මේ රටේ ජනතාවට ලබා දීමට සෑම ආණ්ඩුවකටම වගකීමක් තිබෙනවා. කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල පසු ගිය කාලය පුරාවටම ඇති වූ වාහන තදබදය පිළිබඳව අපි සෑම කෙනෙක්ම බොහොම පැහැදිලිව දන්නවා. එක් පැත්තකින් පෞද්ගලික වාහන -රෝද 4 වාහනත් ඇතුළුව මෝටර්සයිකල්, ත්‍රී වීලර් ආදී වාහන- විශාල සංඛ්‍යාවක් මේ රටේ ලියා පදිංචි කර පෞද්ගලික පරිහරණයට එකතු කර තිබෙනවා. ඒක සතුටට කරුණක්. හැබැයි අනෙක් පැත්තෙන් කනගාටුවට කාරණය තමයි, ඒ හා සමගාමීව පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයන්හි බොහොම පැහැදිලි අවගමනයක් දකින්න ලැබීම. මේ රටේ පොදු ප්‍රවාහන බස් රථ ප්‍රමාණය අඩු වෙනවා. දුම්රිය සේවාව මේ කාලයට අවශ්‍ය පරිදි දියුණු වන්නේ නැහැ. පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයන්හි ඇති වන මේ අවගමනය නිසා ජනතාව වැඩිවැඩියෙන් පෞද්ගලික වාහන පරිහරණයට කැමැත්ත දක්වනවා. මෙහිදී මතු වන ගැටලුව තමයි එක් පැත්තකින් දැඩි මාර්ග තදබදයක් ඇති වීම සහ අනෙක් පැත්තෙන් අනතුරු විශාල සංඛ්‍යාවක් සිදු වීම.

පසුගිය කාලයේ පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ අප දැකපු වැදගත්ම වර්ධනය තමයි, අධිවේගී මාර්ගය ඇති වුණාට පසුව අධිවේගී මාර්ගවල විශාල බස් රථ ප්‍රමාණයක් ධාවනය වන්න පටන් ගැනීම. මේ නිසා ප්‍රධාන නගර අතර ගමන් කිරීමේදී ජනතාව තමන්ගේ පෞද්ගලික වාහනය තියලා අධිවේගී මාර්ගවල ධාවනය කෙරෙන බස්රථවල ගමන් කරන්න පටන් ගත්තා. අපි ඉතාම සන්තෝෂයෙන් සිහිපත් කරනවා, ගාල්ල කොළඹ අතර ගමන් -ගමන් කාලය පැයක වාගේ කාලයක් වීම තුළ- ඉතාම පහසු වූ බව. අපටත් අධිවේගී මාර්ග හරහා පොදු ප්‍රවාහන මාධ්‍ය පාවිච්චි කරන්න පුළුවන් මට්ටමේ ඉතාම හොඳ සේවාවක් ඇති වුණා. හැබැයි පසුගිය කාලය පුරාවටම අනෙකුත් මාර්ගවල, ප්‍රවාහන ක්ෂේත්‍රයේ ලංගම සහ අනෙකුත් සේවාවන්හි සාධනීය වර්ධනයක් සිදු වුණේ නැති බව බොහොම පැහැදිලියි. ඒ නිසා තමයි විශේෂයෙන්ම මොරටුව සරසවිය මුල් කරගෙන JICA ආයතනයේ ආධාර සහිතව ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වුණේ. ව්‍යාපෘති වාර්තාවත් භාර දී තිබෙනවා. මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වන ඒ ව්‍යාපෘතිය ඉතාම ඉක්මනින් මේ රටේ ක්‍රියාවට නැංවිය යුතුයැයි අපි යෝජනා කරනවා. ඒ හරහා වසර 2020දී වාගේම, වසර 2025-2035 ද ඇතුළුව ඉදිරි වසර 20ක කාලය වෙනුවෙන් ලංකාවේ කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල - විශේෂයෙන්ම නාගරික ප්‍රදේශවල- ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් බොහොම පැහැදිලි සැලසුම් කීපයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒවා හරහා ඔවුන් යෝජනා කරන ප්‍රධානතම කාරණයක් තමයි අද කොළඹට කේන්ද්‍රගත වෙලා තිබෙන ආර්ථික මධ්‍යස්ථානය සහ කොළඹට කේන්ද්‍රගත වෙලා තිබෙන මේ රටේ පරිපාලන කේන්ද්‍රස්ථානය ඉක්මනින්ම වෙනස් ස්ථානවලට විස්ථාපනය කළ යුතුයි කියන එක. අපි දන්නවා, දැනට ඒ හරහා වැඩ කටයුතු කීපයක් සිදු වන බව.

ශ්‍රී ජයවර්ධනපුරකෝට්ටේ අග නගරයට කාර්යාල විශාල ප්‍රමාණයක් ගෙනැවිත් තිබෙනවා. හැබැයි, ඉන් පරිබාහිරව උපනගර දියුණු කිරීමේ වැඩසටහන ශක්තිමත්ව සිදු වන්නේ නැති බව අප සඳහන් කරන්න අවශ්‍යයි. අප දකින එකම දේ තමයි එය. අපේ ආණ්ඩුව කාලයේ ආරම්භ කරපු අධිවේගී මාර්ගය විවෘත කිරීමෙන් පසුව ගාල්ල-කොළඹ නගර ආශ්‍රිතව මේ රටේ ප්‍රධානම මධ්‍යස්ථානයක් හැටියට කොට්ටාව උපනගරය දියුණු කරන්න වැඩසටහනක් ක්‍රියාත්මක වුණා. එහි සිට දුම්රිය ස්ථානය, අධිවේගී මාර්ග පිවිසුම වාගේම ඉදිරියේදී ඇති කිරීමට යෝජිත Mass Rapid Transit System එක එහෙම නැත්නම් monorail system එක කොට්ටාව හරහා කොළඹ නගරයට ඇතුළු කරන්න ව්‍යාපෘති යෝජනාවක් තිබෙනවා. හැබැයි, අපට ඒවා පෙනෙන්නට නැහැ. අපි දැක්කා, පසුගිය කාලයේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල සඳහන් කරලා තිබෙනවා, උප නගර සංවර්ධන සැලැස්ම වාගේම කොළඹ නගරයේ තදාසන්න ප්‍රදේශවල සහ ප්‍රධාන උප නගර අතර මේ monorail system එක එහෙම නැත්නම් කුඩා දුම්රිය මාර්ග පද්ධතියක් සකස් කිරීම වැනි කාරණා. කැලණියෙන් වේවා, කොට්ටාවෙන් වේවා, මොරටුවෙන් වේවා, පානදුරෙන් වේවා ඒ එන ජනතාව කොළඹට යොමු කිරීමේ ක්‍රමවේදයක් සකස් කරන්නට අවශ්‍යයි. එහෙම නැත්නම් කොළඹ නගරයේ - අගනගරයේ- ඇතිවන වාහන තදබදය ඉතාම ඉක්මනින් ඉහළ යනවා.

පසුගිය කාල වකවානුව පුරාවට ප්‍රවාහන විශේෂඥයන් සඳහන් කරලා තිබුණා, මෝටර් රථයකින් කොළඹ නගරයේ ගමන් කිරීමේදී ධාවන වේගය පැයට කිලෝමීටර් 12, 13 දක්වා අඩුවෙලා තිබෙන බව. මේ තත්ත්වය ඉදිරියටත් පැවතුණොත්, ඊට විසඳුම් ලබා නොදුන්නොත් 2020 වර්ෂය වන විට කොළඹ ධාවනය වන වාහනයක වේගය පැයට කිලෝමීටර 8ක්, 6ක් දක්වා අඩුවෙන්නට පුළුවන් බව සඳහන් කරලා තිබෙනවා. ඒක ඉතාම නරක

තත්ත්වයක්. ගමන් කරන්නේ පැයට කිලෝමීටර 5ක්, 6ක් නම්, ඒ හරහා විශාල වශයෙන් කාලය සහ ශ්‍රමය අපතේ යාමක් සිදු වෙනවා; ඒ වාගේම ඉන්ධන පිරිවැය පැත්තෙන් බැලුවොත් අතිවිශාල ඉන්ධන ප්‍රමාණයක් දහනය වෙනවා. ඒ නිසා මාර්ග පුළුල් කිරීමේ ක්‍රමවේද අවශ්‍යයි. පසුගිය කාලයේ අපි දැක්කා, පොදු ප්‍රවාහන පද්ධතිය වෙනුවෙන් කරන කටයුත්තක්. උදේ වරුවේ සහ හවස් වරුවේ බස්රථ සඳහා පමණක් මාර්ගයේ කොටසක් වෙන් කරලා - Bus Lane - ප්‍රමුඛතාව ලබාදීලා තිබුණා. බස් රථ ධාවනය සඳහා ප්‍රමුඛතා මං තීරුවක් හඳුන්වා දීලා තිබුණා. අපි ඒක අගය කරනවා. ඒක හොඳ කටයුත්තක්. අපි දැක්කා, ඒ කාල වේලාව තුළ බස් රථවල ගමනාගමනය කලින් තිබුණාට වඩා යම්කිසි ප්‍රමාණයකින් වේගයේ වැඩිවීමක් සිදුවෙලා තිබෙන බව. අවස්ථා කිහිපයකදී මේ වාගේ කටයුතු කිහිපයක් ආරම්භ කළා. අපි දැක්කා, මොරටුව නගරයෙන් ආරම්භ කරලා කොළඹ නගරයට ඇතුළුවීමට පොදු ප්‍රවාහන සැලැස්මක් තිබූ බව. කාර් රථ ගාල් කරලා - park - කරලා එතැන් සිට කොළඹට එන්න ප්‍රවාහන සේවා සැකසුවා. හැබැයි, අඛණ්ඩව මේවා ගැන පසුවිපරමක් තිබුණේ නැති නිසා වසරක් යනකොට ඒ වැඩසටහන් අක්‍රිය වුණා.

අද කොළඹට ඉදිරිපත් කරලා තිබෙන බස් ප්‍රමුඛතා මං තීරු ක්‍රමය තුළත් අපි දකිනවා, ඒ කටයුත්ත ආරම්භ කරපු අවස්ථාවේදී තිබුණු ජවය නැති බව. උදේ වරුවට පටන්ගත් මේ ප්‍රමුඛතා මං තීරු ක්‍රමය පළවෙනි මාස දෙකේ තිබුණා. හැබැයි, මාස කිහිපයක් ගතවෙනකොට ප්‍රමුඛතා මං තීරුවේ ගමන් කරන්නේ බස් රථ පමණක් නොවෙයි. කාර් රථ, ලොරි රථ සහ අනිකුත් සියලු රථ ප්‍රමුඛතා මං තීරුවේ ගමන් කරනවා. ඒ නිසා මේ වෙනුවෙන් අඛණ්ඩව කැප වෙන වැඩ පිළිවෙළක් සහ අඛණ්ඩව මේ පිළිබඳව පසු විපරම් කරන යන්ත්‍රණයක් අවශ්‍යයි කියා අපි යෝජනා කරනවා. එහෙම කළේ නැත්නම් ඊළඟ වසර වෙනකොට - ලංකාවේ දැනට වාහන ලියාපදිංචි කිරීමේ වේගයත් සමඟ- අතිවිශාල වාහන ප්‍රමාණයක් මේ රටට පැමිණීමත් සමඟ කොළඹ නගරයේ වාහන තදබදය ඉතා අධික ලෙස වැඩිවෙන බව කියන්නට අවශ්‍යයි.

මේ හා බැඳුණු ඉතාම වැදගත් කාරණය තමයි ලංකාවට ගෙනෙන මේ අතිවිශාල වාහන ප්‍රමාණයත් සමඟින් මාර්ග අනතුරුවල පැහැදිලි වැඩිවීමක් වුණා කියන කාරණය. සෑම දවසකම රූපවාහිනියේ සෑම channel එකකම වාගේ ප්‍රවෘත්තිවලින් අතිවිශාල ප්‍රමාණයක මාර්ග අනතුරු පිළිබඳව පෙන්වනවා. මේ මාර්ග අනතුරු නිසා අතිවිශාල ජීවිත සංඛ්‍යාවක් අපේ රටට අහිමි වෙනවා. ඒ සෑම ජීවිතයක්ම වටිනවා. නමුත් ඛේදනීයම කාරණය වන්නේ මාර්ග අනතුරුවලින් වැඩියෙන්ම අපේ රටට අහිමි වෙන්නේ රටේ ජීවනාලිය බඳු ඉතාම තරුණ සහ මැදි වයසේ ජීවිත වීම. පසුගිය කාල වකවානුව පුරා අපි දැක්කා, මේ අනතුරුවලින් මිය යන සහ සදාකාලික -පූර්ණකාලීන- ආබාධිත තත්ත්වයට පත්වුණු අතිවිශාල පිරිසක් ඉන්නා බව. හැබැයි, මේ අනතුරු පිළිබඳ විශ්ලේෂණය කිරීමේදී බොහොම පැහැදිලිව පෙනෙන්නට තිබෙන කාරණය තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනතුරුවලින් මිය යන සංඛ්‍යාව නාගරික ප්‍රදේශවල යම් පමණකට අඩුයි කියන එක. ඒකට හේතු දෙකක් තිබෙනවා. එකක් තමයි කොළඹ ඇතුළු නාගරික ප්‍රදේශවල වේගයෙන් වාහන ධාවනය කරන්න බැහැ. වේගයෙන් වාහන ධාවනය කරන්න බැරි නිසා සිදුවෙන අනතුරෙන් වන හානිය අඩුයි. වාහන වේගයෙන් යන්නේ නැති නිසා අනතුරුවලින් වෙන මරණීය අනතුරු ප්‍රමාණය සහ ඉතාම දරුණු අනතුරු ප්‍රමාණය අඩුවෙලා තිබෙනවා.

අනික් පැත්තෙන් බැලුවොත්, කොළඹ සහ නාගරික ප්‍රදේශවල අනතුර සිදුවුණාට පසු ගෙනියන්නට පුළුවන් රෝහල් තිබෙනවා; ඒ වාගේම එම ස්ථානවල හදිසි ප්‍රතිකාර ඒකක ඉතාම ශක්තිමත්ව තිබෙනවා. ඒ නිසා මාර්ග අනතුරු නිසා සිදුවන මරණ සංඛ්‍යාව සහ අනතුරු සංඛ්‍යාව පිළිබඳ විශ්ලේෂණය කිරීමේදී පැහැදිලිව පෙනෙන කාරණය තමයි නාගරික ප්‍රදේශවල දරුණු අනතුරු අඩුයි කියන කාරණය. සමහර විට ප්‍රවාහන අපහසුතා නිසා සහ ළඟ පහසුකම් සහිත රෝහලක් නොමැතිවීම කියන කරුණු නිසාත් ජීවිත හානි විශාල ප්‍රමාණයක් වෙනවා. ඒ නිසා මේ ප්‍රතිඵල හරහා අපට පෙන්වන කාරණය තමයි නාගරික ප්‍රදේශවලින් පරිබාහිරව මෙවැනි අනතුරු වඩාත් සිදුවන ස්ථාන පිළිබඳ අවධානය යොමු කරලා, රෝහල් ආශ්‍රිතව හදිසි ප්‍රතිකාර ඒකක ඇති කරන්නට අවශ්‍යයි කියන කාරණය. එහෙම හදිසි ප්‍රතිකාර ඒකක ඇති කළොත්, ජීවිත විශාල ප්‍රමාණයක් බේරාගන්න පුළුවන් හැකියාව තිබෙනවා. ඒක අත් දැකීමෙන් අපි දන්නවා.

ගාල්ල ප්‍රදේශයේ කරාපිටිය රෝහලට අනුබද්ධිතව හදිසි ප්‍රතිකාර ඒකකයක් ස්ථාපනය කළා. ඒ හදිසි ප්‍රතිකාර ඒකකයට මාර්ග අනතුරුවලින් පමණක් නොවෙයි හෘදය අකරණිය සහ පාර්ශ්වික ආඝාතය වැනි හදිසියේ ඇතිවන ආබාධ තත්ත්වයන්ට ලක්වෙලා රෝගීන් දහස් ගණනක් ගෙන එනවා. මේ වෛද්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම හරහා ඒ රෝගීන් සියලුදෙනාගේම ජීවිත බේරා ගන්නට පුළුවන් පසුතලයක් සැකසුණා. ඒ නිසා අපි සමගාමීව එක් පැත්තකින් මාර්ග අනතුරු අඩු කර ගැනීම පිළිබඳ අවධානය යොමු කරන්න අවශ්‍යයි; අනෙක් පැත්තෙන් මාර්ග අනතුරු සිදු වෙන රෝගීන්ට හදිසි ප්‍රතිකාර ලබාදීමේ ක්‍රමවේදයන් සකස් කරන්න අවශ්‍යයි. ඒ අර්ථයෙන් ගත්තාම, පසුගිය කාලයේ තදාසන්න ප්‍රදේශවල -කොළඹ සහ අර්ධ නාගරික ප්‍රදේශවල- හදිසි ගිලන් රථ සේවාවක් ආරම්භ කළා. අප එය අගය කරන්න අවශ්‍යයි. ඒක හොඳ කාරණයක්. මේ ආණ්ඩුවෙන් විශාල ලෙස කරපු අකටයුතුකම්, මේ රටේ ආර්ථිකයට කරපු හානි විශාල ප්‍රමාණයක් තිබුණා. හැබැයි, මේ ආණ්ඩුව කරපු එක හොඳ කාරණයක් තමයි හදිසි අනතුරුවලින් සහ හදිසි ප්‍රතිකාර වෙනුවෙන් හදිසි ගිලන්රථ සේවාවක් - ambulance service - ආරම්භ කිරීම. ඒ හරහා රෝගී ජීවිත විශාල සංඛ්‍යාවක් බේරා ගන්න පුළුවන් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ මාර්ග තදබදය පිළිබඳ කාරණයේදී ආණ්ඩුව මේ සඳහා මීට වඩා සක්‍රියව දායකත්වය ලබා දෙන්නට අවශ්‍යයි කියලා මම යෝජනා කරනවා. එහෙම නොවුණොත් අතිවිශාල ජීවිත ප්‍රමාණයක් අහිමි වෙන්න ඉඩ තිබෙනවා. ඊට අමතරව, මාර්ග තදබදය හරහා මේ රටේ ජනතාවට විශාල කාල ප්‍රමාණයක් අහිමි වනවා; ඉන්ධන පැත්තෙන් අතිවිශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. පසුගිය කාලයේ -අපේ ආණ්ඩුව කාලයේ- ප්‍රවාහන ක්ෂේත්‍රයට සමගාමීව මේ රටේ ඉතා සාධනීය වෙනස්කම් කිහිපයක් සිදු කළා. එහි ප්‍රධානම කාරණය, අධිවේගී මාර්ග පද්ධතියක් හරහා මේ රටේ විවිධ ප්‍රදේශ යා කරන්න උත්සාහ කිරීමයි. ඒ කාර්යය ඉදිරියට ගෙන යන්න අවශ්‍ය නම් මේ අධිවේගී මාර්ග හා සම්බන්ධ කරලා මාර්ගයට ඉහළින් ගමන් කරන monorail system එකක්, එහෙම නැත්නම් පොදු ප්‍රවාහන පද්ධතියක් දියුණු කරන්න කියලා මම යෝජනා කරනවා. බස් වෙනුවෙන්, දුම්රිය වෙනුවෙන් කරන රජයේ ආයෝජනය සාධනීය නොවන බව බොහොම පැහැදිලියි. එම නිසා පොදු ප්‍රවාහන ක්ෂේත්‍රය දියුණු කරන්න අවශ්‍ය ආයෝජන කරන ලෙසට අපි ආණ්ඩුවට යෝජනා කරනවා. එහෙම කළොත් තමයි මේ රටේ ඇතිවන ප්‍රවාහන අර්බුදය ඉදිරි කාලයේදී නැති කරන්න පුළුවන් වන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
*மாண்புமிகு அசோக் அபேசிங்க ர)*
(The Hon. Ashok Abeysinghe)

අපි දැනටමත් විදේශ ආයෝජකයන් සමඟ එකතු වෙලා එවැනි වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න වැඩ පටන්ගෙන තිබෙනවා. මූලික වැඩකටයුතු අවසන් කරලා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ඔබතුමන්ලා කරනවා නම් හොඳයි. හැබැයි, තවම කිසිවක් පෙනෙන්න නම් නැහැ.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මාලබේ සිට කොල්ලුපිටිය දක්වා ආරම්භ කර තිබෙනවා. එය කරන්නේ විදේශ ආයෝජනයත් සමඟ.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
මට හිතෙන්නේ අපට තමයි ඒවා විවෘත කරන්න වෙන්නේ. ඉක්මනින් කරන්න. නැත්නම් ඔබතුමන්ලාට මුල් ගල තියලා නිකම් ඉන්න වෙයි.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඔබතුමන්ලාට විවෘත කරන්න වෙන්නේ නැහැ. මොකද, මේක 2023දී විවෘත කරනවා. ඔබතුමන්ලාට 2035 වනතෙක් ඉන්න වෙනවා.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ඒ බව පෙනෙනවා, මැතිවරණ ප්‍රතිඵලවලින්.

[අ.භා. 2.24]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෝටර් වාහන පනත යටතේ ඉදිරිපත් කර ඇති නියෝගය පිළිබඳව අද දින පැවැත්වෙන විවාදයට සම්බන්ධ වීමට මට අවස්ථාවක් ලබා දීම ගැන සියලුදෙනාටම ස්තුතිවන්ත වනවා.

අපේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහන් කළ පරිදි අද නවීන තාක්ෂණයෙන් යුත් මෝටර් වාහනවලට සරිලන පරිදි 2000 ආරම්භ කරන ලද මෙම පනතට අලුත් වගන්ති ගෙනැල්ලා, මෝටර් රථ වාහන නියාමනය කිරීමට, ව්‍යාජ අංක තහඩු මඟින් කරන අපරාධ පාලනය කිරීමට සහ ඒ තුළින් ජනතාවට සහනයක් ලබා දීමට තමයි රජය බලාපොරොත්තු වෙන්නේ. මහාමාර්ග සහ ප්‍රවාහනය කියන්නේ අපේ රටේ ඉතාම වැදගත් අංශයක් බව අපි දන්නවා. මෙහි සමාජයීය හා ආර්ථික වශයෙන් ඇති වැදගත්කම හිතලා තමයි මේ ආණ්ඩුව මෙන්ම පසුගිය ආණ්ඩු මේ අංශය සඳහා විශාල මුදලක් ආයෝජනය කරලා, ඉස්සරහාට අරගෙන ගිහිල්ලා තිබෙන්නේ. අධිවේගී මාර්ග, මහාමාර්ග මෙන්ම දුම්රිය, බස් රථ වැනි දේවල්වලට රජය විසින් වාර්ෂිකව විශාල මුදලක් ආයෝජනය කරනවා; වැය කරනවා. රජය ඒ තුළින් බලාපොරොත්තු වනවා, ජනතාවට හොඳ ප්‍රවාහන සේවයක් ලබා දෙන්න. මේ රජය විතරක් නොවෙයි, පසුගිය රජයන් කීපයක්ම මේ අංශය පිළිබඳව අවධානය යොමු කරලා, ඉදිරියට ගෙන ගියා. නමුත් කනගාටුවට කරුණ තමයි, විනයක් නැති, වැඩිම මාර්ග අනතුරු සහිත, විශාල ප්‍රමාණයකින් මිනිස් ජීවිත නැති වන අංශයක් හැටියට අපේ ප්‍රවාහන සේවය අද වන කොට ලෝකයේම නම් දරලා තිබෙනවා. අපට මේ ප්‍රශ්නය මුදල් මතින් පමණක්ම විසඳන්න බැහැ.

අපි විශේෂයෙන්ම දේශපාලන වාසි පසෙකලා ජනතාව දැනුවත් කළ යුතුයි. අපි විනය ගරුක ජනතාවක් බිහි කරලා, රියැදුරන්ට පුහුණුවක් දීලා, මහාමාර්ගවල ගමන් කරන කොට ආත්මාර්ථකාමී වෙන්නේ නැතුව -තමන් ගැනම සිතන්නේ නැතුව - පොදු සමාජය ගැන සිතලා කටයුතු කළ යුතු බව දැනුවත් කළ යුතුයි. අපේ රට සමාජයීය සහ ආර්ථික වශයෙන් ඉස්සරහාට යන්නට මාර්ග පද්ධතිය දියුණු කරනවා මෙන්ම, එය නියාමනය කිරීමට අවශ්‍ය බවත් මම මේ අවස්ථාවේදී මතක් කර දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රියැදුරන්ගේ විනය ආරක්ෂා කිරීම සඳහා අපි පසුගිය කාලයේ දඩ මුදල වැඩි කරන්නට යෝජනා කළා. එම දඩ මුදල ගැන මම තර්ක කරන්නේ නැහැ. නමුත්, ඒ වෙලාවේදී ඒකට විරුද්ධව පෙළපාළි ගියා. පෙළපාළි ගියේ, වැරදි නොකරන මිනිසුන්ට දඩ ගහන්න එපා කියලා නොවෙයි. වැරදි කළත් දඩ ගහන්න එපා කියලා. මාර්ග පද්ධතිය තුළ සිදු වන මරණ සංඛ්‍යාව බැලුවොත්, දවසකට මරණ 7 - 8ක් සිදු වන බව පෙනෙනවා.

මම හිතන විදියට අවුරුද්දකට අපේ මාර්ග පද්ධතියේ මරණ තුන්දහසකට වඩා සිද්ධ වෙනවා. ඒ වාගේම ඒ මාර්ග පද්ධතියේ සිද්ධ වන රිය අනතුරුවලින් තුවාල ලබන අයට රැකියාවක් කර ගන්න බැරුව යාම නිසා විනාශ වන මුදල, එහෙම නැත්නම් විනාශ වන කාලය ගැන බැලුවොත් අපගේ මාර්ග පද්ධතිය පිළිබඳව අපට සෑහීමකට පත් වෙන්න බැහැ. මේ මාර්ග පද්ධතිය පිළිබඳව විග්‍රහ කිරීමේදී අපේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමාත් කිව්වා, වාහන ලක්ෂ හැත්තෑඑකක් ලියා පදිංචි කරලා තිබෙනවාය කියලා. ඒ වාහන ලක්ෂ හැත්තෑඑක ලියා පදිංචි කිරීම සම්බන්ධවත් අප සියලු දෙනාම වග කියන්න ඕනෑ. අපේ රටේ හොඳ පොදු ප්‍රවාහන පද්ධතියක් නැහැ. ජනතාවට කොහේ හරි යන්න, විශේෂයෙන්ම රාත්‍රී කාලයේ කොහේ හරි යන්න, නැත්නම් විවිධ වැඩ කටයුතු කර ගන්න ඕනෑ වුණාම අපේ ප්‍රවාහන පද්ධතිය පාවිච්චි කරලා ඒ වැඩ කටයුතු කාර්යක්ෂම ලෙස කර ගන්න බැහැ කියන පණිවුඩය තමයි ජනතාව දීලා තිබෙන්නේ. ඒ නිසා අවුරුදු ගණනාවක් තිස්සේ විශාල මුදලක් වියදම් කරලාත් අපේ ප්‍රවාහන පද්ධතිය සහ මාර්ග පද්ධතිය මේ තත්ත්වයට පත් වී තිබීම ගැන අප සියලු දෙනාම කනගාටු වෙන්න ඕනෑ. ඒ නිසා ජනතාවට යම් කිසි සහනයක් වන අයුරින් මේවාට විසඳුම් දෙන්න අප සියලු දෙනාම ඉදිරියේදී වැඩ කරන්න ඕනෑ.

අධිවේගී මාර්ග පද්ධතිය තුළින් අපේ විශාල නගර සම්බන්ධ කිරීම ඉතාම කාර්යක්ෂම වුණා කියන කාරණයට මා එකඟ වනවා. මේ වන විට මේ රටේ අධිවේගී මාර්ග පද්ධතිය විනයක් ඇතුව ක්‍රියාත්මක වනවා. නමුත් ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, අධිවේගී මාර්ගවලට ඉතා විශාල මුදලක් වියදම් කරන්න වීමයි. ආර්ථික වශයෙන් තවම දියුණු වෙමින් පවතින රටක් වන අපේ රටට අනෙක් රටවලට සාපේක්ෂව, අධිවේගී මාර්ග පද්ධතිය දියුණු කරන්න විශාල මුදලක් වැය කරන්න සිද්ධ වුණා. අපට නිදහස ලැබුණු දිනයේ පටන් හරි සැලසුමක් ඇතුව අපේ නගර නිර්මාණය -නිවාස ඉදිකිරීම්, නැත්නම් අනෙකුත් ඉදිකිරීම්- කරලා තිබුණේ නැහැ; අනෙකුත් දේවල් නිර්මාණය කරලා තිබුණේ නැහැ. ඒ නිසා අධිවේගී මාර්ග සංවර්ධනය කරන්න යනකොට ඒ ඉඩම් හිමියන්ට විශාල ලෙස වන්දි ගෙවන්න අපට සිදු වුණා. ඒ වාගේම සමහර වෙලාවට දුෂ්කර පැති හරහා අධිවේගී මාර්ග ඉදිකිරීම නිසා අධික වියදමක් දරන්න සිද්ධ වුණා. අධිවේගී මාර්ග

සම්බන්ධයෙන් ඉදිරි සැලසුම් කරන කොට ඒ දුෂ්කරතා මහ හැරලා ඒ කටයුතු කරන්න අපි බලාපොරොත්තු වනවා. මේ වනකොට වත්මන් රජය විධියට අපි ඉතාම සාධාරණ වියදමකින් මේ අධිවේගී මාර්ග පද්ධතිය සංවර්ධනය කර ගෙන යනවා. අපි ඒ කටයුතු නවත්වා නැහැ. විශේෂයෙන්ම හම්බන්තොට, ඒ වාගේම නුවර, රත්නපුරය වැනි විශාල නගරවලට කොළඹ සිට සම්බන්ධ වන්න පුළුවන් ආකාරයට අපි අධිවේගී මාර්ග පද්ධතිය මේ වනකොට සංවර්ධනය කර ගෙන යනවා.

අද මේ සභාවේ කථා කළා, monorail පද්ධතිය පිළිබඳව. පසුගිය රජය විසින් monorail පද්ධතිය සම්බන්ධයෙන් වාර්තා කැඳවා ඒ වැඩ කටයුතු යම් කිසි දුරකට කර ගෙන ගිහිල්ලා තිබුණා. නමුත්, monorail පද්ධතියේ ප්‍රශ්නය වෙලා තිබෙන්නේ වියදම වැඩිවීමයි. එක මගියෙකුට දරන්න වන වියදමත්, ඒ වාගේම අපේ රටේ සිටින ජනගහනයට ඒ monorail පද්ධතිය ඔරොත්තු නොදීම නිසාත් අපේ ප්‍රවාහන ප්‍රශ්නය ඒ monorail පද්ධතිය තුළින් විසඳෙයිද කියන ප්‍රශ්නය පැන නැඟුවා. ඒ හින්දා තමයි වත්මන් රජය නැවත බලයට පැමිණි පසු සැහැල්ලු දුම්රිය පද්ධතියක් - light rail system එකක් - තුළින් අපට monorail පද්ධතියට වඩා විශාල මගීන් සංඛ්‍යාවක් ගෙන යන්න පුළුවන් කියන සාධකය සලකා බැලුවේ. ඒ අනුව මේ වනකොට ඒ සම්බන්ධයෙන් අධ්‍යයන වාර්තා ඇවිල්ලා තිබෙනවා. ඒ අනුව ජපානයත් සමඟ එකතු වෙලා ඉතාම ඉක්මනින් ඒ වැඩ කටයුතු අවසන් කරන්න අපි බලාපොරොත්තු වනවා. මේ වනකොට අපි ඒ වැඩ කටයුතු පටන් ගෙන තිබෙනවා.

මාර්ග තදබදය අඩු කරන රාජගිරිය ගුවන් පාලම වැනි ව්‍යාපෘති සම්බන්ධයෙන් කටයුතු කරන්නත් ඉදිරියේදී අපි බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම කොළඹ සහ ඒ ආසන්න ප්‍රදේශවල මාර්ග දීර්ඝ කාලයක් තිස්සේ හරිහැටි සැලැස්මක් අනුව, ඒ වාගේම වැඩිවන වාහන සංඛ්‍යාව අනුව වෙනස් කරලා තිබුණේ නැහැ. ඒ හින්දා තමයි මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය, ඒ වාගේම මහාමාර්ග අමාත්‍යාංශය, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය ආදී අමාත්‍යාංශ එකතු වෙලා මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ. මේවා ලෙහෙසියෙන් විසඳන්න පුළුවන් කාරණා නොවෙයි. මොකද, නගර සැලැසුම් නැතිව තමයි මේවා දීර්ඝ කාලයක් තිස්සේ ජනාකීර්ණ වෙලා තිබෙන්නේ. මේ පාරවල් හැදිලා තිබෙන්නේත් සැලැසුම් නැතිවයි. පංගුවක් වෙලාවට අනුමැතියක් නැතිව ගොඩනැඟිලිත් හැදිලා තිබෙනවා. අනුමැතියක් නැතිව තවත් නොයෙකුත් දේවල් වෙලා තිබෙනවා. ඒ හින්දා මේ රජයට පමණක් නොවෙයි, බලයට එන මොනම රජයකට වුණත් මේ ප්‍රශ්න විසඳන්න විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අනිවාර්යයෙන්ම computers භාවිතය මඟින් කාර්යක්ෂම කරන්න ඕනෑය කියන දැඩි මතයේ අපි ඉන්නවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදීත් අපි කිව්වා, මේ දෙපාර්තමේන්තුව කාර්යක්ෂම කළේ නැත්නම් විශාල අක්‍රමිකතා, ඒ වාගේම ජනතාවට අපහසුතාවට පත්වන්න සිද්ධ වනවා කියලා. නමුත්, අපි දන්නවා මේ රටේ සමහර නිලධාරින් මේවා කාර්යක්ෂම වෙනවාට කැමැති නැති බව. සමහර නිලධාරින් මේ තොරතුරු කොම්පියුටර්ගත වෙනවාට කැමැති නැත්තේ මොකද? ඒගොල්ලන්ට ඒ තුළින් වංචා හා දූෂණ කරන්නට බැරි වන නිසායි. එහෙම කළොත් ඒගොල්ලන්ට එදිනෙදා ලැබෙන ගතමනාව ලැබෙන්නේ නැහැ. එම නිසා සමහර නිලධාරින් මේ ආයතනවලට තාක්ෂණය හඳුන්වා දීමට බාධා කරනවා. ඒ බව අපි කියන්නට ඕනෑ. "මේ දවසට මේක ඉවර කරලා මේ ටෙන්ඩර් එක දාන්න" කියා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙන් සහ අනෙක් කාරක සභාවලින් නියෝග දුන්නත් එහෙම කරන්නේ නැති නිලධාරින් සිටියා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. එම නිසා ඒ නිලධාරින් කෙරෙහි අවධානය යොමු කරලා ඒ නිලධාරින් ඒ ස්ථානවලින් අයින් කරලා මේ ආයතනවලට තාක්ෂණය ගෙනැල්ලා, ඒ තුළින් අපේ ජනතාවට ඉතාම හොඳ සේවාවන්, වංචාවෙන් හා දූෂණයෙන් තොර සේවාවන්, අපේ ප්‍රවාහන පද්ධතිය නවීන ලෝකයට ගෙනයන්නට පුළුවන් සේවාවන් සකස් කරන්නට අපට සිද්ධ වෙනවා. ඒ සඳහා අපි සියලුදෙනාම සහයෝගය ලබාදෙනවා. ඒවා අපි මේ රටේ ජනතාව වෙනුවෙන් කරන්න ඕනෑ.

අපි කළ යුත්තේ මේ රටේ තව තවත් වාහන වැඩි කරන එක නොවෙයි; කාර්යක්ෂම සහ ජනතාවට පහසුවෙන් වාගේම වැඩි වියදමකින් තොරව ලබා ගත හැකි පොදු ප්‍රවාහන සේවයක් ස්ථාපනය කිරීමයි. ආසියාවේ දියුණු රටවල් එවැනි ප්‍රවාහන පද්ධති ස්ථාපනය කර තිබෙනවා.

ආසියාවේ දියුණු රටවල ස්ථාපනය කර තිබෙන දියුණු පොදු ප්‍රවාහන පද්ධතිය හා සමාන පොදු ප්‍රවාහන පද්ධතියක් අපේ රටේත් ස්ථාපනය කළ යුතුයි. නමුත්, මම දන්නවා අපට ඒ සඳහා බලපාන සංකීර්ණ ගැටලු තිබෙන බව. මොකද, දීර්ඝ කාලීන සැලසුම් අනුව නොවෙයි අපේ නගර සහ අනෙකුත් දේවල් බිහි වෙලා තිබෙන්නේ. නමුත්, ඒවා අබිබවා ගිහින් ජනතාවට අවශ්‍ය සහන ලබාදීලා අපි ඉස්සරහට යන්නට කටයුතු කරන බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 2.35]

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று நடைபெறுகின்ற மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதி தொடர்பான விவாதத்திலே கலந்துகொண்டு சில விடயங்களை முன்வைக்க விரும்புகின்றேன். மிக முக்கியமாக இந்தச் சட்டத்தின் கீழான ஒழுங்குவிதியானது, இலங்கையின் பல்வேறு பகுதிகளிலுமுள்ள போக்குவரத்து நெரிசலைக் குறைத்து, மக்களுடைய போக்குவரத்தை இலகுபடுத்தும் வகையிலே முன்வைக்கப்பட்டிருக்கின்றது. இந்த ஒழுங்குவிதியை நிறைவேற்றுவதனூடாக, நாட்டில் போக்குவரத்துச் சேவைகள் இன்னும் மேன்மையடையும் என்று கருதப்படுகின்றது. இவ்வாறான ஒழுங்குவிதிகள் இச்சபையில் கொண்டுவரப்படுகின்றபொழுது, மோட்டார் வாகனச் சேவைகள் குறிப்பாக, இலங்கைப் போக்குவரத்துச் சபையினூடான பேருந்துச் சேவை மற்றும் அதனோடு இணைந்த ரயில் போக்குவரத்துச் சேவை என்பன இலங்கையிலே வாழ்கின்ற மக்களுக்குச் சரியான முறையில் கிடைக்கின்றனவா? அல்லது அவர்கள் சரியான முறையில் பயன்படுத்தக்கூடிய வகையில் அவை இருக்கின்றனவா? என்கிற விடயம் இந்த நாட்டிலே பல தடவைகள் கேள்விக்கு உட்படுத்தப்பட்டிருக்கிறது. இலங்கைப் போக்குவரத்துச் சபையானது -SLTB- தெற்கிலே ஒரு வகையான செயற்பாட்டுத் திட்டத்தை முன்னெடுத்துச் செல்கின்ற அதேநேரம், வடக்கிலும் கிழக்கிலும் இன்னுமொரு வகையான செயற்பாட்டுத் திட்டத்தை முன்னெடுத்துச் செல்கின்றது.

கடந்த காலங்களில் யுத்தத்தைக் காரணம் காட்டி, பல இடங்களில் இலங்கைப் போக்குவரத்துச் சபையின் சாலைகள் இயங்க முடியவில்லை. இப்பொழுது அந்தச் சாலைகளை இயக்குவதற்கான செயற்பாடுகள் முன்னெடுக்கப்பட்டாலும் சாரதி, நடத்துநர் போன்ற பதவிகளுக்கு அந்தந்த மாவட்டங்களைச் சேர்ந்தவர்கள் நியமிக்கப்படாமல், வேறு

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

மாவட்டங்களைச் சேர்ந்தவர்கள் அங்கு பணியாற்றுகின்ற ஒரு சூழல் காணப்படுகின்றது. இதனால், அந்தச் சாலைகள் கேட்பாரற்ற நிலையில், அபிவிருத்தியடையாத நிலையில், பாதுகாப்பற்ற நிலையில் காணப்படுகின்றன என்பதை நான் இங்கு குறிப்பிட வேண்டும். குறிப்பாக இலங்கைப் போக்கு வரத்துச் சபையின் கிளிநொச்சி சாலையானது, 14 பேருந்து களுடன் ஒரு சுற்றுவட்டத்துக்குள் மட்டும் தன்னுடைய பணியைச் செய்கின்ற, வருமானத்துக்காக மட்டும் உழைக்கின்ற - வியாபார நோக்கத்தோடு செயற்படுகின்ற தாகக் காணப்படுகின்றது. கிளிநொச்சி மாவட்டத்தின் பல கிராமங்களைச் சேர்ந்த மக்கள் இப்பொழுதும் இந்தப் போக்கு வரத்துச் சேவையை எதிர்பார்த்திருக்கிறார்கள். குறிப்பாக, ஏழ்மையில் வாழுகின்ற அக்கிராமங்களைச் சேர்ந்த மக்கள் பல்வேறு இன்னல்களுக்கு மத்தியில் தங்களுடைய அன்றாடப் பணிகளை மேற்கொள்வதற்குக் கஷ்டப்படுகின்றார்கள். அதிலும் குறிப்பாக மாயவனூர், உதயநகர், விவேகானந்தநகர், கிருஷ்ணபுரம், பாரதிபுரம், மலையாளபுரம், பள்ளிக்குடா, வலைப்பாடு போன்ற கிராமங்களில் வாழுகின்ற மக்கள் தங்களுடைய அன்றாடப் பணிகளை மேற்கொள்வதற்கு மிகவும் கஷ்டப்படுகின்றார்கள்.

மேலும், ஒரேயொரு பேருந்தின்மூலம் இயங்குகின்ற யாழ்ப்பாணம் - ஸ்கந்தபுரத்துக்கான முட்கொம்பனூடான சேவையானது, பாடசாலை நடைபெறுகின்ற கிழமை நாட்களில் மட்டும்தான் இடம்பெறுகின்றது. ஏனைய நாட்களான சனி, ஞாயிற்றுக்கிழமைகளில் அந்தச் சேவையில்லாத காரணத்தினால், அங்கே விசேட வகுப்புகளுக்காகச் சென்றுவருகின்ற பள்ளி மாணவர்கள் தங்களுடைய கல்வி நடவடிக்கைகளை மேற்கொள்ள முடியாத அல்லது அன்றாட நடவடிக்கைகளை மேற்கொள்ள முடியாத ஒரு சூழலுக்குள் தள்ளப்பட்டிருக்கின்றார்கள். எனவே, இலங்கைப் போக்குவரத்துச் சபையினால் இதுவரை சரியான பணியை அவர்களுக்கு வழங்க முடியவில்லை என்பது துரதிஷ்டவசமானது. பல தடவைகள் நாங்கள் இந்த விடயம் தொடர்பாக இந்தச் சபையினூடாகக் குறிப்பிட்டிருக்கின்றோம். இதனைவிட, போக்குவரத்துச் சபையினுடைய தலைவருக்கும் போக்குவரத்து அமைச்சர் அவர்களுக்கும் எழுத்துமூலமான கோரிக்கை விடுக்கப்பட்டிருக்கின்றது. ஆனால், இந்தப் பணிகளிலே எந்தவிதமான முன்னேற்றமும் இதுவரை காணப்படவில்லை என்பதுதான் முக்கியமானது. பேருந்து களின் பல சேவைகள் இடம்பெறாமைக்கு, வீதிகள் சரியாக இல்லை; குறித்த வீதிகளைப் பயன்படுத்த முடியாமலிருக் கின்றது என்ற காரணங்கள் அவர்களால் சொல்லப்படுகின்றன. வீதிகள் சரியாக இல்லை என்பதற்காக ஒரு பகுதியிலே வாழ்கின்ற மக்களுக்கான போக்குவரத்துச் சேவையை ஒட்டுமொத்தமாக நிராகரிக்கக்கூடிய சூழலை நாங்கள் உருவாக்க முடியுமா? ஆகவே, இந்த விடயம் தொடர்பில் அதிகமான கவனம் செலுத்தப்பட வேண்டும்.

இந்த நாட்டிலே இருக்கின்ற மக்கள் அனைவருமே இந்தப் போக்குவரத்துச் சேவையை மிகப் பிரதானமான, அத்தியா வசியமான ஒரு சேவையாக நுகர்கின்றார்கள். குறிப்பாக, அவர்களுடைய நுகர்ச்சிகளிலே கல்வி, சுகாதாரம், போக்குவரத்து என்பன மிக முக்கிய இடத்தை வகிக்கின்றன. இன்றைய உலகத்தின் போக்குகளில்கூட, விமானப் போக்கு வரத்தாக இருந்தாலும் சரி, ரயில் போக்குவரத்தாக இருந்தாலும் சரி, தரைவழிப் போக்குவரத்தாக இருந்தாலும் சரி, அவை மக்களுடைய அன்றாட வாழ்க்கையோடு மிகவும் பின்னிப் பிணைந்தவையாகக் காணப்படுகின்றன. அவ்வாறான இந்தப் போக்குவரத்துச் சேவை தற்போதைய நவீன காலத்தில் கிராமங்களிலே வாழ்கின்ற மக்களுக்கு ஏன் இன்னமும் கிடைக்காமல் இருக்கின்றது? இது ஏன், இன்னமும் அவர்களை நோக்கிக் கொண்டுசெல்லப்படவில்லை? என்பன பற்றி முக்கியமாகக் கவனத்திலே எடுக்கப்பட வேண்டும். கௌரவ அமைச்சர் அவர்கள் இதனைக் கவனத்திலே எடுத்தால், இதற்குரிய தீர்வினைப் பெற்றுக்கொடுக்க முடியும். இவ்வாறான சட்டமூலங்கள் தொடர்பில் விவாதிக்கப்படுகின்ற பொழுதுதான் நாங்கள் இந்த இடங்களிலே இருக்கின்ற இந்தப் பிரச்சினைகளை முன்வைக்க முடியும். மேலும், அந்தந்த மாவட்டங்களிலே இருக்கின்ற இளைஞர், யுவதிகளுக்கு வேலைகளை வழங்குவதற்குக்கூட இன்னமும் போக்குவரத்துச் சபை ஒரு தெளிவான முடிவை எடுக்கவில்லை என்பதையும் கவலைக்குரிய ஒரு விடயமாக நான் இந்த இடத்திலே பதிவு செய்கின்றேன்.

மேலும், யாழ்ப்பாணத்திலிருந்து வவுனியா வரைக்குமான புகையிரதப் பாதையிலுள்ள புகையிரதக் கடவைகளில் இதுவரை கிட்டத்தட்ட 53 பேர் புகையிரதத்தால் நசிபட்டு-மோதுண்டு கொல்லப்பட்டிருக்கின்றார்கள். அதாவது, யுத்தம் முடிவடைந்ததன் பின்னர் 2012இலே அங்கு புகையிரதப் போக்குவரத்துத் தொடங்கப்பட்ட நாளிலிருந்து இன்றுவரை புகையிரதக் கடவைகளில் மோதுண்டு 53 பேர் இறந்திருக்கின்றார்கள். அங்கிருக்கின்ற பல புகையிரதக் கடவைகள், 1968ஆம் ஆண்டிலே நிர்மாணிக்கப்பட்டவையாக அறிவிக்கப்பட்டிருக்கின்றனவே தவிர, அவற்றினைப் பராமரிப்பதையிட்டு கவனத்திலே எடுக்கப்படவில்லை. மக்கள் பெருக்கமடைந்து அவர்களுடைய கிராமங்களுக்கான புதிய பாதைகள் உருவாக்கப்படுகின்ற சூழலில், புகையிரதப் பாதைகள் மீளமைக்கப்பட்டபோது, அவர்களுடைய பிரதான மான பாதைகள் புறக்கணிக்கப்பட்டிருந்தன. அவ்வாறு புறக்கணிக்கப்பட்ட நிலையிலும் அவர்கள் தொடர்ந்து தங்களுடைய பாதைகளைப் பயன்படுத்துகின்றார்கள். குறிப்பாக, இரணைமடுச் சந்தியிலே இருக்கின்ற புகையிரதக் கடவை மிக முக்கியமான ஒரு கடவை. அங்குள்ள பாரதிபுரம், மலையாளபுரம், பொன்னகர் போன்ற கிராமங்களைச் சேர்ந்த மக்கள் அந்தப் புகையிரதக் கடவையினூடாகத்தான் தங்களுடைய கிராமங்களுக்குப் பயணஞ் செய்கின்றார்கள். கிட்டத்தட்ட 3,000 குடும்பங்களைச் சேர்ந்த 10,000 க்கும் மேற்பட்டவர்கள் நாளாந்தம் அந்தப் புகையிரதக் கடவையைக் கடந்து செல்கின்ற சூழ்நிலை காணப்படுகின்றது. அதன் அருகிலே ஒரு சந்தை இருக்கின்றது. அங்கே பல துறைசார்ந்த விளையாட்டுக்கழக மைதானங்கள், மற்றும் மக்களுடைய அன்றாட சீவிய நடவடிக்கைகளோடு தொடர்புடைய விடயங்கள் காணப்படுகின்றன. இவ்வாறான ஒரு சூழலில் அந்தப் புகையிரதக் கடவைக்கு இதுவரை ஒரு கடவைக் காப்பாளரோ அல்லது கடவைக்கான ஒரு பாதுகாப்பு ஊழியரோ இல்லை. அதேநேரம், அந்த இடத்திலே சீமெந்தினால் அல்லது தாரினாலான ஒரு பாதைகூட உத்தியோகபூர்வமாக உருவாக்கப்படவில்லை. இது அந்த மக்களுக்கு பாரியளவிலான பின்விளைவுகளைக் கொடுத்திருக் கின்றது. அவர்கள் பல தடவைகள் அதனைக் காரணங்காட்டிச் சில காரியங்களைச் செய்யமுடியாத நிலைக்கு தள்ளப்பட்டிருக் கின்றார்கள்.

கிளிநொச்சி மாவட்டத்தில் முறிகண்டி-பரந்தன் வரையான புகையிரதப் பாதையிலே குறிப்பாக, இரணைமடுச் சந்தியிலுள்ள கடவை, சிவபாதகலையகம் அரசினர் தமிழ்க் கலவன் பாடசாலை இயங்குகின்ற இடத்திலே உள்ள கடவை, 55ஆம் கட்டையிலே இருக்கின்ற கடவை, பரந்தன் உமையாள்புரம் கடவை, உதயநகர் பகுதிக்குச் செல்கின்ற

மக்களுக்கான கடவை என்பன பிரதானமாகக் கவனத்தி லெடுக்கப்பட வேண்டியவை. ஆனால், இங்கேயிருக்கின்ற இந்தக் கடவைகள் எவையும் கவனத்திலே எடுக்கப்படுவ தில்லை. அந்தக் கடவைகளுக்குரிய காவற்கடமையிலே காவலாளிகள் யாரும் நியமிக்கப்படவில்லை. இதனால், அடிக்கடி இந்த இடங்களிலே விபத்துக்கள் ஏற்படுவதும் மக்கள் பாதிக்கப்படுகின்ற சூழலும் நிறையவே ஏற்பட்டிருக்கின்றது. இது தவிர்க்கப்பட வேண்டும். ஏற்கெனவே, பல சட்டங்களை நிறைவேற்றுவதற்காக நாடாளுமன்றத்திலே பிரேரணைகள் கொண்டுவரப்பட்டபோது இவ்வாறான பல தேவைகள் முன்வைக்கப்பட்டிருக்கின்றன. அதேநேரம், இவ்வாறான கோரிக்கைகள் எழுத்துமூலமாகவும் முன்வைக்கப்பட்டிருக் கின்றன. ஆனால், இதுவரை குறித்த கோரிக்கைகள் எதுவும் நடைமுறையில் நிறைவேற்றப்படவில்லை என்பதுதான் துரதிஷ்டவசமானது.

இவ்வாறான தேவைகள் அங்கே இருக்கக்கூடிய நிலையில், அங்கே வாழுகின்ற இளைஞர், யுவதிகள் வேலைவாய்ப்பில் புறக்கணிக்கப்பட்டு, தென்பகுதியிலே இருக்கின்ற பெரும்பான்மைச் சிங்கள சமூகத்தைச் சேர்ந்த இளைஞர், யுவதிகள் அங்கே வேலைக்கு அமர்த்தப்படுகிறார்கள். குறிப்பாக, நேற்றைய தினம்கூட யாழ்ப்பாண மாவட்டச் செயலகத்திற்குச் சாரதிகளாகவும் மற்றும் அலுவலக உதவியாளர்களாகவும் 9 பேர் நியமிக்கப்பட்டிருக்கிறார்கள். கடந்த தேர்தல் முடிந்த மறுநாளே, தென்பகுதியிலே இருக்கின்ற சிங்கள இளைஞர், யுவதிகள் வலுக்கட்டாயமாக அங்கே நியமிக்கப்பட்டிருக்கிறார்கள். இதனால் அங்கிருக்கின்ற இளைஞர், யுவதிகள் பலர் விரக்தி நிலைக்குத் தள்ளப்பட்டிருக் கிறார்கள். இந்தத் திட்டமிட்ட நடவடிக்கை ஏன், மேற்கொள்ளப்படுகின்றது? என்பதை இந்த நாட்டிலே நல்லிணக்கம் பேசி வருகின்ற அரசு தெளிவுபடுத்த வேண்டும். அண்மையிலே நடந்த தேர்தலுக்கு 10 நாட்களுக்கு முதல் கிளிநொச்சி மின்சார சபை அலுவலகத்தில் 14 மின்மானி வாசிப்பாளர்கள் நியமிக்கப்பட்டிருக்கிறார்கள். அவர்கள் அனைவரும் சிங்கள இளைஞர்கள். அதாவது, முற்றுமுழுதாகத் தமிழ்மொழி பேசுகின்ற, தமிழர்களை முழுமையாகக் கொண்ட ஒரு மாவட்டத்தில் சிங்கள இளைஞர்கள் நியமிக்கப்பட்டிருக் கின்றார்கள். கிட்டத்தட்ட ஒன்றரை வருடங்களாக அங்கு மின்மானி வாசிப்பாளர்கள் எவரும் இருக்கவில்லை. இந்த ஒன்றரை வருடங்களாக அங்குள்ள வீட்டுப்பாவனையாளர் களிடமும் சரி, கடை பாவனையாளர்களிடமும் சரி மின்சாரக் கட்டணங்கள் அறவிடப்படவில்லை. அதற்குச் சொல்லப்பட்ட காரணம், மின்மானி வாசிப்பாளர்கள் இல்லை என்பதாகும். ஆனால், இந்தத் தேர்தல் நடைபெறுவதற்கு முதல் வாரம் கிளிநொச்சி மின்சார சபைக்கு 14 சிங்கள இளைஞர்கள் மின்மானி வாசிப்பாளர்களாக நியமிக்கப்பட்டிருக்கிறார்கள். அவர்கள் அங்குள்ள வீடுகளுக்குச் சென்று சிங்கள மொழியிலே பேசி, மின்மானி பற்றிய விடயங்களைக் குறித்துக் கொள்கின்றார்கள். இது எவ்வளவு மோசமானது! யுத்தத்தினால் பாதிக்கப்பட்ட இளைஞர், யுவதிகள், யுத்தம் நடந்து முடிந்ததற்குப் பிற்பாடும் வேலை வாய்ப்பில்லாமல் இருக்கும்போது, இந்த நாட்டிலே சமாதானம், நல்லிணக்கம் தொடர்பாகப் பேசிக்கொண்டிருக்கின்ற இந்த அரசாங்கம் இவ்வாறான நடவடிக்கைகளை மேற்கொள்வது மிகமிக மோசமான காரியம் என்பதை இந்த இடத்திலே பதிவு செய்ய விரும்புகின்றேன். ஆகவே, முதலிலே இந்த நடைமுறைகள் திருத்தப்பட வேண்டும்.

வடக்கிலும் கிழக்கிலும் வாழுகின்ற ஆயிரக்கணக்கான தொண்டராசிரியர்கள் 11 வருடங்களுக்கு மேலாக தங்களுக்கான நிரந்தர நியமனம் கோரிப் போராடுகிறார்கள். அரசாங்கம் அதனைக் கருத்திலெடுத்து, அவர்களுக்கு நிரந்தர நியமனம் கொடுப்பதற்கு இதுவரை தயாராகவில்லை. வேண்டுமென்றே சில காரணங்கள் கூறப்பட்டு அவர்கள் புறக்கணிக்கப்படுகின்றார்கள். குறிப்பாக, பாடசாலைச் சம்பவத் திரட்டிலே அவர்களுடைய பதிவுகள் இல்லை என்ற ஒரு சிறிய காரணம் முன்வைக்கப்படுகிறது. இதனால், போராடிக்கொண்டிருக்கின்ற தொண்டராசிரியர்களுக்கு நிரந்தர நியமனத்தை வழங்காது, இன்றுவரை அரசாங்கம் இழுத்தடித்து வருகின்றது. யுத்தம் காரணமாக பாடசாலையிலுள்ள சம்பவத் திரட்டுக்கள் தொலைந்திருக் கின்றன. கடந்த 11 வருடங்களாக இந்தத் தொண்டராசிரியர் கள் எத்தனையோ இடங்களுக்குச் சென்று கோரிக்கைகளை விடுத்ததுடன் பல போராட்டங்களையும் நடத்தியிருக்கின்றார் கள். அந்த வகையில் அமைச்சர்கள் பலரையும் ஆளுநரையும் சந்தித்துப் பேசியிருக்கிறார்கள்; பலருடைய கால்களில் விழுந்துகூட மன்றாடியிருக்கிறார்கள். ஆனால், அவர்களுடைய உண்மையான நிலையை உணர்ந்து இரக்க சிந்தனையோடு அவர்களுக்கு நிரந்தர நியமனம் வழங்குவதற்கான ஒரு நல்ல முடிவை எடுப்பதற்கு அரசாங்கம் இன்னமும் தயாராக இல்லை. இவ்வாறு அங்கு தமிழர்கள் வேலைவாய்ப்புக்காக அலைகின்றபொழுது தென்னிலங்கை யில் இருக்கின்றவர்களை அங்கே வலுக்கட்டாயமாகக் கொண்டுவந்து நியமனம் செய்வது எவ்வளவு அபத்தமானது? இது இந்த நாட்டிலே இடம்பெறுகின்ற மிக மோசமான ஒரு விடயமாகும்

இதனைவிட வடக்கு, கிழக்கிலுள்ள வைத்தியசாலைகளில் யுத்த காலத்திலும்சரி, யுத்தத்திற்குப் பிற்பட்ட காலத்திலும் சரி, சுகாதாரத் தொண்டர்கள் தொடர்ந்து தங்களுடைய சுகாதாரப் பணியினை ஆற்றியிருக்கிறார்கள். அங்கே அவர்களுக்கான cadre காணப்படுகின்றது; வெற்றிடம் இருக்கின்றது. அந்த வெற்றிடங்களை நிரப்புவதற்காக அவர்களுடைய பதவி நிலைகளைக் கருத்திற்கொண்டு நியமனம் வழங்குமாறு கோரிப் பல்வேறு தடவைகளில் முயற்சிகள் மேற்கொள்ளப் பட்டிருக்கின்றன. அதற்காக அவர்கள் பல போராட்டங்களை முன்னெடுத்திருக்கின்றார்கள். ஆளுநரிடம் சென்றால், "நீங்கள் உங்களுடைய பாராளுமன்ற உறுப்பினர்களிடம் சென்று கதையுங்கள்" என்று அவர் சொல்கிறார். பாராளுமன்ற உறுப்பினர்களிடம் சென்றால், "முகாமைத்துவ அமைப்பிடம் குறித்த விபரங்கள் கொடுக்கப்பட்டு அவற்றுக்கான cadre creation இன்னமும் செய்யப்படவில்லை" என்று அரசாங்கம் சொல்வதாகவும் அதனைச் செய்து முடித்த பிற்பாடுதான் அதுபற்றிச் சொல்ல முடியும் என்றும் அவர்கள் சொல்கிறார்கள். சுகாதார அமைச்சரோடு இதுபற்றிப் பல தடவைகள் பேசியும் அதற்கு இன்று, நாளை அல்லது நாளை மறுதினம் நியமனம் வழங்கப்படும் என்று சொல்லப்பட்டதே தவிர, அவர்களுக்கான நியமனத்தை வழங்குவதாக இல்லை. இப்படியாக, அவர்களுக்கு நியமனம் வழங்குவதிலே அரசாங்கம் காலத்தை இழுத்தடிக்கின்றது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த நாட்டிலே வாழ்கின்ற இந்த மக்கள் குறிப்பாக வடக்கிலும் கிழக்கிலும் வாழ்கின்ற தமிழர்கள் சாதாரணமாக வேலைக்காகப் போராடிக்கொண்டிருக்கிறார்கள். சம்பந்தப் பட்டவர்களுக்குத் தொண்டர் ஆசிரியர்கள் மற்றும் சுகாதாரத் தொண்டர்களுக்கான நிரந்தர நியமனமும் கிடைக்கவில்லை. அவர்களுடைய அந்த உரித்தை வழங்குவதற்கு அரசாங்கம் தயாராக இல்லை. யுத்தத்தால் பாதிக்கப்பட்ட இளைஞர்களும் யுவதிகளும் வேலையில்லாமல் இருக்கின்றபொழுது, அவர்களுடைய நாளாந்த வாழ்வாதாரமே கேள்விக்குட்படுத்தப் படுகின்றபொழுது அரசாங்கம், "பொருளாதார ரீதியாகப்

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

பாதிக்கப்பட்டவர்களுக்கு வாழ்வாதார உதவிகளைச் செய்கின்றோம்" என்று நல்லிணக்க அமைச்சின் மூலமாக ஓர் அறிவித்தல் விடுத்திருக்கின்றது. அப்படியானால், 'வாழ்வாதார உதவி' என்ற ஒரு சொல்லோடு மட்டும் அந்த மக்களின் வாழ்க்கையைக் கொண்டுசெல்ல அரசாங்கம் நினைக்கின்றதா? அல்லது பல்வேறுபட்ட அரசாங்க தொழிற்றுறைகளில் அந்த மக்களுக்கு வேலைவாய்ப்பு வழங்க நினைக்கின்றதா?

நேற்றைய தினம் யாழ்ப்பாணக் கச்சேரியிலே வழங்கப்பட்ட 9 நியமனங்களும் அங்கே இருக்கின்றவர்களுக்கு வழங்கக்கூடியவையாகும். அங்கு வழங்கப்பட்ட மின்மானி வாசிப்பாளர் நியமனங்கள் அங்கு இருக்கின்ற இளைஞர் யுவதிகளுக்கு வழங்கக்கூடியவையாகும். கடந்த வாரம் கிளிநொச்சி, பளைப் பகுதியிலே இயங்குகின்ற தென்னை அபிவிருத்திச் சபையிலே 6 சிங்கள இளைஞர்கள் சாரதிகளாகவும் அலுவலக உதவியாளர்களாகவும் நியமிக்கப்பட்டிருக்கிறார்கள். தேர்தலுக்கு முதல் வாரம் கிளிநொச்சி மின்சார சபை அலுவலகத்திலே 14 சிங்கள் இளைஞர்கள் மின்மானி வாசிப்பாளர்களாக நியமிக்கப்பட்டிருக்கிறார்கள். இவ்வாறு அங்கே சிங்கள இளைஞர்களை நியமிப்பதன் மூலம் தமிழர்களின் வேலைவாய்ப்பைப் பறிக்க அரசாங்கம் நினைக்கின்றதா? அல்லது அவர்களுக்கு வேலைவாய்ப்பு வழங்கக்கூடாதென்று நினைக்கின்றதா? ஏன், இந்தப் பாரபட்சம்? ஏன், இந்த நாட்டிலே இவ்வாறான சிந்தனைகள் தோன்றுகின்றன? இந்த நாடு ஏன், இந்த நிலைமையை நோக்கிச் சென்றுகொண்டிருக்கின்றது? இதுதானே கடந்த காலங்களிலும் நடைபெற்றது! 1983களுக்கு முன்பு இதே நிலைமைகள் காணப்பட்டதனால்தான் இந்த நாட்டிலே குழப்ப சூழ்நிலைகள் ஏற்பட்டன. இவ்வளவு நிலைமைகளைக் கடந்துவந்தும் இதே வேலைகளைத்தான் இந்த அரசும் மேற்கொள்ளுமென்றால், இந்த நாட்டிலே சிங்கள மக்களோடு இணைந்து வாழுகின்ற சூழல் பற்றித் தமிழர்கள் சிந்திப்பார்களா? அவர்களுடைய மனங்களிலே எவ்வாறு நல்லிணக்கம் பற்றிய சிந்தனை ஏற்படும்? நாட்டினுடைய எதிர்காலம் பற்றி அவர்களால் எவ்வாறு சிந்திக்க முடியும்? ஆகவே, தமிழ் மக்கள் மிக மோசமாகப் பாதிக்கப்படுகின்ற இந்த நிலைமைகள் மாற்றப்பட வேண்டும்.

இலங்கையிலே புகையிரதப் போக்குவரத்தை எடுத்துக்கொண்டால், அனைத்து தூர இடங்களுக்கும் செல்லும் புகையிரதங்களில் உறங்கல் இருக்கைகள் இருக்கின்றன. ஆனால், இலங்கையினுடைய புகையிரதப் போக்குவரத்துப் பிரிவுக்கு அதிகூடிய வருமானத்தைப் பெற்றுக்கொடுக்கின்ற வடக்குப் போக்குவரத்துச் சேவையிலே ஈடுபடுத்தப்படுகின்ற புகையிரதங்களில் உறங்கல் இருக்கைகள் இல்லை. அதற்கு அரசியல் காரணம் இருக்கின்றது. ஆகவே, அங்கே இருப்பவர்களுக்கு அந்த வசதியை வழங்காமல் இலங்கையினுடைய ஏனைய மாவட்டங்களுக்கு அதனை வழங்குகிறார்கள். இந்த வேறுபாடுகள் எதற்காகச் செய்யப்படுகின்றன? குறிப்பாக, இந்த புகையிரதப் போக்குவரத்து தொடர்பாக நான் போக்குவரத்து அமைச்சரிடம் கேட்பதற்குரிய கேள்வியைக் கொடுத்து, இன்று 8 மாதங்கள் ஆகின்றன. ஆனால், இதுவரை விடையளிக்கப்படவில்லை. காரணம், விடையளிக்க முடியாத ஒரு சூழ்நிலைக்குள் அவர் தள்ளப்பட்டிருக்கிறாரென்று நான் நினைக்கின்றேன். இந்த நிலைமையில் மாற்றம் ஏற்பட வேண்டும். இவற்றில் மாற்றங்கள் ஏற்படுகின்றபொழுதுதான் இந்த நாட்டிலிருக்கின்ற மக்களுடைய நல்லெண்ணங்களைச் சரியாகப் பகிர்ந்துகொள்ள முடியும். சட்டங்களைக் கொண்டுவந்து போக்குவரத்தை இலகுபடுத்தல் மற்றும் நாட்டிலே வாகன நெரிசலைக் குறைத்தல் என்பதற்கப்பால், அந்தந்தப் பிரதேசங்களிலே வாழ்கின்ற இளைஞர், யுவதிகளுடைய மனநிலைகளைக் கருத்திற்கொண்டு, அவர்களுடைய கல்வித் தரங்களின் அடிப்படையில் போக்குவரத்துத் துறையிலே மற்றும் அதனோடு இணைந்த பல்வேறுபட்ட துறைகளிலே அவர்களுக்கான வேலைவாய்ப்புக்களை வழங்குவதற்கு அரசாங்கம் முன்வர வேண்டும். இதனை ஒரு முன்னுதாரணமாகச் செய்ய வேண்டும். வடக்கிலும் கிழக்கிலும் வாழுகின்ற தமிழ் பேசுகின்ற இளைஞர்களுடைய வேலைவாய்ப்புக்களைப் பறித்து தென்பகுதியில் இருக்கின்ற சிங்கள இளைஞர்களுக்கு வழங்குவதை அரசாங்கம் உடன் நிறுத்த வேண்டும். அப்படி நிறுத்தத் தவறினால் இந்த நாடு சமாதானத்தை நோக்கிச் செல்லாது. இந்த வேலைவாய்ப்புக்களில் அந்த இளைஞர்களைப் புறக்கணிக்கின்ற செயற்பாடு நல்லெண்ணத்தை உருவாக்காது. மாறாக, இந்த நாட்டில் மேலும் பிரிவினைகளை ஏற்படுத்தி, மக்களின் நல்லெண்ணங்களைச் சிதைக்கும் ஒரு நடவடிக்கையாக அமையுமெனக் குறிப்பிட்டு, என்னுடைய உரையை நிறைவு செய்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

அடுத்து, கௌரவ ஏ.எல்.எம். நசீர் அவர்கள்! இப்பொழுது நீங்கள் உங்களது கன்னி உரையை நிகழ்த்தலாம்! வாழ்த்துக்கள்!

[பி.ப. 2.51]

**ගරු ඒ.එල්.එම්. නසීර් මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். நசீர்)
(The Hon. A.L.M. Nazeer)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! இவ்வுயரிய சபையின் கௌரவ உறுப்பினர்களே! இன்று இந்தச் சபையிலே எனது கன்னி உரையினை ஆற்றுவதற்குச் சந்தர்ப்பம் கிடைத்ததால் மட்டில்லா மகிழ்ச்சியுடன் எங்களைப் படைத்த அல்லாஹ்வைப் புகழ்கின்றேன். அல்ஹம்து லில்லாஹ்! அதேநேரம் இந்தச் சந்தர்ப்பத்தை வழங்கிய உங்களுக்கு முதற்கண் நன்றியைத் தெரிவித்துக்கொள்வதோடு, ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் ஸ்தாபகத் தலைவர் மர்ஹூம் எம்.எச்.எம். அஷ்ரஃப் அவர்களை நினைவுகூர்ந்தவனாக அதன் தற்போதைய தலைவரும் அமைச்சருமான அல்ஹாஜ் றவுப் ஹக்கீம் அவர்களுக்கும் இந்தக் கௌரவ சபையின் பாராளுமன்ற உறுப்பினர்களுக்கும் எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். அடுத்து, பல்வேறு இடையூறுகளுக்கு மத்தியிலும் எனது அரசியல் பயணத்தில் அனைத்துப் பங்களிப்புக்களையும் செய்துவரும் அம்பாறை மாவட்ட மக்களுக்கு குறிப்பாக, அட்டாளைச்சேனைப் பிரதேச மக்களுக்கு எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

இன்றைய நாள் எனது வாழ்நாளில் மிக முக்கியமான ஒரு நாள்! தற்போது இந்த நாட்டில் மிக முக்கியமான ஓர் உள்ளூராட்சித் தேர்தலைச் சந்தித்துவிட்டு, அதன் விளைவாகத் தேசிய அரசியலில் தளம்பல்கள் இடம்பெற்றுவிடுமா? என்று அரசியல்வாதிகளும் மக்களும் குழம்பிக்கொண்டிருக்கின்ற ஒரு சூழ்நிலையில் நான் இங்கு உரையாற்றுகின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, மக்களால் தெரிவு செய்யப்படுகின்ற நாம் எல்லோரும் எப்போதும் மக்கள் எதிர்பார்க்கின்ற ஜனநாயகம், நல்லாட்சி, சுதந்திரம், பொருளாதார வளர்ச்சி, நல்வாழ்வு என்பவற்றை அவர்களுக்குப் பெற்றுக்கொடுக்க வேண்டிய ஒரு கடப்பாட்டைக் கொண்டவர்களாக இருக்கின்றோம். அந்த வகையில் இந்த நாட்டில் வேரூன்றியுள்ள சகல பிரச்சினைகளுக்கும் தீர்வு காணவேண்டியது எமது பொறுப்பாகும். கடந்த 30 ஆண்டுகளாக ஜனநாயகம், சுதந்திரம், நல்லாட்சி என்பவற்றுக்காக மக்கள் ஏங்கிக் கொண்டிருந்த சூழ்நிலையை நாங்கள் மறந்துவிட முடியாது. இப்படியான சூழ்நிலை கடந்த பாராளுமன்றத் தேர்தலோடு முடிந்துவிடும் என்று நாங்கள் நம்பிக்கை கொண்டிருந்த காலகட்டத்தில்தான் மீண்டும் நாங்கள் ஒரு தேர்தலைச் சந்தித்தோம். இந்தத் தேர்தல் மூலமாக மக்கள் எமக்கொரு செய்தியைக் கூறியிருக்கின்றார்கள். எனவே, நாம் மக்களின் அபிலாசைகளை மதித்து நடக்க வேண்டும். மீண்டும் சுய, சுகபோக அரசியலுக்காக இந்த நாட்டில் அரசியல் ஸ்திரமற்ற ஒரு சூழ்நிலையை ஏற்படுத்தி, குழப்பமான நிலைமையினைத் தொடரவிடாமல், மக்கள் நமக்குத் தந்த பொறுப்பைச் செவ்வனே நிறைவேற்றி இந்த நாட்டைச் சுபிட்சமான நாடாக மாற்ற அனைவரும் பாடுபட வேண்டும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, ஒரு நாட்டில் அரசியல் ஸ்திரத்தன்மை காணப்படும்போதுதான் மக்கள் எதிர்பார்க்கின்ற வளர்ச்சி ஏற்படும்; ஜனநாயகம், சுபிட்சம் நிலைபெறும் என்பதை நான் கூறி நீங்கள் தெரிந்துகொள்ள வேண்டியதில்லை. இந்த நாட்டில் ஊழல், துஷ்பிரயோகங்கள் ஒழிக்கப்பட வேண்டும் என்பதற்காக இன்று நாங்கள் அனைவரும் உழைக்க வேண்டிய தேவையிருக்கின்றது. இனவாதம், மதவாதம் என்பவற்றைப் பற்றிப் பேசி, இன்னும் இந்த நாட்டைக் குட்டிச் சுவராக்கும் நிலையினை நாங்கள் ஒருபோதும் அனுமதிக்கக் கூடாது. சுயலாப அரசியலைத் தூக்கி எறிந்துவிட்டு, நாட்டுக்காகவும் மக்களுக்காகவும் செயற்பட வேண்டிய தேவை எங்கள் எல்லோருக்கும் இருக்கின்றது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எனது மாவட்டமாகிய அம்பாறையில் மருதமுனை, கல்முனை, நற்பிட்டிமுனை, மத்திய முகாம், சாய்ந்தமருது, மாளிகைக்காடு, சம்மாந்துறை, நிந்தவூர், இறக்காமம், வரிப்பத்தாஞ்சேனை, ஒலுவில், பாலமுனை, அட்டாளைச்சேனை, அக்கரைப்பற்று, பொத்துவில் போன்ற அனைத்துக் கரையோரப் பிரதேசங்களிலும் பொருளாதாரம், கல்வி, விவசாயம், மீன்பிடி, காணி போன்ற விடயங்களிலுள்ள பிரச்சினைகளைத் தீர்ப்பதற்கு என்னாலான அனைத்து முயற்சிகளையும் நான் மேற்கொள்வேன். இதற்காக இங்கிருக்கின்ற சகல உறுப்பினர்களும் அமைச்சர்களும் ஒத்துழைப்பு நல்கவேண்டுமென்று கேட்டுக்கொள்ள விரும்புகின்றேன். விசேடமாக, ஒலுவில் மீன்பிடித் துறைமுகத்தை அமைப்பதற்கான பணிகள் எங்களுடைய பெருந்தலைவர் அஷ்ரஃப் அவர்கள் இருந்த காலகட்டத்திலே ஆரம்பிக்கப்பட்டன. இருந்தபோதிலும், தற்போது அந்தத் துறைமுகப் பிரதேசத்திலே உள்ள மீனவர்களுக்குப் பல்வேறுபட்ட பிரச்சினைகள் காணப்படுகின்றன. அதாவது, மீனவர்களுடைய படகுகளை அந்தத் துறைமுகத்திலே நிறுத்தி வைக்க முடியாத ஒரு நிலைமை ஏற்பட்டிருக்கின்றது. எனவே, இந்தத் துறைக்குரிய அமைச்சராக இருக்கின்ற கௌரவ மஹிந்த சமரசிங்ஹ அவர்கள் ஒலுவில் மீன்பிடித்துறைமுகம் தொடர்பாக விசேட கவனம் செலுத்தவேண்டுமெனக் கேட்டுக்கொள்கிறேன்.

அதேபோன்று, சில வெற்றுக் காரணங்களுக்காக அங்கு தீர்க்கப்படாமல் இருக்கின்ற காணிப்பிரச்சினைகள் தொடர்பாகவும் இந்த உயரிய சபை முடிவு காண வேண்டியுள்ளது. குறிப்பாக, அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற வட்டமடு, பாலையடிவட்டை, பள்ளியடிவெட்டை, கிராங்கோ, கிராங்கோமாரி, வாங்காமம், இறத்தல்வட்டை போன்ற பிரதேசங்களிலுள்ள விவசாயக் காணிகளை உரிய விவசாயிகளிடம் கையளிக்க வேண்டிய தேவையிருக்கின்றது. விசேடமாக, எமது அட்டாளைச்சேனைப் பிரதேச சபைக்குட்பட்ட அஷ்ரஃப் நகர் கிராமத்தில் இராணுவத்தினர் வசமுள்ள காணிகள் மக்களின் பாவனைக்காக விடுவிக்கப்படாமல் இருப்பது தொடர்பிலும் கவனம் செலுத்த வேண்டியுள்ளது. இந்தக் காணிகள் விடுவிக்கப்படாமையால் அந்தப் பிரதேசத்து மக்கள் பல சவால்களுக்கு முகங்கொடுக்கின்ற ஒரு நிலைமை காணப்படுகின்றது. எனவே, இந்தக் காணிகளை விவசாயிகளுக்குக் கையளிக்கும் விடயத்தில் இந்த உயரிய சபையானது ஆவன செய்ய வேண்டுமென்று நான் பணிவோடு வேண்டிக்கொள்கின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றையதினம் விவாதத்திற்கு எடுத்துக்கொள்ளப்பட்டுள்ள மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமாகச் சில விடயங்களை இந்த இடத்திலே எடுத்துக்கூற விரும்புகின்றேன். நமது நாட்டிலே பல பகுதிகளில் சீராக 'காபட்' பாதைகள் அமைக்கப்பட்டிருக்கின்றபோதிலும் அவற்றைப் பயன்படுத்தும் பாதசாரிகள் பாதை ஒழுங்குவசதிகளைச் சரியாகப் பின்பற்றுபவர்களாக இல்லை. இந்தக் குறைபாடு நிவர்த்திக்கப்பட வேண்டும். அத்துடன் எனது மாவட்டமான அம்பாறை மாவட்டத்தில் பிரதான பாதைகளுக்கு 'கார்பட்' இடப்பட்டிருக்கின்றபோதிலும், அங்கே பாதைகளின் வழிகாட்டல்கள் பதாகைகள் இல்லாத ஒரு நிலைமையை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. இந்தக் குறைபாடும் நிவர்த்திக்கப்பட வேண்டும். அதேநேரம் அம்பாறை மாவட்டத்தில் அநேகமாக நகரங்களை அண்டிய பகுதிகளில் பாதை விளக்குகள் இல்லாமலிருப்பதையும் நாம் காணக்கூடியதாக இருக்கின்றது. இவ்வாறு பாதைகளில் மின் விளக்குகள் சீராக இல்லாததாலும் இருக்கின்ற விளக்குகளில் வெளிச்சம் போதாதிருப்பதாலும் அடிக்கடி அங்கு வீதி விபத்துக்கள் ஏற்படுவதனை நாம் அறிவோம். இலங்கை முழுவதிலும் இந்த நிலைமை காணப்படுகின்றது. ஆகவே, இவற்றை ஒழுங்கமைப்பதற்கு போக்குவரத்து மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சு நடவடிக்கையெடுக்க வேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன். அம்பாறை மாவட்டத்தில் இரண்டு மாநகர சபைகளும் ஒரு நகர சபையும் 17 பிரதேச சபைகளும் இருக்கின்றன. இருந்தபோதிலும், அவற்றுக்குரிய எந்தப் பாதைகளிலும் வீதி நிறுத்தற் சமிக்ஞைகளுக்கான விளக்குகள் கிடையாது. இக்குறைபாடுகளை நிவர்த்திக்க இவ்வமைச்சு ஆவன செய்ய வேண்டுமென மிகவும் பணிவோடு நான் வேண்டிக்கொள்கின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று கிழக்கு மாகாணத்தில் அம்பாறை மாவட்டத்தில் கிட்டத்தட்ட 7,000 பட்டதாரிகள் வேலையில்லாத நிலையில் இருக்கின்ற ஒரு நிலைமை காணப்படுகின்றது. நான் கிழக்கு மாகாணசபையின் சுகாதார அமைச்சராக இருந்தபோது அமைச்சரவையிலே பல தீர்மானங்கள் எடுக்கப்பட்டன. அதேபோன்று கிழக்கு மாகாண முதலமைச்சர் அவர்களும் கிழக்கு மாகாண ஆளுநர் அவர்களும் பல தீர்மானங்களை எடுத்தபோதிலும், மத்திய அரசினால் இந்தப் பட்டதாரிகளுக்கு நியமனம் வழங்குகின்ற செயற்பாடு நிலுவையில் வைக்கப்பட்டிருக்கின்றது. இதுதொடர்பாகவும் இந்த உயரிய சபை கவனம் செலுத்த வேண்டுமென்று நான் இந்தச் சந்தர்ப்பத்திலே பணிவோடு வேண்டிக்கொள்கின்றேன்.

[ගරු ඒ.එල්.එම්. නසීර් මහතා]

உண்மையிலே, முழு இலங்கையிலும் இருக்கின்ற மக்களுக்காக இந்த உயரிய சபையிலே நான் தமிழில் எனது கன்னி உரையினை ஆற்றியிருக்கின்ற அதேநேரம், விசேடமாக எனது கட்சித் தலைவர், கட்சியின் உயர்பீட உறுப்பினர்கள் மற்றும் ஆதரவாளர்கள் எல்லோருக்கும் இந்தச் சந்தர்ப்பத்திலே மீண்டும் நன்றியைத் தெரிவித்துக்கொண்டு, இறுதியாக இரண்டு நிமிடங்கள் சிங்களத்திலும் ஆங்கிலத்திலும் பேசலாமென எண்ணுகின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මා විශේෂයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ විතරක් නොවෙයි. මේ ගරු සභාවේ සිටින සියලුම ගරු මන්ත්‍රීවරුන්ටත්, ඇමතිවරුන්ටත් මගේ ස්තුතිය පුද කරනවා.

විශේෂයෙන් දෙහිඅත්තකණ්ඩිය, මහඔය, පදියතලාව ඇතුළු අම්පාර දිස්ත්‍රික්කයේ සියලු ජනතාවට මගේ ස්තුතිය පුද කරනවා. ඒ ජනතාව වෙනුවෙනුයි මා මේ ස්ථානයට පැමිණියේ. ඒ නිසා මා නියෝජනය කළ පක්ෂය වෙනුවෙන් ඡන්දය ලබා දුන් අම්පාර දිස්ත්‍රික්කයේ සිංහල, දෙමළ, මුස්ලිම් ඡන්දදායකයින් සියලුම දෙනාට මා ස්තුතිවන්ත වෙනවා.

Mr. Deputy Chairman of Committees, I am very happy to make my Maiden Speech today in this Eighth Parliament. I hope all of you will help me to make my mission successful. Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

நன்றி. The next speaker is the Hon. R.M. Padma Udayashantha Gunasekera.

[අ.භා. 3.05]

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෝටර් වාහන පනත යටතේ නියෝගය සම්බන්ධයෙන් සංවාදය -විවාදය- සිදු වන මේ වෙලාවේ මේ ආණ්ඩුව ගැන යමක් නොකියාම සිටිය නොහැකි මට්ටමට ඇවිත් තිබෙන නිසා ඒ ගැනත් යමක් කිව යුතුයි.

පසුගිය ඡන්ද කාලයේදී එක්තරා ගමකට ගියාට පස්සේ වත්මන් රජය ගැන ගැමියකු කියාපු කථාවක් මම මේ වෙලාවේ කියන්න කැමැතියි. ඒ තාත්තා කිව්වා, රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ සහ මෛත්‍රීපාල සිරිසේන මහත්තයාගේ මේ ආණ්ඩුව, එහෙම නැත්නම් ජාතික ආණ්ඩුව රට පාලනය කරන්නේ, වැලේ වැල් නැතිව වැටී සිටි බෙබද්දු, සුදු අන්තුවෙකුට ලොතරැයි දිනුමක් ලැබුණා වාගෙයි කියලා. ඒ තාත්තා කියාපු කථාව මට මේ වෙලාවේ කියන්න සිතුණා.

ඒ විතරක් නොවෙයි. මෝටර් වාහන පනත යටතේ නියෝගය පිළිබඳව සාකච්ඡා වන නිසා මා තවත් වැදගත් කාරණයක් කියන්න කැමැතියි. මෙවර ඡන්දයේ ප්‍රචාරක කටයුතු අවසන් වුණු දවසට කලින් දවසේ සවස අප මොනරාගල දිස්ත්‍රික්කයේ නෙල්ලියද්ද කියන ගමට ගියා. නෙල්ලියද්ද කියන ගමට මෙහායින් රතුගල කියන ආදිවාසී ගමක් තිබෙනවා. අපේ ගරු විජයමුණි සොයිසා මැතිතුමාගේ ආසනය. එතුමාගේ දැන් ආසනය නොවෙයි, ඉස්සර ආසනය. ඒ ආදිවාසී නායකතුමාගේ ගමට ගිය වෙලාවේ අලියා ලකුණෙන් ඡන්දය ඉල්ලන අපේක්ෂකයකු කිව්වාලු, "අපට ඡන්දය දෙන්න." කියලා. ඒ වෙලාවේ ආදිවාසී නායකතුමාගේ ගමේ ගැමියකු කියාපු කථාව මොකක්ද? කඩපොළක වාඩි වෙලා තේ කහට එකක් බොන ගමන් ඒ තාත්තා කිව්වාලු, "අනේ! මහත්තයෝ අලියාට ඡන්දය දෙනවාද, නැද්ද කියලා අපි දන්නේ නැහැ. හැබැයි, මේ විදුලිය ඇදපු නායකයාට නම් ඡන්දය දෙනවා." කියලා.

එදා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ පාලන කාලය තුළ විශේෂයෙන් අධිවේගී මාර්ග මෙන්ම ගම්වල කාපට් මාර්ග, ගම්වල අතුරු පාරවල් හදනකොට මොනරාගල දිස්ත්‍රික්කයේ බිබිලේ ආසනයේ නෙල්ලියද්ද කියන ගමට පාරක් තිබුණේ නැහැ; යන්න විධියක් තිබුණේ නැහැ. වළවල්වල වැටි වැටී තමයි වාහන ගියේ. එදා ආදිවාසී නායකතුමා ජනාධිපති කාර්යාලයට ඇවිත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට යෝජනාවක් ඉදිරිපත් කළා, "අනේ! අපේ ජනාධිපතිතුමනි, අපටත් සුදු ඉර මැද තිබෙන පාරක් දෙන්න." කියලා. එතුමා ඒ අනුව කටයුතු කළා. අන්න එහෙමයි එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා ගම්වල මාර්ග සංවර්ධනය ඇති කළේ. තමුන්නාන්සේලා අද මෝටර් වාහන පනත යටතේ නියෝගය ගැන සාකච්ඡා කරනවා. කියන්න ලජ්ජයි, අද වන විට කඩවතින් එහාට හදන්න තිබුණු අධිවේගී මාර්ගය හැදෙන්නේ නැහැ. යාපනය දක්වා යන අධිවේගී මාර්ග නැහැ. නුවර දක්වා යන අධිවේගී මාර්ග නැහැ. හම්බන්තොට දක්වා යන අධිවේගී මාර්ග නැහැ. කතරගම දක්වා යන දුම්රිය මාර්ගත් නැහැ.

මට මතකයි, මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉන්න කාලයේ මඩකලපුවට දුම්රිය මාර්ගයක් හැදුණ බව. බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රදේශයෙන් පටන් ගෙන වැල්ලවාය හරහා බඩල්කුඹුර හරහා බිබිල හරහා මඩකලපුවට යන්නයි සැලසුම තිබුණේ. මේ සංවර්ධන ව්‍යාපෘති කරන්න තිබුණු ව්‍යාපෘතියි. තමුන්නාන්සේලා ඇවිල්ලා මේ රටට කළේ මොකක්ද? තමුන්නාන්සේලාට තිබෙන්නේ, මේ පනත් හද-හදා, ඒවා සංශෝධනය කර-කර ඉන්නයි. තමුන්නාන්සේලාට පසුගිය පළාත් පාලන මැතිවරණයෙන් ගම ඉල්ලුවා. අත ලකුණින් ඡන්දය ඉල්ලපු අයත් ගියේ ගම ඉල්ලන්නයි. බුලත් කොළය ලකුණෙන් ඡන්දය ඉල්ලූ අයත් ගියේ ගම ඉල්ලන්නයි. ජනතා විමුක්ති පෙරමුණ ගියේත් ගම ඉල්ලන්නයි. අලියා ලකුණින් ඡන්දය ඉල්ලපු අයත් ගියේ ගම ඉල්ලන්නයි. ගම ඉල්ලුවා. "රටේ ආර්ථිකය අපි හැදුවා. මෙහෙම කළා, මෙහෙම කළා. ණය බර නැති රටක් හැදුවා. ආර්ථිකය දැන් හොඳට යනවා. ඒ වාගේම ගම හදන්න ගමේ බලය අපට දෙන්න"යි කිව්වා. ගමේ බලය දුන්නේ!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මේ රටට සිද්ද වෙලා තිබෙන්නේ මොකක්ද? ඡන්දය ළං වනකොට රටේ අගමැතිතුමා මාධ්‍යවලින් කිව්වා, රටේ තැන් තැන්වල පැවැත්වූ රැස්වීම්වලදී කිව්වා, 2007, 2014 රජය ණය ගැනීම තුළ, මහ බැංකු බැඳුම්කර නිකුතුව තුළින් රුපියල් බිලියන 4,702ක් වංචා කළ බව. මැතිවරණ ප්‍රචාරක කටයුතු අවසන් දිනයේදී අගමැතිතුමා කිව්වා, රජයේ විගණකාධිපතිතුමා රුපියල් බිලියන 826ක් පෙන්වා දෙමින් ඒවා පොත්වල ලියා නැති බව කිව්වාය කියලා. මොකක්ද, වුණේ? මේ වාගේ කථාවලින් මොකක්ද වුණේ? ලංකාවේ Stock Market එක කඩා වැටුණා. දැන් එන්න-එන්න ආර්ථිකය කඩා වැටෙන තැනට ආයෝජන මුදල් ආපසු හැරිලා යනවා. ආයෝජකයෝ එන්නේ නැහැ. අස්ථාවර රජයක් මේ රටේ තිබෙනවාය කියලා පෙනෙනවා. අගමැතිවරයා කියනවා, "මට බලය තිබෙනවා"යි කියලා. ජනාධිපතිතුමා නීතිපතිතුමාගෙන් අහනවා, "අගමැතිට බලය තිබෙනවාද?" කියලා. කැබිනට් මණ්ඩලයේ ඉන්න අය බලාගෙන ඉන්නවා. රැට රැට කේන්දර බලන මිනිසුන් ළඟටයි, අර දේවාලයේ, මේ දේවාලයේ කපු මහත්වරුන් ළඟටයි ගිහින්, "මට අගමැතිකම හම්බ වෙනවාද? මට

ඇමතිකම හම්බ වෙනවාද?" කියා බලනවා. රටේ මිනිසුන්ට මොකද වෙලා තිබෙන්නේ? ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව අපේ රුපියලේ අගය පහත වැටී තිබෙනවා. අද ඇමෙරිකානු ඩොලරය අපේ රුපියල් 158ක් වෙලා තිබෙනවා. මෙන්න ආර්ථිකයට වෙලා තිබෙන දේ. ආර්ථිකය හමස් පෙට්ටියට යනවා.

තමුන්නාන්සේලා ආණ්ඩු හද-හදා, තවම ජාතික ආණ්ඩුවේ දිගය තිබෙනවාද, දිග් වුණාද කියා බලනවා. තවම ආණ්ඩුවේ කන්‍යාභාවය බලනවා. ඒක කැඩිලාද, බිඳිලාද කියලා බලනවා. කැඩිලා නැත්නම් බිඳ ගන්නේ නැතුව ඒ කන්‍යාභාවය හදා ගන්න පුළුවන්ද කියා බලනවා. හැබැයි, රටේ කන්‍යාභාවය ඉවරයි. රටේ සුරක්ෂිතභාවය ඉවරයි. රටේ ආර්ථිකය දවසින්-දවස කඩා වැටෙනවා. පොල් මිල රුපියල් 100 පැනලා යනවා. හාල් මිල රුපියල් 100 පැනලා යනවා. උම්බලකඩ මිල රුපියල් 100 පැනලා යනවා. රතුලූනු මිල රුපියල් 100 පැනලා යනවා. ජනවාරි මාසයේ 01 වන දා කොල්ලෙක් Facebook එකේ දමා තිබුණා, කිරි බතක් කන්න යන මුදල රුපියල් 400 පනිනවාය කියලා. ඇයි, හත් දෙවියනේ! රතුලූනුයි, උම්බලකඩයි නැතුව කට්ට සම්බලක් හදන්න බැහැ නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. හාල් මිල රුපියල් 100 පැන්නාට පස්සේ කිරි බතක් හදා ගන්න බැහැ නේ. මෙන්න රටේ තත්ත්වය; රටේ ආර්ථිකයේ තත්ත්වය.

තමුන්නාන්සේලා මොන කථා කිව්වත් රටේ තත්ත්වය ඒකයි. නුදුරේදීම ගෑස් මිල රුපියල් 300කින් වැඩි කරන්නට වෙනවා. පෙට්‍රල්, ඩීසල් වැඩි කරන්නට වෙනවා. වතුර බිල්, විදුලි බිල් වැඩි කරන්නට වෙනවා.

අනේ එදා කොල්ලෝ කෙල්ලෝ Wi-Fi ගන්න ආණ්ඩුවට ඡන්දය දුන්නා. 2015 ජනවාරි මාසයේ 08වෙනි දා Wi-Fi දෙනවා කිව්වා. තමුන්නාන්සේලා ඡන්දය ළං වන විට ගම්වලට ගිහින් කිව්වා, "හැම ගමකටම Wi-Fi කලාප දෙනවා." කියලා. Wi-Fi නොවෙයි, රටේ කොල්ලන්ට කෙල්ලන්ට වයිත් නැහැ ෆයිත් නැහැ. 2015 ජනවාරි 08 ඡන්දය දුන්නා. නමුත්, වයිත් නැහැ ෆයිත් නැහැ. හැබැයි, දැන් නැවත හැම ගමකටම ගිහින් Wi-Fi කලාප දෙනවා කියලා රටේ මිනිස්සු රවටනවා. එදා 2001දී රනිල් වික්‍රමසිංහ මහත්මයා ආණ්ඩුව ගන්න විටත් කිව්වේ ඕක.

එදා කිව්වේ මොනවාද? බුලත්විට වෙනුවට අපේ අම්මලා තාත්තලාට කන්නට චුයින්ගම් දෙනවා කිව්වා. කෙල්ලන්ට bracelet, මාල, වළලු දෙනවා කිව්වා. අධ්‍යාපන ඇමති කිව්වා, "ටැබ්ලට් පරිගණක දෙනවා." කියලා. අධ්‍යාපන ඇමති ගැන ලජ්ජයි; මේ ආණ්ඩුව ගැන ලජ්ජයි.

අපේ මොනරාගල දිස්ත්‍රික්කයේ වාගේම සමහර වියළි කලාපයේ දිස්ත්‍රික්කයන්හි වකුගඩු රෝගයෙන් පෙළෙන අම්මලා, තාත්තලා ඉන්නවා. ඔවුන්ගේ දරුවන් බොන වතුර ටික පිරිසිදු කර ගන්න water filter එකක් තිබෙන එක ඉස්කෝලයක්වත් නැහැ. මේවා ගැන කියන්න ලජ්ජයි. අනුරාධපුරය, පොලොන්නරුව, අම්පාර, හම්බන්තොට, මොනරාගල දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, වියළි කලාපයේ දිස්ත්‍රික්කවල ජීවත් වන මිනිසුන්ගේ පාසල් යන දරුවන්ට Tabs දෙන්න කලින් පිරිසිදු වතුර ටිකක් ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න. පිරිසිදු වතුර ටිකක්වත් නැති ඉස්කෝල තමයි හැම තැනකම තිබෙන්නේ. තමුන්නාන්සේලා මේ ගැන හොයලා බලන්න; ආණ්ඩුව මේ ගැන හොයලා බලන්න. උදේ පාන්දර අම්මා, තාත්තා දරුවකු ඉස්කෝලේ යවනකොට ඔහුට බත් එකක් දෙනවා වාගේම අනිවාර්යයෙන්ම ඔවුන්ට ගෙදරින් පිරිසිදු වතුර ටිකක් ගෙනි යන්න දෙන එකත් අද මේ රටේ සංස්කෘතියක් වෙලා තිබෙනවා. එහෙම පිරිසිදු වතුර ටිකත් ගෙදරින් ගෙනි යන්න දෙන්න වෙලා තිබෙන්නේ ඇයි? කිසිම පාසලක නියමිත සෞඛ්‍ය පහසුකම් නැහැ; කිසිම පාසලක පිරිසිදු ජලය බොන්න පුළුවන් නිවැරදි තැනක් නැහැ. අපේ ගම්බද පාසල්වල තත්ත්වය එසේයි. නිකම් නරුම ආර්ථික ප්‍රතිපත්ති ගෙනෙන්න ගියාම මොකක්ද වුණේ? තමුන්නාන්සේලා ගමේ ජනතාව ප්‍රතික්ෂේප කළා. ගමේ ජනතාව තමුන්නාන්සේලා ප්‍රතික්ෂේප කළාට පස්සේ ගලේ පහරපු බළලා වාගේ දැන් කියනවා, "අපිට බලය තිබෙනවා"ය කියලා.

ඊළඟ පාර්ලිමේන්තු මැතිවරණය, ඊළඟ ජනාධිපතිවරණය, ඊළඟ පළාත් සභා මැතිවරණය, පොදු ජන පෙරමුණ -පොහොට්ටුව - යටතේ මේ රට දිනවපු මහින්ද රාජපක්ෂත් එක්ක හිට ගන්න සූදානම් කියන එක රටේ ඡන්ද දායකයා දැන් තීරණය කරලා ඉවරයි කියන කාරණය මා තමුන්නාන්සේලාට කියන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, මෙදා පළාත් පාලන ඡන්ද ප්‍රතිඵලය ලක්ෂ 49යි. 2008 පළාත් පාලන ඡන්ද ප්‍රතිඵලය සියයට 44ක්. අලියාට කීයද? සියයට 32යි. 'බුලත් කොළය' ලකුණින් ඉල්ලලා සියයට 8යි. 'අත' ලකුණින් ඉල්ලලා සියයට 4යි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතැනත් ඉන්නේ නිකම් අය නොවෙයි. අනාගතයේ එකතු වෙන්න ඉන්න බලවේගයක් තමයි අලියාට විරුද්ධව එකතු වෙලා සිටින්නේ. හැබැයි, තමුන්නාන්සේලා මේ ගැන තව හිතන්න.

දයාසිරි ජයසේකර මැතිතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පැත්තේ ඉඳගෙන තවමත් ජාතික ආණ්ඩුව එක්ක දිග කන්න පුළුවන් කියලා බලාගෙන ඉන්න අය හිතන්න ඕනෑ කාරණයක් තිබෙනවා. තමුන්නාන්සේලා එහෙම හිතුවොත් මේ රටත් ඉවරයි, තමුන්නාන්සේලාත් ඉවරයි කියන එක මතක තියා ගන්න. රටත් ඉවරයි; රටේ ආර්ථිකයත් ඉවරයි; තමුන්නාන්සේලාගේ ගමනත් ඉවරයි කියන එක මතක තියා ගන්න. ඒ නිසා නිවැරදි ගමනක් තීරණය කරන්න ඕනෑ වෙලාවකට තමයි අද මේ රට ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)
මගේ නම සඳහන් කරපු නිසයි මම කථා කරන්නේ. ඔබතුමා නිකම් එක එක වචන කියන්න ලෑස්ති වෙන්න එපා. මගේ නම කියපු නිසයි මම කථා කරන්නේ. මේ Debate එක, - [බාධා කිරීමක්] ඉන්න, ඉන්න, මටත් කථා කරන්න ඕනෑ. ඔබතුමා එක එක් කෙනාගේ නම කියන්න පටන් ගත්තා. මෙතැන කයිය ගහන්න බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මමත් එක්ක මැතිවරණය ගැන විවාද කරන්න එතුමාට එන්න කියන්න. ජාතික ආණ්ඩු තිබෙන එක ගැනත් මමත් එක්ක විවාදයකට එන්න කියලා එතුමාට කියන්න. එතුමාත් එක්ක විවාද කරන්න මම සූදානම්. දන්නේ නැති ඒවා කථා කරන්නේ නැතිව ඉන්න කියන්න. දන්නේ නැති ඒවා ගොඩාක් එදා කථා කරලා තිබෙනවා. තවත් කථා කරන්න එපා. දන්න ඒවා ගැන කථා කරන්න.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මගේ මිත්‍ර දයාසිරි ජයසේකර ඇමතිතුමා සමඟ මගේ කිසිම අරෝවක් නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

අවසාන වශයෙන් ඔබතුමාට කියන්න ඕනෑකම තිබෙන්නේ, මේ රට වැටිලා තිබෙන තැන ගැනයි. මෙතැනින් මෙහාට මේ රට වෙනස් කරන්න බැරි නම්, මේ රට විශාල විනාශයකට යනවා. මහ බැංකුවෙන් සිදු වූ පාඩුව, සෘජුව කොල්ලකෑ මුදල අද රුපියල් මිලියන 25,000ක් වෙලා තිබෙනවා. "ඒ මුදල කොල්ලකාපු අය අත් අඩංගුවට ගන්නවා; හිරේ දමනවා" කියපු අය අද නිහඬව සිටින වෙලාවකයි පාර්ලිමේන්තුව පැවතෙන්නේ.

ළඟදි "දිවයින" පත්තරේක තිබුණා, මේ ජාතික ආණ්ඩුව සම්බන්ධව අපූරු කවියක්. මේක මට තාලයට කියන්න බැහැ; තාලයට කියන්න අවසරත් නැහැ. තාලෙට, ලීලෙට, රටාවට, හැඩයට මේක කියන්න ඕනෑ නැති වුණත්, මුන්නෑහේලාට මේක ඇහෙන්නත් ඕනෑ නිසා, රටත් මේක දැනගන්න ඕනෑ නිසා මේ වෙලාවේ මේ කවියට කියන්න තමයි ඕනෑ. මෙන්න මෙහෙමයි ඒ කවියේ තිබුණේ :

"ගුල්ලන් ගසා යහපාලන බුරුත කොටේ

පල්ලන් ගියා දැන් දෙපිරිස එකට ගැටේ

කං කං බූරු රජයක් ගොඩ නගති හැටේ

වන්නම් බලන් ඉනු අලුතින් ගහන ගැටේ"

අගමැතිතුමාට කියන්න තිබෙන්නේ, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට කියන්නේ, ගහන ගැටයක් ගහන්න; ගහන කරණමක් ගහන්න. මොන බෙර පද ගැහුවත්, රටත්, ජාතියත් එක්ක මේ හිටගත්ත දේශප්‍රේමී ජනතාව තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පෙරළා දැමීමට සූදානම් කියන ස්ථිර පණිවුඩය තබමින් මම නිහඬ වනවා. තමුන්නාන්සේට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මහතා.

[අ.භා. 3.17]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පද්ම උදයශාන්ත මන්ත්‍රීතුමාට වෙලා තිබෙන්නේ ගලේ පහරපු බල්ලාට වෙච්ච දේ. මොකද, මේ ගොල්ලෝ "මහින්ද අගමැති කරනවා" කියලා posters ගැහුවා. දැන් කර ගන්න බැහැ. හොරා කාපු සල්ලි එතුමන්ලා දන්නා මාධ්‍ය ආයතනවලට දීලා බැලුවා, ගේමක් ගහලා මොනවා හෝ කරන්න පුළුවන්ද, ජනමතයක් හදා ගන්න පුළුවන්ද කියලා. ඒක කර ගන්නත් බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අද දින වැදගත් මාතෘකාවක් විවාදයට ගන්නේ. රටේ විශාල මරණ සංඛ්‍යාවක් සිදු වෙන්නේ මෝටර් රථ නිසායි. එවැනි වැදගත් මාතෘකාවක් තිබියදී, පද්ම උදයශාන්ත මන්ත්‍රීතුමා නැවතත් අර පරණ පදයම ගහගෙන, ගහගෙන යනවා. එදා මහින්ද රාජපක්ෂ මහත්තයා ජනාධිපති කරන්න කියලා ඡන්දය ඉල්ලද්දී, එතුමා පැරදුණාට ජනාධිපති කරන්න කියලා ඡන්දදායකයන් සියයට 47ක් ඡන්දය දුන්නා. සියයට 47ක් දුන්නා, පැරදුණාට! නමුත්, අද අගමැති කරන්න ගිහිල්ලා ඡන්දදායකයන්ගේ ප්‍රමාණයෙන් සියයට 44යි දුන්නේ. දිනලා නැහැ. පැරදිලායි තිබෙන්නේ. එදා ඡන්දදායකයින්ගෙන් සියයට 47ක් ගත්ත මහින්ද අද සියයට 44ට බැස්සා. ඒක කියන්නේ නැහැ. නමුත්, අපේ ඡන්ද ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා කියලා දැනගන්න. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඡන්දය ඉල්ලුවේ සියලු පක්ෂත් එක්ක. එදා අපි සියයට 51ක් ගත්ත එක, පක්ෂ ටික ඔක්කෝම එකතු වුණාම අද සියයට 55ක් අරගෙන තිබෙනවා. අද එක එක මත හද හදා, බොරු හද හදා කෑ ගහන කට වාචාලයෝ ටිකක් ඉඳගෙන බොරු මත හදනවා. නමුත් මේක මතක තියා ගන්න. විදුලි පුටුවක් ගැන කියලා එදා ජනතාව ඔය වාගේම රැවැට්ටුවා. විදුලි පුටුව ගැන කිව්වාට දෙවැනි වරටත් ජනතාව ඒක පිළිගත්තේ නැහැ. අදත් අගමැති කරන්න ඡන්දය දෙන්න කියලා ඉල්ලුවා. අන්තිමට ගමේ ඉන්න හොරා, තක්කඩියා, කුඩුකාරයා, කිණිසිකාරයා, පොලුකාරයා තමයි ගම අස්සෙන් එළියට ඇවිල්ලා ප්‍රාදේශීය සභාවට එන්නේ. තව සතියක්, දෙකක් යන කොට මිනිස්සු තක්බීර් වෙනවා,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අපි ඡන්දය දුන්නේ" කියලා.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අපේ මන්ත්‍රීතුමා?" කියලා හිතනවා. මතක තියා ගන්න, දිනුවේ නැහැ. දිනුවේ නැහැ! 47, 44ට බැස්සා. දිනුවේ නැහැ. අපේ පක්ෂයත් සමඟ එකට ඉඳලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජයග්‍රහණය කරන කොට අපි සියයට 51 ගත්ත ඡන්ද සංඛ්‍යාව, අද සියලු පක්ෂවල එකතුවෙන් සියයට 56 දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවාය කියලා මතක තියා ගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙවැනි මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවට එවපු ජනතාව ගැන බොහොම කනගාටු වෙනවා. අද අද දවසේ කථා කරන මෝටර් වාහන පනත වැදගත් පනතක්. ඒ යටතේ නියෝගයක් ගැන මේ විවාදය තිබියදී මොනවාද මේ කියවන්නේ? මේ, පාර්ලිමේන්තුවට අදාළ දේද? මේ පාර්ලිමේන්තුවේ මුදල් වියදම් කරන්නේ, මේ පාර්ලිමේන්තුවේ පහසුකම් සලසන්නේ වාචාලයින්ට ඇවිල්ලා මේ විධියට වල්පල් දොඩවන්නද; මාතෘකාවට අදාළව කථා කරන්න නොවෙයිද? කථාවක් ඉල්ලුවාට, ඊට අදාළ ගැසට් එක කියවලා තිබෙනවාද දන්නේත් නැහැ; මාතෘකාව මොකක්ද කියලාවත් දන්නේත් නැහැ. මාතෘකාවට අදාළව එක වචනයක්වත් කථා කළාද? ඒ නිසා මම කියනවා, මේ ජනතාව කනගාටු වෙයි කියලා, මේ අයද පාර්ලිමේන්තුවට එව්වේ කියා. පද්ම උදයශාන්ත මන්ත්‍රීතුමනි, ඔබතුමා අභයාරාමයට ගිහිල්ලා ඔහොම කියන්න; ගහක් යටට ගිහින් කියන්න. මේ උත්තරීතර සභාව ඔය විධියට කෙලසන්න එපා කියා විශේෂයෙන්ම කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පවතින වර්තමාන තත්ත්වය ගැන බැලුවාම මේ ගෙනැවිත් තිබෙන නියෝගය ඉතාම වැදගත් බව පෙනෙනවා. අලුත් තාක්ෂණයට අනුව අලුත් ලෝකයට ගැළපෙන විධියට වාහනවල නොම්මර තහඩුව නවීකරණය කිරීමට කටයුතු කිරීම ගැන අපි ස්තුතිවන්ත වෙනවා. පසුගිය දවස්වල මේ වාගේ වාචාලයෝ ටිකක් එකතු වෙලා කිව්වා, "මේ ආණ්ඩුව ආවාට කාර් ගන්න බැරි වුණා; මෝටර් රථ වාහන ගන්න බැරි වුණා" කියලා. Department of Motor Traffic එකට ගිහිල්ලා බලන්න. 2014 වසරේ අලුත් කාර් ලියා පදිංචි වෙලා තිබෙන්නේ 38,780යි. Department of Motor Traffic එකේ වාර්තාවේ තිබෙනවා, 2015 වෙන කොට කාර් 1,05,000ක් ලියා පදිංචි වෙලා තිබෙනවා කියලා. ඒ කියන්නේ 2014ට වඩා තුන්

ගුණයකට වැඩි ප්‍රමාණයක් මෝටර් කාර් විතරක් ලියා පදිංචි වෙලා තිබෙනවා. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන බලන්න. 2014 වර්ෂයේ මෝටර් සයිකල් 73,000ක් ලියා පදිංචි වෙලා තිබෙනවා. 2015 වර්ෂයේ මෝටර් සයිකල් 1,29,000ක් -දෙගුණයක්- ලියා පදිංචි වෙලා තිබෙනවා. මේ රජය ආවාට පස්සේ ලියා පදිංචි කළ මෝටර් රථ ප්‍රමාණය තුන් ගුණයකින් වැඩි වෙලා තිබෙනවා; බයිසිකල් ප්‍රමාණය දෙගුණයකින් වැඩි වෙලා තිබෙනවා. නමුත් මේ වාගේ වාචාලයන් මාධ්‍ය හරහා කරන ප්‍රකාශවලින් "මිනිහෙකුට කාර් එකක් ගන්න බැරි වුණා" කියලා බොරු කථා මවනවා. ඒ අයට ගිහින් වාර්තා බලන්න කියලා මම විශේෂයෙන්ම ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම මම මේ කාරණය කෙරෙහිත් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානය 2010 - 2020 මාර්ග රිය අනතුරු අවම කිරීමේ දශකය වශයෙන් නම් කරලා තිබුණා. ශ්‍රී ලංකාවද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයෙක්. එම නිසා ශ්‍රී ලංකාවද 2010 - 2020 වර්ෂ 10 මාර්ග රිය අනතුරු අවම කිරීම සඳහා සහයෝගය ලබා දිය යුතු වෙනවා. විශේෂයෙන්ම මේකට සමාන්තරව ලෝක සෞඛ්‍ය සංවිධානය දැනුම් දීලා තිබෙනවා, 2020 වෙන කොට අපේ රටේ තිබෙන රිය අනතුරු සංඛ්‍යාව සියයට 50කින් අඩු කරන්න කියලා. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මේ නිර්දේශය අනුව ඔවුන්ද කථා කරලා තිබෙනවා. නමුත් ඒ ප්‍රමාණය අඩු වෙලා නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ ගැන විශේෂයෙන් අවධානය යොමු කරන්න කියන එකයි මම මෙතැනදී කියන්නේ.

2009 වන විට මේ රටේ රිය අනතුරු 33,094ක් ඇති වුණා; මේ රිය අනතුරු නිසා මරණ සංඛ්‍යාව 2,413ක් බවට පත් වුණා. ඒ කියන්නේ සාමාන්‍යයෙන් දවසට 6.6ක ප්‍රමාණයක් පුද්ගලයන් අහිමිවීම් සිදු වුණා. රිය අනතුරු සංඛ්‍යාව අවම කිරීමට ලෝක සම්මුතියට එකඟ වුණත්, 2020 වෙන කොට සියයට 50කින් රිය අනතුරු සංඛ්‍යාව අඩු කරනවා කියලා කිව්වත් 2010 සිට වර්ෂයෙන් වර්ෂයට රිය අනතුරු සංඛ්‍යාව සහ ඒවායින් සිදුවන මරණ සංඛ්‍යාව වැඩි වීමයි සිදු වුණේ. මම විශේෂයෙන්ම කියනවා, අපි ඒ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ කියලා. ඒ ප්‍රශ්නයට උත්තරයක් ලැබිලා නැහැ. මොන ආණ්ඩුව මොන දේ කළත් 2010 සිට මේ වන තෙක් ඒ ගැන උත්තරයක් ලැබිලා නැහැ. විශේෂයෙන්ම වර්තමාන රජය ගත් එක පියවරක් සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙනවා. රිය අනතුරුවලින් මිය යන සංඛ්‍යාව අඩු කරන්න ambulance service එක -ක්ෂණික ගිලන්රථ සේවය- මේ රට තුළ නොමිලයේ ක්‍රියාත්මක කිරීම ගැන විශේෂයෙන්ම මා ස්තුතිවන්ත වෙනවා.

2009 වර්ෂයේ ශ්‍රී ලංකාවේ රිය අනතුරු සංඛ්‍යාව 33,094ක් වුණත් වසරින් වසර ඒ සංඛ්‍යාව වැඩි වෙලා දැන් වෙන කොට වර්ෂයකට සිදුවන රිය අනතුරු ප්‍රමාණය 39,000ක් බවට පත් වෙලා තිබෙනවා. 2009 වසරේ රිය අනතුරු නිසා සිදු වූ මරණ සංඛ්‍යාව 2,413ක් වුණාට වර්තමානය වන විට එම සංඛ්‍යාව 2,900ත් ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. මේ සඳහා විශේෂයෙන් අප සැලකිලිමත් වෙන්න ඕනෑ. මේ රිය අනතුරුවලින් අවුරුදු 21-25ත් අතර තරුණයන් තමයි වැඩි වශයෙන්ම මිය ගිහිල්ලා තිබෙන්නේ. ඒ වාගේම දෙවැනියට රටට අහිමි වෙලා තිබෙන්නේ අවුරුදු 26-30ත් අතර තරුණයන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රිය අනතුරුවලින් සිදුවන මරණ සංඛ්‍යාව සලකා බැලූ විට විශේෂයෙන්ම මගේ නගරය, මගේ පොලිස් බල ප්‍රදේශය සුවිශේෂ අගයක් අරගෙන තිබෙනවා. ගම්පහ, අනුරාධපුරය, නුගේගොඩ සහ කැලණිය කියන පොලිස් බල ප්‍රදේශවල ඉන්න ජනතාව තමයි -ඒ මඟින් තමයි, ඒ පදිකයන් තමයි- වැඩියෙන්ම රිය අනතුරුවලින් මිය ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා ඒ ගැන කටයුතු කරන්න කියලා මම විශේෂයෙන් ඉල්ලනවා.

ගරු ඇමතිතුමනි, ගම්පහ SLTB එකේ ඉඩම අක්කර 12ක් තිබෙනවා. වෙරහැර හදලා තිබෙනවා වාගේ රියැදුරු බලපත්‍ර ලබා දීමේ සුවිශේෂ අංගණයක් ගම්පහ ඉදිකරන්න කියලා ගරු අශෝක් අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත්, ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමැතිතුමාගෙනුත් විශේෂ ඉල්ලීමක් කරනවා. සිදු වී ඇති රිය අනතුරුවලින් සියයට -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමාට වෙන් කළ කාලය මට ලබාදෙන්න කියා ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
එතුමාට වෙන් කළ සම්පූර්ණ කාලයම ඔබතුමාට අවශ්‍යද?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මගේ කථාව කරගෙන යනකොට බලමු.

සිදු වී ඇති රිය අනතුරුවලින් සියයට 85ක්ම සිද්ධ වෙලා තිබෙන්නේ පෞද්ගලික හේතු නිසායි. ඒ කියන්නේ නොසැලකිල්ල නිසා තමයි අනතුරුවලින් සියයට 85ක්ම සිද්ධ වෙලා තිබෙන්නේ. එම අනතුරුවලින් සියයට 90ක්ම තිබෙන්නේ වළක්වාගත හැකි රිය අනතුරුයි. මේ රටේ සිදු වන රිය අනතුරු නිසා අවම වශයෙන් දිනකට 8දෙනෙක් මිය යනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කලින් කිව්වා වාගේ රිය අනතුරු නිසා දිනකට මේ රටේ 8දෙනෙක් මිය යනකොට, අවුරුදු 21ත් 25ත් අතර තරුණයන් තමයි වැඩිම ප්‍රමාණයක් මිය යන්නේ. දෙවැනි තැනට වැඩිම ප්‍රමාණයක් මිය යන්නේ අවුරුදු 26ත් - 30ත් අතර අයයි. එම වයස, ජීවිතයේ බරපතළක් නොමැති වයස. නිකරුණේ තරුණ ජීවිත මේ විධියට මහ මඟට බිලිවෙනවා. බීමත්කම නිසා වැඩිහිටි අයත් රිය අනතුරුවලින් මිය යනවා -ජීවිතයෙන් සමුගන්නවා-.

අපි දන්නවා, තමන්ගේ දරුවා තමයි දෙමව්පියන්ට තිබෙන ලොකුම වස්තුව බව. හැම දේම කරන්නේ තමුන්ගේ දරුවා වෙනුවෙන්, දරුවා ගැන ලොකු බලාපොරොත්තුවක් තියාගෙනයි. හැබැයි, දරුවා හදලා-වඩලා අවුරුදු 20 පැනලා අවුරුදු 21, 22, 23 වෙනකොට රිය අනතුරකින් මිය ගියොත්, ඒක ඒ දෙමව්පියන්ට වාවාගන්න පුළුවන් කාරණයක්ද? මේ ගැන අපි ලොකු අවධානයක් යොමු කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය දවස්වල ගම්පහ ප්‍රදේශයේ විදුහල්පතිවරු දෙදෙනෙකුගේ දරුවන් දෙදෙනෙක් රාත්‍රී කාලයේ බයිසිකලයේ ගමන් කරද්දී රිය අනතුරක් නිසා එතැනම මිය ගියා. ඔවුන් ඉගෙන ගත්තේ ආනන්ද විද්‍යාලයේයි. මේ වාගේ ශෝකජනක, ඛේදජනක

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

අවස්ථා විශාල ප්‍රමාණයක් රටේ හතර දිග් භාගයෙන්ම -හතර පැත්තෙන්ම- අපට අහන්නට ලැබෙනවා. ඒ නිසා, මේ ගැන හිතන්න කියලා, මේ ගැන මීට වඩා වැඩි අවධානයක් යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම රිය අනතුරු නිසා තරුණ බිරින්දෑවරු වැන්දඹුවන් බවට පත්වුණු අවස්ථා මේ රටේ කොච්චර නම් තිබෙනවාද? ඒ වාගේම දූ පුතුන්ට පිය සෙනෙහස නැතිවෙලා, ඒ දූ පුතුන් බලාපොරොත්තු වන ඉලක්කයට, දූ පුතුන් බලාපොරොත්තු වන අනාගත ලෝකයට යන්න බැරිව, ආර්ථික ප්‍රශ්න නිසා ඔවුන් කඩා වැටිලා ඔවුන්ගේ පවුල් අසරණ වුණු අවස්ථා කොච්චර නම් මේ රටේ තිබෙනවාද? අවුරුද්දකට 29,000ක් දෙනා රිය අනතුරුවලින් මිය යද්දී, ඒ පවුල් 29,000ටම ඇති වන ඉරණම එයයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රියැදුරු බලපත්‍ර ලබා ගැනීමේ විශේෂ ක්‍රමයක් සකස් කිරීම පිළිබඳව මීට වඩා වැඩි අවධානයක් යොමු කරන්නට ඕනෑ. මොකද, රියැදුරු බලපත්‍ර ලබා ගන්නා ක්‍රමවේදය දිහා බැලුවොත්, එය රටේ තිබෙන පගා ගන්නා ලොකුම ක්‍රමය බවට හඳුන්වන්න පුළුවන් වෙනවා. මොකද, රියැදුරු පුහුණු පාසලකට ගියාම සමහර විට examinerට දෙන්න මෙච්චරක් මුදලක් ඕනෑ කියලා licence එක ගන්න එන කෙනාගෙන් කැත නැතුව ඉල්ලන යුගයක් නිර්මාණය වෙලා තිබෙනවා. එම මුදල දෙනවාද නැද්ද කියලා අපි දන්නේ නැහැ. නමුත්, එහෙම ඉල්ලීම් කරන රියැදුරු පාසල් බොහොමයක් තිබෙනවා. සියයට 100ක්ම ඒ විධියට ඉල්ලීම් කරනවාය කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. ඒ නිසා කෙනෙක් මත යැපෙන රියැදුරු බලපත්‍ර ලබාදීමේ ක්‍රමය නැති කරන්න ඕනෑ.

අපි විශේෂයෙන්ම කියනවා, ඒ සඳහා online exam ක්‍රමය ඇති කරන්න කියලා. දැනට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ඒ පිළිබඳව හිතලා තිබෙනවා, සියලුම දිස්ත්‍රික්කවල කඩිනමින් එම online exam ක්‍රමය ඇති කරන්න. ඒ වාගේම වේරහැර තිබෙනවා වාගේ රියැදුරු පුහුණු ධාවන පථයක් ඉඩ තිබෙන තැන්වල ඇති කළ යුතුයි කියා මම කියනවා. රිය අනතුරුවලින් වැඩිපුරම මරණ සිදුවන පොලිස් බලප්‍රදේශය තමයි ගම්පහ පොලිස් බලප්‍රදේශය. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සතු අක්කර 10ක විතර ඉඩමක් ඒ ප්‍රදේශයේ තිබෙනවා. එම ඉඩමේ හෝ පුහුණු ධාවන පථයක් ස්ථාපිත කරන්න කියලා මම ඉල්ලනවා.

මෝටර් රථ පාලනය කිරීම සඳහා පොලීසියට තිබෙන තැන මොකක්ද? ලොකු පොලීසියක් තිබුණත්, මෝටර් රථ පාලන අංශය සඳහා වෙන්වෙලා තිබෙන්නේ එක කාමරයයි. පොලිස් දෙපාර්තමේන්තුව තුළ motor traffic අංශය වෙනුවෙන් මීට වඩා විශේෂ තැනක්, මීට වඩා විශේෂ වැඩ පිළිවෙළක් නිර්මාණය කර දෙන්නට ඕනෑ. මෝටර් රථ පාලන අංශය නිකම් පැත්තක තිබෙන කොටසක් බවට පත්වෙලා තිබෙනවා. එහෙම නැත්නම් මුළු රටේම මෝටර් රථ පාලන කටයුතු සඳහා වෙනම පොලීසියක් හැදෙන්නට ඕනෑ. අනෙක් පොලීසිවලින් ස්වායත්ත වෙලා -අනෙක් පොලීසිවලින් නිදහස් වෙලා- මෝටර් රථ වැරදි සඳහා, නැත්නම් මෝටර් රථ පාලනය කිරීම සඳහා වෙනම පොලීසියක් ඇති කරන්න ඕනෑ. පොලිස් මෝටර් රථ අංශයේ හොඳ දක්ෂ නිලධාරින් ඉන්නවා අපි දැක තිබෙනවා. ඒ අය වෙන රටවලට ගිහිල්ලා මෝටර් රථ පාලනය ගැන, මෝටර් රථ නීති ගැන ඉගෙන ගන්නවා. හැබැයි, ඉගෙන ගෙන ලංකාවට ආවාම ඔහු අපරාධ අංශයට මාරුවෙනවා. ඉගෙන ගත්ත දේවල් කිසි දේකින් වැඩක් නැහැ. ඒක සමාජයට වැඩක් නැහැ. ඔහු ඉගෙන ගත් දේ සමාජයට දෙන්න විධියක් නැහැ. ඊළඟට, ඔහුව මාරු කර තිබෙන්නේ අපරාධ අංශයට. ඒ නිසා මේ ක්‍රමවේදය ශක්තිමත් කරන්න නම් මෝටර් රථ පොලීසිය වෙනම ඒකකයක් විධියට රටේ ස්ථාපිත වෙන්න ඕනෑ කියලා මම යෝජනා කරනවා. ඊළඟට පොලීසිය, ප්‍රවාහන අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, ජාතික ගමනාගමන කොමිෂන් සභාව කියන මේ ආයතන වෙන වෙනමයි කටයුතු කරන්නේ. මේ ආයතන සියල්ලම එකතු වෙච්ච පද්ධතියක් තුළින් රිය අනතුරු ගැන කථා කරලා, රිය අනතුරු ප්‍රශ්න විසඳන ක්‍රමවේදයක් නිර්මාණය කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 65,610යි. එයින් කිලෝමීටර් 11,610ක් පාරවල්වලට වෙන් වෙලා තිබෙනවා. අපේ රටේ වාහන ලක්ෂ 72ක් මේ කිලෝමීටර් 11,610 තුළ ගමන් කරනවා. මෙච්චර වාහන ප්‍රමාණයකට මේ පාරවල් ඉඩ මදි. මෙච්චර වාහන මේ පාරවල්වලට ඔරොත්තු දෙන්නේ නැහැ. ඒ නිසා පොදු මඟී ප්‍රවාහනය ශක්තිමත් කිරීමේ වැඩ පිළිවෙළ අපට අවශ්‍ය වෙනවා.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා ඇමතිතුමා කලින් කිව්වා, දුම්රිය මාර්ගයේ තුන්වැනි line එක දානවා කියලා. රාගම සිට වේයන්ගොඩ දක්වා තුන්වැනි දුම්රිය line එකක් electric ක්‍රමයට ඇති කරනවා කියලා එතුමා කිව්වා. ඒවා ගැන කඩිනමින් කටයුතු කරලා මේ පොදු ප්‍රවාහන පද්ධතිය ශක්තිමත් කරපුවාම අපට රිය අනතුරු මීට වඩා අඩු කරගන්න පුළුවන් වෙනවා. අපි දන්නවා, පාරට බහින හැම කෙනෙක්ම එක්කෝ රියැදුරෙක්; එහෙම නැත්නම් මගියෙක්; එහෙමත් නැත්නම් පදිකයෙක්; නැත්නම් යතුරුපැදිකරුවෙක් බව. පාරට බහින සියලුදෙනා මේ කොටස් 4න් එක් කොටසකට අයත් වෙනවා. එක්කෝ, රියැදුරෙක් වෙනවා. නැත්නම්, වාහනයක ගමන් කරන මගියෙක් වෙනවා. නැත්නම්, පාරේ ගමන් කරන පදිකයෙක් වෙනවා. එහෙමත් නැත්නම් මෝටර් සයිකල් පදවන කෙනෙක් වෙනවා. මේ සිව් ආකාරයට මාර්ගයේ ගමන් කරන අය තමයි අනතුරුවලට ලක් වෙන්නේ. මෙවැනි අනතුරුවලට ලක්වීම නිසා සමහර අය සුළු තුවාල ලබනවා; සමහර අය බරපතළ තුවාල ලබනවා; සමහර අයට මරණීය අනතුරුවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. මේ නිසා එක පැත්තකින් බෙහෙත් හේත් සඳහා රටේ සල්ලි කොච්චර නම් වියදම් කරනවාද? ඒ පිළිබඳවත් ඔබතුමන්ලාගේ විශේෂ අවධානය යොමු කරවන්න කැමැතියි.

එක්සත් ජාතීන්ගේ සංවිධානය 2010 සිට 2020 දක්වා දශකය "රිය අනතුරු අවම කිරීමේ දශකය" ලෙස නම් කර තිබෙනවා. මේ නම් කිරීමෙන් බලාපොරොත්තු වෙනවා, 2009දී සිදුවූ රිය අනතුරු ප්‍රමාණයෙන් සියයට 50ක් අඩු කරගන්න. නමුත්, අපි යන ගමන් මාර්ගය දෙස බැලුවාම එහෙම අඩුවීමක් පේන්න නැහැ. සියයට 200ක් රිය අනතුරු වැඩි වෙන එකයි පේන්නේ. රිය අනතුරු වළක්වා ගැනීම සඳහා මුදල් වියදම් කළාට රටට පාඩුවක් වෙන්නේ නැහැ; රටේ ආර්ථිකයට පාඩුවක් වෙන්නේ නැහැ. මොකද, රිය අනතුරු වැඩිවීම නිසා රටේ ජාතික ධනය විශාල වශයෙන් නාස්ති වෙනවා. මේ සඳහා දැඩි අවධානයක් යොමු කරමින් අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 3.34]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பில் எனது கருத்துக்களை இங்கு முன்வைப்பதற்குச் சந்தர்ப்பம் வழங்கியதையிட்டு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். மோட்டார் போக்குவரத்துத்

தொடர்பில் கருத்துக் கூறுகின்றபோது, எமது நாட்டில் நாளாந்தம் அதிகரித்து வருகின்ற வாகன விபத்துகள் குறித்தே முக்கிய அவதானத்தைச் செலுத்த வேண்டியிருக்கின்றது. அந்த வகையில், கடந்த வருடத்தில் மாத்திரம் சாரதிகள் மற்றும் பாதசாரிகளினால் வீதி ஒழுங்கு விதிகளைக் கடைப் பிடிக்காததன் காரணமாக சுமார் 40,000 வீதி விபத்துகள் இடம்பெற்றுள்ளதாகவும் இதற்கு மேலதிகமாக 2,922 வீதி வாகன விபத்துகளில் 3,100 பேர் உயிரிழந்துள்ளனர் என்றும் சுமார் 7,500 பேர் காயங்களுக்கு உள்ளாகியுள்ளதாகவும் பொலிஸ் தலைமையக அறிக்கை சுட்டிக்காட்டுகின்றது.

வீதிச் சட்டங்களை முறையாகக் கடைப்பிடிக்காதோர் குறித்துப் பொலிஸ் தலைமையகப் போக்குவரத்துப் பிரிவின் மூலமாக பொலிஸார் மேற்கொண்ட நடவடிக்கைகளின்போது, ஓரிலட்சம் பேர் அடையாளம் காணப்பட்டதாகவும் பொலிஸாரின் கண்காணிப்பு நடவடிக்கைகளில் சிக்காதோர் மேலும் பலர் கடந்த வருடத்தில் இருந்திருக்கக்கூடும் என்றும் தெரிவித்துள்ள மேற்படி அறிக்கையானது, கடந்த வருடத்தில் வீதிச் சட்டங்களை மீறியமை தொடர்பில் 1,40,000 பேருக்கு தண்டப் பணம் விதிக்கப்பட்டதாகவும் தெரிவிக்கின்றது. கடந்த வருட புள்ளிவிபரங்களைப் பார்க்கின்றபோது, வீதி விபத்துகள் காரணமாக 935 பாதசாரிகள் உயிரிழந்துள்ளனர் எனத் தெரிய வருகின்றது. கடந்த சில வருடங்களைப் பார்க்கின்றபோது, முறையாக வீதி ஒழுங்குகளைப் பின்பற்றி பாதசாரிகளுக்கான கடவைகளின் ஊடாகப் பயணஞ் செய்கையில், வருட மொன்றுக்கு சுமார் 100 பாதசாரிகள் முறையற்ற வாகன சாரதிகளால் கொல்லப்படுவதாகவும் சுமார் 1,000 பேர் வரையிலான பாதசாரிகள் காயமடைவதாகவும் தெரிய வருகின்றது. இத்தகைய வீதி விபத்துக்களைப் பார்க்கின்ற போது, எமது நாட்டில் நாளாந்தம் சுமார் 10 பேர் வீதம் வீதி வாகன விபத்துகளால் உயிரிழப்பதுடன், சுமார் 20 பேர் வரையில் அங்கவீனமாக்கப்படுகின்றனர். அதுமட்டு மல்லாது, மேற்படி விபத்துகள் காரணமாக வருடத்திற்கு சுமார் 20 பில்லியன் ரூபாயை மருத்துவச் செலவாக அரசு செலவிட வேண்டிய நிலைமையும் ஏற்பட்டிருக்கின்றது என்பதையும் நாம் அவதானத்திற்கொள்ள வேண்டும்.

வேகக் கட்டுப்பாட்டினை மீறுதல், போதையில் வாகனத்தைச் செலுத்துதல் போன்ற காரணங்களும் மேற்படி வீதி விபத்துகளுக்கான காரணங்களாக முன்வைக்கப்படுகின்ற நிலையில், வீதிச் சமிக்ஞைகள், வீதிக் குறியீடுகளின் பொருத்தமற்ற தன்மைகள், வீதிகளின் மோசமான நிலைமை கள், பாதசாரிக் கடவைகளில் பொருத்தப்பட்டுள்ள போக்கு வரத்து விளக்குகள் பொருத்தமான வகையில் செயற்படாமை, போக்குவரத்து மின்விளக்குகளுடன் காணப்படுகின்ற நேரமானிகளில் ஏற்படுகின்ற குளறுபடிகள் போன்றவையும் இத்தகைய விபத்துக்களுக்கு காரணங்களாக முன்வைக்கப்படு கின்ற நிலைமைகளும் இல்லாமலில்லை.

அத்துடன், பாதசாரிக் கடவைகளில் இடம்பெறுகின்ற விபத்துக்களில் 30 சதவீதமானவை கைத்தொலைபேசிப் பாவனை மூலமாக ஏற்படுவதாக இலங்கைத் தகவல் பொறியியல் பல்கலைக்கழகம் தகவல் வெளியிட்டிருக்கிறது. பாதசாரிகள், பாதசாரிக் கடவைகளைக் கடக்கின்றபோது கைத்தொலைபேசிகளைப் பயன்படுத்துவதாலும் வாகன சாரதிகள் வாகனங்களைச் செலுத்திக்கொண்டு பாதசாரிக் கடவைகளைக் கடக்கின்ற நிலையில் கைத்தொலைபேசியைப் பயன்படுத்துவதனாலும் இத்தகைய நிலை ஏற்படுவதாகத் தெரிய வந்துள்ளது.

இன்றும்கூட பல பொலிஸ் நிலையங்களில் வேகக் கட்டுப்பாட்டினை மீறுகின்ற வாகனங்களின் சாரதிகளைப் பிடிப்பதற்கான நவீன இயந்திர சாதனங்கள் இல்லாத நிலையும் பல பகுதிகளில் போக்குவரத்துப் பொலிஸாரின் பணிகள் அதிகாலை நேரங்களில் காணப்படாத நிலைமையும் காணப்படுகின்றது. குற்றங்கள் நிகழும்வரையில் மறைந்து பார்த்துக்கொண்டிருந்துவிட்டு, குற்றம் நிகழ்ந்த பின்னர் ஓடிச்சென்று பிடித்துத் தண்டப் பணம் அறவிடுவதைவிட, குறித்த குற்றச் செயல்கள் நிகழ முன்பதாக அவற்றைத் தடுக்கக்கூடிய பணிகளில் போக்குவரத்துப் பொலிஸார் அதிகளவில் ஈடுபடுத்தப்பட்டால் போதியளவு குற்றங்களைத் தடுக்க முடியுமென்பதை இச்சந்தர்ப்பத்தில் தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன்.

மேலும், திருத்த வேலைகள் நடைபெறுகின்ற பாதைகளிலும் பாதைத் திருத்தங்கள் காரணமாக மாற்றுப் பாதைகளைப் பயன்படுத்தவேண்டிய இடங்களிலும் பொதுவாகவே தமிழ் மொழியில் அறிவிப்புகள் குறிப்பிடப் படுவதில்லை. இவ்விடயம் தொடர்பிலும் கவனமெடுத்து, இத்தகைய இடங்களில் மும்மொழிகளிலும் அறிவிப்புகள் இடம்பெறும் வகையில் நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டும் என்பதையும் இங்கு வலியுறுத்திக்கூற விரும்புகின்றேன்.

அடுத்து, கொழும்பு-யாழ்ப்பாணம் தனியார் பேருந்துப் போக்குவரத்துச் சேவைக்கான வழித்தட அனுமதிக் கட்டணமானது, எமது நாட்டைப் பொறுத்தவரையில் மிகவும் அதிகமானதாகக் காணப்படுவதாலும் வழித்தட அனுமதிகளின் பங்கீடுகளில் முறைகேடுகள் இடம்பெறுவதாலும் சில பேருந்துகள் வழித்தட அனுமதியைப் பெறாமல் போக்கு வரத்துச் சேவையில் ஈடுபடுகின்ற நிலைமைகளும் இல்லாமலில்லை. அதேநேரம், வழித்தட அனுமதிக்குரிய எண்ணிக்கையினை மீறிய வகையில் முறைகேடாக வழங்கப்படுகின்ற வழித்தட அனுமதிகளும் இல்லாமலில்லை. இத்தகைய நிலைமைகள் காரணமாக போக்குவரத்துக்களின் போது பல்வேறு முறைகேடுகள், ஒழுங்குவிதி மீறல்கள் போன்றவை இடம்பெறுவது மட்டுமன்றி, எரிபொருள் மாற்றுப் பாவனைகளும் இடம்பெறுவதால் அதிகளவில் சூழல் மாசுறுகின்ற நிலைமையும் காணப்படுகின்றது. எனவே, போக்குவரத்து அமைச்சானது இத்தகைய நிலைமையினை அவதானத்திலெடுத்து உரிய நடவடிக்கைகளை மேற் கொள்வதோடு, மேற்படி வழித்தட அனுமதியின் கட்டணக் குறைப்புக்கும் வழித்தட அனுமதிப் பங்கீடுகளில் முறை கேடுகள் இடம்பெறாதிருப்பதற்கும் வழிகாண வேண்டும்.

அதுமட்டுமன்றி, வடக்கு மாகாணத்தைப் பொறுத்த வரையில் தனியார் பேருந்துப் போக்குவரத்துச் சேவை தொடர்பில் அரசு மாற்றாந்தாய் மனப்பான்மையுடனேயே இன்னமும் செயற்பட்டு வருவதாகத் தெரிய வருகின்றது. வடக்கு மாகாணப் போக்குவரத்து அதிகாரசபையினைச் செயற்படுத்துவதற்கு நிதி இல்லையெனத் தெரிவித்து, அதனைச் செயற்படுத்துவதற்கான நிதியைத் தனியார் பேருந்து உரிமையாளர்களிடம் கோருகின்ற நிலையில், வட மாகாண உள்ளூர்ப் போக்குவரத்தில் ஈடுபடுகின்ற பேருந்துகளுக்கான வழித்தட அனுமதிக் கட்டணம் மூவாயிரம் ரூபாயிலிருந்து பத்தாயிரம் ரூபாய்வரை திடீரென அதிகரிக்கப்பட்டுள்ளதாகத் தெரிய வருகின்றது. பின்னர் இது ஏழாயிரத்து ஐந்நூறு ரூபாயாகக் குறைக்கப்பட்டுள்ளபோதிலும், அதனை ஐயாயிரம் ரூபாயாகக் குறைக்குமாறும் அதேபோன்று, மாதாந்த log sheet கட்டணமானது 200 ரூபாயிலிருந்து 1,000 ரூபாய்வரை அதிகரிக்கப்பட்டு, பின்னர் அது 750 ரூபாயாகக் குறைக்கப்பட்டுள்ளபோதிலும் அதனை 500 ரூபாய்வரை குறைக்குமாறும் தனியார் பேருந்து உரிமையாளர் சங்கத்தினர் கோரிக்கை விடுத்து வருகின்றனர். அவ்வாறே, பழைய

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

பேருந்தினை விற்றுவிட்டுப் புதிய பேருந்து வாங்குவோருக்கான பதிவுக் கட்டணம் வடக்கில் மாத்திரம் 2,000 ரூபாயிலிருந்து 10,000 ரூபாயாக அதிகரிக்கப்பட்டுள்ளதாகவும் தெரிய வருகின்றது. எனவே, இத்தகைய நிலைமைகள் உடனடியாக மாற்றப்பட்டு, தென்னிலங்கையில் என்ன நியதியோ, அதே நியதியை வடக்கிலும் கடைப்பிடிப்பதற்கு இந்த அரசு நடவடிக்கை எடுக்கவேண்டுமென வலியுறுத்திக் கூற விரும்புகின்றேன்.

எமது நாட்டில் குறிப்பாக வடக்கு நோக்கிய ரயில் கடவைகள் பலவும் பாதுகாப்பற்றனவாகவே இன்றும் இருந்து வருகின்றன. இதனால், அங்கு தொடர்ந்தும் பல விபத்துகள் ரயில் கடவைகளில் இடம்பெற்று வருகின்றன. வடக்கிற்கான ரயில் போக்குவரத்து மீள ஆரம்பிக்கப்பட்டதன் பின்னர், பொலிஸ் திணைக்களத்தினால் பாதுகாப்பற்ற ரயில் கடவைகளின் பாதுகாப்பிற்காக பணியாளர்கள் இணைத்துக் கொள்ளப்பட்டனர். எனினும், இதுவரையில் இவர்களது தொழில் ஒரு தொழிற்றுறையாக ஏற்றுக்கொள்ளப்படாமலும் நிரந்தரமாக்கப்படாமலும் இருக்கின்றது. அத்துடன், இவர்களுக்கான மாதாந்தக் கொடுப்பனவு என்பது இவர்களது வாழ்வாதாரங்களை ஈட்டிக்கொள்ள இயலாத வகையில் மிகவும் சொற்பமான ஒரு தொகையாகவே இருந்துவருவதுடன், இவர்களுக்கு விடுமுறைகள்கூட இல்லாத நிலை காணப்படுகின்றது. மேற்படி பாதுகாப்பற்ற ரயில் கடவைகளின் பாதுகாப்புப் பணியாளர்களின் பிரச்சினைகள் தொடர்பில் நான் பலமுறை இந்தச் சபையில் சுட்டிக்காட்டியிருக்கின்றேன். அதற்கு நடவடிக்கை எடுக்கப்படும் எனக் கூறப்பட்ட போதிலும், இதுவரையில் எவ்விதமான நடவடிக்கைகளும் மேற்கொள்ளப்பட்டதாகத் தெரியவில்லை. எனவே, மேற்படி பணியாளர்களை இலங்கைப் புகையிரதத் திணைக்களத்துடன் இணைத்து, அவர்களது தொழிலை நிரந்தரமாக்குவதற்குப் போக்குவரத்து அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

ரயில் சேவையினை மேலும் அதிகரித்தும் தரமுயர்த்தியும் விஸ்தரிப்பதனூடாக எமது நாட்டில் காணப்படுகின்ற வாகன நெரிசல்களுக்குப் போதியளவு தீர்வு காணலாமென எண்ணுகின்றேன். அந்த வகையில் வடக்கின் ரயில் சேவையில் பாரிய நெருக்கடிகள் காணப்படுவதால், இரண்டாவது தபால் ரயில் சேவையை ஆரம்பிப்பதற்கும் 'ரஜரட்ட ரெஜின' உள்ளிட்ட, நகரங்களுக்கிடையிலான ரயில் சேவைகளை வவுனியாவுக்கும் கிளிநொச்சிக்கும் இடையில் நடத்துவதற்கும் காங்கேசன்துறைக்கும் பளைக்கும் இடையில் அரச அதிகாரிகள் மற்றும் பாடசாலை மாணவர்களது வசதி கருதி விசேட ரயில் சேவையொன்றை மீண்டும் நடத்துவதற்கும் நடவடிக்கை எடுக்குமாறு வலியுறுத்த விரும்புகின்றேன். கடந்த காலங்களில் இந்தச் சேவை இருந்தது என்பதையும் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அதேபோன்று மாகோவுக்கும் பொல்காவலைக்கும் இடையில் வடக்கு, கிழக்குப் பகுதிகளிலிருந்து எதிர்த்திசையில் பயணிக்கும் ரயில்கள் கடவைகளில் தாமதமடைவதால், அங்கு இருவழிப் பாதை அமைப்பதற்கும் யாழ்ப்பாணத்தை மையமாகக் கொண்டு உதவி எந்திரி அலுவலகம் ஒன்றை அமைப்பதற்கும் யாழ்-கொழும்பு 'உத்தரதேவி' ரயில் சேவையைக் கல்கிசை வரையில் நீடிப்பதற்கும் குளிரூட்டப்பட்ட ரயில் சேவையில் ஈடுபடுகின்ற ரயில்களில் தினம், தேவை கருதி விசேட பெட்டிகளை இணைப்பதற்கும் ரயில்களின் ஆசனங்கள், மலசலகூடங்கள் உள்ளிட்டவற்றின் தரங்களை உயர்த்துவதற்கும் நடவடிக்கை எடுக்குமாறு கேட்டுக் கொள்வதோடு, வடக்கு, கிழக்கு மாகாணங்களுக்கான ரயில் சேவையில் போதியளவில் தமிழ்மொழி தெரிந்த அதிகாரிகள் மற்றும் பணியாளர்களை நியமிப்பதில் கூடிய கவனம் செலுத்துமாறும் மீண்டும் வலியுறுத்திக்கூற விரும்புகின்றேன்.

மோட்டார் போக்குவரத்துத் திணைக்களமானது அதனது வினைத்திறன்களைக் கருத்தில்கொண்டு முழுமையாக கணினிமயப்படுத்தப்பட உள்ளதாகத் தகவல்கள் வெளிவந்திருக்கின்றன. இந்த ஏற்பாடுகள் தற்போது எந்த நிலையில் இருக்கின்றன? எனவும் அறிய விரும்புகின்றேன். கடந்த காலங்களில் ஊழல், மோசடிகள் தொடர்பில் ஊடகங்களால் பேசப்பட்ட துறைகளில் மோட்டார் போக்குவரத்துத் திணைக்களமும் முக்கிய இடத்தினை வகித்திருந்தது. இத்தகைய நிலைமைகளை ஒழிப்பதற்காகவே மேற்படி கணினிமயப்படுத்தல் கொண்டுவரப்படப் போவதாகக் கூறப்பட்டது. எனவே, அதனது தற்போதைய நிலைமைகள் குறித்தும் அறியத்தருமாறு கேட்டுக் கொள்கின்றேன்.

அதேநேரத்தில், இன்று அதிகாலை தியத்தலாவையில் நடந்த ஓர் அசம்பாவிதத்தில் பலர் பாதிக்கப்பட்டிருக்கிறார்கள். அந்தச் சம்பவம் கண்டிக்கப்பட வேண்டியது; மிகவும் வருத்தத்துக்குரியது. எனினும், பொறுப்புவாய்ந்தவர்கள் - ஊடகங்களாக இருக்கலாம், அரசியல்வாதிகளாக இருக்கலாம் - யாராக இருந்தாலும் தேசிய நல்லிணக்கத்துக்குப் பாதிப்பு ஏற்படாத வகையில் அது சம்பந்தமான செய்திகளை வெளியிடவேண்டும் என்பதையும் உண்மைகளை மறைத்துக் கொள்வதற்காக அப்பாவித் தமிழ் மக்கள்மீது அந்தப் பழியைச் சாட்டிவிடக்கூடாது என்பதையும் இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவருவதோடு, எனக்கு இங்கு உரையாற்றுவதற்கு நேரம் கொடுத்ததற்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
මීළඟට, ගරු සිසිර ජයකොඩි මහතා.

[අ.භා. 3.46]

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින ඉදිරිපත් කර තිබෙන මෝටර් වාහන පනත යටතේ නියෝගය පිළිබඳවයි අපි සාකච්ඡා කරන්නේ. අද කවුරුත් නොකියන දෙයක් තමයි මේ නියෝගය මඟින් සිදු කරන්නේ. මෝටර් වාහන සඳහා අංක තහඩු ලබා ගනිද්දී අය කරන ගාස්තු සංශෝධනය කිරීමක් මෙයින් සිදු කරනවා. මේ රටේ ජනතාවට රුපියල් එක්දහස් පන්සියයකින් හෝ බර වැඩි කිරීමක්. රට ආර්ථික වශයෙන් විනාශ කරපු, රටේ ජනතාවට දවසින් දවස බදු බර පටවන, ජනතාව පීඩාවට පත් කරන ආණ්ඩුව තවදුරටත් මහා දේශපාලන සාකච්ඡාවන් කරන සභාවන් බවට පරිවර්තනය කරලාත් කථා කරන්නේ ගාස්තු වැඩි කිරීම ගැන. මේ ගාස්තු වැඩි කිරීම සම්බන්ධයෙන් අපේ සහෝදර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිසි කෙනෙක් කථා කරන්නේ නැහැ. වෙනත් වැල්වටාරම් කථා කිරීම පමණයි සිද්ධ කරන්නේ. රුපියල් එක්දහස් පන්සියයකින් වෙන්නට පුළුවන්; විවිධ අයිතම්වලින් ලබා දෙන ගාස්තු වැඩි කිරීම් වෙන්නට පුළුවන්, ඒ සියලු දෙය මේ රටේ ජනතාවට මහ විශාල බරක්; වැය බරක්. මේ රටේ අහිංසක මිනිහාගේ pocket එකට ගහන, මේ රටේ

අහිංසක මිනිසුන්ට රිදවන, මේ රටේ අහිංසක මිනිසුන්ගේ මුදල් සූරාකන, දේශද්‍රෝහී ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව දවසින් දවස පත් වෙනවා. ඇත්ත ගැසට් නිවේදනයේ කරුණු නොකියා බොරු පුරසාරම් දොඩනවා. ඒකයි සත්‍ය කථාව.

ඊළඟ කාරණය, -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Lucky Jayawardana to the Chair?

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

I propose that the Hon. Lucky Jayawardana do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ඉතිහාසයේ ප්‍රවාහනයත් එක්ක මුලින්ම බැඳෙන්නේ කරත්තයයි. අපි මුලින්ම ගමන් කළේ කරත්තයෙන්. මේ ආණ්ඩුවත් හරියට බරකරත්තයක් වාගෙයි. කඩා වැටෙන, ගරා වැටෙන කරත්තයක්. අද ආණ්ඩුව සහාග ගිවිසුම දීර්ඝ කරනවා අපි දැක්කා. ඒ කියන්නේ, පරණ කරත්තයම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

බැඳලා මේ දුෂ්කර ආර්ථික ගමන යන්න දැන් ආණ්ඩුව ලැහැස්ති වෙනවා. අපේ ප්‍රවාහන සේවයේ ආරම්භක දෙය පරණ කරත්තය. ඒ පරණ කරත්තය, ගරා වැටෙන කරත්තය, විනාශ වෙච්ච කරත්තය, කැලි ගැලවෙන, ඇණ මුරිච්චි ගැලවෙන කරත්තය රටේ ආර්ථිකය බර කරලා, රටේ ආර්ථිකය විනාශ කරලා. අපේ මූල්‍ය වෙළඳපොළ කඩා වැටිලා. රට ආර්ථික වශයෙන් බංගොලොත් භාවයට පත් කරලා. _

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඒ බර කරත්තයේ බඳවා ගන්න තෝන්ලැල්ලේ බඳින්න දැන් පටන් අරගෙන, අද ඉඳන් ඔන්න ගමන යනවා. එම නිසා ප්‍රවාහනයට විතරක් නොවෙයි, මුළු රටටම සෙතක් නැති, අනාගතයක් පෙනෙන්නේ නැති රටක් බවට අපේ රට පරිවර්තනය වෙලා තිබෙනවා. ඒ ගැන කිසිම සැකයක් ඇත්තේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි පසුගිය මැතිවරණ කාලපරිච්ඡේදයේ දී අපේ ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කිව්වා, අවුරුදු තුනක් තිස්සේ මේ ආණ්ඩුව රට විනාශ කළා, මේ රටේ ජාතික ධනය එක්සත් ජාතික පක්ෂය සොරකම් කළාය කියලා. කවුද කිව්වේ? අපි නෙවෙයි. එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමයි කිව්වේ. දැන් ඒ පරණ හොරුත් එක්කම, ඒ පරණ කණ්ඩායමත් එක්කම ලජ්ජා නැතිව නැවත ගමනක් ආරම්භ කරනවා. අපි නම් කිව්වා, බොරු සටන් පාඨ කියමින් මේ බෙරු හුරතලයක් පෙන්වන්නේ කියලා. මේක තාවකාලික තරහවීමක්. පෙම්වතුන්ගේ දවස වෙනකොට මේ දෙන්නා සෙන්ට් - පවුඩර් දාලා ආයෙත් කසාද බඳිනවාය කියා අපි නම් මැතිවරණ වේදිකාවේ කිව්වා. අපේ කථාව මේ රටේ ජනතාව පිළිගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේවා කියන්නේ ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා සංඛ්‍යා ලේඛන විජ්ජාවක් ගැන කථා කරපු නිසා. ජනාධිපතිවරණයේ දී ඡන්ද හැට දෙලක්ෂයකට වැඩියෙන් ලබා ගත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ පක්ෂයට මේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී ලක්ෂ දහතුනට වඩා ඡන්ද අඩු වෙනවා. ඒ කියන්නේ ලක්ෂ පනහකට ආසන්න පිරිසක් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ නායකත්වය රට තුළ ප්‍රතික්ෂේප කරනවා. ඡන්දදායකයන් සියයට පනහක්. එම නිසා මොන සංඛ්‍යා විජ්ජාව කළත්, මේ රටේ මහ පොළොවේ යථාර්ථය තමයි මේ ආණ්ඩුවට මේ දුෂ්කර ආර්ථික ගමන යන්න බැහැ කියන එක. ප්‍රවාහනය විතරක් නොවෙයි, රටේ සමස්ත ඉදිරි ගමන යන්න මේ ආණ්ඩුවට බැරි බව ඉතාම පැහැදිලිව පේනවා. ඒක තමයි යථාර්ථය බවට පත් වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවේ කට්ටිය ප්‍රවාහනය ගැන මහා දේශනා පවත්වනවා. මම හැමදාම එන්නේ කැලණිය, විද්‍යාලංකාර පිරිවෙන ඉදිරිපිට පාලමෙන්. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව දවස් 61ක් ඇතුළත මේ පාලම හදලා අවසන් කළා. දැන් මේ පාලමේ එක පැත්තක් ගලවා දමා මාස හතක් ගත වෙනවා. මේ නිසා උදේට කිරිබත්ගොඩ සිට කොළඹට ඇතුළු වන සියලු වාහන මහා තදබදයක් එක්ක පැය ගණන් රස්තියාදු වෙනවා. අපි හදපු පාලමේ ඇණ ටික තද කරන්න බැරි ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. ලජ්ජා නැතිව තව කථා කරන්නත් එනවා. මේ පාලම ප්‍රතිසංස්කරණය කර ගන්න බැරිව මාස හතක් ගත වෙලා තිබෙනවා. මම ඒ ප්‍රදේශයේ ජීවත් වන කෙනෙක්. පාලමේ ඇණ ටික තද කර ගන්න බැරිව එහි එක පැත්තක් -මංතීරුවක්- වහලා තිබෙන්නේ. මොකක්ද මේ රට? මේ රට කොහේටද යන්නේ? මොනවාටද මේ පුරසාරම්? මේ රට නැති කරපු කණ්ඩායමද මේ කථා කරන්නේ? [බාධා කිරීමක්] ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙලාව වෙන් කර තිබෙනවා. ඒ වෙලාවේදී ඔබතුමාට උත්තර දෙන්න පුළුවන්. දැන් මගේ කථාවට බාධා කරන්න එපා. [බාධා කිරීමක්] රිදෙනවා නම් ගිහින් පාලම හදන්න. අසත්‍ය උත්තර දෙන්න එපා. ඔය අසත්‍ය උත්තර රටේ මිනිසුන්ට දැන් ඇති වෙලා තිබෙන්නේ.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා දින 61කින් හදපු පාලමක් ගැන කිව්වා. ආර්.ආර්. සමරකෝන් මහත්මයා "කැලණි පාලම" කියා නාට්‍යයක් හැදුවා නේ. ඔබතුමා කියන්නේ ඒ නාට්‍යය ගැනද? එහෙම නැත්නම් දින 61කින් හදපු ඇත්තම පාලමක් එතැන තිබෙනවාද? ඔබතුමා කියන්නේ මොකක් ගැනද?

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

ඔබතුමාත් අගමැතිතුමාගේ ගෝලයෙක් නිසා ඕනෑම ප්‍රශ්නයකට විහිළුවක් දමලා "ෂේප්" වෙන්න තමයි යන්නේ. අගමැතිතුමාගේ ගෝලයා නිසා ඔබතුමාට ඕනෑම දෙයක් විහිළුවක්. මේ රටේ සිටින ලක්ෂ ගණන් මිනිසුන්, උදේට පාසල්වලට යන්න එන දරුවෝ මහ පාරේ රස්තියාදු වෙනවා. කඩිනම්ව ක්‍රියාත්මක වෙලා, කොළඹට ඇතුළු වන ප්‍රධාන මාර්ගයේ මේ පාලම ඉක්මනින් හදන්න.

ඉස්සර, මෙහි දුම්රිය හරස් මාර්ගය නිසා උදේට විනාඩියෙන් විනාඩියට වාහන නැවැත්වීම නිසා මිනිසුන්ට ප්‍රවාහනයේ දී අපහසුකම් මතු වුණු බව අපි දන්නවා. අපේ ආණ්ඩුව ඒ ප්‍රශ්නය විසඳුවා. දැන් මේ පාලමේ එක මංතීරුවක් වසා දමලා අලුත්වැඩියා නොකර ඉන්නවා. ඔබතුමන්ලා ආර්.ආර්. සමරකෝන්ගේ අර පරණ "ජෝක්" එක දමන්න යනවා. ඔබතුමන්ලා අගමැතිතුමාගේම ගෝලයෝ තමයි. රටට වැඩක් නැහැ. විහිළු සපයන එක විතරයි කරන්නේ. ඔය විහිළුව දැන් මේ රටට ඇති. මේක ඔබ අප සියලුදෙනාගේම රටයි. මේවා මිනිසුන්ගේ ප්‍රශ්න. ඒවාට විසඳුම් දෙන්න. බැරි නම් ඔබතුමන්ලා අයින් වෙන්න. ඔබතුමන්ලා ප්‍රවාහන ඇමතිතුමාට, මහාමාර්ග ඇමතිතුමාට කථා කරලා කියන්න, මේ පාලම හදා දෙන්නය කියලා. ඒක මේ රටේ ජනතාවගේ ප්‍රශ්නයක්. ඒක කොළඹ නගරයට ඇතුළු වන ප්‍රධාන මාර්ගය.

මා ඊළඟට කියන්න යන කාරණය මමත් පෞද්ගලිකව අත් විඳින ප්‍රශ්නයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පස්වරු පහයි කාලට බම්බලපිටියේ සිට කිරිබත්ගොඩට එන්න පිටත් වුණොත්, රෑ අට වන තුරු අපි කිරිබත්ගොඩට එනවා. පාඨලී චම්පික රණවක ඇමතිතුමා අධිවේගී මාර්ගවලට සාප කරනවා මම දැක්කා. අපි ආරම්භ කළ කඩවත නුවර අධිවේගී මාර්ගය විවෘත කරන්න නියමිතව තිබුණේ 2020ට ඉස්සර වෙලායි. අද එහි තත්ත්වය මොකක්ද? තවම වන්දි ගෙවලාත් නැහැ. කඩවත ප්‍රදේශයේ අදත් උද්ඝෝෂණ. මිනිසුන් මැසිවිලි නඟනවා. ඒ මිනිසුන්ට මුදල් ටික දීලා නැහැ. ඉඩම් පවරා ගැනීම -අත්පත් කර ගැනීමේ කාර්යවත්- තවම නිමා කර නැහැ. කොහේටද මේ රට යන්නේ? කටුනායක - පැලියගොඩ අධිවේගී මාර්ගයේ මූලික සැලැස්මේ තිබුණේ මේ වර්ෂයේ මැයි මාසය වන විට එය කොළඹ වරාය දක්වා යන්නයි. අපි කැලණියේ ජීවත් වන අයයි. මහජන නියෝජිතයක් ලෙස මමත් මෙම මාර්ග සැලැස්ම සම්බන්ධ සාකච්ඡාවට සහභාගි වුණා. 2018 වන විට මෙම මාර්ගය කන්ටේනර් -බහලුම්- එක්ක වරායට ගමන් කරන්න තමයි සැලසුම් කර තිබුණේ. අද එය මේ රටේ සිද්ධ වෙනවාද? අද මේ රට කඩා වැටිලා නැද්ද? රට ආර්ථික වශයෙන් නැවතිලා නැද්ද?

මේ ඔක්කොම අස්සේ දැන් ආණ්ඩුව සැරසෙනවා, මැතිවරණය අවසන් වන තුරු නවත්වා තිබුණු බඩු මිල ඉහළ දැමීම ක්‍රියාත්මක කරන්න. ඩොලර් එක දවසින් දවස වැඩි වෙනවා. අද එහි විකුණුම් මිල රුපියල් 160ට ආසන්න වෙලායි තිබෙන්නේ. එහි මිල රුපියල් 157.17යි කියා අද පුවත් පත්වල පළ වී තිබෙනවා. අපි දන්නවා, මූලා වෙළෙඳ පොළේ ව්‍යාපාර ගනුදෙනු සිදු වන්නේ ඩොලරයේ අගය 160ට වඩා වැඩියෙන් බව. ඩොලර් එක වැඩි වෙනවා කියන්නේ, මේ රටේ සියලුම ආනයන වියදම් වැඩි වෙනවා කියන එකයි.

එහෙම නම් තමුන්නාන්සේලා තව මාස දෙකක් යන කොට තෙල් මිල වැඩි කරනවා. ඒක තමයි යථාර්ථය. ගෑස් මිල වැඩි කරන්න දැන්ම තීරණය කරලා ඉවරයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු පියල් නිශාන්ත මන්ත්‍රීතුමාගේ කාලයෙන් මට විනාඩි හතරක් ලබා දී තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඒ විනාඩි හතරක් එක්ක තමයි කාලය අවසන් වී තිබෙන්නේ.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා. එතුමා කථා කරන්නේ නැහැ. එතුමාගේ කාලයෙන් විනාඩි දෙකයි මම ගන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

එහෙම නම් ඒ විනාඩි දෙක කථා කරන්න.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

හොඳමයි.

ඔබතුමන්ලා බඩු මිල වැඩි කරන්නයි යන්නේ; ඉන්ධන මිල වැඩි කරන්නයි යන්නේ. තමුන්නාන්සේලාට තිබෙන්නේ දුෂ්කර ගමනක්. මේ ආණ්ඩුව ක්‍රියාත්මක කර ගෙන යන ආර්ථික පිළිවෙතේ වැරැද්ද, රට දුවන්නේ නැතිකම, රටේ ආයෝජන නැතිකම, ව්‍යාපාර කඩාගෙන වැටීම, බඩු මිල වැඩිවීම, උද්ධමනය වැඩිවීම, දරාගන්න බැරි පීඩනය මේවා නිසා මේ රටේ මිනිස්සු නොසන්සුන්වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒ මනස සුවපත් නොකර මාර්ග අනතුරු සිද්ධ කරන්න එපා කියලා අපට කිසිම රියැදුරකුට කියන්න බැහැ; දේශනා පවත්වන්න බැහැ. අර එක මන්ත්‍රීතුමෙක් කථා කළා. එතුමා මාර්ග අනතුරු වැළැක්වීම පිළිබඳ දේශනාවක් කළා. මිනිසාගේ මනස තමයි මාර්ග අනතුරු සිදුවීමට බලපාන ප්‍රශ්නය. මානසික වශයෙන් තිබෙන ව්‍යාකූලභාවය. නිරවුල් මනසකින් රිය පදවන මනුස්සයා අතින් අනතුරක් වන්නේ නැහැ. ඒ නිසා මේ ප්‍රශ්නත් එක්ක, මේ පීඩනයත් එක්ක, මේ වාහන තදබදයත් - traffic jam එකත් - එක්ක, මේ බඩු මිලත් එක්ක, මේ ඉන්ධන මිලත් එක්ක; මේ සමාජය තුළ තිබෙන පීඩනයත් එක්ක මිනිහෙකුට නිරවුල් මනසකින් වාහනයක් එළවාගෙන යන්න බැහැ. ඇයි, මේ රට එළවන්නේ දුර්වල නායකයෝ. රට ඉදිරියට ගෙන යන්නේ, රට නැමැති රථය අරගෙන යන්නේ දුර්වල නායකයෝ; වැඩ බැරි නායකයෝ; රට විනාශ කරපු නායකයෝ; රට පරාදීන කරපු නායකයෝ; රටේ ආර්ථිකය කඩා වට්ටපු නායකයෝ. ඒ නිසා කොහොමද, අනතුරු වළක්වන්න පුළුවන් වන්නේ? කොහොමද සමබරව ගමනක් යන්නේ? ගමනක් යන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මේ කාරණයත් කියනවා. අපට රට විනාශ වුණත්, ආර්ථිකය නැති වුණත් එක සැනසුමක් තිබුණා. ඒක තමයි රටේ බෝම්බ

පුපුරන්නේ නැහැයි කියන එක. මම බොහොම සංවේගයෙන් කථා කරන්නේ. අපේ රටට, අපේ රටේ මිනිස්සුන්ට අබමල් රේණුවක හරි වරදක් වෙනවා නම් අපි ඒකට කැමැති නැහැ. හැබැයි, ඒ පෞද්ගලික සිද්ධිද, ආරක්ෂක සිද්ධිද කියලා මම දන්නේ නැහැ. රටේ ඉතිහාසයේ නොවූ විරූ සිද්ධි අද ආරම්භ වෙමින් පවතිනවා. මේවායේ නැවතීම කොතැනද කියන එක පිළිබඳව අපට ප්‍රශ්නයක් එනවා. ඒ නිසා මුළු රටත්, සමස්ත ආර්ථිකයත්, රට තුළ පැවතුණු සාමකාමී වාතාවරණයත් මේ සියල්ල විනාශ කළ දේශද්‍රෝහී ගමන් මඟක් තමයි මේ අවුරුදු තුනක කාල පරිච්ඡේදය තුළ ගෙන ගියේ. ඒකට අපේ රටේ ජනතාව නිසි උත්තරය දීලා තිබෙනවා. ඒ නිසා දැන් තිබෙන්නේ මේ පැදගෙන යන රථය නවත්වලා, පුළුවන් මිනිස්සුන්ට භාර දීලා ගෙදර යන එකයි කියලා මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා.

[අ.භා. 3.59]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද, ඉතාමත් වැදගත් නියෝගයක් පිළිබඳව කථා කරන අවස්ථාව. හැබැයි, අපේ සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා නම් කථා කළේ මාතෘකාවට අදාළ නොවන වෙනත් දේවල් ගැනයි. පරණ කරත්තය,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

බැඳගෙන යනවා කියලා තමයි එතුමා කියන්නේ. අනේ, මම දන්නේ නැහැ,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියලා තමයි එතුමා ඉස්සරවෙලාම ප්‍රකාශ කළේ. [බාධා කිරීමක්] මේ අවස්ථාවේ එතුමා පක්ෂයේ නායකයා වන

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියලා අපහාස කළා. සදාචාරාත්මකව එහෙම කියන්න හොඳ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියලා චෝදනා කරනවා නම් ඒක ඉතාමත්ම බරපතළ වැරැද්දක්. හැබැයි, මම කියන්න කැමැතියි, තමුන්නාන්සේලාත් ඔය කරත්තයේ බඳින්න හරකෙක් ගෙනාවාය කියන එක. ඒ හරකා ගෙනැල්ලා බැඳගෙන කොහොම හරි 113 හදා ගෙන කරත්තයට නඟින්න හැදුවා. ඒක බැරි වුණාට පස්සේ තමයි තමුන්නාන්සේලාත් ඔය කරත්තයට ගරහන්නේ; හරකුන්ට ගරහන්නේ. තමුන්නාන්සේලා කියපු හරකා බැන්දා නම් තමුන්නාන්සේලාට බොහොම චූන් එකට ඔය කරත්තයේ යන්න තිබුණා. ඒ නිසා කථා කරන කොට කරුණාකරලා පරිස්සමින් වචන කථා කළොත් හොඳයි. කරත්තය පරණයි තමයි; අපි ඒ කරත්තයේ ආපහු ගමන් ආරම්භ කරලා තිබෙනවා තමයි. නමුත් කරත්තයේ තිබුණු අඩු පාඩු විශාල ප්‍රමාණයක් නිවැරදි කර ගෙන තමයි දැන් අපි මේ ගමන යන්නේ කියන එක මතක තියා ගන්න. අර යකඩ පට්ටම් වෙනුවට අපි දැන් ඒකට රබර් පටි දමනවා. ඒ කරත්තයේ තිබුණු අලවංගු වාගේ දේවල් වෙනුවට රේසර් සවි කරලා, අපෙන් සිද්ධ වුණු වැරදි, අඩු පාඩු මකා ගෙන තමයි අපි මේ කරත්තයේ ආපසු ගමන් ආරම්භ කරන්න සූදානම් වෙලා තිබෙන්නේ. ඇත්තටම අපි අපේ අඩු පාඩු පිළිගන්නවා. ඔච්චර ආඩම්බර වෙන්න එපා; ඔච්චර ලොකුකමට නටන්න එපා; තමුන්නාන්සේලාට පළාත් පාලන මැතිවරණයෙන් ජන වරමක් ලැබුණාය කියලා ඔච්චර නටන්න දෙයක් නැහැ.

රජයක් හැටියට අපෙන් ජනතාවට යම් යම් අඩු පාඩු සිදු වුණු නිසා ජනතාව අපට රිදෙන්න ටොක්කක් ඇන්නා. "උඹලාගේ වැරැදි හදා ගත්තේ නැත්නම් අපි උඹලාට දෙන දඬුවම මෙන්න" කියලා ජනතාව අපට පෙන්නුවා. අපි ඒක බොහොම නිහතමානීව පිළිගෙන වැරදි හදා ගන්න එක අපේ වැඩක්.

දැන් අපි මෝටර් වාහන පනත යටතේ නියෝගය ගැන විවාද කරද්දී තමුන්නාන්සේ, තමුන්නාන්සේගේ මතවාදය ඒකේ පටවාගෙන ගියා. මෙය ඉතාම වැදගත් පනතක්. හැබැයි, තමුන්නාන්සේ ඒකේත් වැරැද්දක් දැක්කා. බදු අය කර ගන්න, number plates විකුණා ගන්න, රුපියල් 1,500 ගණනේ එකතු කර ගන්න හදනවා වාගේ තමයි කථා කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාහන තදබදය කියන එක අද අපට බලපෑ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් කියන එක මම විශේෂයෙන් කියන්න ඕනෑ. [බාධා කිරීමක්] මට විනාඩි දහයක කාලයක් තිබෙන්නේ. කෑ ගහන්නේ නැතුව ඉන්න. දැන් සිසිර ජයකොඩි මන්ත්‍රීවරයා වාහන තදබදය ගැන කිව්වා. මේ වාහන තදබදය අවුරුදු තුනක කාලසීමාව තුළ අපි නිර්මාණය කරපු දෙයක්ද? මේකත් අපි නිර්මාණය කරපු දෙයක් විධියට තමයි කථා කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන් කියන්න ඕනෑ, අපි මේ වාහන තදබදය අවම කර ගැනීම සඳහා රාජගිරියේ ගුවන් පාලම හැදුවා. මේ පාලම විවෘත කරලා දවස් දෙකයි ගත වුණේ, ඒකට පුදුම විවේචන තමයි ආවේ. මේක කඩිමුඩියේ විවෘත කරන්න තිබුණු ප්‍රශ්නය මොකක්ද, මෙයින් මාර්ග තදබදය ඉවත් වුණාද කියලා ඇහුවා. එතුමා දවස් 62කින් හදාපු පාලමක් ගැන කථා කරනවා. කැලණි පාලම දවස් 62න් හැදුවා කියලා එතුමා කියනවා. ආර්.ආර්. සමරකෝන් මහත්මයා "කැලණි පාලම" කියලා වේදිකා නාට්‍යයක් හැදුවා නේ. මම අහන්නේ දවස් 62න් හැදුවා කිව්වේ ඒ "කැලණි පාලම" ගැනද කියලායි. දවස් 62කින් හදාපු කැලණි පාලමක් ගැන නම් අපි අහලා නැහැ. ආර්.ආර්. සමරකෝන් මහත්මයා ඒ වාගේ පාලමක් හදන්න ඇති.

අද සිදු වෙන රිය අනතුරු ප්‍රමාණය දිහා බැලුවාම, විශේෂයෙන් අවුරුදු 20ත් - 25ත් අතර තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක් රිය අනතුරුවලින් මිය යනවා. රිය අනතුරු නිසා විශාල මිනිස් ජීවිත ප්‍රමාණයක් අද අපට අහිමි වෙනවා. පසුගිය යුද සමයේ රණවිරුවන් අපට අහිමි වුණාට පසුව, ගම්වල අපි ලබන භයානක අත් දැකීමක් තමයි තරුණ පිරිස් පුදුමාකාර විධියට රිය අනතුරුවලින් මිය යාම. අපි රියැදුරු පාසල් ආරම්භ කරලා විතරක් හරියන්නේ නැහැ. රියැදුරන්ට, යතුරු පැදිකරුවන්ට අවශ්‍ය වන නීති-රීති, උපදෙස් සම්බන්ධ විශාල වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න ඕනෑ කියන එක මම මේ අවස්ථාවේදී විශේෂයෙන් කියනවා.

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

ගරු පද්ම උදයශාන්ත මන්ත්‍රීතුමා කිව්වා, වැලේ වැල් නැතිව හිටපු සුදු අන්තුවෙකුට ලොතරැයියක් ඇදුනා වාගේලු මේ ආණ්ඩුව ලැබුණ එක. අනේ ඉතින්, තමන්ගේ කථාව තමයි ඒ කියා ගත්තේ. වැලේ වැල් නැතිව හිටපු බඩු ටිකකට ලොතරැයියක් ඇදුනා වාගේ දෙයක් තමයි මේ පළාත් පාලන ඡන්දයෙන් සිදු වුණේ. මට මේ කරුණ විශේෂයෙන් කියන්න අවශ්‍යයි. යන්නේ කොහේද, කරන්නේ මොනවාද කියලා හිතා ගන්න බැරුව බලාගෙන හිටපු බඩු ටික, කලින් විදුලි පුටුවට ගෙන යනවා කියලා කැගැහුවා වාගේ ජාතිවාදය විකුණලා, රට විකුණන්න හදනවා කියලා, මෙන්න ප්‍රජා අයිතිය අහිමි කරන්න යනවා, අපව අත් අඩංගුවට ගන්න හදනවා කියලා, මේ සේරම වපුරලා සභා කිහිපයක් දිනා ගත්තා. හැබැයි, මතක තියා ගන්න මේ පළාත් පාලන ආයතනවලින් 160ක සභා පිහිටුවීමේ බලය අපි සතුව තිබෙනවා. මේ පුංචි සිද්ධියක් අරගෙන ගෙම්බෙක් පනින උඩ. ඒක තමයි මට කියන්න තිබෙන්නේ.

මම ඒ එක්කම කියන්න ඕනෑ, ඒකාබද්ධ පොහොට්ටුව, පොහොට්ටු කණ්ඩායම සූදුවෙන් දිනුවා තමයි. හැබැයි, සූදු පොළේ -මැන්ඩියේ- සල්ලි නැති වේලාවේ තමයි සූදුවෙන් දිනුවේ. මැන්ඩියේ සල්ලි තිබෙන වේලාවේ නොවෙයි මේ අයට මේ සූදු පොළ දිනා ගන්න ලැබුණේ. සූදු පොළේ සල්ලි නැති වේලාවේ තමයි මේ අය දිනුවේ. සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා ඒක භාගේට කියන්න ඇවිත් නැවැත්තුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රටේ බෝම්බ පුපුරනවාලු. දැන් ඒකත් මෙතුමන්ලාගේ වාසියට හරවා ගන්නයි හදන්නේ. අපි ප්‍රවාහනය ගැන කථා කරන මේ අවස්ථාව වෙනකොට බණ්ඩාරවෙල නගරයේ බස් රථයක් ඇතුළේ බෝම්බයක් පුපුරලා. මෙය ඉතාම කනගාටුදායක සිද්ධියක්. එහි යුද හමුදාවේ කිහිප දෙනෙක් ඉඳලා තිබෙනවා. බරපතළ තුවාල ලබපු සාමාන්‍ය මගීන් රාශියක් හිටියා. මේ වන විට හමුදාපතිවරයා ප්‍රකාශ කරලා තිබෙනවා, බෑගයක් ඇතුළේ තිබුණු අත් බෝම්බයක් තමයි මේ ආකාරයට පිපිරිලා තිබිලා තිබෙන්නේ කියලා. හැබැයි, මතක තියා ගන්න මේ බෝම්බය පිපිරුණු සිද්ධියෙනුත් මේ කණ්ඩායම ජාතිවාදය ගෙන යන බව.

මේ නිසා අපේ ආණ්ඩුවට -අපේ රජයට- ඇඟිල්ල දිගු කරනවා, "මෙන්න ආයෙත් රට පුරා බෝම්බ පිපිරෙන්න පටන් අරගෙන, එක්සත් ජාතික පක්ෂය මූලික කරගත් ආණ්ඩුවක් නිසා ඔන්න දැන් ආයෙත් උතුරේ බෝම්බ මෙහේ පිපිරෙනවා." කියලා. බස් එකක් තුළ බෝම්බයක් පිපිරී යෑම නිසා දැන් මේ ගොල්ලන් ඒ තුළින් ජාතිවාදය ගෙනෙන්න හදනවා. ඒ වාගේම හෙට වෙනකොට, එම කනගාටුදායක සිද්ධිය දඩ මීමා කරගෙන තමන්ට අවශ්‍ය වෙන මතයක් රට තුළ ඇති කරන්න හදනවා. සාලාව හමුදා කඳවුරේ ඉතාම හදිසියේ පිපිරීමක් වුණු ආකාරය අපි දැක්කා. එම සිදුවීම පිටුපස ඉන්නේ කවුද, එම සිදුවීම පිටුපස තිබෙන බලවේගය මොකක්ද කියන එක අපි වහාම සොයන්න ඕනෑ. බණ්ඩාරවෙල සිද්ධ වුණු කනගාටුදායක සිදුවීම සම්බන්ධව අපි රටක් හැටියට කනගාටු වෙනවා. එම සිදුවීමෙන් බරපතළ තුවාල ලැබූ අයට අපි සියලු දෙනා රටක් හැටියට එකතු වී ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන්න ඕනෑ. එහෙම නැතුව මේ ගොල්ලන් -ඒකාබද්ධ විපක්ෂයේ උදවිය- එහෙම බස් රථයේ බෝම්බයක් පිපිරී සිදුවුණු අවාසනාවන්ත සිද්ධියෙන් පවා මේ රටේ ජාතිවාදය අවුස්සන්න හදනවා, එම සිදුවීම පාදක කරගෙන ආපසු උතුරේ බෝම්බ මෙහේ පිපිරෙනවා කියලා නැති මානෘකාවකට එන්න හදනවා. කරුණාකරලා ඒ කෑත වැඩ, ඒ බාල වැඩ, ඒ නීච වැඩ කරන්න එපා කියන එක මම විශේෂයෙන් මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

ඊළඟට, බඩු මිල ගැන කථා කරනවා. බඩු මිල ගැන කථා කරන්න මේ ගොල්ලන්ට තිබෙන අයිතිය මොකක්ද? ගෑස් මිල රුපියල් 300කින් වැඩි වෙනවාලු. රුපියල් 2,450ට, රුපියල් 2,500ට තිබුණු ගෑස් මිල තමයි අපි 1,200ට, 1,300ට අඩු කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සියයට 50කින් මිල අඩු කළා. අපි ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල් මිල විශාල වශයෙන් අඩු කළා. මිල වැඩි කිරීමක් සිද්ධ වුණොත් ඒ රුපියල් 5කින්, 10කින් තමයි. හැබැයි, අපි රුපියල් 50, රුපියල් 100 වැනි ප්‍රමාණයෙන් මිල අඩු කරලා තිබෙනවා. අදටත් සාමාන්‍ය ජනතාවගේ දෛනික ජීවිතයට අත්‍යවශ්‍ය බඩු භාණ්ඩවල මිල ගණන් මීට අවුරුදු 3කට ඉස්සෙල්ලා -2015 ජනවාරි 08 වැනි දා- යහපාලන රජය පත් වුණාට පසුව පැවති මිල ගණන්වලට සාපේක්ෂවම පවතිනවා. දැන් පොල් ගැන කථා කරනවා, වී ගැන කථා කරනවා. අපි බරපතළ දැවැන්ත නියඟයකට මුහුණ දීමේ ප්‍රතිඵලයක් හැටියට ඒවායේ මිල වැඩි වුණා. පොල් බෑයක් ගැන මේ ගොල්ලන් මහ ලොකුවට උඩ දමාගෙන කථා කරනවා. හැබැයි, ගන්නා බඩු මල්ල තුළ පොල් ගෙඩියකට වැය වන මිල වැඩි වුණාට, අනෙක් දේවල්වල මිල අඩු වී තිබෙනවා. රුපියල් 235ට, 240ට, 250ට ගත් සැමන්වල මිල අද රුපියල් 125යි, 130යි, 135යි. පොල්ම කාලා ජීවත් වෙන්න හදන මීයෝ ටිකක් වාගේ තමයි මේ අය කථා කරන්නේ. ඒ නිසා යහපාලන රජය තුළ අපි අඩු කරපු බඩු මිල මේ අයට කිට්ටු කරන්නවත් බැරි මට්ටමට තවම -අදටත්- අඩුයි කියන එක මම විශේෂයෙන් කියනවා.

ඒකාබද්ධ පොහොට්ටුවේ කණ්ඩායමට අර නන්නත්තාර වෙලා හිටපු සුදු අන්තුවෙකුට ලොතරැයියක් වාගේ ඇඳුණා වාගේ වැඩක් වුණේ. පසුගිය මැතිවරණය දිනලා දවස් දෙක ගත වෙනකොට, අපි ගම්වල කරපු සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළව තිබුණු පුවරු සියල්ල ඒවායේ බටත් එක්කම නැහැ. බෝඩ්වත් නැහැ, මොනවත් නැහැ. සියල්ලම වීසි කරලා. මගේ ආසනයේ සිදුවුණු එවැනි සිදුවීමක් සම්බන්ධ photo එකක් මට viber කරලා එවා තිබුණා. මේ දවස් ටිකේ අපි කොළඹ තමයි ඉන්නේ. මගේ ආසනයේ කඳුබොඩ ආරණ්‍ය සේනාසනයක් තිබෙනවා. අපි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ගමට දුන් සල්ලිවලින් එම ආරණ්‍ය සේනාසනයට ජල ව්‍යාපෘතියක් ලබා දුන්නා. එයට අදාළ බෝඩ් එකේ ජනාධිපතිතුමාගේ සහ අගමැතිතුමාගේ මුහුණු යොදා තිබුණා. අන්න, පොහොට්ටුවේ ඉන්නා පොල් ලෙලි කෑලි ටික එම ජල ව්‍යාපෘතියට අදාළ බෝඩ් එකත් කඩා වීසි කරලා. බන්දුල ගුණවර්ධන මහත්මයා ඇත්ත තමයි කිව්වේ. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පැත්තෙන් ඡන්දයට ඉදිරිපත් කළේ, පොල් ලෙලි කෑලි ටිකක් කියලා කිව්වේ ඒක තමයි. එතුමාම කිව්වා. අපි අපේ පක්ෂවලින් උගතුන්, බුද්ධිමතුන්, වැදගත් මිනිසුන්, ගුණගරුක මිනිසුන් පුදුම අමාරුවකින් සොයා ගෙන, සම්මුඛ පරීක්ෂණවලට ලක් කරලා ඉදිරිපත් කරද්දී ඒකාබද්ධ විපක්ෂයෙන් ඉදිරිපත් කළේ කවුරුන්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

ගමේ හිටපු හොඳම කසිප්පුකාරයා, කසිප්පුකාරයාගේ පවුල, ගංජාකාරයා, ලීමෝල්කාරයා, වැලි, මැටි, පස් ජාවාරම් කරපු අය. මෙන්න, ඒ අය දිනලා. ඒක තමයි කිව්වේ. "අපි පොල් ලෙලි කෑල්ලක් දැම්මත් දිනනවා." කියලා කිව්වේ ඒකයි. ඒ පොල් ලෙලි කෑලි ටික තමයි දැන් මේ වැඩ ටික කරන්නේ. ඒ නිසා සමස්තයක් හැටියට ඡන්දය දුන් උගත්, බුද්ධිමත් මිනිසුන්ට බන්දුල

ගුණවර්ධන මන්ත්‍රීවරයා කළේ බරපතළ අපහාසයක්. ඒකාබද්ධ පොහොට්ටුවේ නියෝජිතයන් පත්වීම සඳහා ඡන්දය ලබා දුන් සියලු ඡන්ද දායකයින්ට බන්දුල ගුණවර්ධන මහත්මයා කළේ බරපතළ අපහාසයක්.

මේ රටේ සිටින වැදගත්, බුද්ධිමත් ජනතාව ඡන්දය දුන්නේ පොල් ලෙලි කැලිවලටද කියන තර්කය මේ අවස්ථාවේදී මම මතු කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

[අ.භා. 4.11]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෝටර් වාහන පනතට අද ගෙන එන සංශෝධනය පිළිබඳව කතා කිරීමේදී කිව යුතුයි, මෙය සභානායකතුමා නොව, අපේ අශෝක් අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා නොව ප්‍රවාහන අමාත්‍යතුමා ඇවිල්ලා ඉදිරිපත් කරයි කියා මා බලාපොරොත්තු වූ බව. මා කල්පනා කර කර සිටියේ මේ සංශෝධනය අලුත් අගමැතිතුමා හැටියට එතුමා ඉදිරිපත් කරයිද, එහෙම නැත්නම් වෙනත් කෙනකු ඉදිරිපත් කරයිද කියලායි. කොහොම වුණත් පසු ගිය කාලයේ -විශේෂයෙන්ම පසු ගිය සතියේ- රූපවාහිනී ප්‍රවෘත්ති සහ breaking news දිහා බලාගෙන සිටියා නම් රටේ තිබෙන ප්‍රශ්නය මොකක්ද කියන එක ජනතාවට හඳුනාගන්න තිබුණා. මේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රශ්නයක් තිබෙනවා ද කියා නොහිතෙන තරමටම ඒ ප්‍රවෘත්ති බලවත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දකින්න ඇති පළාත් පාලන මැතිවරණයෙන් පසුව මේ රටේ ඇති කරපු සෝෂාව. විජේරාමයේ, මහගමසේකර මාවතේ, සිරිකොත ළඟ, අරලියගහ මන්දිරය ළඟ කැමරා අටවා ගෙන මේ රටේ මාධ්‍යවලින් පෙන්වූ අතිසුඛෝපභෝගී වාහන ටික දැක්කාට පසුව, ඒවා දිහා බලාගෙන සිටි මේ රටේ ජනතාවට සිතෙන්න ඕනෑ, 'අනේ මේ අපේ බදු මුදල් නේද, අපේ බදු සල්ලිවලින් නේද මේවාට තෙල් ගහන්නේ?' කියා. එහෙම හිතෙන තරමට අතිසුඛෝපභෝගී වාහන double lights දාගෙන එහාට මෙහාට ගියා. අවසානයේදී වෙච්ච දෙයක් නැහැ. නටපු තොවිලෙකුත් නැති බෙරේ පළුවකුත් නැති තත්ත්වයකට තමයි පත් වී තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ප්‍රවාහන ප්‍රශ්නය අද ඉතාම බරපතළ අඩියකට වැටිලායි තිබෙන්නේ. එය තවත් උග්‍ර වෙමින් යනවා. ආණ්ඩුව හැටියට බලයේ සිටින කවර කණ්ඩායම හෝ ඒ කෙරේ අවධානය යොමු නොකළොත් අපේ රටේ ආර්ථිකයට ඊළඟ මරු පහර වදින්නේ ප්‍රවාහනයෙනුයි. ප්‍රවාහන ප්‍රශ්නය විසඳීම සඳහා පසු ගිය කාලය පුරාවට යම් හෝ වැඩපිළිවෙළක් අනුගමනය කරනවා කියා අපට පෙනුණේ නැහැ. පසුගිය ආණ්ඩුව කාලයේත් තිබුණු පාරවල් පුළුල් කළා හැර ප්‍රවාහන ප්‍රශ්නය විසඳීම වෙනුවෙන් යෝජනා කරන ලද, ක්‍රියාත්මක කරන ලද සැලසුම්සහගත විද්‍යාත්මක වැඩ පිළිවෙළක් අපි දැක්කේ නැහැ. එවැනි වැඩ පිළිවෙළක් මේ රටේ සාකච්ඡා නොකෙරුණා නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන් මා ඒ ගැන දන්නවා. අපේ මොරටුව විශ්වවිද්‍යාලයේ තිබෙනවා, ග්‍රාම හා නගර නිර්මාණ දෙපාර්තමේන්තුව. වසරකට උපාධිධාරින් 100 දෙනෙක් පමණ එයින් එළියට එනවා. දෙපාර්තමේන්තුවක් හැටියට එය අපේ රටට ඕනෑ කරන නව නගර සහ ග්‍රාම නිර්මාණ සැලැස්ම අවුරුදු ගණනාවක් තිස්සේ විටින් විට එළිදක්වා තිබෙනවා.

විශේෂයෙන්ම මහාචාර්ය අමල් කුමාරගේ මහතා ප්‍රවාහනයට සම්බන්ධ ගැටලු ගණනාවක් විශ්ලේෂණය කරලා අපේ රටේ මේ තිබෙන ආර්ථිකය තුළ ඒවාට ගත හැකි විසඳුම් යෝජනා කර තිබෙනවා. නමුත් ඒ කිසිදු විසඳුමක් පයිසයකට හෝ මායිම් කරන්නේ නැතිව තමයි අලුත් අලුත් වැඩ පිළිවෙළ සකස් වන්නේ. මහානගර අමාත්‍යාංශය වුණත් තමන්ගේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කළ වේලාවේ එකී විද්වතුන්ගේ, බුද්ධිමතුන්ගේ දායකත්වයක් ලබා ගත්තා ද කියන සැක සංකාව මට තිබෙනවා. කොහොම වුණත් ප්‍රවාහන ප්‍රශ්නය විසඳනවා නම් එය හුදු දුම්රිය දෙපාර්තමේන්තුවේ හෝ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ හෝ එහෙමත් නැත්නම් CTB එකේ හෝ ප්‍රශ්නයක් නොවෙයි. එය සමස්ත සමාජයත් එක්ක ගැට ගැසී තිබෙන ප්‍රශ්නයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටම පෙනෙනවා ඇති, පාසල් ආරම්භ වන වේලාවේත්; පාසල් අවසන් වන වේලාවේත් මේ රටේ තිබෙන වාහන තදබදය. දැනට නඩත්තු කරගෙන යමින් තිබෙන ජනප්‍රිය පාසල් වෙත බොහෝ ඈත ඉඳන් -දුර බැහැර ඉඳන්- එන පාසල් බස් රථ, වෑන් රථ ගමන ආරම්භ කරන්නේ සමහර විට උදේ 5.00ට හෝ 5.30ට යි. ඒ වාහනවල දරුවන් පටවාගෙන ඇවිත් ඒවා ඒ පාසල් ළඟ ගාල් කර තැබීමෙන් කොතරම් ප්‍රවාහන ප්‍රශ්නයක් ඇති වනවාද කියා ඔබතුමාට පෙනෙනවා ඇති, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තවත් හේතුවක් තමයි, ප්‍රධාන නගරවල සවස් යාමයේ පැවැත්වෙන ටියුෂන් පන්ති. ඒවා ආශ්‍රිතව ඇති වී තිබෙන තදබදය ද තවත් ප්‍රශ්නයක්. වෙනදාට නම් ගත්තොත්, ටියුෂන් එක හවසට අවසන් වනවා; දරුවා ගෙදර යනවා. හැබැයි දැන් එහෙම නොවෙයි. දැන් ටියුෂන් එක රෑ 7.30, 8.00, 9.00 පමණ වන තුරු පැවැත්වෙනවා. ඒ නිසා දෙමව්පියන්ට සිද්ධ වනවා මෝටර්සයිකල් පැත්තක තියලා රෝද හතරක වාහනයක් අරගෙන ඇවිල්ලා තමන්ගේ දරුවා එන තුරු පෝලිමේ ඉන්න. ඒවාත් මේ ප්‍රවාහන ප්‍රශ්නයට බලපානවා.

මා හොඳටම දන්නා කාරණයක් සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. ඇමතිතුමනි, උදේට නුගේගොඩ, පැපිලියාන පැත්තේ සිට ඇතිවන වාහන තදබදයට බලපා තිබෙනවා කියලා කියන්නේ ඒ ආශ්‍රිතව තිබෙන ජාත්‍යන්තර යැයි කියා ගන්නා පෞද්ගලික පාසලක සැලැස්මකට අනුකූලව රථවාහන පෙළ ගැස්වීමත්, සමහර පාරවල් වහලා තිබෙන කාරණයයි. ඒ මත අපේ හොරණ සහ බණ්ඩාරගම පැත්තේ සිට එන ජනතාවට විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නය නිසා ඔවුන්ගේ ගමන් කාලයට වඩා අමතර පැයක් එකහමාරක් පාරට වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

මේ මාර්ග තදබදය, අධ්‍යාපනයත් එක්ක සම්බන්ධ වුණු ප්‍රශ්නයක්; අපේ රටේ කර්මාන්ත ව්‍යාප්තියත් එක්ක සම්බන්ධ වුණු ප්‍රශ්නයක්; අපේ රටේ වෙළඳ පොළත් එක්ක සම්බන්ධ වුණු ප්‍රශ්නයක්; ඒ වාගේම අපේ රටේ රජයේ ආයතන ස්ථානගත වෙලා තිබෙන තැන් සමඟ ඇති වුණු ප්‍රශ්නයක්. ඒ නිසා පාරවල් පළල් කිරීමෙන් හෝ එහෙම නැත්නම් වාහනවලට බදු වැඩි කරලා වාහන ආනයනය කිරීම සීමා කිරීමෙන් හෝ මේ ප්‍රශ්නය විසඳන්න හැකි යැයි කවුරු හෝ හිතනවා නම්, එය කළ හැකි වැඩක් නොවෙයි. රටට සම්පූර්ණ සැලැස්මක් අවශ්‍යයි. ඒ සැලැස්මේ කොටසක් තමයි ප්‍රවාහනය කියලා කියන්නේ. ඒ ඔස්සේ ප්‍රවාහන ප්‍රශ්නය විසඳනවා මිසක් තැන් තැන්වලින් අල්ලාගෙන කරන්න පුළුවන් වැඩක් නොවෙයි, මෙය. මම හිතනවා, මේකට තිබෙන ඉතාම සුදුසු සහ අපට ගැළපෙන විසඳුම පොදු ප්‍රවාහන සේවය ශක්තිමත් කිරීම බව. පොදු ප්‍රවාහන සේවය ශක්තිමත් කළ හැම රටකම ප්‍රවාහන ප්‍රශ්නය යම් තරමකට විසඳාගෙන තිබෙනවා. අපි හොයලා බලන්න ඕනෑකම තිබෙනවා, අපේ රටේ ජනතාව මේ පොදු ප්‍රවාහන සේවයෙන් දිනෙන් දින ඈත් වෙන්නේ ඇයි කියලා. දැන් ඒකට තමයි විසඳුම් සොයන්නට

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ඕනෑකම තිබෙන්නේ. යුරෝපයේ, එංගලන්තයේ, ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනතාව පොදු ප්‍රවාහනය කෙරෙහි යොමු වෙනවා නම්; කලට වෙලාවට බස් එක හෝ දුම්රිය එනවා නම්, එහි පහසුකම් ටික තිබෙනවා නම්, වගකීම එහි පාලන අධිකාරිය විසින් දරනවා නම් මම හිතනවා, අපේ රටේ ජනතාවත් පොදු ප්‍රවාහන සේවය කෙරෙහි ආසක්ත කරන්න පුළුවන්කම තිබෙන බව. ඒ නිසා පොදු ප්‍රවාහන ක්‍රමය දියුණු කරන්නේ නැතුව වාහන සංඛ්‍යාව අඩු කරන්නට හෝ ජනතාව මහ මහ රස්තියාදු වෙන එක වළක්වන්නට බැරි වේවි.

දැන් තමුන්නාන්සේලා රුපියල් 1,500ක් තවදුරටත් ජනතාවගෙන් අය කර ගන්නා වෙලාවේ මම අහන්නට කැමතියි, පසුගිය කාලයේ ප්‍රවාහන අමාත්‍යාංශයේ සිද්ධ වුණු වංචා දූෂණ වළක්වා ඒවායින් යම් මුදල් ප්‍රමාණයක් ඉතුරු කරගෙන ජනතාවට සහනයක් දෙන්න තමුන්නාන්සේලා කටයුතු කරනවාද කියලා. මොකද, ඊයේ කථා කරන්න නියමිතව තිබිලා නමුත් කථා කරන්න බැරි වුණු විවාදය ගැන බලන්න. මම දන්නේ නැහැ, ඇත්තටම දෙමළ භාෂා පරිවර්තනයේ ප්‍රශ්නයක් නිසාමද ඒ විවාදය නතර වුණේ කියලා. ඒක නතර වුණු ආකාරය හරිම පුහුප්සාජනකයි. ජනාධිපතිතුමාට භාරදුන් බරපතළ වංචා දූෂණ සම්බන්ධ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ ප්‍රවාහන අමාත්‍යාංශයට අදාළව තිබෙන 15වන විමර්ශනය පිළිබඳව අවධානය යොමු කරන්න මා මේ අවස්ථාවේදී කැමැතියි. එය "නාවලපිටිය දුම්රිය ස්ථානයට අයත් රක්ෂිත ඉඩම බදු පදනම මත මහින්දානන්ද පදනම වෙත ලබාදීමේදී සිදුවී ඇති අක්‍රමිකතා සම්බන්ධ පෙත්සම" සම්බන්ධවයි.

පසුගිය මැතිවරණ වේදිකාවේ ජනාධිපතිතුමා බොහොම උජාරුවෙන් කිව්වා, "කඩුව අරගෙන හතර අතේ වනනවා. දැන් මේ කඩුවට කවුරු කවුරු අහුවෙයි ද දන්නේ නැහැ" කියලා. ජනාධිපතිතුමාට භාරදුන්නා, ඒ වාර්තාව. -මේ පරීක්ෂණ 34 සම්බන්ධයෙන් ඇති සම්පූර්ණ වාර්තාව නොවෙයි.- මේ මම කියන නාවලපිටිය දුම්රිය ස්ථානයට අයත් රක්ෂිත ඉඩම් මහින්දානන්ද අලුත්ගමගේ පදනමින් බදු අරගෙන වංචා කිරීම පිළිබඳ වාර්තාව භාරදුන්නේ 2017 ජුනි 01 වෙනිදා. මීට මාස හයකට කලින්. මේකේ පාර්ශ්වයන් හැටියට හඳුනාගෙන තිබෙනවා, මහින්දානන්ද අලුත්ගමගේ පාර්ලිමේන්තු මන්ත්‍රී, අංක 70, කින්සි පාර, කොළඹ 07; පාලිත ආරියරත්න, වැඩ බලන දුම්රිය සාමාන්‍යාධිකාරී; විජය අමරතුංග, වැඩ බලන දුම්රිය සාමාන්‍යාධිකාරී; ගාමිණී සෙනෙවිරත්න, වැඩ බලන නියෝජ්‍ය වාණිජ අධිකාරී සහ නාවලපිටිය නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙක්. එතකොට දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක් 2005 සිට 2009 වනතෙක් පස් අවුරුදු බදු පදනමකට අරගෙන ඊට පස්සේ 2010 ජනවාරි 01 වෙනිදා සිට 2015 ජනවාරි 10 දක්වා අවුරුදු පහක්, අර කලින් ගත්ත බදු පදනම මතම, ඒ බදු කොන්දේසි කිසිවක් සලකන්නේ නැතුව, කිසිදු බදු ගෙවීමකින් තොරව, ඒ බදු ඔප්පුව උල්ලංඝනය කරලා, මහල් තුනක ගොඩනැගිල්ලක් හදලා, "මහින්දානන්ද පදනම සමිති ශාලාව" කියලා පවත්වාගෙන ගිහිල්ලා තිබෙනවා. ඔබතුමාත් මේ සිද්ධිය දන්නවා, නේද? එතකොට මම අහන්නේ මේ වාර්තාව ඉදිරිපත් වෙලා තිබෙද්දී, දුම්රිය දෙපාර්තමේන්තුවට සිදුවුණු මේ අලාභය විතරක් නොවෙයි, මෙහි සඳහන් වන විධියට නාවලපිටිය දුම්රිය ස්ථානාධිපතිට වෙන් කර තිබුණු රුපියල් 10,50,000ක් වටිනා අංක 33 දරන නිල නිවස සහ කණිෂ්ඨ නිලධාරින්ගේ 14,80,000 ක් වටිනා නිල නිවාස 12ක් ඇතුළු රුපියල් ලක්ෂ 200ක් වටිනා ඉඩම හිස් භූමියක් හැටියට ව්‍යාජ තොරතුරු පෙන්වා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් මහින්දානන්ද පදනම කියන ගොඩනැගිල්ල හදන්න අරගෙන තිබෙනවා.

මෙම වංචා, දූෂණ පිළිබඳ විමර්ශන වාර්තාව අපේ රටේ ඉන්න ඉතා කීර්තිමත් විනිශ්චයකාරවරු, අභියාචනාධිකරණ විනිශ්චයකාරවරු, මහාධිකරණ විනිශ්චයකාරවරු මාස 6කට කලින් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක ඉදිරිපත් කරලා තිබෙන්නේ රටේ විධායකයට. හැබැයි, එතැනින් එහාට ඒ සම්බන්ධයෙන් ගත්ත ක්‍රියාමාර්ගයක් නැහැ. විධායකයට ඉදිරිපත් කළාට පසුව මේ සම්බන්ධයෙන් ගත්ත ක්‍රියාමාර්ග මොනවාද යන්න පිළිබඳ ජනාධිපතිතුමා ඇතුළුව මෙම අමාත්‍ය මණ්ඩලය වග කියන්න ඕනෑ. ඒ නිසා එවැනි දේවල්වලට ක්‍රියාමාර්ග ගන්නේ නැතිව තමුන්නාන්සේලා ජනතාව මත බදු පටවමින්, ජනතාව මත ගාස්තු වැඩි කරමින් මේ යන ක්‍රියාවලිය අපි කවුරුවත් අනුමත කරන්නේ නැහැ.

මේ රටේ ජනතාව 2015 ජනවාරි මාසයේදී තමුන්නාන්සේලාට හරිහමන් පාරක් පෙන්නුවා. ඒ පාර පෙන්වලා තමුන්නාන්සේලාට යන්න කිව්වා, හොරු අල්ලන පාරේ. හැබැයි, තමුන්නාන්සේලා ගියේ හොරු ආරක්ෂා කරන පාරේ. 2015 ජනවාරි මාසයේ මේ රටේ ජනතාව තමුන්නාන්සේලාට පෙන්නුවා, හොරකම් නොකරන පාරක්. හොරකම් නොකරන පාරක යන්න කියලා කිව්වා. හැබැයි, තමුන්නාන්සේලා ගියේ හොරු ආරක්ෂා කරනවා වාගේම හොරකම් කරන පාරේ. ඒ වාගේම තමුන්නාන්සේලාට පෙන්නුවා, නීතිය ශක්තිමත් කරන පාරේ යන්න කියලා. තමුන්නාන්සේලා ගියා, නීතිය නවන පාරේ. තමුන්නාන්සේලාට පෙන්නුවා, විධායක ජනාධිපති ධුරය අහෝසි කරන පාරේ යන්න කියලා. තමුන්නාන්සේලා දැන් යමින් ඉන්නේ විධායකය තවදුරටත් ශක්තිමත් කරන පාරක. තමුන්නාන්සේලාට ජනතාව පාරක් පෙන්වලා තිබෙද්දිත් තමුන්නාන්සේලා ඒ පාරේ නොයා බැදිවල ගමන් කරමින් ඉන්නවා. එසේ බැදිවල ගමන් කිරීමට ජනතාව දුන්නු හොඳ අතුල් පහරක්; කනේ පහරක් තමයි මේ 2018 පළාත් පාලන ආයතන මැතිවරණ ප්‍රතිඵලය. ඒක ඉලක්කම් විජ්ජාවලින් වෙන වෙන ආකාරයට විග්‍රහ කර ගත්තාට, ජනතාව දීපු ජනවරම තමුන්නාන්සේලා ආරක්ෂා නොකළාට, හොරු ආරක්ෂා කළාට, වෙන වෙන බැදිවල ජනතාවත් අරගෙන යන්න හදනකොට ජනතාව ඒකට හොඳ පහරක් දීලා තිබෙනවා. ඒ නිසා අපි කල්පනා කරනවා, තමුන්නාන්සේලා එක්සත් ජාතික පක්ෂය හෝ ආණ්ඩුව කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ ඡන්ද පදනම අඩුවීමේ නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ කියලා. 2015 ජනවාරි මාසයේ මේ රටේ ජනතාව තමන්ගේ ජීවිත අනතුරේ හෙළාගෙන, තමන්ගේ වෘත්තීන්, තමන්ගේ පවුල් යනාදී සියල්ල අනතුරේ හෙළා ගෙන ගත් තීරණයක් තිබුණා. ඒ තීරණය ආපස්සට හැරවිය හැකි මට්ටමට ඒ ජනවරමට බාධාවන අයුරින් හැසිරිලා තිබෙන්නේ තමුන්නාන්සේලායි. එම නිසා අඩු තරමින් මේ අවස්ථාවවත් පාවිච්චි කරලා 2015 ජනවාරියේ මේ රටේ තීන්දුවක් ගත්ත ලක්ෂ 62ක ජනතාවට සාධාරණයක් කරයි කියලා අපි හිතනවා. ඒ ජනතාවට යුක්තිය ඉටු කරලා දෙන්න, ඒ ජනතාවගේ වරම ආරක්ෂා කරලා දෙන්න තමුන්නාන්සේලා අඩුම තරමින් දැන්වත් කල්පනා කරයි කියලා හිතනවා. එහෙම නැත්නම් මේ සුනාමිය ඊටත් වඩා බරපතළ තත්ත්වයකට පත් වේවි. ඒ නිසා දැන් අපි මේ ජනවරම ආරක්ෂා කරන අතරේම, මම කලින් කිව්වා වාගේ රටේ ප්‍රවාහන ප්‍රශ්නය ඉලක්ක කර ගත් සැලැස්මක් අපට වුවමනා කරලා තිබෙනවා. ඒ සැලැස්මේ අපට කෙටි කාලීන, මැදි කාලීන හා දිගු කාලීන වැඩ පිළිවෙළවල් තිබේවි. ඒ වෙනුවෙන් ප්‍රතිපාදන ඇති පදමින් යොදවන්න සිදු වෙනවා. ඒ සඳහා අවධානය යොමු කරන්න. මේ ප්‍රවාහන ප්‍රශ්නය බරපතළ ප්‍රශ්නයක් ලෙස අරගෙන ඉදිරියේදී රටේ ආර්ථිකයට මීට වඩා දැවැන්ත ආකාරයට බලපාන ප්‍රශ්නයක් විධියට තේරුම් අරගෙන එය විසඳීම සඳහා මැදිහත් වෙන්න කියන ඉල්ලීම කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, චන්දිම ගමගේ ගරු මන්ත්‍රීතුමා.

[අ.භා. 4.25]

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද 1951 මෝටර් වාහන (විවිධ) නියෝගය, එහි හතරවැනි උපලේඛනයේ 6 හා 7 අයිතමයන් ඉවත් කිරීමටයි එදා මෙම තීරණය අරගෙන තිබෙන්නේ. එයින් කියැවුණේ, තමන් විසින් සකස් කර ගත්ත අංක තහඩුවක් සවි කර ගත්ත කාල වකවානුවක වාහනයේ බොනට්ටුවට වැඩිය පහළ මට්ටමින් සවි කිරීම සහ එම අංක තහඩුවේ උස අඟල් 5කට වැඩිය අඩු විය යුතුයි යන්නයි. ඒ වාගේම වාහනයේ පිටුපස windscreen එක මත අංක තහඩු සවි කිරීම තහනම්. ඒ අයිතමයන් දෙක ඉවත් කරලා 2013 අංක 1833/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර තිබූ නියෝගයට තවදුරටත් වලංගුභාවය ලබා දීම තමයි අද කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු නලින්ද ජයතිස්ස මැතිතුමා කිව්වා, අලුත් ආණ්ඩුවෙන් බදු අය කරනවා කියලා. එතුමාට මතක් කර දෙන්නට ඕනෑ, 2013 සිට අය කරන ගාස්තුවක් ගැන තමයි අද අපි විවාදයට අරගෙන තිබෙන්නේ කියන එක. 1951 මෝටර් වාහන (විවිධ) නියෝගය, එහි සතරවන උපලේඛනයේ අයිතමයන් දෙකක් ඉවත් කිරීම තමයි මෙම නියෝගයෙන් සිදු කරලා තිබෙන්නේ.

ඒක මතක් කරලා දෙන්නට ඕනෑ. මොකද, "මේ යහ පාලන ආණ්ඩුවෙන් බදු ගහනවා." කියලා සමහර මන්ත්‍රීවරු වැරදි අර්ථ කථනයක් දෙන්න උත්සාහ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාහනවල අංක තහඩු සවි කිරීම ගැන කථා කරද්දී මතක් කර දෙන්නට ඕනෑ, 1956දී අපේ රටේ "ශ්‍රී" අකුර සහිත වාහන අංක යොදා ගත්තා. ඒ අවස්ථාවේ රටේ හර්තාලයක් ඇති වෙලා උතුර ගිනි ගත්තා. දෙමළ ජනතාව ජීවත් වූ ප්‍රදේශවල "ශ්‍රී" අකුර දෙමළෙනුත්, දකුණ ඇතුළු සිංහල ජනතාව ජීවත් වුණු ප්‍රදේශවල එම අකුර සිංහලෙනුත් යොදන්නට ගිහිල්ලා ජාතිවාදය ඇවිස්සුණු පළමු සිද්ධිය එදා තමයි ඇති වුණේ. මේ අංක තහඩු ගැටලුව ජාතිවාදය ඇවිස්සුණු සිද්ධියක් බවට එදා පත් වුණා. ඊළඟට, අංක තහඩු නැති යුගයකුත් තිබුණා. ඒ තමයි 2015 ජනවාරි 08වැනි දා යහ පාලනය හරහා ජනාධිපතිවරයා පත් කරනතාක් කල් හිටපු රෙජිමය රජයේ යුගය. ඒ රජයේ හිටපු උදවියගේ හොර මැරකම් වසන් කර ගැනීමට එදා අංක තහඩු නැති, අංක තහඩු වෙනස් කළ සුදු පාට වෑන්වලින් ඇවිල්ලා ඒ රජයට විරෝධි පුද්ගලයන් පැහැරගෙන ගිහිල්ලා තර්ජනය කිරීම, පහර දීම, මරා දැමීම හා අතුරුදන් කිරීම සිදු කළා. විවිධ ගනුදෙනුවලින් උපයාගත් අයථා මුදල් සම්බන්ධයෙන් කරුණු හෙළි කිරීම වැළැක්වීමට මාධ්‍ය ආයතනවලට පහර දීමට, මාධ්‍ය ආයතන විනාශ කිරීමට, මාධ්‍ය ආයතන මර්දනය කිරීමට කටයුතු කළා. අංක තහඩු නැති වාහන පාවිච්චි කරලා රාජ්‍ය අනුග්‍රහයෙන් කෙරුණු මේ වාගේ මර්දනකාරී, මැර ත්‍රස්තවාදයක් ක්‍රියාත්මක වෙච්ච යුගයක් තිබුණා. ඒ කාලයේ රටට මර බිය උදා කරලා ඒ රාජපක්ෂවරුන්ගේ පාලනයට විරුද්ධව කථා කරන ඕනෑම කෙනෙකුට දඬුවම් දෙන්න සුදු වෑන්, එහෙම නැත්නම් අංක තහඩු නොමැති, එහෙමත් නැත්නම් අංක තහඩු වෙනස් කළ වාහන යොදා ගැනීමට කටයුතු කළා. හැබැයි, ඒ පාලනයට භයේ එදා කට වහගෙන සිටි උදවිය, එදා නිහඬව සිටි උදවිය, එදා නිශ්ශබ්දව සිටි මාධ්‍ය ආයතන අද යහ පාලනයට විරුද්ධව කථා කරන්න පටන් අරගෙන තිබෙනවා. මේ රටේ ඒ කාලයේ ගොදුරු බවට පත් වුණේ ඒ පැවැතුණු පාලනයට විරුද්ධ වුණ උදවියයි. ඒ කාලයේ පැවතුණු ආණ්ඩුවට, ඒ පාලනයට විරුද්ධ වුණු උදවියට මේ රටේ ජීවත් වීමට අයිතියක් නැහැ කියන බොහොම බරපතළ නරක පූර්වාදර්ශයක් ලබා දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු ජනාධිපති රාජපක්ෂ මැතිතුමාගේ කාර්ය මණ්ඩලීය ප්‍රධානී තමයි, ගාමිණී සෙනරත් මැතිතුමා. අපට මතකයි 2014 අවුරුද්දේ අවසන් මාසවල එතුමාගේ ගෙදරට නිතර දෙවේලේ වාහන එන්න යන්න පටන් ගත්තා. ඒවා නිකම් නොවෙයි ආවේ. සල්ලි මලු පුරවාගෙන තමයි ආවේ. කළු සල්ලි කෝටි ප්‍රකෝටි ගණන් ප්‍රවාහනය කරන්න ඒ වාහන යොදා ගත්තා. මේ තොරතුරු අද වන කොට අපරාධ විමර්ශන කොට්ඨාසයට වාර්තා වෙලා තිබෙනවා. ඒ මුදල්වලට මොකද වුණේ කියලා ඉදිරියේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව නඩු විභාග කරයි කියලා අපි විශ්වාස කරනවා. 2014.11.19වන දා රාත්‍රී 12.30ට පමණ WP KL 1824 දරන කළු පාට ජීප් රථයෙන් මිලියන 43ක් ලෙස සඳහන් වූ කාඩ්බෝඩ් පෙට්ටි 4ක මුදල් ගෙනැල්ලා තිබුණා. ඒ වාගේම මිලියන 11ක මුදලක් තැන්පත් කරපු පෙට්ටියක්, මිලියන 20ක් තැන්පත් කරපු පෙට්ටියක් තිබුණා. මේ සෙනරත් මැතිතුමාගේ ගෙදරට සල්ලි ගෙනාපු වාහනයක්. මේ ඔක්කෝම අංක තහඩු තිබෙන වාහන.

ඊළඟට, WP LM 0522 වාහනයෙන් කිලෝ 50ක් බර ඇති මුදල් පුරවන ලද කාඩ්බෝඩ් පෙට්ටියක් ගෙනැවිත් තිබෙනවා. චීන ජාතික කාන්තාවන් දෙදෙනෙක් තමයි මේ සල්ලි ගෙනැල්ලා තිබෙන්නේ. මේක ගියේ සෙනරත් මැතිතුමාගේ නිවසට. ඊළඟට, KB 5610 වාහනයෙන් 2014.12.19වැනි දා රාත්‍රී 8.00ට පමණ අරලියගහ මන්දිරයේ සිට ලොකු travelling bags දෙකක තමයි සෙනරත් මැතිතුමා ඔහුගේ ගෙදරට මුදල් අරගෙන ගිහින් තිබෙන්නේ. ඊළඟට, KM 1424 වාහනය. 2013.11.20 උදේ 9.00ට පොහොර බෑග් දෙකක් පුරවලා මේ වාහනයෙන් තමයි සෙනරත් මැතිතුමාගේ නිවසට මුදල් රැගෙන ආවේ.

ඒ වාගේම KV 5270 දරන ජීප් රථයෙන්, ලොකු travelling bags දෙකකින්, 2014.04.28වන දා සෙනරත් මැතිතුමාගේ නිවසට මුදල් ගෙනැල්ලා තිබුණා. ඒ ඔක්කෝම අංක තහඩු සඳහන් වාහන. ඒ නිසා මේ "අංක තහඩු" කියන එක බොහොම වැදගත්. මේ වාගේ තොරතුරු විශාල ප්‍රමාණයක් ලැබී තිබෙනවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉදිරියේදී මේ සම්බන්ධයෙන් අදාළ කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා. මෙතැනදී විවිධ උදවිය, විවිධ උපක්‍රම හරහා, වාහන අංක තහඩුවලට අදාළ නියෝගය පිළිබඳ මේ විවාදයට දේශපාලනය ඇදා ගන්න උත්සාහ කළා. පසුගිය මැතිවරණයේදී ජනතාව අපට අනතුරු ඇඟවීමක් සිදු කළා. අපි මොනවා කිව්වත්, හොරු අල්ලපු නැති ප්‍රශ්නය තිබෙනවා. අල්ලපු හොරුත් මාස දෙක-තුනක් බන්ධනාගාරයේ ඉඳලා ඇප අරගෙන එළියට ඇවිල්ලා, "අපි හොරකම් කළේ නැහැ, හොරු ඇල්ලුවාද?" කියලා අපෙන් අහනවා. එතකොට බලාගෙන ඉන්න මිනිස්සුත් හිතනවා, "මේ මිනිස්සු හොරකම් කරලා නැහැ, ඔය එළියේ ඉන්නේ!" කියලා. තමුන්නාන්සේලා දන්නවා, මාස තුනක් විතර බන්ධනාගාරය ඇතුළේ හිටියාට පසුව ඕනෑ කෙනෙකුට ඇප ලබා දෙන බව. අදාළ තොරතුරු විභාග කළාට පස්සේ ඇප ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. එහෙම ඇප අරගෙන ඇවිල්ලා විළිලජ්ජා නැතුව අහනවා, "හොරු ඇල්ලුවාද?" කියලා. ඒ වාගේම අල්ලපු නැති හොරු ටිකකුත් ඉන්නවා. ඒ බවත් අපි කියනවා. ඉදිරියේදී ඒ හොරු ඇල්ලීම තමයි මේ රජයේ, ඒ වාගේම අදාළ

[ගරු චන්දිම ගමගේ මහතා]

අමාත්‍යාංශවල, අදාළ බලධාරින්ගේ වග කීම වන්නේ. හොරු ඇල්ලීම සහ බඩු මිල පිළිබඳව විතරක් නොවෙයි, තව ප්‍රශ්න ගණනාවක් තිබෙනවා.

පසුගිය කාලයේ රජයක් විධියට අපි මේ රටේ සම්පත් අනවශ්‍ය විධියට ආරක්ෂා කරන්න උත්සාහ කළා. එදා බොරලු ටික, කළු ගල් ටික, වැලි ටික, ඒ වාගේම පස් ටික තොරතෝංචියක් නැතුව කපලා විනාශ කරනකොට අපි නීති රාමුවක් ගෙනැල්ලා, මතු පරම්පරාවට ඒ සම්පත් ආරක්ෂා කරලා දෙන්න අවශ්‍ය කටයුතු සිදු කළා. හැබැයි ඒකෙන් මොකක්ද වුණේ? රුපියල් 6,000ට-7,000ට තිබුණු වැලි කියුබ් එකක මිල රුපියල් 11,000 වෙනකල් ඉහළ ගියා. මා නියෝජනය කරන්නේ අනුරාධපුරය, කැකිරාව ආසනය. මනම්පිටියෙන් වැලි අරගෙන කැකිරාවට ගෙනෙනකොට කලින් රුපියල් 9,000ටයි අළෙවි වුණේ. ඒක දැන් රුපියල් 36,000ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. කොළඹට එනකොට රුපියල් 59,000යි, කියුබ් තුනහමාරේ වැලි ලෝඩ් එක. මේ විධියට රත්තරන්වලට සමාන මිලක් වැලිවලට දීලා තිබෙනවා. බොරලුත් එහෙමයි; පසුත් එහෙමයි. අපි නීති රීති දමලා, මේ රටේ සම්පත් විනාශ වීම වළක්වලා, ඒ කටයුතු ක්‍රමවත් කරන්න ගියාම ඇති වුණු තත්ත්වය නිසා ජනතාව අප සමඟ උරණ වුණා.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගත්තාම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ රටේ රජ කාලේ ඉදලා තිබෙන වැව් තිබෙනවා. තමුන්නාන්සේලා හැමෝම දන්නවා, කලා වැව ගැන.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
හොඳයි.

ඒ වැව හදපු දවසේ ඉඳලාම ඒ ප්‍රදේශයේ ජනතාව මාළු කැවේ වැවෙන් අල්ලාගෙන. අද මාළු අල්ලන්න බැහැ. මාළු ඇල්ලුවොත් අරගෙන ගිහිල්ලා හිරේ දමනවා. එහෙම නැත්නම් දඩ ගහනවා. වැව් පිටියට හරකෙක් වතුර බොන්න දක්කන්න බැහැ. හරක් දැක්කුවොත් නඩුවක් පවරලා හිරේ දමනවා. ඒ වාගේම වැව් පිටියට ගිහිල්ලා දර කෑල්ලක් කපා ගන්න බැහැ. නීති විරෝධී දැව ජාවාරම් සිදු කරනවා කියලා හිරේ දමනවා. ඉණේ ගිනි පෙට්ටියක් තිබුණොත් කැලෑ ගිනි තිබ්බා කියලා හිරේ දමනවා. ඒ මොකද? මේ සම්පත් ආරක්ෂා කරන්නයි. ඒ වාගේම අද වැටකොලු, පතෝල, තක්කාලි වාගේ මැහි නිර්මාණය කරලා කරන වගා සඳහා ඉන්නක් කපා ගන්න බැහැ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නඩු පවරනවා. ජනතාවගේ මේ පීඩනය තමයි මැතිවරණය තුළින් ඉදිරියට ආවේ. ඔය විපක්ෂයේ උදවිය ජෝගි නැටුවාට, ඒ ගොල්ලන් කරපු හොඳ දෙයක් නිසා නොවෙයි එහෙම වුණේ. අපි රටේ සම්පත් ආරක්ෂා කරන්න ඕනෑ. නමුත් ඒ සම්පත් ආරක්ෂා කරන්න නීති රීති පනවනකොට මූලික වශයෙන් ජනතාව ආරක්ෂා වෙන්න ඕනෑ. ජනතාව ආරක්ෂා නොවන පරිදි සම්පත් ආරක්ෂා කරන්න ගියාම මේ ප්‍රතිඵලය ලැබෙනවා. ඒ නිසා කවුරු කවුරුත් දැන ගන්න ඕනෑ, සම්පත් ආරක්ෂා කරනවා වාගේම මොනවා කරන්නත් ඉස්සර වෙලා ජනතාවගේ ජීවන මට්ටම රැකෙන්න ඕනෑ කියලා. එහෙම නොවුණොත් මේ වාගේ මැතිවරණ ප්‍රතිඵල ලැබෙනවා. ඒක එහෙම වුණා කියලා ඔය

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

පසුගිය කාලයේ හොරකම් කරලා අද

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඒ වාගේම පසුගිය කාලයේ ස්ත්‍රී දූෂණ කරපු උන් උඩ පනින්න ඕනෑ නැහැ. මේක එහෙම උඩ පනින්න ඕනෑ අවස්ථාවක් නොවෙයි. වැරදි තිබෙනවා නම් අපි ඒ වැරදි නිවැරදි කර ගන්න ඕනෑ බව ඇත්ත. හැබැයි මේක පසුගිය කාලයේ වැරදි කරපු උන්ට නටන්න ලැබුණු අවස්ථාවක් නොවෙයි. සමහර කට්ටිය හිතාගෙන ඉන්නවා, රජ වුණා කියලා. නමුත් රජ වෙන්න බැහැ.

පළාත් පාලන ආයතන කීපයක් දිනුවා කියලා රජ වෙන්න බැහැ. මැතිවරණය තිබුණේ පළාත් පාලන ආයතන 342කට. ඒකෙන් පළාත් පාලන ආයතන 200කට ආසන්න ප්‍රමාණයක බලය අපි පිහිටුවනවා. එම නිසා තාවකාලිකව පොඩි වුන් එකක් ලැබුවාට, ඒ වුන් එක යථාර්ථයක් බවට පත් වන්නේ නැහැ. මේ අය පළාත් පාලන ආයතන කීපයක් ජයග්‍රහණය කරලා ආණ්ඩු පෙරළන්න ගියා. පළාත් පාලන ආයතන ජයග්‍රහණය පැත්තක තියලා ආණ්ඩු පෙරළන්න ගිහිල්ලා, ආණ්ඩු පෙරළන්න බැරිව අද පොහොට්ටුව ඇන ගෙන ඉන්නවා. මේක තමයි යථාර්ථය. ඒ නිසා තමන්ගේ ප්‍රමාණය දැනගෙන කටයුතු කරන්න ඕනෑ. එහෙම නැති වනකොට තමන් මොකක්ද කරන්නේ කියලා තමන් දන්නේත් නැහැ.

ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් කිව්වා, පොදු ප්‍රවාහනය සම්බන්ධයෙන්. එතුමාට මේ කාරණය මා මතක් කරලා දෙන්න ඕනෑ. මේ වනකොට මහව, දඹුල්ල, හබරණ, පොළොන්නරුව, ත්‍රිකුණාමලය වැනි ප්‍රදේශවල අලුතින් දුම්රිය මාර්ග ඉදිවෙමින් පවතිනවා. ඒ වාගේම මහා මාර්ග ගත්තාම මධ්‍යම අධිවේගී මාර්ගය, උතුරු අධිවේගී මාර්ගය නිර්මාණය වනවා. මේවා එපා කියලා, ඒ ඉඩම් සම්බන්ධයෙන් අනවශ්‍ය ප්‍රශ්න ඇති කරලා මේ කටයුතු කඩාකප්පල් කරන අයම තමයි මෙතැනට ඇවිල්ලා පොදු ප්‍රවාහන පහසුකම් දියුණු වන්නේ නැහැ කියලාත් කථා කරන්නේ. එවැනි දෙබිඩි පිළිවෙතක් ගෙන යන්නේ නැතිව එක මතයක ඉඳගෙන මේ රටේ සංවර්ධනය වෙනුවෙන් කැපවන්න කියලා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

[පි.ව. 4.37]

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதி தொடர்பான விவாதத்திலே கலந்துகொண்டு பேசுவதற்கு எனக்கு வாய்ப்பளித்தமைக்கு முதற்கண் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். நாட்டு மக்களுக்கு நன்மை பயக்கக்கூடிய வகையில் வினைத்திறன் மிக்க சேவையை வழங்குவதற்காகவே நாங்கள் இத்தகைய சட்டங்களைத் திருத்தி நடைமுறைப்படுத்துகின்றோம். ஆனால், இங்கு கொண்டுவரப்படுகின்ற சட்டங்கள் எந்த அளவுக்கு நடைமுறைப்படுத்தப்படுகின்றன? அவற்றின்மூலம் வினைத்திறன் மிக்க சேவையை இந்த நாட்டு மக்கள் அனைவரும் பெற்றுக்கொள்கிறார்களா? என்பன கேள்விக்குரிய விடயங்களாகவே இருந்துவருகின்றன. இன்று பல சட்டங்கள் திருத்தப்படுகின்றன; ஆனால், அவை நடைமுறைக்கு வருவதில்லை. அதனால், மக்கள் எந்தவிதமான பயனையும் அனுபவிப்பதில்லை. ஆகவே, சட்டமன்றத்தில்

உருவாக்கப்படுகின்ற, திருத்தப்படுகின்ற சட்டங்கள் சரியான முறையில் அமுல்படுத்தப்பட வேண்டும். அதன்மூலம் இந்த நாட்டு மக்கள் மிகச் சிறந்த சேவையை - நன்மையைப் பெற்றுக்கொள்ள வேண்டும். அந்த அடிப்படையில்தான் மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதி இங்கே கொண்டுவரப்பட்டிருக்கின்றது.

இன்று நாங்கள் 'டிஜிட்டல்' மயப்படுத்தப்பட்ட பல விடயங்களைப் பற்றிப் பேசுகிறோம். போக்குவரத்துத் துறையில் மாத்திரமல்ல, கல்வி போன்ற துறைகளிலும் இவ்வாறான விடயங்களைப் பற்றிப் பேசுகிறோம். ஆனால், இன்று கிராமப்புறங்களை எடுத்துக்கொண்டால், எத்தனையோ அடிமட்டக் கிராமங்கள் போக்குவரத்து வசதிகளை அனுபவிக்காமல் இருக்கின்றன. அதுமாத்திரமன்றி, இலங்கைப் போக்குவரத்துச் சபையின் பஸ் வண்டிகளையே காணாத எத்தனையோ கிராமங்கள் இருக்கின்றன. நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மட்டக்களப்பு மாவட்டத்தை எடுத்துக்கொண்டால், அது கிட்டத்தட்ட 1,080 கிராமங்களைக் கொண்ட ஒரு பிராந்தியம். ஆனால், அந்த மாவட்டத்திலுள்ள 350க்கும் மேற்பட்ட கிராமங்களுக்கு இன்னமும் பஸ் போக்குவரத்தே இல்லை. அந்த வகையில் அங்கு இலங்கைப் போக்குவரத்துச் சபையின் பஸ் வண்டிகளைக் காணாத கிராமங்களும் இருக்கின்றன. இதனால், அந்தக் கிராமங்களில் இருக்கின்ற மக்கள் போக்குவரத்துத் தொடர்பில் பல அசௌகரியங்களை அனுபவிக்கின்றார்கள். இவ்வாறான நிலையில்தான், இன்று நாங்கள் 'டிஜிட்டல்' மயம் பற்றியெல்லாம் பேசுகிறோம். இந்த அரசாங்கம் ஆட்சிக்கு வரும்போதே, Wi-Fi பற்றிப் பேசிக்கொண்டு வந்தது; கல்வி அமைச்சினூடாக பாடசாலை மாணவர்களுக்கு Tablets கொடுப்பது பற்றியும் பேசியது. ஆனால், இன்று மட்டக்களப்பு மாவட்டத்தில் மாத்திரமல்ல, இலங்கையிலே இருக்கின்ற எத்தனையோ கிராமங்களில் சாதாரணமாக குடிநீர் வசதிகூட இல்லாமல் பாடசாலைகள் இயங்குகின்றன. அங்கு சுத்திகரிக்கப்பட்ட நல்ல குடிநீர் வசதிகள் இல்லாமையினால், பாடசாலை செல்கின்ற பருவத்திலுள்ள பிள்ளைகள் மற்றும் பச்சிளங்குழந்தைகள் எத்தனையோ பேரின் சிறுநீரகங்கள் பாதிக்கப்படுகின்ற நிலைமை காணப்படுகின்றது. இவ்வாறு உரிய அடிப்படை வசதிகளின்றி எத்தனையோ குக்கிராமங்கள் அழிந்துகொண்டிருப்பதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. எனவே, இது பற்றிச் சற்றுச் சிந்திக்க வேண்டும்.

இன்று மட்டக்களப்பு மாவட்டத்திலுள்ள 270 கிராமங்களில் இருக்கின்ற பாடசாலைகளில் சரியான குடிநீர் வசதிகள் இல்லை. அவை தகரக் கொட்டில்களிலும் ஓலைக் கொட்டில்களிலும் இயங்குகின்ற நிலைமை இருக்கின்றது. இவ்வாறு அங்கிருக்கின்ற கிராமப் பாடசாலைகள் அடிப்படை வசதிகள் இல்லாமல் இயங்குகின்றன. எமது மக்கள் ஓர் ஆட்சி மாற்றம் தேவை என்ற அடிப்படையிலே, 2015ஆம் ஆண்டு ஜனவரி மாதம் 8ஆம் திகதி இடம்பெற்ற ஜனாதிபதித் தேர்தலில் தற்போதைய ஜனாதிபதி அவர்களுக்கு வாக்களித்து நல்லாட்சியை ஏற்படுத்தினார்கள். அதாவது, இலங்கையிலே இனவாதத்தை, மதவாதத்தை விரும்பாத பெரும்பான்மை மக்களோடு இணைந்து, எமது நாட்டிலே இருக்கின்ற சிறுபான்மை மக்களான தமிழ், முஸ்லிம் மக்கள் பெருமளவான வாக்குகளை அளித்தார்கள். அதற்குப் பின்பு 2015ஆம் ஆண்டு 9ஆம் மாதம் இடம்பெற்ற பாராளுமன்றத் தேர்தலிலே இந்த ஆட்சியைப் பலப்படுத்துவதற்கு அதிகளவு வாக்குகளை வழங்கியிருந்தார்கள். ஆனால், இவ்வாறு வாக்குகளை வழங்கியும் எமது மக்கள் பலவிதங்களில் - பல்வேறு துறைசார்ந்து இன்னமும் ஏமாற்றங்களையே அனுபவித்துக் கொண்டிருக்கின்றார்கள். இவ்வாறான ஏமாற்றங்களை இரண்டரை - மூன்று வருடங்களாகத் தொடர்ச்சியாக இந்த மக்கள் அனுபவித்ததனால்தான் இன்று கிராமப்புறங்களிலே இந்த அரசாங்கம் பாரிய பின்னடைவைச் சந்தித்திருக்கின்றது. இதுதான் யதார்த்தம். அதை ஏற்றுக்கொண்டேயாக வேண்டும்.

இன்று இந்த அரசாங்கம் பணம் படைத்தவர்களும் அரசியல்வாதிகளும் பெரிய கம்பனிகளை நடத்துபவர்களும் வாழ்வதற்காக உருவாக்கப்பட்டதல்ல. இந்த நாட்டில் சாதாரண மக்களும் வாழவேண்டும். இன்று விலைவாசி நாளுக்குநாள் அதிகரித்துக்கொண்டு செல்கின்றது. தேங்காயின் விலையைப் பாருங்கள்! சீனியின் விலையைப் பாருங்கள்! எரிவாயுவின் விலை அதிகரிக்கும் என எதிர்பார்க்கப்படுகின்றது. அந்த வகையில் இன்று மாலை 6 மணிக்குள் என்னென்ன பொருட்களின் விலைகள் அதிகரிக்குமோ, நாளை என்னென்ன பொருட்களின் விலைகள் அதிகரிக்குமோ என்ற விதத்திலான ஏக்கத்தோடுதான் இன்று அந்த மக்கள் வாழ்கின்றார்கள். இந்த நிலைமையினால்தான் இந்த அரசாங்கத்தில் - ஆளுந்தரப்பில் இருக்கின்ற கட்சிகள் அதாவது ஐக்கிய தேசியக் கட்சியும் ஸ்ரீலங்கா சுதந்திரக் கட்சியும் இன்று கிராமங்களிலே அதிகளவான பின்னடைவைச் சந்தித்திருக்கின்றன. இந்தப் பின்னடைவானது, ஏற்கெனவே இருந்த அரசாங்கத்தின்மீது கொண்ட விருப்பத்தினால் அல்ல, இப்போதைய அரசாங்கத்தினது போக்கின்மீது உள்ள வெறுப்பின் நிமித்தமாகத்தான் இன்று இந்தப் பின்னடைவை இவர்கள் சந்தித்திருக்கின்றார்கள். ஆகவே இந்த விடயம் சம்பந்தமாகச் சற்றுச் சிந்திக்கவேண்டும்! ஏனெனில், இங்கு பேசப்படுகின்ற விடயங்கள் வெறுமனே 'ஹன்சாட்'டில் பதியப்படுகின்ற விடயங்களாகத்தான் இருக்கின்றன. ஆனால், அவை நடைமுறைப்படுத்தப் படுவதாகத் தெரியவில்லை. "யானையைப் பூனையாக்குவோம் அல்லது பூனையை யானையாக்குவோம்" என்றும் 'டிஜிட்டல்' என்றும் 'நவீனம்' - 'நவீனத்துவமயம்' என்றும் பேசப்பட்டதெல்லாம் பேச்சளவிலேயே இருக்கின்றன. ஆனால், கிராமங்களிலே வாழ்கின்ற மக்கள் அடிப்படை வசதிகளில்லாமல் இன்னமும் கஷ்டப்படுகின்றார்கள்.

"போக்குவரத்துத் துறையிலே பல புதிய மாற்றங்கள் கொண்டுவரப்படும்; புதிய தொழில்நுட்ப முறைகள் கையாளப்படும்" என்று பேசப்பட்டு வருகின்ற நேரத்தில், இன்று 270 கிராமங்களிலே இலங்கைப் போக்குவரத்துச் சபையின் பஸ் வண்டியைக் காணாத மக்களும் இருக்கின்றார்கள். அந்தக் கிராமங்களிலே இருக்கின்ற ஏழை மாணவர்கள் பாடசாலைக்கு 5- 6 கிலோமீற்றர் தூரம் நடந்துசெல்ல வேண்டும். அதேபோன்று மீண்டும் 5 - 6 கிலோமீற்றர் தூரம் நடந்து வீட்டுக்குச் செல்லவேண்டும். இவ்வாறு அந்தக் கிராமத்து ஏழைப் பிள்ளைகளும் மக்களும் ஒரு நாளைக்குக் கிட்டத்தட்ட 12 -13 கிலோமீற்றர் தூரம் நடக்க வேண்டிய அவல நிலைக்குத் தள்ளப்பட்டிருக்கின்றார்கள். மூன்று தசாப்த காலமாக வடக்கு, கிழக்கிலே நடைபெற்ற யுத்தத்தினால் பலவிதமான அழிவுகளை, இழப்புக்களை, துயரங்களைச் சந்தித்த மக்கள் இந்தப் போக்குவரத்துத் துறையில் சரியான சீர்படுத்தல், சரியான புனரமைப்பு இல்லாததனால் இன்று பாரிய பிரச்சினைகளை எதிர்நோக்கியவண்ணம் இருக்கின்றார்கள்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அன்றாடம் தங்களுடைய வாழ்க்கையைக் கொண்டு நடத்துவதற்குக் கஷ்டப்படுகின்ற - சிரமப்படுகின்ற மக்கள்தான் இந்த நாட்டிலே பெரும்பான்மையாக இருக்கின்றார்கள். எனவே, நாங்கள் எடுக்கின்ற எந்த நடவடிக்கையும் நாங்கள் கொண்டுவருகின்ற எந்தத் திட்ட அமுலாக்கலும்

[ගරු එස්. වියාලේන්දිරන් මහතා]

கிராமங்களை நோக்கியதாக இருக்கவேண்டும்; கிராம மக்களை மையப்படுத்தியதாக இருக்கவேண்டும். "ஊழலை ஒழிப்போம், ஊழல்வாதிகளைச் சட்டத்தின்முன் நிறுத்துவோம்" என்று சொல்லிக்கொண்டுதான் இந்த நல்லாட்சி அரசானது பதவிக்கு வந்தது. ஆனால், இந்த நல்லாட்சி வந்து இரண்டு - இரண்டரை வருடங்களிலேயே மத்திய வங்கியில் பல கோடி ரூபாய் பிணைமுறி மோசடி நடந்திருக்கின்றது. சற்றுச் சிந்தித்துப் பாருங்கள்! "ஏற்கெனவே இருந்த அரசாங்கம் பல கோடி ரூபாய் ஊழல்களைச் செய்தது: அதனால் இந்த நாட்டுக்குக் கிட்டத்தட்ட 7,400 பில்லியன் ரூபாய் கடன் இருக்கிறது; இந்தக் கடன் சுமையையும் மக்கள் மீது திணிக்கப்படுகின்ற வரிச்சுமையையும் குறைத்து மக்களுக்கு ஒரு சாதகமான நிலையை ஏற்படுத்த வேண்டும்; ஊழல்வாதிகள் சட்டத்தின்முன் நிறுத்தப்பட வேண்டும்" என்று கூறிவந்த இந்த நல்லாட்சி அரசாங்கத்தில் இரண்டரை வருடங்களுக்குள்ளே மத்திய வங்கியில் பல்லாயிரம் கோடி ரூபாய் மோசடி செய்யப்பட்டிருக்கின்றது. இலங்கை வரலாற்றிலேயே இதுதான் மிகப் பெரிய மோசடியென்று நான் நினைக்கின்றேன்.

முன்னைய அரசாங்கமாக இருக்கலாம் அல்லது "ஊழலை ஒழிப்போம்!" என்று சொல்லிக்கொண்டு வந்த இந்த நல்லாட்சி அரசாங்கமாக இருக்கலாம். மாறிமாறி இந்த அரசாங்கங்களால் மேற்கொள்ளப்படுகின்றதான இவ்வாறான நடவடிக்கைகள் ஒட்டுமொத்தமாக இந்த நாட்டிலே இருக்கின்ற ஏழை மக்களைப் பாதிக்கின்ற செயற்பாடுகளாகத்தான் இருக் கின்றன. நாளுக்குநாள் பொருட்களின் விலைகள் அதிகரிக்கப் படுகின்றன! இன்று ஏழை மக்கள் சாதாரணமாக ஒரு வீட்டினைக் கட்டிக்கொள்வதற்காகவோ அல்லது ஒரு தொழிலினைச் செய்வதற்காகவோ வங்கிகளிலே கடன் பெறுகின்றார்கள். அந்த வங்கிகளிலே வட்டி வீதம் இன்று அதிகரித்துக் காணப்படுகின்றது. மத்திய வங்கியில் இடம்பெற்றதான பாரிய ஊழல் மோசடி இன்று யாரைப் பாதிக்கின்றது? அல்லது முன்பிருந்த அரசும் அதனோடு இணைந்த அரசியல்வாதிகளும் மேற்கொண்டதான ஊழல் மோசடிகள் யாரைப் பாதிக்கின்றன? இந்த நாட்டில் வாழும் சாதாரண மக்களுடைய தலைமீதுதான் அவை சுமத்தப் படுகின்றன. இது சம்பந்தமாக நாங்கள் சற்றுச் சிந்திக்க வேண்டிய நிலையிலே இருக்கின்றோம்.

" இலட்சக்கணக்கானோருக்கு வேலைவாய்ப்புக்கள் கொடுப்போம்" என்று சொல்லிக்கொண்டுதான் இந்த நல்லாட்சியின் பிரதமர் வந்தார். 2015ஆம் ஆண்டு 09ஆம் மாதம் அந்த உரையை நாங்கள் இந்தப் பாராளுமன்றத்திலே கேட்டோம். கிழக்கு மாகாணத்திலே 2012ஆம் ஆண்டிலிருந்து வேலையில்லாத எத்தனையோ பட்டதாரிகள் - கர்ப்பிணிப் பெண்கள், கைக்குழந்தைகளோடு உள்ள பெண்கள்கூட- வேலை கேட்டு 90 நாட்களையும் தாண்டி வெயிலிலும் மழையிலும் இரவுபகலாக வீதியோரங்களிலே கிடந்தார்கள். அதேநேரத்தில், கிழக்கு மாகாணத்திலுள்ள கிராமசேவகர் பிரிவுகளிலே, 'சமுர்த்தி' மற்றும் அரச திணைக்களங்களிலே 4,000க்கு மேற்பட்ட பதவி வெற்றிடங்கள் இருந்தும் இன்று அந்த வெற்றிடங்கள் அந்த மாகாணத்திலிருக்கின்ற பட்டதாரிகளைக்கொண்டு நிரப்பப்படாமல் தென்னிலங்கை யிலே இருப்பவர்களைக்கொண்டு நிரப்பப்பட்டு வருகின்றன. ஆனால், 3 - 4 வருட காலத்தையும் பணத்தையும் செலவழித்துப் பட்டத்தைப் பெற்றுக்கொண்ட அந்த ஏழைப் பிள்ளைகள் இன்று அங்கு வேலையில்லாமல் அலைந்து திரிகின்றார்கள். அவர்கள் இது சம்பந்தமாக மாகாண சபைக்குச் சென்று முன்பிருந்த முதலமைச்சரோடு பேசினார்கள். "உங்களுக்கு வேலை தருவோம்" என்று அவர் கூறியதற்கு அமைய அவர்கள் தங்களுடைய ஆர்ப் பாட்டத்தைக் கைவிட்டார்கள். ஆனால், பின்னர் எதுவும் நடக்கவில்லை. அவர்கள் நடந்து முடிந்ததான உள்ளூராட்சி மன்றத் தேர்தலிலே "VIP" - வேலை இல்லாப் பட்டதாரிகள் என்று எழுதித்தான் தங்கள் வாக்கைப் போட்டார்கள் என்பதை நாங்கள் அவர்கள் மூலமாக அறிந்துகொள்ளக்கூடியதாக இருந்தது. இவ்வாறு இன்று எத்தனையோ இளைஞர், யுவதிகள் பட்டத்தைப் பெற்றுவிட்டு வேலையில்லாமல் இருக்கின்ற - வேலையில்லாத் திண்டாட்டத்தை அனுபவித்துக் கொண்டிருக்கின்ற அவல நிலையை நாங்கள் பார்க்கின்றோம். ஆகவே, இந்த அரசாங்கம் வேலைவாய்ப்பு வழங்குவதிலே சரியான ஒரு கொள்கையைக் கடைப்பிடிக்க வேண்டும். அங்கு கல்வி அமைச்சினால் வழங்கப்படுகின்ற வேலைவாய்ப்புகள் மற்றும் சுகாதார அமைச்சினால் வழங்கப்படுகின்ற சுகாதாரத் தொண்டர் நியமனங்கள்கூட, இன்று தென்னிலங்கையில் உள்ளவர்களைக் கொண்டுதான் நிரப்பப்படுகின்றன. ஆனால், அங்குள்ள பட்டதாரிகள் வேலையில்லாமல் இன்னமும் பட்டதாரிகளாகவே இருந்து கொண்டிருக்கின்றார்கள்.

அரசாங்கம் இந்த இரண்டரை வருடத்திலே, "வேலை வாய்ப்புகள் வழங்கப்படும்" என்றும் "மக்களுடைய வாழ்வாதாரத்திலே பல மாற்றங்கள் கொண்டு வரப்படும்" என்றும் கூறியது. மீதமாக இருக்கின்ற வருடங்களில் எந்தளவுக்கு மக்கள்நலன் சார்ந்து, மக்களுடைய வாழ்வாதார முன்னேற்றம் சார்ந்து இவர்கள் சிந்திக்கப்போகிறார்கள்? தங்களுடைய ஆட்சியைத் தக்கவைத்துக் கொள்வதையிட்டுச் சிந்திப்பதில்தான் இனிவரும் காலங்களை இவர்கள் கழிப்பார்களேயொழிய, வேறெதுவும் நடக்காதென்று நான் நினைக்கின்றேன். அந்த மக்களை நோக்கியதான நலத் திட்டங்களில் - வேலைவாய்ப்புகளை வழங்குவதிலோ, வாழ்வாதாரத்தில் முன்னேற்றத்தை ஏற்படுத்துவதிலோ அல்லது அபிவிருத்தி சார்ந்த உட்கட்டமைப்பு வசதிகளை ஏற்படுத்துவதிலோ - எந்தளவுக்கு இவர்கள் கவனம் செலுத்தப்போகிறார்கள்? என்பது ஐயப்பாடான விடயமாகவே இருக்கின்றது என்பதைக் கூறிக்கொண்டு, விடைபெறு கின்றேன். வாய்ப்புக்கு மீண்டும் நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Mohamed Navavi. You have five minutes.

[4.50p.m.]

ගරු මොහොමඩ් නවවි මහතා
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)

Mr. Presiding Member, I thank you for giving me this opportunity. I must especially thank the Hon. Minster for bringing in this Regulation, which seeks to improve the standard of transport for the benefit of the people.

Fortunately, certain amemdments have been brought in to this Regulation. I would also like to mention the problems that we are facing regarding the transport service today. Last month, I brought to your notice an incident where a bus plying from Colombo to Jaffna via Puttalam met with a major accident due to the negligence of its driver where eight people died and almost 22

people were injured. It was a fatal accident. I visited them at the Puttalam Hospital. I came to know that these buses plying at night start at 10.00 in the night and reach Jaffna around 6.00 or 6.30 in the morning. These buses have only one driver and all of them are young people. I spoke to the Hon. Minister and the Deputy Minister with regard to this matter. I think there have to be at least two drivers for a bus which plies from Colombo to Jaffna, which covers almost 250 miles, so that the drivers could have a rest. This ensures not only their safety, but the safety of the passengers and the other vehicles which are plying on the road. So, I request the Hon. Minister to impose a law that every bus travelling over 200 miles or 300 kilometers, to have two drivers. This practice was followed in the past. While travelling in Tamil Nadu, I noticed that long-distance buses had two drivers. This is for the safety of the passengers as well as the other people.

Once I had the opportunity to travel from Anuradhapura to Jaffna in the Jaffna night mail train. Actually, there are over 150 buses going from Colombo to Jaffna in the night but the train going to Jaffna at this time is not crowded. The reason is, since it is a night train, people think about their security. Actually speaking, travelling by train is comfortable and smooth, but in the night, unfortunately, since there are insufficient security officers in the train, people are reluctant to travel by train. If proper security can be provided, I am sure, not only one train, probably even two trains will not be enough for the people who are travelling to Jaffna at night. At the same time, we can bring down the congestion of these buses plying from Colombo to Jaffna. The Hon. Deputy Minister is also here. He must make a note of this and see that more security officers are provided for the night mail train from Colombo to Jaffna, so that people will have proper security.

In addition, I was just mentioning that all buses going from Colombo to Jaffna and other long distance buses must have at least two drivers, so that the drivers can change and take a rest. Otherwise, it is very difficult for a single driver to drive a bus at a stretch for eight to ten hours. It affects his safety and as well as the passengers' safety.

Also, I would like to refer to the Puttalam railway line. When I was the Transport Minister for North-Western Province, I made repeated requests for a train service on our Puttalam railway line at night, because there are no trains plying from 10.00 p.m. to 6.00 a.m. on that line. We also have a cement factory, which caters to nearly 46 per cent of the cement requirement. It was constructed to transport cement by train because warehouses are available in Colombo.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

**ගරු මොහොමඩ් නවවි මහතා**
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Please give me two more minutes.

But, somehow, I can remember, as the cost was so high the CGR refused to transport cement by train. Hon. Deputy Minister, you are also from Wayamba. Please make arrangements so that we could transport all the cement by train, by which you can earn more money. At the same time, the congestion on the road would be less.

I read an article in the newspaper regarding the train to Badulla. Almost all the tourists are going by train but unfortunately, there are no toilet facilities in the train. In addition, people say that cleanliness is also very poor. So, I request the Hon. Deputy Minister, who is present today, to look into these things so that you could make more money and the passengers will have a safe journey.

Thank you.

[අ.භා. 4.56]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிதி மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)
The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Finance and Mass Media)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෝටර් වාහන පනත යටතේ වූ නියෝගයක් අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී විවාදයට සම්බන්ධ වීමට ලැබීම ගැන මම ඉතාමත් සතුටු වෙනවා. අද මේ නියෝගය සම්බන්ධයෙන් වූ විවාදය ආරම්භයේ සිටම ඉදිරිපත් වූ අදහස් අනුව සාමාන්‍ය අවබෝධයක් ඇති වෙන්නේ වාහන අංක තහඩුවල ප්‍රමිතිය සම්බන්ධයෙන් යම්කිසි නීති හඳුන්වා දීමක් විධියටයි. ඒ වාගේම යම් අයෙක් මෙහි අරමුණු විධියට හිතයි යම්කිසි බදු මුදලක් අය කරලා රජයට ආදායමක් ලබා ගැනීම සහ වාහනයේ අංක තහඩුවට ප්‍රමිතියක් ඇති කිරීම කියලා. එම අරමුණුවලට සීමා වීමක් ගැන තමයි අපට අද අහන්නට ලැබුණේ. නමුත්, මෝටර් වාහන පනත යටතේ මෙවැනි රෙගුලාසි ගෙන එන්නේ ඊට වඩා පුළුල් පරමාර්ථ සහ අරමුණු ඇතිව කියන එක විශේෂයෙන්ම අපි අවබෝධ කර ගත යුතුයි. වෙනත් විධියකින් කියනවා නම්, සමස්තයක් විධියට අවසානයේ ප්‍රවාහනය පිළිබඳව ගුණාත්මක දියුණුවක් අපේක්ෂාවෙන් තමයි මෙවැනි නීති රීති හඳුන්වා දීමට කටයුතු කරන්නේ. විශේෂයෙන්ම මේ නියෝගය හඳුන්වා දීමට කටයුතු කරලා තිබෙන පුළුල් පරමාර්ථය, අරමුණ රටේ සමස්ත ප්‍රවාහන සේවයේ ගුණාත්මක දියුණුවක් ඇති කිරීමයි.

නිදහසින් පසු අපේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ ප්‍රමාණාත්මකව යම් දියුණුවක් තිබෙනවා. මාර්ග පද්ධතිය දියුණුයි, වාහන සංඛ්‍යාවේ විශාල වර්ධනයක් තිබෙනවා. මේ අතින් බලන විට සමස්ත ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රමාණාත්මක දියුණුවක් තිබෙනවා. පොදු ප්‍රවාහනය තුළ මීට දශක ගණනාවකට පෙර අපේ රටේ මගී ජනතාවට ලැබුණු පහසුකම්වලට වඩා සුඛෝපභෝගී පහසුකම්, -දුම්රිය තුළ, බස් රථ තුළ සහ පෞද්ගලික වාහන තුළ- අද තිබෙනවා. උදාහරණයක් විධියට මීට දශක ගණනාවකට පෙර කොළඹ සිට අනුරාධපුරයට යන්නට පැය 10ක 12ක කාලයක් වැය කරන්නට සිදු වුණත් අද වන විට පැය 3ක්, 3,1/2ක් ඇතුළත අධික වේගයෙන් අනුරාධපුරයට ළඟාවීමේ හැකියාව ලැබිලා තිබෙනවා. ඒ අනුව ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රමාණාත්මක වශයෙන් යම් දියුණුවක් අපට දකින්නට පුළුවන්කමක් තිබෙනවා. නමුත් මා පෞද්ගලිකව දකින විධියට වර්තමානයේ මේ ප්‍රවාහන ක්ෂේත්‍රය දැවැන්ත අභියෝග රාශියකට

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

මුහුණ දීලා තිබෙනවා. ආර්ථික වශයෙන් ගත්තොත් දළ ජාතික නිෂ්පාදිතයට සෘජුව හා වක්‍රව ප්‍රවාහනයෙන් සිදු වන දායකත්වය අපට කොහෙත්ම අවතක්සේරු කරන්නට පුළුවන්කමක් නැහැ.

රිය අනතුරු නිසා සාමාන්‍යයෙන් වාර්ෂිකව 3,000කට ආසන්න මරණ ප්‍රමාණයක් සිද්ධ වනවා; දෛනිකව විශාල මරණ ප්‍රමාණයක් සිද්ධ වනවා; සදාකාලික ආබාධිතයන් බවට පත්වනවා; තුවාලකරුවන් ඇති වනවා. රිය අනතුරු නිසා විශේෂයෙන්ම රටේ ආර්ථිකයට වාගේම රක්ෂණය වැනි දේවල්වලට දැවැන්ත මුදලක් වැය වනවා. මේ ආකාරයෙන් වර්තමාන ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ දැවැන්ත අභියෝග ගණනාවක් තිබෙන බව අපි හඳුනා ගත යුතුව තිබෙනවා. රිය අනතුරු නිසා ජාතික ආර්ථිකය, රාජ්‍ය ආදායම, මාර්ග නීතිය හා මාර්ග විනය ක්‍රියාත්මක වීම ආදිය පිළිබඳව වර්තමානය තුළ අපේ රට දැවැන්ත අභියෝග ගණනාවකටම මුහුණ දෙනවා.

මා ප්‍රවාහන අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට කටයුතු කරන අවස්ථාවේදී යාල්ගම්මෝදර දුම්රිය මාර්ගය හරහා අකීකරු රියැදුරකු විසින් බස් රථයක් ධාවනය කිරීම නිසා ජීවිත පනස් ගණනක් අහිමි වුණු බව මට මතකයි. ඒ වෙලාවේ මුළු රටම ප්‍රවාහන ක්ෂේත්‍රයේ වැදගත්කම පිළිබඳව කථා කළා. ඒ අනුව ඒ සඳහා පාර්ලිමේන්තුවේ වෙනම ම විශේෂ කාරක සභාවක් පත් කළා. ඒ විශේෂ කාරක සභාව එවකට ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුතුවයි පත් කළේ. ඊට පස්සේ පී. දයාරත්න හිටපු ඇමතිතුමාගේ සභාපතිත්වයෙන් යුතුව ඒ විශේෂ කාරක සභාවේ කටයුතු පවත්වාගෙන ගියා. ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කළා. ප්‍රවාහන ක්ෂේත්‍රයේ පවතින ගැටලු පිළිබඳව මේ ආකාරයට විවිධ සාකච්ඡා පවත්වා, වාර්තා අනන්තවත් ඉදිරිපත් කර තිබෙනවා. දේශපාලනඥයන් විධියට අපටත්, නිලධාරීන්ටත් වර්තමානයේ දැවැන්ත වග කීමක්, අභියෝගයක් තිබෙනවා. රටක් විධියට අප ප්‍රවාහනය සම්බන්ධයෙන් වර්තමානයේ මුහුණ පා තිබෙන තිබෙන අභියෝගවලට මුහුණ දීම සඳහා දැවැන්ත වග කීමක් තිබෙන බව අපි අවබෝධ කර ගත යුතුව තිබෙනවා. ප්‍රවාහන ක්ෂේත්‍රයට තිබෙන වර්තමාන අභියෝග පිළිබඳව නිසි ප්‍රමුඛතාව ලබා දෙමින්, ඒ පිළිබඳව අප සියලු දෙනා අවධානය යොමු කරලා නැහැයි කියන එකයි මා පෞද්ගලිකව දකින්නේ. එම නිසා අප සියලු දෙනා මේ පාර්ලිමේන්තුව තුළ, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විධියට මා එම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තුළ උත්සාහ කරන්නේ, වර්තමාන ප්‍රවාහන ක්ෂේත්‍රය මුහුණ පා තිබෙන අභියෝගවලට අවශ්‍ය පිළිතුරු ලබා දීමටයි. ප්‍රවාහන ක්ෂේත්‍රයෙන් ඉටු විය යුතු සේවය නොඅඩුව ලබා දීම අපේ යුතුකමක් හා වගකීමක් විධියටයි මා පෞද්ගලිකව දකින්නේ. වෙනත් විධියකින් කියනවා නම්, ජාතික වශයෙන් ප්‍රවාහන ක්ෂේත්‍රයේ යම් යම් වෙනස්කම්, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමකින් තොරව වර්තමානයේ ප්‍රවාහන ක්ෂේත්‍රයට තිබෙන අභියෝග - විශේෂයෙන්ම මාර්ග තදබදය පිළිබඳව තිබෙන ප්‍රශ්නය- අපට ජය ගන්න මොනම ආකාරයටවත් පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. එම නිසා අද මේ ගෙනෙන නියෝගය හුදෙක්ම රජයට ආදායමක් ලබා ගැනීමටත්, ඒ වාගේම වාහනයක ඉදිරිපස අංක තහඩුව ප්‍රදර්ශනය කිරීමටත් කියන කරුණු දෙකට පමණක් සීමාවෙලා නැහැ.

ඊට එහා ගිය පුළුල් අරමුණක්, වග කීමක් ඉටු කිරීමේ කාර්ය භාරය මේ රෙගුලාසි තුළින් අද පැවරිලා තිබෙනවා. ඒ වාගේම අපට මතකයි, මීට කලින් මෝටර් වාහන පනත යටතේ ගෙනා නියෝග මඟින් සංශෝධන ඉදිරිපත් කරලා විවිධාකාරයේ ප්‍රතිපත්ති, වැඩ පිළිවෙළ හඳුන්වා දුන් බව. විශේෂයෙන්ම නවීන තාක්ෂණය භාවිත කිරීම පිළිබඳව. ඒ අනුව "e-Motoring" ව්‍යාපෘතිය අවුරුදු 10කට ආසන්න කාලයක් තිස්සේ ක්‍රියාත්මක වනවා.

මීට අමතරව ප්‍රධාන ප්‍රශ්නයක් විධියට තිබෙන රියදුරන්ගේ විනය ඇති කිරීමේ අරමුණ ඇතුව විශේෂයෙන්ම 'අකුසලතා රියදුරු බලපත්‍ර ක්‍රමය' හඳුන්වා දීම අපි කළා. මේවාට නීති-රීති, රෙගුලාසි ගෙනැල්ලා දැන් අවුරුදු 10කට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා. නමුත් කනගාටුවෙන් වුවත් අපි කියන්න ඕනෑ, ඒ පිළිබඳව ලබා ගෙන තිබෙන ප්‍රගතිය පිළිබඳව මොනම ආකාරයකටවත් සෑහීමකට පත්වන්න පුළුවන්කමක් නැහැයි කියන කාරණය. වර්තමානයේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ සිදුවන අක්‍රමිකතාවන් නිසා ජනතාවට විවිධ අපහසුතාවන් සිදුවනවා. මේක වර්තමානයේ පමණක් සිදුවන දෙයක් නොවෙයි. ඒකත් කියන්න ඕනෑ. පසුගිය දශක ගණනාව තිස්සේම අඩු වැඩියක් ඇතුව මේ තත්ත්වයන් සිදු වුණා. ඒක ප්‍රසිද්ධ කරුණක්. ඒකට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් වග කිව යුතුයි කියලා අපි කියන්නේ නැහැ. නමුත්, අනිවාර්යයෙන්ම බහුතරයක් මෙහි වගකීම භාර ගත යුතුයි. අවංකව කටයුතු කරන නිලධාරීන්ට ලබා දිය යුතු සැබෑ ගරුත්වය ඇතුවයි අපි මේ කරුණු ඉදිරිපත් කරන්නේ. මේ අක්‍රමිකතා අවම කර ගැනීමේ අරමුණක් ඇතිව තමයි අපි "e-Motoring" ව්‍යාපෘතිය හඳුන්වා දීමට කටයුතු කළේ. නමුත්, අද වන විට ඒකේ ප්‍රගතිය පිළිබඳවත් අපි සෑහීමකට පත් වන්නේ නැහැ.

රියදුරු බලපත්‍ර ලබා දීමේ ක්‍රමය පිළිබඳවත් විවිධ විවේචන තිබෙනවා. මෑතකදී අත පය නැති අය පවා වාහන ධාවනය කරන බවක් දක්නට තිබෙනවා. ඒ වාගේම ඔවුන් රියදුරු බලපත්‍රත් ලබා ගන්නවා. රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයකටවත් යන්නේ නැතිව බොහෝ කාලයකට පෙර රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමේ අවස්ථා තිබුණා. එම නිසා ඒවාට පවත්වන විභාග ක්‍රමය සංශෝධනය කරලා ඒ සිදුවන අක්‍රමිකතාවන් අවම කර ගන්න අපි ක්‍රම හඳුන්වා දුන්නා.

විශේෂයෙන්ම මේ සම්බන්ධයෙන් වූ ලිඛිත පරීක්ෂණය පිළිබඳව විශාල ප්‍රශ්න තිබුණා. සමාජයේ කවුරුත් මේ පිළිබඳව දන්නවා. රියදුරු පාසල්වලින් විභාගයට වාඩි වීමට පෙර මේ ප්‍රශ්න පත්‍රය ලැබුණා. එම නිසා තමයි අපි විශේෂයෙන්ම යෝජනා කළේ නවීන තාක්ෂණය භාවිත කරලා මේ විභාග ක්‍රමය ක්‍රියාත්මක කරන්න කියලා. නමුත්, එහි ප්‍රගතිය සම්බන්ධයෙන් නම් අපට සෑහීමකට පත්වන්න පුළුවන්කමක් නැහැ.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මේ කාරණය පිළිබඳව දිගින් දිගටම කථා කළා. ලබන මාසයේද කොහේද එය ක්‍රියාත්මක කරනවා කියලා මට දැනගන්න ලැබුණා. පාර්ලිමේන්තුව රැස්වෙලා, දවසකට විශාල මුදලක් වියදම් කරලා, අපි නීති හඳුන්වා දෙනවා. නීති හඳුන්වා දීම තුළින් පමණක් මේ ප්‍රශ්නවලට විසඳුම් ලැබුණාය කියලා කියන්න මොනම ආකාරයකටවත් පුළුවන්කමක් නැහැ. නීති හඳුන්වා දුන්නාට පස්සේ ඒ නීති ක්‍රියාත්මක කිරීම පිළිබඳව විශේෂයෙන්ම නිලධාරීන්ට විශාල වගකීමක් පැවරෙන බව අපි අවබෝධ කර ගත යුතුව තිබෙනවා. ඒ වාගේම, රියදුරු බලපත්‍ර නැවත ලබා දීමේදී අනුගමනය කරන අවාසි සහගත ලකුණු ක්‍රමය පිළිබඳව ප්‍රායෝගිකව විවිධ ප්‍රශ්න තිබුණා. ඒ සඳහා නවීන තාක්ෂණය භාවිත කරලා, නව කාඩ්පතක් ඉදිරිපත් කළා. නමුත් ඒකෙනුත් බලාපොරොත්තු වුණු අරමුණු ඉටු වුණේ නැහැ. පොලීසියට ඒ උපකරණ ලබා දීමේ ක්‍රියාවලියවත් නිම කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ වෙනුවෙනුත් අපි මීට අවුරුදු දහයකට කලින් මෙවැනි නීති රීති තමයි ගෙනාවේ; රෙගුලාසි ගෙනාවා; සංශෝධන ගෙනාවා.

මම කලිනුත් සඳහන් කළා වාගේ ජාතික වශයෙන් ප්‍රවාහන ක්ෂේත්‍රයේ තිබෙන මේ අභියෝගවලට විසඳුම් ලබා දීමේ අරමුණ ඇතිව, පාර්ලිමේන්තුව විසින් පත් කරන ලද තේරීම් කාරක සභා වැනි රටේ වලංගුතාවක් තිබෙන වාර්තාවලින් ඉදිරිපත් වුණු කරුණුවලට අදාළ නියෝග තමයි වර්තමානයේදී මේ ක්‍රියාත්මක වෙන්නේ. මේ නියෝග පාර්ලිමේන්තුව තුළින් ක්‍රියාත්මක කළාට පස්සේ -නීති සම්පාදනය කළාට පස්සේ- ඒවා ප්‍රායෝගිකව හරිහැටි ක්‍රියාත්මක කිරීම අපි සියලුම දෙනාට පැවරෙන යුතුකමක් සහ වගකීමක් බව අපි අවබෝධ කර ගන්න ඕනෑ. එහෙම නැත්නම් මේවායෙන් කිසිම ආකාරයකින් ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ; බලාපොරොත්තු වුණු අරමුණු ඉටු වෙන්නේ නැහැ. ලෝකයේ විවිධ දියුණු රටවල් මෙවැනි තාක්ෂණික ක්‍රම භාවිත කරලා තිබෙනවා. එලෙස තාක්ෂණය භාවිත කිරීම තුළින් තමයි පොදු ප්‍රවාහනය දියුණු කරලා තිබෙන්නේ; මාර්ග තදබදයට විසඳුම් ලබා දීලා තිබෙන්නේ; රිය අනතුරු පාලනය කරලා තිබෙන්නේ; ජාතික වශයෙන් රාජ්‍ය ආදායමට, රටේ දළ ජාතික නිෂ්පාදනයට නිසි දායකත්වය ලබා දීලා තිබෙන්නේ. එම නිසා අපි මෙහි වැදගත්කම අවබෝධ කරගෙන, පෞද්ගලිකව එක් එක් බලවේගවල අවශ්‍යතාවලට සැබෑ ලෙස මුහුණ දීලා, ඒ බලවේගයන්ගේ අභියෝග සහ අරමුණු ජය ගන්න දෙන්නේ නැතුව කටයුතු කිරීම මහජන නියෝජිතයන් විධියට අපේත්, නිලධාරින්ගේත් යුතුකම සහ වගකීම බව අපි අවබෝධ කර ගන්න ඕනෑ. එම නිසා අපි මේ ආකාරයෙන් කටයුතු කළ යුතුව තිබෙනවා. අපිට මේ පාර්ලිමේන්තුව තුළ වැඩ කටයුතු කරන්න පුළුවන් සීමාවක් තිබෙනවා.

උදාහරණයක් විධියට ගත්තොත් විශේෂයෙන්ම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මේ වනවිට මේ සම්බන්ධයෙන් රැස්වීම් වාර දහයක්, දොළහක් පවත්වලා තිබෙනවා. ඇතැම් විට ඒ වගකීම්වලින් එහාට ගිහිල්ලා පවා අපිට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කටයුතු කරන්න සිදුවෙලා තිබෙනවා. මාස දෙකකට කලින් රැස්වීමක් පවත්වලා නියෝග ලබා දුන්නත්, මාස දෙකකට පස්සේ ලැබෙන ප්‍රගතිය පිළිබඳව අපි සෑහීමකට පත් වෙන්නේ නැහැ. මේ තත්ත්වය දිගින් දිගටම ඇති වෙන්න පුළුවන්කමක් නැහැ. මේ කටයුත්තට අපි පාර්ලිමේන්තුව විධියට මැදිහත් විය යුතුව තිබෙනවා. වර්තමාන ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා මේ කටයුත්ත වෙනුවෙන් ඉතාම හොඳ නායකත්වයක් ලබා දෙනවා. දේශපාලන නායකත්වයේ අත්දැකීම් තිබෙන අය විධියට නියෝජ්‍ය අමාත්‍යතුමාත් ඉතාම සුහදව ඒ අමාත්‍යාංශය තුළ කටයුතු කරන බව අපි දන්නවා. එතුමන්ලා ඒ ලබා දෙන නායකත්වයත් අපි ප්‍රයෝජනයට ගත යුතුයි. හුදෙක්ම රාජ්‍ය ආදායම යම්කිසි කරුණකට පමණක් සීමා කරන්නේ නැතිව, ප්‍රවාහන ක්ෂේත්‍රයේ තිබෙන වර්තමාන අභියෝග පිළිබඳව හිතට එකඟව අවබෝධ කරගෙන අපි සියලුම දෙනාම කටයුතු කළ යුතුයි. එලෙස කටයුතු කිරීමකින් තොරව ප්‍රායෝගිකව මොන නීති රීති ගෙනාවත් රටේ ජනතාවටත්, රටටත් මම හිතන්නේ එයින් එලක් වෙන්නේ නැහැ කියන කාරණය අපි කනගාටුවෙන් වුවත් ප්‍රකාශ කරන්න ඕනෑ.

එම නිසා වර්තමානයේදී මේ පිළිබඳව තිබෙන අභියෝගය අපි ඉතා හොඳින් අවබෝධ කරගන්න ඕනෑ. මේ නීති රීති හඳුන්වා දුන්නාට පසු ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න ඕනෑ. එසේ නීති රීති ක්‍රියාත්මක කිරීමට නියෝග පැනවීම පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ. එයට තාක්ෂණය අවශ්‍යයි; මානව සම්පත්, පුහුණුවීම් අවශ්‍යයි; භෞතික සම්පත් අනිවාර්යයෙන්ම අවශ්‍යයි. මේ නීති රීති ක්‍රියාත්මක කරන්න ඒ සෑම අංශයකම දායකත්වය කඩිනමින් ලබා දිය යුතුව තිබෙනවා. එසේ නොමැතිව මේ අරමුණු ඉටු කර ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. අද මෝටර් වාහන අනතුරු පිළිබඳ දැවැන්ත අභියෝගයක් තිබෙන බව අපි දන්නවා. මේ නීති රීති සියල්ලක්ම ගෙන එන්නේ ඒවා අවම කරගන්නයි. එය අපි අවබෝධ කරගන්න ඕනෑ. එය අවබෝධ කරගන්නේ නැතිව මේ ගැන සාකච්ඡා කිරීම පමණක් මේ ප්‍රශ්න විසඳීමට කුමන ආකාරයකටවත් ප්‍රමාණවත් වන්නේ නැහැ.

පොදු ප්‍රවාහනය ගැන මෙම ගරු සභාව තුළ හැමදාම කථා කරනවා. අපට මාර්ග තදබදය පිළිබඳව දැවැන්ත අභියෝගයක් තිබෙනවා. ඒ ගැන මම අවස්ථා ගණනාවකදීම මෙම ගරු සභාව තුළ සඳහන් කර තිබෙනවා. වර්තමානයේ කොළඹ නගරයේ මාර්ගවල වාහන ධාවන වේගය පැයට කිලෝමීටර් 12යි. 2020, 2021 වන විට මෙය පැයට කිලෝමීටර් 6 ක් බවට පත් වෙනවා. පෞද්ගලික වාහන වැඩි කිරීම තුළ මේකට විසඳුමක් ලැබෙන්නේ නැහැ. දුම්රිය සේවාව, බස් රථ සේවාව වැඩි වැඩියෙන් දියුණු කරලා පෞද්ගලික වාහනවල යන අය පොදු ප්‍රවාහන සේවයට ළඟා කර ගැනීමට අවශ්‍ය වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පක්ෂයට විනාඩි 40ක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි 20ක කාලයක් තමයි තිබුණේ. දැන් ඒ විනාඩි 20 නම් අවසානයි. අවශ්‍ය නම් තව කාලය ගන්න පුළුවන්.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
හොඳයි.

එම නිසා පොදු ප්‍රවාහන සේවයේ ගුණාත්මකභාව දියුණු කරන්න මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දායකත්වය වැඩි වැඩියෙන් ලැබිය යුතුයි. විශේෂයෙන් පොදු ප්‍රවාහන සේවයේ බස් රථ සඳහා විධිමත් කාලසටහන් සකස් කිරීමේදී, ඒවා පරිපාලනය කිරීමේදී නවීන තාක්ෂණය උපයෝගී කර ගැනීම අනිවාර්යයෙන්ම අවශ්‍යයි. මෙවැනි නීති රීති අවශ්‍යයි. පොදු ප්‍රවාහන සේවයට රියදුරන්ගේ ගුණාත්මක සේවයක් ලබා දීම සඳහා මේ නියෝග හරහා ඉදිරිපත් කරන ක්‍රමවේදයන් ඉතා අවශ්‍යයි.

විශේෂයෙන් අද ආණ්ඩුවක් විධියට මාර්ග පද්ධතිය සඳහා යොදවන මුදල පිළිබඳවත් විවිධ විවාදයන් තිබෙනවා. නමුත්, රටේ මෙතරම් අවශ්‍යතාවක් තිබියදීත්, පොදු ප්‍රවාහන සේවය සඳහා යොදවන මුදල පිළිබඳව රජයක් විධියට අපි සාකච්ඡා කළ යුතුව තිබෙනවා; ප්‍රතිපත්තිමය වශයෙන් තීන්දු තීරණ ගත යුතුව තිබෙනවා. වර්තමානයේ පමණක් නොවෙයි, ඉතිහාසයේ දශක ගණනාවක් තිස්සේ පැවැති සෑම ආණ්ඩුවක් විසින්ම පොදු ප්‍රවාහන සේවයට ලබා දීපු දායකත්වය පිළිබඳව සෑහීමකට පත් වෙන්න බැහැ. මේ පිළිබඳවත් විශේෂ අවධානයක් යොමු කළ යුතුයි.

විශේෂයෙන් අපේ රටේ තිබෙන පෞද්ගලික බස් රථ සේවය, ලංගම බස් රථ සේවය, දුම්රිය සේවාව වැනි සේවාවන් තවතවත්

[ගරු ලසන්ත අලගියවන්නමහතා]

ශක්තිමත් කරලා පෞද්ගලික වාහනවල යන අයට තමන්ගේ පෞද්ගලික වාහනයෙන් ප්‍රවාහන අවශ්‍යතාව සපුරා ගැනීමේදී ලැබෙන ඒ ගුණාත්මක සේවය පොදු ප්‍රවාහන සේවයෙන් ලබා දීමේ මට්ටමටම පොදු ප්‍රවාහන සේවාව දියුණු වීමේ අවශ්‍යතාව තිබෙන බව අපි අවබෝධ කර ගත යුතුව තිබෙනවා.

මම මුලින් සඳහන් කළ පරිදි, මේ නියෝග හඳුන්වා දුන්නේ, පටු අරමුණක්, පරමාර්ථයක් ඇතිව නොවෙයි. සමස්ත රටේ ජාතික අවශ්‍යතාවක් ඉටු කරගැනීමේ අරමුණින් යුතුවයි මේ නියෝග ඉදිරිපත් කළේ. මේ යථාර්ථය අවබෝධ කරගෙන, විශේෂයෙන් ලාභය, මුදල කියන කරුණුවලට ප්‍රමුඛතාව ලබා දෙන්නේ නැතිව, රටේ පොදු අවශ්‍යතාවට ප්‍රමුඛතාව ලබා දීලා දේශපාලන අධිකාරියත්, නිලධාරිනුත්, අනෙකුත් පාර්ශ්වයත්, පෞද්ගලික අංශත් එකට එකතු වෙලා කටයුතු කරමු කියන ආරාධනය කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 5.20]

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சாந்தி ஶ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதத்தில் உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்குத் தங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகளின்மூலம் இலக்கத் தகடுகள் மற்றும் வாகன அனுமதிப் பத்திரங்களைக் கணணிமயப்படுத்தும் செயன் முறைக்காக 500 மில்லியன் ரூபாய் வரை மதிப்பீடு செய்யப்பட்டிருக்கின்றது. பொதுவாக ஒரு நாட்டின் அபிவிருத்தி - முன்னேற்றம் முதலியவற்றில் கணணி முறையான சேவை என்பது முக்கிய விடயமாக அமைகின்றது. அந்தவகையிலே மோட்டார் வாகனப் போக்குவரத்துத் துறையிலும் இவ்வாறான ஒரு முன்னேற்றம் ஏற்படுவதற்கு இன்று நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது. இருந்தபோதிலும் ஒட்டுமொத்தமாகப் பார்க்கின்றபொழுது, பின்தங்கிய இடங்களிலே வாழ்கின்ற மக்கள் இந்தப் பொதுப் போக்குவரத்துச் சேவைகளைப் பெற்றுக்கொள்வதில் எவ்வளவு தூரம் சிரமங்களை எதிர்கொள்கின்றார்கள் என்ற விடயம் இங்கே முக்கியமாகக் கவனிக்கப்பட வேண்டும்.

இங்கே எனக்கு முன்பு உரையாற்றிய கௌரவ உறுப்பினர்கள் போக்குவரத்திலே வாகன விபத்து என்பது ஒரு முக்கிய விடயமாக இருக்கின்றதெனக் குறிப்பிட்டிருந்தார்கள். இந்த விபத்துக்கள் நாளுக்குநாள் அதிகரித்துக்கொண்டு செல்வது முக்கியமாகக் கவனிக்கப்பட வேண்டிய ஒரு விடயமாக இருக்கின்றது. இந்த விபத்துக்கள் ஏற்படுவதற்கு போக்குவரத்து வசதிகளிலுள்ள குறைபாடுகள் மட்டும் காரணமாக அமைவதற்கு அப்பால், அதனோடு தொடர்புபட்ட வேறு பல விடயங்களும் காரணமாக அமைகின்றன. அந்தவகையிலே, மதுபோதையில் வாகனம் ஓட்டப்படுவது விபத்துக்கு முக்கியமான காரணமாக அமைந்திருக்கின்றது. மதுபோதையில் வாகனம் ஓட்டுகின்ற நிலைமை ஏன், வளர்ந்துகொண்டு போகின்றது? அல்லது ஏன், இதனைத் தடை செய்ய முடியாதிருக்கின்றது? மதுபானசாலைகளுக்குத் தொடர்ச்சியாக அனுமதிகள் வழங்கப்பட்டு குறித்த வியாபாரங்கள் மேற்கொள்ளப்படுவது, அதேபோல் சட்டத்திற்கு முரணான வகையிலான கசிப்பு -கள்ளச் சாராயங்களின் உற்பத்தி ஊக்குவிக்கப்படுவது அல்லது அவற்றைத் தடுப்பதற்கெனப் பொலிஸ் நிர்வாகம் பொருத்தமான நடவடிக்கைகளை எடுக்காதிருப்பது போன்றனவும் மதுபோதையிலே வாகனம் ஓட்டிச் செல்கின்றவர்களின் வீதம் அதிகரிப்பதற்கும் அவற்றின்மூலம் விபத்துக்கள் ஏற்படுவதற்கும் முக்கியமான காரணிகளாக இருக்கின்றன.

இந்த வாகன விபத்துத் தொடர்பான எனது ஓர் அனுபவத்தையும் நான் இங்கு முன்வைக்க விரும்புகின்றேன். இன்று வன்னியின் காடு சார்ந்த இடங்களில் முக்கியமாக 'ரிப்பர்' வாகன விபத்துக்கள் அதிகரித்துக்கொண்டு செல்வதைக் காணலாம். நான் வாழ்ந்துகொண்டிருக்கின்ற பிரதேசத்திலிருந்து 7 கிலோமீற்றருக்கப்பால் உள்ள மாங்குளம், வெள்ளாங்குளம் வீதியிலே ஏறக்குறைய 7 மாதங்களுக்கு முன்பு மோட்டார்சைக்கிளில் தனது பிள்ளையை ஏற்றிக்கொண்டு சென்ற தாய், அங்கு தரித்துநின்ற ஒரு பச்சை நிற 'ரிப்பர்' வாகனத்திலே மோதுண்டு ஸ்தலத்திலேயே பலியானார். இது தொடர்பில் எனக்குத் தொலைபேசி மூலமாகத் தெரிவிக்கப்பட்டவுடன் அந்த இடத்திற்கு நான் விரைந்து சென்றேன். அங்கு பொலிஸாரும் வந்திருந்தார்கள். அவர்கள் என்னிடம் கூறிய ஒரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். அதாவது, "காடு சார்ந்த இடங்களில் இருக்கின்ற பிரதான வீதிகளிலே பச்சை 'பெயின்ற்' பூசப்பட்ட வாகனங்களுடன் மாலை வேளைகளில் அல்லது அதிகாலை வேளைகளில் அல்லது பனிபடர்ந்த வேளைகளில் இவ்வாறான விபத்துக்கள் இடம்பெறுவது ஒரு சாதாரண விடயமாகப் பார்க்கக்கூடியதல்ல" என்று கூறினார்கள்.

எனவே, வாகன இலக்கத்தகடுகள் மற்றும் அனுமதிப் பத்திரங்கள் அடங்கிய ஆவணங்களைக் கணினிமயப்படுத்து வதற்கு நடவடிக்கை எடுக்கின்ற அதேவேளையிலே, வாகனங்களுக்குப் பூசப்படுகின்ற வர்ணப் பூச்சுக்களும் இவ்வாறான விபத்துக்களுக்குக் காரணமாக அமைகின்றன என்ற விடயத்தையும் கௌரவ பிரதி அமைச்சர் அவர்கள் கருத்திற்கொள்ள வேண்டுமென்று நான் கேட்டுக் கொள்கின்றேன்.

வடக்கு, கிழக்கிலே முப்பது வருடகால யுத்தத்திலே பாதிக்கப்பட்டு மாற்றுத்திறனாளிகளாக இருக்கின்றவர்கள் இன்று சாரதி அனுமதிப்பத்திரங்களைப் பெற்றுக்கொள்வதில் பல தடைகளை எதிர்கொள்கின்றார்கள். முக்கியமாக, தங்களுடைய குடும்ப வருமானத்திற்காக முச்சக்கர வண்டி ஓட்டுவதை அவர்கள் தொழிலாக மேற்கொண்டு வருகின்றார்கள். ஆகவே, அவர்களது உடல் நிலையைக் கருத்திற்கொண்டு, அவர்களுக்குச் சாரதி அனுமதிப் பத்திரங்களை வழங்குவதில் விசேட கவனம் செலுத்த வேண்டும். இன்று பொதுவாக விபத்துக்கள் சம்பந்தமான செய்திகள் ஊடகங்கள் வாயிலாக வெளிவருகின்றபோதிலும் மாற்றுத்திறனாளிகள் வாகனங்கள் செலுத்தி விபத்துக் குள்ளான செய்திகள் வெளிவருவது மிகவும் அருமை அல்லது இல்லையென்றே கூறலாம்.

இலங்கைப் போக்குவரத்துச் சபை இலாபத்தை மட்டும் கருத்திற்கொண்டு இயங்குகின்றதா? என்ற ஒரு கேள்வியையும் நான் இங்கு முன்வைக்க விரும்புகின்றேன். முக்கியமாக பின்தங்கிய பிரதேசங்களிலுள்ள கிராமப்புறங்களிலே போக்கு வரத்துச் சேவையை மேற்கொள்ளுமாறு நாங்கள் கோரிக்கை விடுக்கின்றபோதிலும் இலாபமீட்டாத பிரதேசத்தில் இந்தப் போக்குவரத்துச் சேவையை நடத்த முடியாதென்ற கருத்து சம்பந்தப்பட்டவர்களால் முன்வைக்கப்படுகின்றது. குறித்த இடங்களில் இந்தப் போக்குவரத்துச் சேவையின்மையால் குறிப்பாக பாடசாலைப் பிள்ளைகள் உரிய நேரத்திற்கு

பாடசாலைக்குச் செல்ல முடியாதிருக்கின்றது. அதுமட்டுமல்ல, பாடசாலைப் பிள்ளைகளை ஏற்றிச்செல்லாத போக்குவரத்துச் சேவையும் நடைபெறுகிறது என்பதை இங்கு கவனத்திற் கொள்ள வேண்டும்.

நானும் ஒரு மாற்றுத்திறனாளி என்ற வகையிலே இந்தப் போக்குவரத்துச் சேவையின் மோசமான ஒரு செயற்பாட்டை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். அதாவது கிளிநொச்சிப் பகுதியில் ஏ-9 வீதியிலே சக்கரநாற்காலியுடன் ஒரு மாற்றுத்திறனாளி பஸ்ஸுக்காக காத்திருந்தார். அப்பொழுது அங்கு வந்த பஸ்ஸில் அந்த மாற்றுத்திறனாளியையும் அவரது சக்கரநாற்காலியையும் ஏற்றியதன் பின்பு பஸ்ஸின் நடத்துனர் அந்த மாற்றுத்திறனாளியிடம் நாற்காலிக்கும் சேர்த்து இரண்டு ரிக்கட்டுக்களைக் கொடுத்திருக்கிறார். இந்த விடயம் இங்கு முக்கியமாகக் குறிப்பிடப்பட வேண்டியதாகும். இவ்வாறு இந்த மாற்றுத்திறனாளிகள் பாதிப்புக்களுக்கு உள்ளாகின்றபொழுது அதனை விசேடமாகக் கவனிப்பதற்கென குழுவொன்று இயங்குவதற்கான ஏற்பாடுகள் செய்யும் வகையில் ஒழுங்குவிதிகள் மேற்கொள்ளப்படுவதற்கு போக்குவரத்துச் சபை ஊடாக நடவடிக்கை எடுக்கவேண்டும் என்ற விடயத்தையும் இங்கு முன்வைக்க விழைகின்றேன்.

ஏற்கெனவே இங்கு ஏனைய உறுப்பினர்கள் குறிப்பிட்டது போல பாதுகாப்பற்ற புகையிரதக் கடவைகள் உள்ள பிரதேசங்களில் வாழ்கின்ற மக்கள் புகையிரதங்களில் சிக்கி விபத்துக்குள்ளாகின்றார்கள். அத்தகைய இடங்களில் பாதுகாப்பான கடவைகளை அமைக்குமாறு எழுத்து மூலமாக நாங்கள் பல்வேறு கோரிக்கைகளை விடுத்திருந்தபோதிலும் அதற்கான எந்தவிதமான நடவடிக்கைகளும் மேற்கொள்ளப்படவில்லை. இதனால் பாடசாலைப் பிள்ளைகள், சாதாரண பொதுமக்கள் விபத்துக்குள்ளாகி மிகவும் பாதிப்புக்குள்ளாகின்ற நிலைமை தொடர்கின்றது. எனவே, பாதுகாப்பற்ற புகையிரதக் கடவைகளில் பாதுகாப்பை ஏற்படுத்தி மக்களுக்குச் சிறந்த போக்குவரத்தை வழங்குவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமென்ற விடயத்தையும் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

முல்லைத்தீவு மாவட்டத்தின் வட்டுவாகல் பகுதியில் கடற்படைத் தளம் அமைந்திருக்கின்ற 671 ஏக்கர் காணியில் 378 ஏக்கர் அறுதியுறுதி அனுமதிப்பத்திரங்கள் உள்ள பொதுமக்களது காணிகளாக இருக்கின்றன. இந்த வட்டுவாகல் பகுதியானது சர்வதேச ரீதியில் முக்கியம் வாய்ந்த ஓர் இடமாகக் காணப்படுகின்றது. ஏனெனில், இறுதி யுத்தத்தின் போது எங்களுடைய மக்கள் அங்குதான் தங்களுடைய உறவுகளை அதாவது கணவனை, சகோதரனை, தகப்பனை சம்பந்தப்பட்டவர்களிடம் கையளித்தார்கள். அங்கு அவர்களைக் கையளித்ததற்கான ஆவணங்களை வைத்துக் கொண்டு இன்றும் எமது மக்கள் தங்களது உறவுகளைத் தேடிக்கொண்டிருக்கின்றார்கள். இந்த யுத்தத்திலே நசுக்கப்பட்ட மக்களை மேலும் புண்படுத்துகின்ற வகையிலே இந்த இடத்தை மையமாக வைத்து நாளையும் ஒரு நிகழ்வு நடைபெறவிருக்கின்றது. அந்த வகையில் முல்லைத்தீவு மாவட்டத்தின் அரசாங்க நில அளவையாளரினால், "காணி எடுத்தல் பிரிவு 5 - நில அளவை தொடர்பான பொது அறிவித்தல்" என்ற தலைப்பின்கீழ் அங்கு ஓர் அறிவித்தல் விடுக்கப்பட்டுள்ளது. அதாவது, "காணி அமைச்சின் செயலாளரின் 2017.07.21 திகதிய 4-3/4/2013/D/213ஆம் இலக்கக் கடிதத்தின் மூலமாக முள்ளிவாய்க்கால் கிழக்கு கிராம அலுவலரின் ஆளுகைக்குட்பட்ட வட்டுவாகல் பகுதியில் இலங்கைக் கடற்படைத் தளம் அமைந்துள்ள காணியின் அளவீடானது 22.02.2018 இலிருந்து ஆரம்பிக்கப்படவுள்ளது; இந்நில அளவைக்கு ஒத்துழைப்பு வழங்குமாறு கேட்டுக் கொள்கின்றேன்" என்ற அறிவித்தல்கள் 10 அங்கு ஒட்டப்பட்டிருக்கின்றன. இன்று அந்த மக்கள் தங்களுடைய காணிகளுக்காகப் போராடிக் கொண்டிருக்கின்ற இந்தச் சந்தர்ப்பத்தில், அங்கு குறித்த கடற்படைத் தளத்துக்காக நில அளவீடு செய்வதானது மிகவும் மோசமான ஒரு நடவடிக்கை என்பதனை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

ஆனால், குறித்த காணிச் சுவீகரிப்பு நடவடிக்கை தொடர்ந்து நடைபெறாது என்று மேதகு ஜனாதிபதி அவர்கள் குறிப்பிட்டிருக்கின்றார். இதற்கும் மேலாக இந்தக் கடற்படைத் தளம் அமைந்துள்ள காணியிலே 378 ஏக்கர் மக்களுக்குரியது என்பதற்கான ஆவணங்களை அந்த மக்கள் தங்களிடம் வைத்திருக்கிறார்கள். இது தொடர்பாக முல்லைத்தீவு மாவட்ட அரசாங்க அதிபரது தலைமையிலே நாங்கள் சம்பந்தப்பட்ட கடற்படை அதிகாரிகள், இராணுவ அதிகாரிகளோடு பல சந்திப்புக்களை மேற்கொண்டு பேச்சுவார்த்தைகளை நடத்தியிருக்கின்றோம். ஏற்கெனவே இவ்வாறு நில அளவை மேற்கொள்வதற்காக நடவடிக்கை எடுக்கப்பட்டபோதும் அங்கு மக்கள் வீதியிலே தரித்திருந்து அந்தச் செயற்பாட்டைத் தடுத்திருக்கிறார்கள். ஆனாலும் இவை எல்லாவற்றையும் மீறி நாளை தொடக்கம் மீண்டும் இந்தக் காணியை அளப்பதற்காக நடவடிக்கை எடுக்கப்படுவதென்பது மிகவும் வேதனைக்குரிய ஒரு விடயமாகும். இந்த நிலையில், மக்கள் தங்களது சொந்த உடைமைகளைப் பெற்றுக்கொள்வதற்குத் தொடர்ந்து போராட வேண்டியதாக இருக்கின்றது. இவ்வாறு தொடர்ந்து அந்த மக்களை வீதியிலிருந்து போராடச் செய்வதானது, அவர்களிடத்தே ஒரு வக்கிரத்தை ஏற்படுத்துகின்ற ஒரு நடவடிக்கையே தவிர, நல்லிணக்கத்தை ஏற்படுத்துகின்ற நடவடிக்கையாக அமையாது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you time is over.

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)
Sir, give me one more minute.

ஏற்கெனவே தங்களுடைய காணிகளைக் கேட்டுப் போராடிக் கொண்டிருக்கின்ற கேப்பாப்பிலவு மக்களுக்குச் சாதகமான முறையில் பதிலளிக்குமுகமாக, இந்தக் காணியைச் சுவீகரிக்கின்ற வகையிலான குறித்த காணி அளவிடும் நடவடிக்கையை உடனடியாக நிறுத்திவைக்குமாறு சம்பந்தப்பட்ட அதிகாரிகளிடம் இந்த உயரிய சபையினூடாக மிகவும் தயவாகக் கேட்டுக்கொள்கின்றேன். நன்றி.

[අ.භා. 5.33]

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෝටර් වාහන පනත යටතේ නියෝග සම්බන්ධයෙන් කථා කරන මේ අවස්ථාවේ මටත් ඒ සම්බන්ධයෙන් වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන සතුටු වනවා. අපේ යහ පාලන රජයේ ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේ මේ ගරු සභාවේ ඉන්නවා. ඉදිරි අනාගතයේ ප්‍රවාහන සේවය හොඳ තත්ත්වයකට ගෙනෙන්නට එතුමාත්, ප්‍රවාහන ඇමතිතුමාත් විශාල උනන්දුවක් දක්වනවා. ගරු

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා කොපමණ උනන්දුවක් දැක්වුවත්, අපි පාර්ලිමේන්තුවේදී නීති හැදුවත් වැඩක් නැහැ. ඒ නීති ඉෂ්ට කරන්න අපි රටම ඉදිරිපත් වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ප්‍රවාහන සේවයේ විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. වාහන අනතුරු නිසා අවුරුද්දකට තුන්දහස් ගණනකට වැඩි ප්‍රමාණයකගේ ජීවිත නැති වෙනවා. එදා යුද්ධයෙන් තමයි එවැනි ප්‍රමාණයක් ජීවිත නැති වුණේ. මේ ගැන අපි කොපමණ විසඳුම් ඉදිරිපත් කළත්, මෙය තමයි සමස්ත රටේම තිබෙන ප්‍රශ්නය. අපේ පොදු ප්‍රවාහන සේවය හරියට කළමනාකරණය කර ගත්තොත් පමණයි මේ තිබෙන ප්‍රශ්නවලට අපට ස්ථාවර විසඳුමක් සොයාගන්න පුළුවන් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ දියුණු රටවල අපේ රටට වඩා ජනගහනයේ වැඩිවීමක් තිබෙනවා; නගර දියුණු වෙලා තිබෙනවා. නමුත්, ඒ නගරවල කිසිම තදබදයක් නැතිව වාහන ගමන් කරනවා. ඒ වාගේම, කිසිම බාධාවක් නැතිව ජනතාව ගමන් කරනවා. අපේ රටේ එහෙම දෙයක් නැහැ. අපේ රටේ කොළඹ හා අනෙක් දිස්ත්‍රික්කවල ප්‍රධාන නගරවල උදේ වරුවේ, දවල් වරුවේ, හවස් වරුවේ පැය දෙක තුනක් විශාල traffic එකක් දකින්න පුළුවන්. අද උදේ මම gym එකට ආපු වෙලාවේ දැක්කා, එක වාහනයක රියැදුරු හැර තව එක්කෙනායි ගමන් කරන්නේ කියලා. ලෝකයේ වෙනත් දියුණු රටවල්වලට ගිහින් බැලුවාම අපට පේනවා, ඒ රටවල සම්පූර්ණයෙන් වාහනයේ fill වෙලා තමයි ජනතාව ගමන් කරන්නේ කියලා. ඒ වාගේ අපේ රටේත් නගරවල එවැනි ක්‍රමයක් ඇති කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ළඟදී රාජගිරියේ ගුවන් පාලමක් විවෘත කළා. ඒ පාලම හරහා මම ඊයේ සවස 5.00ට විතර ගමන් කළා. නමුත්, එදා තිබුණු තත්ත්වය තමයි ඊයේත් තිබුණේ. ඒ විධියට කොපමණ පාලම් හැදුවත් ඒ සම්බන්ධයෙන් අපට නිසි වැඩ පිළිවෙළක් හරියට ක්‍රියාත්මක කර ගන්න බැහැ. නියම විධියට ගමන් කරන්න පුළුවන් ආකාරයේ පොදු ප්‍රවාහන සේවයක් හරියට ඇති කළොත් පමණයි මේ රටේ තිබෙන ප්‍රවාහන ප්‍රශ්නය විසඳන්න පුළුවන් වෙන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා එක්ක එකතු වෙලා ඒ සඳහා අවශ්‍ය කටයුතු කරමින්, පොදු ප්‍රවාහන සේවය විධිමත් විධියට කළොත් පමණයි ඒ ප්‍රශ්නවලට විසඳුමක් සොයාගන්න පුළුවන් වෙන්නේ.

පසුගිය පළාත් පාලන මැතිවරණ කටයුතුවලට මම අනුරාධපුර දිස්ත්‍රික්කයේ මගේ ආදරණීය ජනතාව ජීවත් වෙන ගම්වලට ගියා. ඒ පළාත්වල ඉස්කෝලේ යන ළමයින්ට ඉස්කෝලේ යන්න පහසුකමක් නැතුව පැය භාගයක්, විනාඩි 45ක් පයින් යනවා. එවැනි යුගයක් අපට තවම දකින්න පුළුවන්. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම නිතරම ඔබතුමාගේ ඇමතිතුමාටත් මේ ගැන කථා කරනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආසන හතක් තිබෙනවා. සමස්ත ලංකාවේම දුෂ්කරම ගම්මාන තිබෙන්නේ මගේ ආදරණීය අනුරාධපුර දිස්ත්‍රික්කය ඇතුළේ තමයි. ඒ ගම්මානවල ජීවත්වන දරුවන්ට හරියාකාර පාසලක් නැහැ. ඒ දරුවන් කිලෝමීටර් හතරක්, පහක් පාසලට පයින් යනවා.

උදාහරණයක් විධියට කියනවා නම්, තිඹිරිඅත්තාවල, මාවත්තාවැව, අලිකිඹුලාව කියන ගම්මාන හඳුන්වා දෙන්න පුළුවන්. මීට කලිනුත් ඔබතුමාට මා ඒ ගැන ප්‍රකාශ කළා. ඒ අයට නගරයට එන්න කිලෝමීටර් අටක දුරක් තිබෙනවා. නමුත් ප්‍රවාහන ක්‍රමයක් නැත. මාසයකට දෙපාරයි, තුන්පාරයි ඒ ගම්මානවලට බස් එක යන්නේ. අනෙක් කාලවල බස් එක යන්න බොහොම අමාරු තත්ත්වයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ විශේෂ අවධානය ඒ සඳහා යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. අපට වැඩිය වයසට ගිය අයට ගමන් කරන්න උදව් නොකළත්, මේ රටේ අනාගතයේ අධ්‍යාපනයෙන් ඉදිරියට යන දරුවන් ගැනවත් ඔබතුමාගේ විශේෂ අවධානයක් යොමු කරලා උදවු කරයි කියලා මම හිතනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපට ඕනෑ වෙලාවක ඔබතුමාට කථා කරන්න පුළුවන්. දුරකථනයෙන් වුණත් සම්බන්ධ වෙන්න පුළුවන් එකම නියෝජ්‍ය ඇමතිතුමා තමයි ඔබතුමා. අනුරාධපුර මගේ ජනතාව වෙනුවෙන් මා ඉල්ලීමක් කරනවා. මම ඔබතුමා පෞද්ගලිකව හම්බ වෙන්නම්. ඔබතුමා සභාපතිතුමාට කියලා ඒ අවශ්‍ය කටයුතු කරලා දෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මට ලිඛිතව දෙන්න. අපි ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු කරන්නම්.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
බොහොම ස්තුතියි, නියෝජ්‍ය ඇමතිතුමනි.

ඔබතුමාගේ උනන්දුවට මම ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ඇමතිතුමාටවත්, පාර්ලිමේන්තුවටවත් නීතිය ක්‍රියාත්මක කරන්න බැහැ. ඒකට පොලිසිය පැහැදිලිවම ඉදිරිපත් වෙන්න ඕනෑ. අද බලන්න, සල්ලිවලට private bus වාගේම ලංගම බස් තරගයට යනවා. රුපියල් දෙකක් ගන්න ගිහිල්ලා ජීවිත නැති කරන අවස්ථා අපට දකින්න පුළුවන්. හැම දාම උදේම mediaවලින් අපට අහන්න තිබෙන්නේ, මිනීමැරුමක් ඇති වෙලා තිබෙනවා; hospital වලට 20ක්, 30ක් admit වෙලා තිබෙනවා කියන පුවත්ති තමයි. එදා යුද්ධවලින් තමයි එහෙම දේවල් වුණේ. අද ඒ වාගේ දේවල් වෙන්නේ වාහනවලින් වෙන ප්‍රශ්න නිසා. ඒක නිසා අපි ප්‍රවාහන ක්ෂේත්‍රයෙන් දියුණු රටක් විධියට මේ රට අරගෙන යන්න ඕනෑ. අපට දුකයි, තවමත් අපේ රට ඒ තත්ත්වයට පත් වෙලා නැති එක ගැන. ඉන්දියාව, පාකිස්ථානය වාගේ දියුණු වෙන රටවලට ගියා නම් බලන්න පුළුවන් ඒ රටවල ඉන්න ජනගහනයයි, ඒ ප්‍රවාහන ක්ෂේත්‍රයට තිබෙන බස් ප්‍රමාණයයි කොච්චරද කියලා. ඒ වාහනවල තිබෙන වැඩිවීමත් එක්ක ඒ රියදුරු මහත්වරුන්ගේ තිබෙන විනය කොහොමද කියලා අපට දකින්න පුළුවන්.

අපේ රියදුරු මහත්වරුත් විනයානුකූලව මේ මහා මාර්ගවල ගමන් කරවන්න අපි උනන්දුවක් දක්වන්න ඕනෑ. ඒ අය අධ්‍යාපනයක් නැති අය නොවෙයි. අධ්‍යාපන සුදුසුකම් තිබෙන අය තමයි රියදුරු මහත්වරු විධියට කටයුතු කරන්නේ. ඒ අයට විනයානුකූලව කටයුතු කරන්න අපි අවස්ථාව ඇති කරලා දෙන්න ඕනෑ. එහෙම නැති වුණොත්, කොච්චර නීති දැම්මත් දියුණු රටක් විධියට අපේ රට හදා ගන්න බැරි වෙනවා. අද ගිහිල්ලා බලන්න, සිංගප්පූරුවට; යුරෝපා රටවලට; ඉංග්‍රීසි භාෂාව කථා කරන රටවලට.

ඒ පාරවල්වල ගමන් කරන්න අපි ආසයි; පයින් යන්නත් ආසයි. හැබැයි, ලංකාව වාගේ රටවල මහ පාරේ එක පැත්තක ඉඳලා අනිත් පැත්තට මාරුවෙන එකත් භයානකයි. කොයි මොහොතක ප්‍රශ්නයක් ඇතිවෙයිද කියන අවධානමත් එක්ක තමයි අපට ගමන් කරන්න තිබෙන්නේ.

අපට වඩා පසු පසින් හිටපු රටවල් අද ආර්ථිකය අතින් හැම පැත්තෙන්ම දියුණුවෙලා තිබෙනවා. නමුත් අපේම රට තව තවත් පස්සට යන එක ගැන හිතනකොට අපි දුක්වෙන්න ඕනෑ, අපි පීඩාවට පත්වෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ තත්ත්වය අපට විශාල කනගාටුවක්. ඒ නිසා අපි ඔක්කෝම එකතුවෙලා, රටේ සියලු ජනතාව එකතුවෙලා, ගරු ඇමතිතුමාටයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාටයි මෙම කර්තව්‍ය කරන්න සහයෝගය දෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලබාදුන් කාලය දැන් අවසන්.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මට තව විනාඩියක් දෙන්න, කථාව නවත්වන්නම්.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, අන්තිමට ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසල් යන දරුවන්ට පාසල් ඉවරවෙලා ඉන්න පුළුවන් bus stand එකක් නැති ප්‍රශ්නය තිබෙනවා. ඒ ගැන ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා පාසල් ඉදිරිපිට හෝ අමාත්‍යාංශය හරහා පොඩි හෝල්ට් එකක් හදලා දුන්නොත් බොහොම පිං. ඒක රටේ අනාගත දියුණුව සඳහා හැදෙන දරුවන්ට විශාල සහනයක්. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් එම ගෞරවනීය ඉල්ලීම කරමින්, මට කථා කරන්නට අවස්ථාව ලබාදුන් මූලාසනයේ ඉන්න ගරු මන්ත්‍රීතුමාටත් ස්තුති කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 5.44]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අද ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සිටියා නම් හොඳයි. ඇත්තටම අපි අද අමාත්‍යතුමා බලන්න ආසාවෙන් හිටියේ. නමුත්, අමාත්‍යතුමා නැහැ. නියෝජ්‍ය අමාත්‍යතුමා තමයි අද අපිත් එක්ක ඉන්නේ. අමාත්‍යතුමා විශේෂ කාරණයක් හැටියට වර්තමානයේ පවතින වාහනවල, ඒ වාගේම නවීන වාහනවල නොම්මර තහඩුව, ඒ ඒ වාහනවලට සවිලන විදියට සවි කිරීමට අවස්ථාව ලබාදී තිබෙනවා. ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට තමයි අද අපට මෙම විශේෂ අවස්ථාව ලබාදී තිබෙන්නේ. නමුත් මේ අවස්ථාවේ බොහෝ දෙනෙක් කථා කළේ මේ සම්බන්ධව නොවෙයි. මේ ක්‍රමයේදී අපට යම් කිසි ආදායමක් ලැබෙනවා වෙන්නට පුළුවන්. හැබැයි, මේ රටේ වාහන පාවිච්චි කරන ජනතාව වෙනුවෙන් විශේෂ පහසුකමකුත් සලසනවා. වාහන පාවිච්චි කරන ජනතාව වෙනුවෙන් එම පහසුකම සලසද්දී, අමාත්‍යාංශය සම්බන්ධ කරගෙන දෙපාර්තමේන්තුව විසින් තමයි මෙම වැඩ සටහන දියත් කරලා තිබෙන්නේ. මෙම දෙපාර්තමේන්තුව පිළිබඳව ආපස්සට ගිහිල්ලා කථා කළොත්, මෙම දෙපාර්තමේන්තුව පිළිබඳව රට තුළ ප්‍රශ්න රාශියක් තිබුණා. අපේ ගම්වල ප්‍රවාහන දෙපාර්තමේන්තුවත් එක්ක සම්බන්ධ වුණු කඩ තිබෙනවා. ඒ කාලයේ ඒ කඩවල රෑට බොහෝ දෙනෙක් එකතුවෙලා ඉන්නවා අපි දකිනවා. ඒ කාලයේ විශාල ජාවාරම් සිද්ධ වුණා. හැබැයි, වර්තමානයේ ඒ තත්ත්වය නැති කරලා තිබෙනවා. ඒ පිළිබඳව අපි සන්තෝෂ වෙනවා.

විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාත් එක්ක සාකච්ඡා කරද්දී එතුමා කිව්වා, දැන් ඒ වැඩ පිළිවෙළ විශාල ලෙස අඩු කරලා අමාත්‍යාංශය, ඒ වාගේම දෙපාර්තමේන්තුව අද හොඳ තත්ත්වයේ තිබෙනවා කියලා. ඒක අහන්න ලැබීම සතුටක්. මොකද, මගේම හිතවතුන් බොහෝ දෙනෙකුට ඒ හා සම්බන්ධ විශාල ප්‍රශ්න රාශියක් ඇතිවුණු අවස්ථා තිබුණා. ඒ පිළිබඳව අපි මෙතුමාත් එක්ක සාකච්ඡා කරලා මෑතකදීත් යම් ප්‍රශ්නයක් විසඳාගත්තා.

ප්‍රවාහන දෙපාර්තමේන්තුවත් එක්ක, අමාත්‍යාංශයත් එක්ක බැඳුණු ආයතන කිහිපයක් තිබෙනවා. මීට පෙර හිටපු අමාත්‍යවරු අමාත්‍යාංශයත් එක්ක කරපු ගනු දෙනු මොනවාද කියලා අපි දන්නවා. එදා එදා දුම්රිය දෙපාර්තමේන්තුවට කම්කරුවෙක් හැටියට කාන්තාවක් බඳාවාගෙන තිබුණා. නමුත් අද අපේ අමාත්‍යවරුන්ට රැකියාවක් දෙන්න බැහැ. රැකියා දෙන්නේ නැහැ කියලා අද රට තුළ විශාල ප්‍රශ්නයක් තිනෙවා. හැම කෙනාම ප්‍රශ්න නඟනවා, "අපට රැකියාවක් නහැ, අපට රැකියාවක් නැහැ, අලුත් ආණ්ඩුවක් ආවා, ඒත් රැකියා නැහැ" කියලා. දුම්රිය දෙපාර්තමේන්තුවට කාන්තා කම්කරුවන් ගත්තාම, ඊට පස්සේ පිරිමි කම්කරුවන් ගන්නත් බැහැ, කාන්තා කම්කරුවන්ගෙන් ඒ වැඩේ කරගන්නත් බැහැ.

මම හිතන විදියට රටේ බොහෝ දෙපාර්තමේන්තුවල, අමාත්‍යාංශවල සහ අනෙකුත් ආයතනවල මෙවැනි අවස්ථා බොහොමයක් තිබෙනවා. අපි පසුගිය දා ප්‍රාදේශීය සභා මැතිවරණය පැවැත්වූවා. විපක්ෂයේ බොහොමයක් දෙනා උඩ පැන පැන හැම තැනකම මහා උජාරුවට කෑ ගහන්න ගත්තා, "ආණ්ඩුව දැන් ඉවරයි; ආණ්ඩුවට දැන් එන්නේ වෙනත් අගමැතිවරයෙක්; වෙන ආණ්ඩුවක් තමයි දැන් පත් වෙන්නේ." කියලා. හැබැයි, උඩ පැන පැන හැම තැනකම කෑ ගහන මේ අයත් ඒ අයගේ පාලන කාලය තුළ මේ රට යම්කිසි සැලසුමකට හැදුවේ නැහැ. රටේ ප්‍රවාහනය වෙන්න පුළුවන්, අනෙකුත් කරුණු කාරණා වෙන්න පුළුවන් ඒ සම්බන්ධව නිවැරදි ආකාරයෙන් යම්කිසි වැඩ පිළිවෙළක් හදලා, ජනතාවට තිබෙන ප්‍රශ්න අවම කරගෙන රටක් හැටියට ඉස්සරහට යමින් ඉදිරි අනාගත පරපුරට මේ රට නැවත නිර්මාණය කරලා දෙන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ මේ කෑ ගහන අය සකස් කරලා තිබුණේ නැහැ. මම COPE කමිටුවේ ඉන්න සාමාජිකයෙක් හැටියට දන්නවා, ප්‍රවාහන දෙපාර්තමේන්තුව සම්බන්ධව සහ මේ කරුණු කාරණා සම්බන්ධව බොහෝ දේවල් COPE කමිටුව තුළ සාකච්ඡා කළ බව.

විශේෂයෙන්ම අමාත්‍යාංශ සම්බන්ධව සහ සමහර මණ්ඩල, දෙපාර්තමේන්තු සම්බන්ධවත් නොයෙක් කරුණු කාරණා COPE කමිටුව තුළ සාකච්ඡා වුණා. ඒ අවස්ථාවේ දී අපට දැනගන්නට ලැබුණා, අමාත්‍යාංශවල තිබුණු මුදල් මේ අය නාස්ති කළේ කොහොමද කියලා. එදා තිබුණු ආණ්ඩුවේ ප්‍රවාහන අමාත්‍යාංශය භාරව සිටි අමාත්‍යවරයාට තවත් එක එක ආයතන සම්බන්ධ කරලා තිබුණු බව අපි දන්නවා. එදා හිටපු ප්‍රවාහන අමාත්‍යවරයා බස් අලුත්වැඩියා කරන්න අවශ්‍ය කරන අමතර කොටස් මිලදී ගන්න කොට සිද්ධ කරපු වංචාවන් මොනවාද කියලා අපි දැක්කා. අද ඒවා ඔක්කෝම හෑංගිලා තිබෙනවා. ඒවා තමයි එදා මේ රටේ තිබිච්ච විශාල ප්‍රශ්න. ඒ අමතර කොටස් ගෙන්වපු ආකාරය; බස් ගෙන්වපු ආකාරය; ඒවාවලින් හොරකම් කරපු විදිය; ඒවාවලින් වංචා කරපු විදිය සම්බන්ධව මේ වාර්තාවල සඳහන්ව තිබෙනවා. ඒවායේ පරීක්ෂණ කටයුතු අවසාන කරලාත් තිබෙනවා. විගණන වාර්තාත් තිබෙනවා. ඒ වාගේම, මම හිතන විදියට විශේෂ පරීක්ෂණ වාර්තාත් තිබෙනවා. FCID එකෙත් වාර්තා තිබෙනවා. හැබැයි, තවම මේ රටේ නියම හොරුන්ට දඬුවමක් දෙන්න බැරිව ගියා.

අපේ රටේ සියලු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන බොහොමයක්ම විනාශ කළේ එදා ආණ්ඩුවේ හිටපු ඇමතිවරුයි. හැබැයි, ඒවා ඔක්කෝම යට ගිහිල්ලා. අපි දන්නේ නැහැ, මේ රටේ කොතැනද සාධාරණය ඉෂ්ට වෙන්නේ කියලා. මේ රටේ හොරු ටික පැත්තකින් ඉන්නවා. හොරු ටික ජයඝෝෂා නඟනවා.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

හොරු ටික මේ රටේ ඉඳගෙන සුරසැප විඳිනවා. හැබැයි, වෙන කණ්ඩායමකට හොරු කියලා මඩ ගහනවා.

ඒ විතරක් නොවෙයි, මාධ්‍යයත් එකතු කරගෙන ඒ අය හොරකම් කරපු මුදල් ටිකත් දැන් නැවත සමාජයට දාලා, සමාජයේ බොහෝ දේවල් මුදල්වලින් තමන්ගේ අතට අරගෙන අනෙක් අයට හොරුයි කියලා ඇඟිල්ල දිගු කරන සමාජයකයි අද අපි ඉන්නේ. අපි ආණ්ඩුවක් හැටියට මේ රටේ වැඩ කටයුතු කරද්දී අපි දීර්ඝ කාලීන වැඩසටහන් හැදුවේ. දීර්ඝ කාලීන වැඩසටහන් කියන්නේ මොනවාද? අපේ රටේ සියලුම ජනතාව ණය බරින් මිරිකලා තිබෙන රටකයි ජීවත් වෙන්නේ. තිබ්බච ආණ්ඩු විදේශවලින් ණය ගත්තේ කිසිම සැලසුමක් නැතිවයි. ඒ නිසා අපටත්, අපේ දරුවන්ටත් විශාල වශයෙන් මේ ණය ටික ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. එහෙම ගෙවන්න සිද්ධ වෙලා තිබෙන රටක අපි ආණ්ඩුව ගත්තාට පස්සේ අපි කළේ මොකක්ද? ඉදිරි අනාගතයේ අපේ දරු පරපුරට මේ රට ණයක් නැතිව, බරක් නැතිව හොඳින් සතුටින් ජීවත් වෙන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ සකස් කරන්න අපි සැලසුම් කළා. එහෙම ජීවත් වෙන්න අවශ්‍ය ඒ පරිසරය නිර්මාණය කරන්න නම් අපට බොහෝ දේවල් පරිත්‍යාග කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා තමයි අපි කණ්ඩායම් දෙකක් එකට එකතු වෙලා ආණ්ඩුවක් හදාගෙන, ඒ ආණ්ඩුව තුළින් අපේ රට ඉස්සරහට යන ගමන් මඟට අවශ්‍ය සැලසුම් ටික හැදුවේ. අපි විදේශ රටවල් ටික මිත්‍ර කරගෙන ඒ අවශ්‍ය සැලසුම් හදාගත්තා. අපේ ගම්මානවල අඩු පාඩු ලෙස තිබෙන අධ්‍යාපනයත්, සෞඛ්‍යයත් වෙනුවෙන් අවශ්‍ය කරන පහසුකම් ටික සකස් කරන ගමන්ම, විශේෂයෙන්ම අපේ රටේ සංවර්ධන කටයුතු සැලසුම් සහගතව දීර්ඝ කාලීනව කරන්න තමයි අපි පියවර ගත්තේ. හැබැයි, කියන්න කනගාටුයි. එක පැත්තකින් රටේ ජනතාව මේකට හුරුවෙලා නැහැ. මේ රටේ ජනතාවට එදිනෙදා විසඳා ගැනීමට අවශ්‍ය ප්‍රශ්න ගොඩාක් තිබෙන බව අපි දකිනවා. ඒ ප්‍රශ්න ටික විසඳන්න කියන පණිවුඩය තමයි ජනතාව අපට මේ දුන්නේ.

මම දැක්කා, එහා පැත්තෙන් කථා කරපු සමහර මන්ත්‍රීවරුන් අද මේ විවාදයේ දී කථා කළේ මොනවාද කියලා. අද දින සාකච්ඡාවට නියමිතව තිබෙන්නේ, මෝටර් වාහන පනත යටතේ නියෝගය සම්බන්ධවයි. නමුත් එතුමන්ලා කථා කළේ පසුගියදා පැවැති ඡන්දය ගැනයි, වැඩි ඡන්ද ප්‍රමාණයක් ලැබුණු එක ගැනයි, ආණ්ඩුව ගැනයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට කියන්න දෙයක් තිබෙනවා. අපි බොහෝ දේවල් කැප කරලා තමයි අද ආණ්ඩුවේ පසුපෙළ මන්ත්‍රීවරුන් හැටියට වාඩි වෙලා මේ වැඩ කටයුතු කරන්නේ. අපේ ගම්වල බොහෝ දුක් විඳින ජනතාව සිටිනවා. සමහර වෙලාවට අපි ඒ අයට පෞද්ගලිකව පහසුකම් නොදීපු නිසා වෙන්න ඇති, ඔවුන් තවමත් දුක් විඳිමින් සිටිනවා. එම ජනතාව රටේ අනාගතය ගැන හිතලා අපිත් එක්ක එකට අත්වැල් බැඳගෙන ඉන්නවා. හැබැයි, විපක්ෂයේ අය රටේ අනෙකුත් කොටස් ඒක රාශී කරගෙන විශේෂයෙන්ම ජාතිවාදය වපුරවමින් සිටිනවා.

රණවිරු දඩයම කියලා මහා පට්ටපල් බොරු ප්‍රචාර පතුරවමින් සියලු ජනතාව නොමඟ යවනවා. බුද්ධාගම ගැනත්, රටේ තිබෙන විශේෂ ආයතන සම්බන්ධවත් අපේ ආණ්ඩුව ගන්නා තීන්දු තීරණ වැරැදියි කියා ප්‍රකාශ කරමින් ජනතාවගේ ඔළුවලට විසබීජ කවලා මේ රටේ පැවැති ප්‍රාදේශීය සභා මැතිවරණයේ දී යම්කිසි වෙනස් කිරීම් ටිකක් කළා. හැබැයි, අපි මතක තබා ගත යුතු කාරණයක් තිබෙනවා. ශ්‍රී ලාංකිකයන් හැටියට අපි සියලු දෙනා එකට එකතු වෙලා, එකට වාඩි වෙලා මේ රට හදනවා නම් අපි ජනප්‍රිය වැඩසටහන්වලට වඩා දීර්ඝකාලීනව මේ රට හදන වැඩසටහන්වලට යන්නට ඕනෑ. හැබැයි, වර්තමානයේ අපිට එහෙම කරන්න සිදු වෙයිද කියලා අපි දන්නේ නැහැ. මොකද ජනතාව බලාපොරොත්තු වන්නේ ජනප්‍රිය සහ කෙටි කාලීන වැඩසටහන් නම්, එවැනි වැඩසටහන් තුළින් ජනතාව සතුටු කරන්න අවශ්‍යයි කියන මතය රට පුරා තිබෙනවා නම්, ආණ්ඩුවක් හැටියට එවැනි වැඩ පිළිවෙළට යන්න අපටත් සිද්ධ වෙනවා. විශේෂයෙන්ම විපක්ෂයත් එක්ක වැඩ කටයුතු කරද්දී අපි මේ කාරණය දකිනවා. විපක්ෂය දැනගත යුතුයි, තමන් පට්ටපල් බොරු කියමින් රටේ ජනතාවගේ ඔළුව විකල් කරනවාට වඩා -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඒ අය කළ පාප ටික මකා ගන්න, ඒ අය සියලු දෙනා එකතු වෙලා මේ රට නැවත නිර්මාණය කරන්නට ඕනෑය කියා යම් කිසි විධියකින් කල්පනා කරනවා නම්, මේ රටට හොඳ අනාගතයක් නිර්මාණය කර ගන්නට හැකි වෙයි කියා මා හිතනවා. මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය.

ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

*අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

## රජයේ පාසල් වර්ග කිරීම
## அரச பாடசாலைகளைத் தரம் பிரித்தல்
## CLASSIFICATION OF GOVERNMENT SCHOOLS

[பி.ப. 5.55]

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பின்வரும் சபை ஒத்திவைப்புவேளைப் பிரேரணையை நான் சமர்ப்பிக்கின்றேன்:

"மாகாண ரீதியில் நிலவுகின்ற உட்கட்டமைப்பு வசதிகள் மற்றும் பொருளாதார வசதிகள் என்பவற்றினை அடிப்படையாகக் கொண்டு வழங்கப்படுகின்ற புள்ளி வழங்கல் முறைக்கேற்ப அரசாங்கப் பாடசாலைகள் கஷ்டம், அதிகஷ்டம், வசதி, அதிவசதி என்ற அடிப்படையில் தரம் பிரிக்கப்படுகின்றன.

எனவே, இவ்வாறு மாகாண ரீதியில் புள்ளி வழங்கும்போது ஒப்பீட்டளவில் அம்மாகாணத்திலுள்ள ஒரு மாவட்டம் மற்றைய மாவட்டத்தை விடவும் மிகவும் பின்தங்கிய நிலையில் இருக்கலாம். அவ்வாறு பின்தங்கிய நிலையிலுள்ள மாவட்டத்தைச் சேர்ந்த பாடசாலைகளுக்கு மேற்படி புள்ளி வழங்கல் முறைமை ஊடாகத் தரம் பிரிக்கும்போது அநீதி ஏற்படுகின்றது.

எனவே, பாடசாலைகளைத் தரம் பிரிக்கும்போது மாகாண ரீதியில் தரம் பிரிப்பதற்குப் பதிலாக மாவட்ட ரீதியில் நிலவுகின்ற உட்கட்டமைப்பு வசதிகள் மற்றும் பொருளாதார வசதிகள் என்பவற்றினை அடிப்படையாகக்கொண்டு வழங்கப்படுகின்ற புள்ளி வழங்கல் முறைக்கேற்ப கஷ்டம், அதிகஷ்டம், வசதி, அதிவசதி என்ற அடிப்படையில் தரம் பிரிப்பதற்கான முறையை அமுல்படுத்த வேண்டுமென இச்சபையில் பிரேரணை முன்வைக்கின்றேன்."

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மத்திய கல்வி அமைச்சினால் கஷ்டம், அதிகஷ்டம், வசதி, அதிவசதி என்று பாடசாலைகளைத் தரம் பிரிப்பதற்குச் சில அளவுகோல்கள் அல்லது பிரமாணங்கள் அனுப்பிவைக்கப்படு கின்றன. அதன்படி, குறித்த பாடசாலை அமைந்துள்ள இடத்திலே காணப்படுகின்ற மின்சார வசதி, தொலைபேசி வசதிகள், கணினி வசதிகள், வீதிப் போக்குவரத்து வசதிகள், வைத்தியசாலை அமைந்துள்ள தூரம், அந்தப் பாடசாலையை அண்மித்து நகரம் அமைந்துள்ள தூரம், புகையிரத நிலையம் அமைந்துள்ள தூரம், வங்கிச் சேவைகளினுடைய வசதிவாய்ப்புகள் என்பவற்றை அடிப்படையாகக் கொண்டு அந்தப் பாடசாலையைத் தரம் பிரிப்பதற்குப் புள்ளியிடல் வழங்கப்படுகின்றது. இவ்வாறு புள்ளியிடல் வழங்கப்படுகின்ற போது அந்தப் பாடசாலை அமைந்துள்ள இடம் போன்ற விடயங்கள் மட்டும் கருதப்படுகின்றது. ஆனால், அந்தப் பாடசாலையிலே கல்வி கற்கின்ற பிள்ளைகளது வசதி நிலைகள் - அவர்களது வருமானம், அவர்களுக்கு ஏற்படும் பாதிப்பு, அவர்களது போஷாக்கு - சம்பந்தமாகக் கருத்திற் கொள்ளப்படுவதில்லை.

நகரப்புறத்திலே அமைந்துள்ள பாடசாலைகளுக்கு உயர் கல்வியைக் கற்பதற்கு - க.பொ.த. சாதாரண தரமாகவோ அல்லது உயர் தரமாகவோ இருக்கலாம் - அதிதூரத்திலுள்ள கிராமப்புறங்களிலிருந்து பிள்ளைகள் வருகை தருகிறார்கள். அந்த வகையில் போக்குவரத்து வசதியற்ற அதிதூரக் கிராமப்புறங்களிலிருந்து பிள்ளைகள் பாடசாலைகளுக்கு வருகை தருகின்றார்கள், வருமானம் குறைந்த குடும்பங்களி லிருக்கும் பிள்ளைகள் இந்தப் பாடசாலைகளுக்கு வருகை தருகின்றார்கள், யுத்தத்திலே தகப்பனை, உழைக்கக்கூடிய சகோதரனை இழந்த பிள்ளைகள் அங்கு கல்வி கற்பதற்காக வருகை தருகின்றார்கள். ஆனால், இந்தப் பாடசாலைகளைத் தரம் பிரிக்கும்போது இந்தப் பிள்ளைகளது சூழல், அவர்களது பின்னணி என்பன கருத்திற்கொள்ளப்படுவதில்லை. அந்த வகையில் இத்தகைய பிள்ளைகள் கஷ்ட, அதிகஷ்டப் பாடசாலைகளுக்கு அரசினால் வழங்கப்படுகின்ற சப்பாத்து, சீருடை போன்ற மேலதிக வசதிகளை இழக்கின்றார்கள்.

அதிகஷ்டப் பாடசாலைகளில் கல்வி கற்பிக்கின்ற ஆசிரியர்களுக்கு மேலதிகக் கொடுப்பனவு உதவிகள் வழங்கப்படுகின்றன. அந்த வகையில் அதிகஷ்டப் பாடசாலைகளுக்கு 2,500 ரூபாய் மற்றும் கஷ்டப் பாடசாலைகளுக்கு 1,500 ரூபாய் என வழங்கப்படுகின்ற பொழுதும் அங்கு கல்வி கற்பிக்க வருவதற்கு ஆசிரியர்கள் மறுக்கின்றார்கள். இதற்குப் பல காரணங்கள் இருக்கின்றன. முக்கியமாக வெளி மாவட்டங்களிலிருந்து வந்து கற்பிக்கின்ற ஆசிரியர்களுக்கு குறிப்பாக, ஆசிரியைகளுக்கு ஒழுங்கான தங்குமிட வசதிகள்கூட கிராமப்புறங்களிலே இல்லை. அந்த வகையில் அந்த ஆசிரியைகள் தங்கியிருக்கின்ற வதிவிடங்கள் வௌவால்கள் உறங்குகின்ற இடங்களாகவும் குரங்குகள் உட்புகுகின்ற இடங்களாகவும் காணப்படுகின்றன. இதனால் தான் இந்த ஆசிரியைகள் இங்கு வருகை தர மறுக்கின்றார் கள்.

தேசிய மட்டத்திலே எடுக்கப்படுகின்ற பிரமாணங்களுக்கு அமைவாக பாடசாலைகளைத் தரம் பிரிக்கின்றபொழுது, முப்பது வருட யுத்தத்திலே பாதிக்கப்பட்ட பிரதேசங்களிலே கல்வி கற்கின்ற எமது பிள்ளைகள் வசதிவாய்ப்புக்களை இழந்து போகின்றார்கள். உதாரணமாக, முல்லைத்தீவு மாவட்டத்தில் இருக்கின்ற Mullaitivu Hindu Board Tamil Mixed School என்ற பாடசாலை அதிவசதியான பாடசாலை என்ற தரத்தினுள் வகைப்படுத்தப்பட்டிருக்கின்றது. இருந்த போதிலும், அங்கு கல்வி கற்பதற்கு வருகின்ற கிராமப்புறப் பிள்ளைகள் பல கிலோமீற்றர் தூரத்தைத் தாண்டி வருகின்றார்கள். ஒரு துவிச்சக்கர வண்டிகூட இல்லாத குடும்பங்களைச் சார்ந்த பிள்ளைகளும் இங்கு கல்வி கற்க வருகின்றார்கள். அதேநேரம், இந்தப் பாடசாலை அதிவசதியான பாடசாலையாக வகைப்படுத்தப்பட்டதனால் இந்தப் பிள்ளைகளுக்குரிய வசதிகள் மற்றும் ஏனைய உதவிகள் மறுக்கப்படுகின்றன. இது மோசமான ஒரு நிலைமையாகும். இது தொடர்பாக நான் வட மாகாண கல்வி அமைச்சோடு தொடர்பு கொண்டபொழுது, பாடசாலைகளைத் தரம் பிரித்தலை மீளாய்வு செய்கின்ற ஒரு நடைமுறை இருந்தாலும், கடந்த நான்கு வருடங்களாக இந்த மீளாய்வு நடைமுறைப்படுத்தப்படவில்லை என்பதை அறிய முடிந்தது.

மாகாண மட்டத்திலே பாடசாலைகளைத் தரம் பிரிப்பதற் குரிய மீளாய்வின்பொழுது சில கருத்துக்கள் கோரப்பட்டாலும், மத்திய மட்டத்திலே பாடசாலைகளுக்கென ஒரு quota system அறிமுகப்படுத்தப்பட்டு, அந்த வகைக்குள்ளே இந்தப் பாடசாலைகளை உள்ளடக்கப்பட வேண்டிய ஒரு நிலை காணப்படுகின்றது. எனவே, பாடசாலைகளைத் தரம் பிரிக்கின்றபொழுது - வகைப்படுத்துகின்றபொழுது வலயப் பணிமனை மட்டத்திலோ அல்லது பிரதேச செயலக மட்டத்திலோ குழுக்கள் அமைக்கப்பட்டு அவற்றுக்கூடாக பாடசாலைகள் வகைப்படுத்தப்படுகின்றபொழுது, பின்தங்கிய பாடசாலைகளும் மற்றும் பாதிக்கப்பட்ட பிள்ளைகளும் மேலும் வசதிகளைப் பெற்றுக்கொள்ள முடியும்.

கஷ்டமான பிள்ளைகள் எண்பது சதவீதம் கல்வி கற்கின்ற சில பாடசாலைகளும் வசதியான பாடசாலைகளென்று வகைப்படுத்தப்பட்டிருக்கின்றது. உதாரணமாக, ஏ - 9 வீதியை

[ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය]

அண்டிய பாடசாலைகள், பிரதான வீதிகளை அண்டியிருக்கின்ற பாடசாலைகள் என்ற அடிப்படையிலும் வங்கி வசதி, போக்குவரத்து வசதி, தொலைபேசி வசதி போன்ற வசதிகளைக் கொண்ட பாடசாலைகள் என்ற அடிப்படையிலே சில பாடசாலைகள், "வசதியான பாடசாலைகள்" என்ற வகைப்படுத்தலுக்குள் சேர்கின்றன. ஆனால், குறித்த பாடசாலைகளில் கல்வி கற்கின்ற பிள்ளைகளது குடும்ப வருமானம், அவர்களுடைய குடும்ப நிலைமைகளைப் பார்த்தால், எண்பது சதவீதமான பிள்ளைகள் வறுமைக் கோட்டின்கீழ் வாழ்பவர்களாக இருப்பதைக் காணலாம்.

ஆகவே, பாடசாலைகளைத் தரம் பிரிக்கின்றபொழுது, அங்கிருக்கின்ற பிள்ளைகளுடைய பின்னணி மற்றும் அப்பாடசாலைகளுக்குக் கல்வி கற்க வருகின்ற பிள்ளைகள் எதிர்நோக்குகின்ற பிரச்சினைகளைக் கள நிலையிலிருந்து ஆய்வு செய்து, குறித்த பாடசாலைகளைத் தரம் பிரிக்கக்கூடிய ஒரு முறைமையை முன்வைக்க வேண்டுமென்று கௌரவ கல்வி இராஜாங்க அமைச்சர் அவர்களிடம் மிகவும் தயவாகக் கேட்டுக்கொள்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

நன்றி! அடுத்து, இந்த ஒத்திவைப்புப் பிரேரணையை வழிமொழியுமாறு கௌரவ ஸ்ரீநேசன் அவர்களை அழைக்கின்றேன்.

[பி.ப. 6.03]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ உறுப்பினர் சாந்தி ஸ்ரீஸ்கந்தராசா அவர்களால் கொண்டுவரப்பட்ட "பாடசாலைகளை வகைப்படுத்தல்" தொடர்பான ஒத்திவைப்புவேளைப் பிரேரணையை நான் வழிமொழிவதோடு, அவர் குறிப்பிட்ட விடயம் தொடர்பில் சில தெளிவுபடுத்தல்களையும் இந்த இடத்தில் கூறிவைக்க விரும்புகின்றேன். அதிவசதியான பாடசாலை, வசதியான பாடசாலை, கஷ்டப் பிரதேச பாடசாலை, அதிகஷ்டப் பிரதேச பாடசாலை என்று மாகாணத்தை மையமாகக் கொண்டு பாடசாலைகளை வகுதிப்படுத்துவதைவிட, மாவட்ட அடிப்படையில் அவற்றை வகுதிப்படுத்துவது அல்லது வகைப்படுத்துவதுதான் பொருத்தமானதாக இருக்கும் என்ற அடிப்படையிலே கௌரவ பாராளுமன்ற உறுப்பினர் அவர்களது கருத்து அமைந்திருந்தது. உண்மையில் நாங்கள் வாழுகின்ற மாவட்டங்களை எடுத்துப்பார்த்தாலும், அங்கு பிரதேச செயலக மட்டங்களில் கஷ்ட, அதிகஷ்டப் பிரதேசங்கள் அல்லது வசதியான, அதிவசதியான பிரதேசங்கள் என்று பிரதேசங்களை வகைப்படுத்தக்கூடியதாக இருக்கின்றது. எனவே, உண்மையில் பாடசாலைகளை வகைப்படுத்துகின்றபோது, மேலோட்டமான முறையில் வகைப்படுத்துவதற்கு இந்த மாகாண மட்ட அடிப்படையிலான பார்வை பொருத்தமானதாக இருக்கும். ஆனால், நுணுக்கமான முறையில் வகைப்படுத்துகின்றபோது, அவற்றை மாவட்ட மட்ட அடிப்படையில் பார்ப்பதிலும் பார்க்க பிரதேச செயலகப் பிரிவு மட்ட அடிப்படையில் பார்ப்பதுதான் மிகவும் பொருத்தமானதாக இருக்கும். குறைந்தபட்சம் மாவட்ட அடிப்படையிலாவது இந்தப் பாடசாலைகளை வகைப்படுத்துவதுதான் நன்றாக இருக்கும் என்று நான் நினைக்கின்றேன்.

கௌரவ சாந்தி ஸ்ரீஸ்கந்தராசா அவர்கள் வன்னி மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற ஒரு பாராளுமன்ற உறுப்பினர் என்ற அடிப்படையில், அவர் முல்லைத்தீவு, வவுனியா, மன்னார் ஆகிய மாவட்டங்களை மையமாகக்கொண்ட தனது அவதானிப்பின் அடிப்படையில், பாடசாலைகளை மாகாண எல்லை அடிப்படையில் வகைப்படுத்தாது, மாவட்ட எல்லை அடிப்படையில் வகைப்படுத்த வேண்டும் என்று கூறுகின்றார். உண்மையில் மாவட்ட மட்டத்தில்கூட அதிவசதியான பாடசாலைகள், வசதியான பாடசாலைகள், கஷ்டப் பிரதேச பாடசாலைகள், அதிகஷ்டப் பிரதேச பாடசாலைகள் என்று வகுதிகள் இருக்கின்றன. ஐந்தாம் ஆண்டுப் புலமைப் பரிசில் பரீட்சையின் வெட்டுப்புள்ளிகளைத் தீர்மானிக்கின்றபோது, அல்லது அந்த மாவட்டத்தில் கற்கின்ற மாணவர்களது பரிசளிப்பு விழாக்களில் அவர்கள் சகல பாடங்களிலும் அதிவிசேட சித்திகளைப் பெற்றவர்கள் என்று எல்லாம் நாங்கள் வகைப்படுத்திப் பார்க்கின்றபோது, வசதியான, அதிவசதியான பாடசாலைகளுக்கு வழங்கப்படுகின்ற வசதிவாய்ப்புகளைவிட, கஷ்ட, அதிகஷ்டப் பிரதேசங்களில் காணப்படுகின்ற பாடசாலைகளுக்கு வழங்கப்படுகின்ற வசதிவாய்ப்புகளில் வேறுபாடுகள் காணப்படுகின்றன. இந்த 21ஆம் நூற்றாண்டின் தகவல் தொழில்நுட்ப யுகத்தில்கூட, இந்த நிலைமை காணப்படுகின்றது.

உதாரணமாக மட்டக்களப்பு மாவட்டத்தில், வின்சன்ட் மகளிர் தேசிய பாடசாலையும் புனித மைக்கல் தேசிய பாடசாலையும் பிரபல்யமான, வசதியான பாடசாலைகளாக இருக்கின்றன. அதேநேரத்தில் இதே மாவட்டத்தில், மட்டக்களப்பு கிழக்குப் பகுதி, மட்டக்களப்பு மேற்குப் பகுதி என்று இரண்டு பிரதேசங்கள் இருக்கின்றன. மட்டக்களப்பு மேற்குப் பகுதியிலுள்ள வாகரைப் பிரதேச செயலகப் பிரிவு, வெல்லாவெளிப் பிரதேச செயலகப் பிரிவு, வவுணதீவு பிரதேச செயலகப் பிரிவு போன்றவற்றில் அதிகஷ்டமான, கஷ்டமான பாடசாலைகள் காணப்படுகின்றன. அங்குள்ள அந்தப் பாடசாலைகளுக்கு வழங்கப்படுகின்ற வரப்பிரசாதங்கள் அல்லது சிறப்புரிமைகள் இன்றும்கூட மிகவும் கம்மியாகவே காணப்படுகின்றன. எனவே, பாடசாலைகளை மிகவும் கவனமாக பிரமாணங்கள், நியதிகளைப் பின்பற்றி வகுதிப்படுத்துகின்றபோதுதான் கஷ்டமான, அதிகஷ்டமான பாடசாலைகளுக்குக் கிடைக்கக்கூடிய வரப்பிரசாதங்களை அதிகரிப்பதற்கு வாய்ப்பு ஏற்படும்.

கௌரவ உறுப்பினர் அவர்கள் குறிப்பிட்டதுபோன்று ஆசிரியர்கள்கூட வசதியான, அதிவசதியான பாடசாலைகளில் கற்பிப்பதற்குத்தான் கூடுதலாக விரும்புகின்றார்கள். அதிகஷ்டப் பிரதேசப் பாடசாலைகள் உள்ள இடங்களில் போக்குவரத்து வசதிகள், குடிநீர் வசதிகள் மிகவும் குறைவாகவே காணப்படுகின்றன. அதேபோன்று குறைவாகக் காணப்படுகின்றன. இதையும்விட, வறுமைக் கோட்டின்கீழ் வாழுகின்ற மக்களின் தொகை அதிகமாக இருக்கின்றது. எனவே, நுணுக்கமான ஓர் ஆய்வின் அடிப்படையில் பாடசாலைகளை வகைப்படுத்தி, அவற்றுக்கு உரிய வசதிவாய்ப்புக்களை அதிகமான அளவில் பெற்றுக்கொடுப்பதன் மூலம்தான் இந்தப் பாடசாலைகளுக்கு இடையில் சமநிலையை - சமத்துவமான தன்மையைப் பேணக்கூடியதாக இருக்கும். இன்று நான் கல்வி அமைச்சுக்குச் சென்றநேரத்தில், திரு. செந்தில்மாறன் என்ற ஓர் அதிகாரியிடம் குறிப்பிட்ட விடயத்தைக் கூறிவிட்டு வந்தேன்.

மட்டக்களப்பைப் பொறுத்தமட்டில், அங்கு ஐந்து கல்வி வலயங்கள் காணப்படுகின்றன. அவற்றில் ஒன்று புதிதாக

உருவாக்கப்பட்ட மட்டக்களப்பு மேற்குக் கல்வி வலயமாகும். கௌரவ கல்வி இராஜாங்க அமைச்சர் அவர்கள் அந்தப் பகுதிக்கு எல்லாம் விஜயம் செய்து, அங்குள்ள பாடசாலைகளைப் பார்வையிட்டிருக்கின்றார். ஆனால், மட்டக்களப்பு மேற்குக் கல்வி வலயத்தில் ஆசிரியர்களைப் பயிற்றுவிக்கின்ற ஒரு மத்திய நிலையம் இன்னமும் வழங்கப்படாத நிலைமை காணப்படுகின்றது. ஆசிரியர்களை வாண்மைத் தேர்ச்சி - professional qualifications - உடையவர்களாக மாற்றுவதற்குரிய நிலையங்களாக இந்த ஆசிரியர் மத்திய நிலையங்கள் காணப்படுகின்றன. அங்கு நான்கு வலயங்களுக்கும் ஆசிரிய மத்திய நிலையங்கள் வழங்கப்பட்டிருக்கின்றன. 97 வலயங்களுள் மிகவும் பின்தங்கிய நிலையில் காணப்படுகின்ற மட்டக்களப்பு மேற்கு வலயத்திற்குரிய ஆசிரிய மத்திய நிலையம் வழங்கப்படாம லிருப்பது என்பது ஒரு குறைபாடாகவே காணப்படுகின்றது. எனவே, இந்த ஆசிரிய மத்திய நிலையத்திற்குரிய ஆளணியினரை மற்றும் ஆசிரிய மத்திய நிலைய முகாமையாளரை நியமித்து, அதற்குரிய வள நிலையத்தை உருவாக்கி, அங்குள்ள ஆசிரியர்களைச் சிறப்பான முறையில் பயிற்றுவிக்க வேண்டுமென்று கௌரவ கல்வி இராஜாங்க அமைச்சர் அவர்களிடம் நான் தயவாகக் கேட்டுக் கொள்கின்றேன். அதன் மூலமாகத்தான் இப்படியான அதிகஷ்ட, கஷ்டப் பிரதேசங்களைக் கொண்டிருக்கின்ற வலயத்தில் காணப்படுகின்ற தொய்வுகளை, குறைபாடுகளைச் சீர் செய்யக்கூடியதாக இருக்கும்.

கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, உங்களது பதவிக் காலத்தில் இந்த அதிகஷ்ட மற்றும் கஷ்டப் பாடசாலைகளை வசதியான நிலைக்கு, அதிவசதியான நிலைக்குக் கொண்டுவரக்கூடிய விதத்தில் அந்தப் பாடசாலைகளை நோக்கிக் கூடுதலான வளங்களை, கூடுதலான நிதியினை நீங்கள் நகர்த்த வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். அண்மையில் கஷ்டப் பிரதேசத்தி லிருக்கின்ற கரடியனாறு மத்திய மகா வித்தியாலயத்திலிருந்து, அங்கு 28ஆம் திகதி நடைபெறவுள்ள விளையாட்டுப் போட்டிக்குரிய அழைப்பொன்று உங்களுக்கு விடுக்கப்பட்டி ருக்கின்றது. இப்படியான பாடசாலைகளை நீங்கள் நேரடியாகச் சென்று பார்வையிடுவதன் மூலமாக, உங்களுடைய தரிசிப்பானது ஓர் ஆய்வாக அமைந்து இந்தப் பாடசாலைகளில் காணப்படுகின்ற குறைபாடுகளை நிவர்த்தி செய்வதற்கு வழிகோலும்.

மேலும், கௌரவ உறுப்பினர் குறிப்பிட்டதுபோன்று, பாடசாலைகளை வகைப்படுத்துவதில் மாகாணப் பார்வையை விட, மாவட்ட அடிப்படையிலான பார்வை, பிரதேச செயலக அடிப்படையிலான பார்வை உண்மையில் குறித்த பாடசாலைகளில் காணப்படுகின்ற குறைபாடுகளை நிவர்த்தி செய்வதற்கு அதிகமாக உதவும் என்பதைக் கூறிக் கொள்வதுடன், கௌரவ கல்வி அமைச்சர் அவர்களது முன்னிலையில் இந்தக் கருத்துக்களை எடுத்துரைத்து, உங்களுடைய ஆக்கபூர்வமான சிபார்சினையும் ஆலோசனை களையும் வழங்கி, அதற்குரிய ஆக்கபூர்வமான செயற்பாடு களை முன்னெடுப்பீர்கள் என்ற நம்பிக்கையுடன் எனது உரையினை நிறைவு செய்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

நன்றி! அடுத்து, கௌரவ கல்வி இராஜாங்க அமைச்சர் வீ.எஸ். இராதாகிருஷ்ணன் அவர்கள்!

[பி.ப. 6.11]

**ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன் - கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. V.S. Radhakrishnan -State Minister of Education)

கௌரவ சபைக்குத் தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய சபை ஒத்திவைப்புவேளைப் பிரேரணை, "மாகாண ரீதியில் நிலவுகின்ற உட்கட்டமைப்பு வசதிகள் மற்றும் பொருளாதார வசதிகள் என்பவற்றினை அடிப்படையாகக்கொண்டு வழங்கப்படுகின்ற புள்ளி வழங்கல் முறைக்கேற்ப அரசாங்கப் பாடசாலைகள் கஷ்டம், அதிகஷ்டம், வசதி, அதிவசதி எனத் தரம் பிரிக்கப்படுகின்ற தற்போதுள்ள முறைமையை மாற்றியமைத்து அவற்றை மாவட்ட ரீதியில் மேற்கொள்ள வேண்டும்" என்ற அடிப்படையில் வன்னி மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் கௌரவ சாந்தி ஸ்ரீஸ்கந்தராசா அவர்களினால் முன்வைக்கப் பட்டுள்ளது. அதற்குரிய விளக்கங்களை நான் பின்வருமாறு தருகின்றேன்.

அரச பாடசாலைகளில் ஆசிரியர் சேவையைப் பூர்த்தி செய்யும் நோக்கத்துடன் அடையாளங்காணப்பட்ட நியதிகளின் அடிப்படையில் அந்தந்த மாகாணப் பாடசாலைகள் தரம் பிரித்தலுக்கு உள்ளாக்கப்படுகின்றன. இங்கு இலங்கை ஆசிரியர் சேவைப் பிரமாணக் குறிப்பின் விதிமுறைகள் மற்றும் தேசிய ஆசிரியக் கொள்கைகளை நடைமுறைப்படுத்தும் தேவைக்காக "வசதிகள் மையப்படுத்தப் பட்ட பாடசாலைகள் வகைப்படுத்தல்" என 2005.01.18ஆம் திகதிய இலக்கம் 2005/ 01இற்குரிய சுற்றுநிருபமொன்று கல்வி அமைச்சினால் வெளியிடப்பட்டுள்ளது. இணைப்பு ஒன்றாக அதனை இங்கே சமர்ப்பிக்கின்றேன்.*

அத்துடன், கஷ்ட மற்றும் அதிகஷ்டப் பிரதேசங்களில் அமைந்துள்ள பாடசாலைகளில் ஆசிரியர் பற்றாக்குறைகளை நிறைவு செய்வதற்காக ஆசிரியர்களைப் பகிர்ந்தளித்தல், ஊக்குவித்தல் தொடர்பாக ஊக்குவிப்புக் கொடுப்பனவு நிதியொன்றை வழங்குவதற்காக கஷ்ட மற்றும் அதிகஷ்டப் பிரதேச பாடசாலைகளாக வகைப்படுத்தல் என்ற பெயரில் இலக்கம் 2006/43இற்குரிய சுற்றுநிருபம் ஒன்று 2006.11.24ஆம் திகதி வெளியிடப்பட்டுள்ளது. இணைப்பு 02 ஆக அதனையும் இங்கே சமர்ப்பிக்கின்றேன்.*

சுற்றுநிருப இலக்கம் 2005/01இன் நியதிகளுக்கமைவாக நிதி அமைச்சின் உடன்படிக்கையின்படி, அந்தந்தப் பாடசாலை வகைகளுக்காக அந்தந்த மாகாணத்திற்கு ஒதுக்கக்கூடிய பாடசாலைகளுடைய எண்ணிக்கை விகிதாசார முறையில் அடையாளம் காணப்பட்டிருக்கின்றது. மாகாணங் கள் தொடர்பாக அந்தந்தப் பாடசாலை வகைகளுக்காக ஒதுக்கக்கூடிய விகிதாசார முறைகள் இந்தச் சுற்றுநிருபத்தில் உள்ள அட்டவணையில் கொடுக்கப் பட்டிருக்கின்றன. அதனை நான் இங்கு வாசிக்கின்றேன்.

வடக்கு, கிழக்கு மாகாணங்களிலே அதிகஷ்டப் பாடசாலைகள் ஆகக்கூடியது 38, கஷ்டப் பாடசாலைகள் ஆகக்கூடியது 14, வசதியற்ற பாடசாலைகள் 13, வசதிப் பாடசாலைகள் 19, அதிவசதிப் பாடசாலைகள் 16; மத்திய

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා]

மாகாணத்திலே அதிகஷ்டப் பாடசாலைகள் ஆகக்கூடியது 07, கஷ்டப்பாடசாலைகள் ஆகக்கூடியது 17, வசதியற்ற பாடசாலைகள் 30, வசதிப் பாடசாலைகள் 20, அதிவசதிப் பாடசாலைகள் 26;

சப்ரகமுவ மாகாணத்திலே அதிகஷ்டப் பாடசாலைகள் 04, கஷ்டப் பாடசாலைகள் 25, வசதியற்ற பாடசாலைகள் 22, வசதிப் பாடசாலைகள் 25, அதிவசதிப் பாடசாலைகள் 24; வடமத்திய மாகாணத்திலே அதிகஷ்டப் பாடசாலைகள் 24, கஷ்டப் பாடசாலைகள் 27, வசதியற்ற பாடசாலைகள் 13, வசதிப் பாடசாலைகள் 19, அதிவசதிப் பாடசாலைகள் 17; வடமேல் மாகாணத்தில் அதிகஷ்டப் பாசாலைகள் 13, கஷ்டப் பாடசாலைகள் 23, வசதியற்ற பாடசாலைகள் 21, வசதிப் பாடசாலைகள் 22, அதிவசதிப் பாடசாலைகள் 21; ஊவா மாகாணத்திலே அதிகஷ்டப் பாடசாலைகள் 08, கஷ்டப் பாடசாலைகள் 15, வசதியற்ற பாடசாலைகள் 37, வசதிப் பாடசாலைகள் 22, அதிவசதிப் பாடசாலைகள் 18; மேல் மாகாணத்திலே அதிகஷ்டப் பாடசாலை 01, கஷ்டப் பாடசாலைகள் ஆகக்கூடியது 04, வசதியற்ற பாடசாலைகள் 12, வசதிப் பாடசாலைகள் 28, அதிவசதிப் பாடசாலைகள் 55; தென் மாகாணத்திலே அதிகஷ்டப் பாடசாலைகள் 05, கஷ்டப் பாடசாலைகள் 14, வசதியற்ற பாடசாலைகள் 17, வசதிப் பாடசாலைகள் 26, அதிவசதிப் பாடசாலைகள் 38 என்ற வகையில்தான் இந்தப் பாடசாலைகள் தரம் பிரிக்கப் பட்டிருக்கின்றன.

அத்துடன், இந்த இரண்டு சுற்றுநிருபங்களின் நியதிகளுக்கு அமைவாகவும் மற்றும் மாகாணத்தின் பிரதேச ரீதியான நியதிகளையும் கவனத்திற்கொண்டு, பாடசாலை வரையறைகளை மீறாத வகையில், பாடசாலை வசதிகளின் அடிப்படையில் அந்தந்த மாகாணத்தின் பாடசாலை வகைப்படுத்தல் செயற்பாடானது, இலக்கம் 2005/01 சுற்றுநிருபம் மூலமாக மாகாண அதிகாரிகளிடம் ஒப்படைக்கப் பட்டுள்ளது. அதன் பிரகாரம் மாவட்ட சிரமங்களைத் தனிப்பட்ட ரீதியாகக் கவனிப்பதற்குப் பதிலாக, அதற்கு மேலாகச் சற்று ஆழமாகப் பாடசாலை அமைப்பு ரீதியான சிரமங்களைக் கவனத்திற்கு எடுப்பதனால், மாவட்டச் சிரமங்களைத் தனிப்பட்ட ரீதியாக கவனத்திற்கொள்ளும் அவசியம் ஏற்படாது. மேலும், ஒட்டுமொத்த மாவட்டத்தைச் சிரமமாகக் கணித்து, பல்கலைக்கழக நுழைவின்போது சம வாய்ப்புக்களை உறுதிப்படுத்துவதைக் கவனத்தில் எடுத்தாலும், பாடசாலைக் கல்விச் சந்தர்ப்பங்களை வழங்கும் போது, விசேடமாக அந்தந்தப் பாடசாலைகளில் நிலவும் வசதிகளைக் கவனத்தில்கொண்டு உரிய வகைப்படுத்தல் மேற்கொள்ளப்படும். எனவே, பிரதேச ரீதியான வசதிகளைக் கவனத்தில் கொண்டு பாடசாலைகள் வகைப்படுத்தும் முறைமைகளைக் கொண்ட செயற்பாடு இந்தச் சுற்றுநிருப விதிமுறைகளின் ஊடாக மாகாணத்திற்கு வழங்கப்பட்டிருப் பதனால், மீண்டும் மாவட்ட ரீதியான வகைப்படுத்தல் அவசியப்படாது.

மாகாண அமைச்சுக்கள் கல்வி வலயங்களுக்கூடாக பாடசாலைகளுடைய வசதிகளைக் கருத்திற்கொண்டு அதிகஷ்டப் பிரதேசம், கஷ்டப் பிரதேசம், வசதியான பிரதேசம், அதிவசதியான பிரதேசம் என்ற தீர்மானம் எடுக்கின்ற செயற்பாடு அந்தந்த மாகாணங்களுக்குப் பகிர்ந்தளிக்கப் பட்டிருக்கின்றது என்பதும் இங்கு சொல்லப்பட்டிருக்கின்றது.

கௌரவ உறுப்பினர் அவர்களே! பொதுவாக ஒவ்வொரு மாகாணத்திற்கும் இந்த வாய்ப்புகள் அளிக்கப்பட்டிருக் கின்றன. ஆகவே, மாகாணக் கல்விப் பணிப்பாளர், வலயக் கல்விப் பணிப்பாளருடன் இணைந்து பாடசாலைகளின் தரம் பிரித்தலைச் செய்யவேண்டும். அதன்மூலமாக அவர்கள் செய்யும் சிபாரிசு மத்திய அரசாங்கத்தினால் ஏற்றுக்கொள்ளப் பட்டு, நிதியமைச்சு இதில் சம்பந்தப்பட்டிருப்பதனால், அதனுடைய அங்கீகாரத்துடன் இந்தச் செயற்பாட்டை மேற்கொள்ள முடியுமென்று நான் இந்தச் சபைக்குத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.18 ට, 2018 පෙබරවාරි මස 22 වන බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி.ப. 6.18 மணிக்கு பாராளுமன்றம், 2018 பெப்ருவரி 22, வியாழக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Parliament adjourned accordingly at 6.18 p.m. until 10.30 a.m. on Thursday, 22nd February, 2018.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.